වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

## සත්‍ය ධර්මය අවදි විය

(හයවන වෙළුම)

# අභිඥා ඥානයට හසුවන

## පරම සත්‍ය - 02

**සියලුම හිමිකම් ඇවිරිණි**

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටාගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

# අභිඥා ඥානයට හසුවන පරම සත්‍ය - 02

බුද්ධෝත්පාද ධර්ම දේශනා ශ්‍රවණයට
https:/youtube.com/channel/ucwms400m8EsZc9foKtEajg

අන්තර්ජාල ශ්‍රවණයට - website
buddhothpado.com

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් E-mail : suranchaminda50@gmail.com
Tel: 0777959235

පරිගණක මුද්‍රණ සැකසුම හා මුද්‍රණය **Vishan Print Shop & Book Shop**
197, වක්වැල්ල පාර, ගාල්ල.
දුරකථන : 0912247940

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිත ද මායාවක් වන තැන සිතේ මායාවෙන් මිදුන තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ථ භහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුල සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ, මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් **ඉදප්පච්චතාවයයි.** එනම්

දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්වභාවයයි. දෙයක් නැති තැන **චෙතෝවිමුක්තියයි.** එනම් අනිමිත්ත ශූන්‍යත, අප්ප්‍රනීත **චේතොවිමුක්තියයි.** ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවයටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

**''නිස්සත්වෝ නිජ්ජීවෝ ශූනණයෝ''**

පහන නිවී ගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන.
ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි.
ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

**විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පභං**
**එත්ථ ආපෝච පඨව ච - තේජෝ වායෝ න ගාධති**
**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති**
**විඤ්ඤස්ස නිරෝධෙන - ඒත්තෙ තං උපරුජ්ජන්ති**

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**- බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්, නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධුරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධුරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍ය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**- අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

# පුන්‍යානුමෝදනාව

මේ උතුම් ධර්ම දානයට

දායක වූ සියලු දනන් හට,

මෙතුළින් ජනනි වන්නා වූ පුණ්‍ය ශක්තිය,

බුද්ධෝත්පාදයෙන් විවර වූ උතුම්

ශ්‍රී සද්ධර්මය කන්වැකීමටත්, අවබෝධ වීමටත්

සංසාර දුකින් මිදී

නිවන් සැනසීම ලබන්නටත් හේතු වේවා !

# පිදුම

කාලයේ වැලි තලාවෙන් සැඟව ගිය
ඒ උතුම් ශ්‍රී සද්ධර්මය
අතැඹුලක් කොට,
අවිද්‍යා ලොවම දෙදරවමින්
සත්‍යයේ දෝංකාරය තුළ
ආත්මය හැර දමා
සසර පුරුද්දට ආ ගමනේ අවසන
මරණයක් නැති ලෝකයට
මොහොතට අවදියෙන්
සිතෙන් මිදෙමින්
නිස්සරණ මග ඇවිද යන්නට
මං විවර කළ
බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට
උපහාරයක් ම වේවා !



# පටුන

01. ආනාපානසති භාවනාව වඩන්නේ කොහොමද? 1

02. ඥාන දස්සන විසුද්ධිය
(නිවන් මඟ සරලව) 38

03. නාම රූප පරිච්ඡේද ඥාණය 73

04. රූපය පිළිසිඳ දැකීම
(සමථයානික, ශුෂ්ක විදර්ශක 93

05. භාහිරත් සිතත් සත්‍යක් නොවේ
(දිට්ඨි විශුද්ධිය) 113

# ධර්මය තුළ ප්‍රායෝගික වෙමු.

''ධර්මය සරලයි ඒ දැකීම පහසු නැහැ.''

තෙරුවන් සරණයි...!

## ⋆ 1 වෙනි පරිච්ඡේදය ⋆

**ආනාපානසති භාවනාව වඩන්නේ කොහොමද?**

**''ඉධ භික්ඛවේ භික්ඛු අරඤ්ඤගතෝවා රුක්ඛමූල - ගතෝවා සුඤ්ඤාගාර ගතෝවා නිසිදති පල්ලංකං ආභූජිත්වා, උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා''**

දැන් මේක හැමෝම දන්නවා. මේ ආනාපාන සති භාවනාව වඩන කෙනෙක් වනයට ගිහිල්ලා, ගසක් මුල හෝ මිනිසුන්ගෙන් හිස් ගේකට හෝ ශූන්‍යාගාරයක හෝ ධර්මය තුල සඳහන් කාරණා අපි බොහෝම සෛද්ධාන්තිකව පොත් පත්වල ඔබ ඇසුරු කරන අය දන්න කාරණාවක් මේ. අපි බලමු කොහොමද නිවැරදිව නිවන් මඟ කටයුතු කරන්නේ සමථයානික රහතන්වහන්සේ නමක් බිහිවෙන්නේ කොහොමද? ශුෂ්කයානික විදර්ශනා සමථ පුබ්බංගමා නැත්නම් සමථ මුල් කරගෙන කොහොමද සමථයානික රහතුන්වහන්සේ නමක් බවට පත්වන්නේ. නිවන් දකින්නේ. විදර්ශනා භාවනාවෙන් විදර්ශනා මූළික කරගෙන කොහොමද ශුෂ්කයානික රහතන්වහන්සේ නමක් රහත් භාවයට පත්වන්නේ. මේ සමථ විපස්සනා යුගන්දන විදියට මේ භාවනාවෙන් අවසානයේ මේ වැඩෙනා ආකාරයේ සමථ භාවනාවේ නියැලෙන කෙනෙක් සමථ භාවනාවෙන් විපස්සනා භාවනාවට යොමු වෙන්නේ කොහොමද? මේ නිවන් අවබෝධය නිවන් සාක්ෂාත් කරගැනීම සඳහා නිවැරදිව

කටයුතු කළයුතු ආකාරය ගැන කවුරුත් දන්න ගාථාවක් තමයි අපි ඉදිරිපත් කළේ.

**''ඉධ භික්ඛවේ භික්ඛු අරංඤ්ඤගතෝවා රුක්ඛමූල ගතෝවා සුඤ්ඤාගාර ගතෝවා නිසිදති පල්ලංකං අභූජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා''**

මහණ තෙමේ වනයට හෝ ගසක් මුලට හෝ මිනිසුන්ගෙන් හිස් ගේකට හෝ ගියේ පැලක් බැඳගෙන හිඳගෙන ශරීරය ඇද නැතිව කෙලින් තබාගෙන සිහිය අභිමුඛ කොට සිහිය පිහිටවාගෙන මෙන්න මේ විදිහට මේ වාක්‍ය හැමෝම දන්නවා මේක **උජුං ධාය** කියන එක මේ. පොත්වල සඳහන් වෙලා තියෙන්නේ කවුරුත් දන්නේ මේ විදිහට තමයි. මේකට වෙනත් අර්ථකථන තියෙනවා. නමුත් අපි අර්ථකථන ඒවා ගැන ගැටුමට අපට අවශ්‍යතාවයක් නැහැ. කොහොම කිව්වත් මෙතන තියෙන්නේ වචනයක්මයි. ඒ වචනේ පරිසමාප්තියෙන් ඔබට වැටහෙනවා මෙතන විවේකය අවශ්‍යයි. කාය විවේකය, චිත්ත විවේකයට වැදගත් වෙනවා. ඉතිං න්‍යායාත්මකව සෛද්ධාන්තිකව, අපි බලමු ඒ විදිහට ම පෙල දහම අනුවත් බලමු. ඒ විදිහටම සිද්ධවෙන ආකාරය අපි බලමු.

**''අරණ්‍යගතෝවා රුක්ඛමූල ගතෝවා ශූන්‍යාගාර ගතෝවා''** මේ විදිහට ආනාපාන සතියට යොමුවන යෝගාවචරයෙක් එතකොට හැමෝම දන්නවා සිහියෙන් ම හුස්ම ගන්නේ, සිහියෙන් ම හුස්ම පිටකරන්නෙ කියන්නේ **''සෝ සතෝවා අස්සසති - සෝ සතෝව පස්සසති''** එතකොට සිහියෙන් හුස්ම ගනී, සිහියෙන් හුස්ම පිටකරයි. දැන් ඔබ ආනාපන සති භාවනාවට යොමුවන කෙනෙක් නම් ඔබ මේ සිහියෙන් හුස්ම ගන්නවා පිටකරනවා කියන එක හිතලා කරන එකක් නෙමෙයි. හුස්මට සිහිය පිහිටන එක තමයි එතනදි සිද්ධ වෙන්නේ. එතකොට ඒකට හොඳට සිහිය පිහිටලා වෙන එක තමයි දීර්ඝ

හුස්මක්ද කෙටි හුස්මක්ද කියලා සිහිය පිහිටා ගන්න එක. දීර්ඝව හුස්ම ගන්න එකක් නෙමෙයි. ඔබ දීර්ඝව හුස්ම ගන්නවා නෙමෙයි, කෙටියෙන් හුස්ම ගන්නවාත් නෙමෙයි, හිතලා කරනවාත් නෙමෙයි. මේ වැටෙන හුස්ම දිහා බලා සිටිනවා. සිහියෙන්. සිහියෙන් ඔබ සිහිය පවත්වනවා හුස්මට. එතැනදි මේ වැටෙන හුස්ම දීර්ඝව වැටෙනවා, කෙටිව වැටෙනවා කියලා ඔබට සිහිය වේ. සිහිය තමා වැදගත් වෙන්නේ.

**''දීඝංවා අස්සසතෝ දීඝං අස්සසාමීති පජානාති, දීඝංවා පස්සසන්තෝ දීඝං පස්සසාමිනි පජානාති''** ඒ වගේම කෙටිම හුස්ම ගන්වා, කෙටිව හුස්ම පිට කරනවා කියන එක.

**''රස්සංවා අසසසන්තෝ රස්සං අස්සසාමීති පජානාති''** කියලා ධර්මයේ සඳහන් වෙනවා. මේ මූලික සිද්ධාන්ත ටික. එතකොට මේ සිහිය පවත්වනවා මේ හුස්මට. එතකොට දැන් මෙතන ඔබට හුස්ම වැදෙන තැනක් හමුවෙනවා. ඒකට හුස්ම වැදෙන තැන ඔබ අරමුණු කරනවා. **''සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමිනි සික්ඛතී සබ්බකාය පටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති''** මේ ආශ්වාසය ප්‍රාශ්වාසය දැන් රූපයේ අන්තයේ මෙතන කථා කරාට මේ ආශ්වාස ප්‍රාශ්වාස භාවනාව ආනාපානාසති භාවනාව කරන ඔබත් පුරුදු වෙලා ඇති ඉතිං හැමෝම දන්න කාරණාවක් මේ මෙතන අපට තොල අග්‍රයේ හුස්ම වදින තැනට ඒ කියන්නේ රූපයේ අන්තයට සිහිය පිහිටන එක ඒ වදින තැනට සිහිය පිහිටන එක සබ්බකාය පටිසංවේදී සිහිය පිහිටනවා කියන එක. **''සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති''** ආශ්වාසයත් සබ්බකාය පටිසංවේදී පස්සසිස්සමීති සික්ඛති ප්‍රාශ්වාසයත් හුස්ම වදින තැන තමයි අපට කොහොමත් අපි සිහිය පිහිටවන කොට නිමිත්ත වෙන්නේ එතන සති නිමිත්ත පදනම කොට ආශ්වාස ප්‍රාශ්වාසයට හුස්ම වැදි තැන තමයි අපට කොහොමත් නිමිත්ත වෙන්නේ එතන සති නිමිත්ත පහළ වෙන්නේ එතකොට එතන

තමයි **''පස්සම්භයං කාය සංඛාරං අස්සසිස්සාමිති සික්ඛති පස්සම්භයං කාය සංඛාරං පස්සසිස්සාමිති සික්ඛති''** කියන්නේ එතකොට කාය සංඛාර එතකොට පස්සම්භයං කියන්නේ ඔබට මේ දැනෙන කාය සංකාර අස්සසිස්සාමිති සික්ඛති ඔය ඒ කියන්නේ ඔබට ප්‍රකට වෙනවා නම් හුස්ම වදින තැන **පස්සම්භයංකාය සංඛාරං පස්සසිස්සාමිති සික්ඛති** ඒක දනිමියි කියන සිහියෙන් ඒ සිහියට ම හුස්ම යන එන ආකාරයේ ඒ නිමිත්ත තමන්ට ප්‍රකටවන ආකාරයෙන් තැනම තමයි. ඒ නිමිත්ත මෙන්ම ප්‍රකටවන ඒ දියුණුව පවතින්නේ ආශ්වාස ප්‍රාශ්වාසයේ තමන්ට මේ සිහිය හුස්ම දැනෙන ඒ හොඳට ප්‍රකටවන එක විසිරෙන හිත හැමතැනම දුවන හිත ඒ හැමතැන දුවන එක අඩුවෙලා තමන්ගේ සති නිමිත්තට මේ තොල අග්‍රයට හෝ නාසිකා අග්‍රයට හෝ දැනෙන තැනට සිහිය පවත්වා එක එතනදී තමන්ම සිහිය හුස්ම දැනෙන්න ගන්නවා එතකොට එතෙන්ට සිහිය පවත්වන එක සති නිමිත්ත අල්ලනවා කියන තැන බොහොම කවුරුත් දන්න කාරණාවක් මෙය හැම කෙනෙක්ම මේ ආනාපානා සති භාවනාව කරන කොට මේක අත්හදා බලනවා. පුරුදු වෙනවා. ඉතිං මෙතනින් තමයි පටන් ගන්නේ හැබැයි මෙතනදී බොහෝම පරිස්සමින් සිහිය හොඳට බොහොම තැන්පත්ව ඉන්ද්‍රිය සංවරය ඇති කරගෙන කාය විවේකය ඇති කරගෙන මේ විසිරෙන හිත තැන්පත් කරගෙන බොහොම නිවෙන ස්වභාවයක් තමන්ගෙම මේ භාවනාවට යොමුවුණු මේ යෝගාවචරයෙක්ගේ ස්වභාවයට මේ කටයුතු සිද්ධ වෙන්න ඕනේ බොහොම සිහියෙන් නුවණින් යන ගමනක් එතන දී ආශ්වාසය ප්‍රාශ්වාසය හුස්ම රැල්ලට සිහිය පවත්වන එකයි කරන්නේ. ඔබ හිතලා ඕනකමින් හුස්ම ගන්නවා නෙමෙයි. හුස්මට සිහිය පවත්වා ගන්නවා හුස්ම දැනෙන තැන තමන් අඳුනාගන්නවා නිමිත්ත ඉතිං ඒක රූපයේ අන්තය භාහිරය කියලා තමන් දකින්න ඕනේ එතනදි තොල අග්‍රයේ ද නාසිකා අග්‍රයේ ද එය ප්‍රකට වෙන්නේ එය වැදගත් වෙනවා එතන්ට සිහිය හොඳින් ප්‍රකට වන තැන

හොඳින් සති නිමිත්ත පවත්වාගෙන යන්න ඕනේ එතනදී ඉතිං ඒ උග්ගහ නිමිත්ත ඒ කියන්නේ එතන ඔබට ප්‍රකට වන තැන් ස්භාවය තව දියුණු ස්වභාවයට එන කොට ඔබ හඳුනාගන්න එය උග්ගහ නිමිත්ත කියලා. ඒ වගේ ම ඒක ඒ නිමිත්ත හොඳින් සියුම්ව තමන්ගේ භාහිර අන්තයට එන ඒ හුස්ම ස්වභාවය මේක දැනෙන ස්වභාවය ප්‍රකට වන ස්වභාවයට තමන්ගේම භාහිරයට යන්නැති විසිරෙන්නැති පිට පනින්නැති එකම නිමිත්තටම හිත බැහැගෙන සිටින ප්‍රකට ව දැනෙන අවස්ථාවක් එනවා බොහෝ අයට මෙතනදී ඒ නිමිත්තට ම ආලෝක නිමිත්ත කියලත් කියනවා. මෙතෙන්ට තමයි ඕභාසය කියන්නේ. එච්චර එහෙම නැතත් ඔබට ප්‍රකටවනවා නම් ඒ නිමිත්ත ප්‍රකට වනවා නම් එයයි වැදගත් වන්නේ. ඒ සති නිමිත්ත ඔබ පුරුදු කරලා තියෙනවා නම් ඒක මහා දියුණුවක්. සිත විසිරෙන් නැතුව තබාගන්න එක වැදගත් වෙනවා. ඉතිං ඒ නිවන්මග ගමන් කරන යෝගාවචරයාට ඉතාම වැදගත් කාරණාවක් තමයි මේ සති නිමිත්ත අල්ලනවා කියන කාරණාව. මේ සිහිය පවත්වනවා කියන එකයි මෙතන දී වෙන්නේ. හුස්මට හුලං රැල්ලට මෙතනදි ඒක හොඳින් ප්‍රකට වෙන තැනක් එනවා භාහිර අන්තය කියා උග්ගහා නිමිත්ත ඔබට ග්‍රහනයවෙනවා. ප්‍රකට වෙනවා. ඒ තොල අග්‍රයේ හෝ නිසාකා අග්‍රයේ හෝ එය නැවතත් හොඳින් සිහිය පවත්වන විට එයට ම එයම ප්‍රකට වන ස්වභාවය තුළ එයම දීප්තිමත්ව ප්‍රකට වන ස්වභාවය තමයි පටිභාග නිමිත්ත කියලා ඒ හිතට දැනෙන ස්වභාවය තුළ ඒ ප්‍රකට වෙනවා ඔබට හඳුනාගන්න ඕනේ. පටිභාග නිමිත්ත කියලා එතකොට මෙතන මේ නිමිත්තට වඩා හොඳින් පැහැදිලි වන අවස්ථාවක් තමයි ඒ දීප්තිමත්ව දකින අවස්ථාව. ඒ තමයි පටිභාග නිමිත්ත කියන්නේ. ඉතිං ඒ මෙතන සිත විසිරෙන අවස්ථාවක් නෙමෙයි. හිතන නිමිත්තට ම බැස ගෙන සිටින අවස්ථාවක්. දියුණු අවස්ථාවක්. එය ඉතා වැදගත් වෙනවා යෝගාවචරයෙකුට. ඉතිං එතනින් තව ටිකක් භාවනාව දියුණු

කරගෙන යන කොට ඔබට අර සමාධි අවස්ථාවට ඔබ පත්වෙනවා. ඒක නැවත පුරුදු කරන්න ඕනේ. නැවත නැවත ඒ සති නිමිත්ත ඔබ පුරුදු කරන කොට පිට යන්නැති එහෙන්ම බැස ගෙන සිටින ඒ උපචාර සමාධි අවස්ථාවට ඇවිල්ලා එය ඉතාම දියුණු අවස්ථාවක්. එකපාරම නොවන්න පුළුවන්. නමුත් ඒක නැවත නැවත පුහුණු වෙන කොට ඔබටම ප්‍රකට වෙන්න ගන්නවා ඒ උපචාර අවස්ථාව.

ඇත්තටම ධ්‍යාන අවස්ථාවට පෙර අවස්ථාව මේ උපචාර අවස්ථාව තමන්ට ම අත් විඳින්න ලැබෙන අවස්ථාවක් මේ ආනාපාන සති භාවනාව වඩන කෙනෙකුට ඒ අවස්ථාව ඉතාමත් ම වැදගත් වෙනවා. කිසිම දේකට අරමුණු නොවන නිමිත්තට ම බැසගත් ස්වභාවයක් ඒ තුළ තියෙනවා. භවාංග චිත්තය හා සමාන ස්වභාවයකට තමන්ට ඒ වචන පාවිච්චි කරනවාට වැඩිය ප්‍රායෝගික පැත්තේ දී තමන්ට ඒ දැනෙන දැනීම් තුළ උපචාර සමාධිය තමන්ට දැනෙන්න ගන්නවා. ඒක දියුණු අවස්ථාවක්. ඇත්තට ම ඒ උපචාර සමාධියේ ධ්‍යානයට පෙර අවස්ථාව. හැබැයි තවත් ටිකක් හොඳින් මේ නැවත නැවත මේ විදිහට ප්‍රගුණ කරගෙන යන කොට උපචාර සමාධියෙන් එය ආනාපාන සමාධිය කියන තැනට එනවා. එතකොට තමන්ගේම සිතට ප්‍රකට වන ඒ ස්වභාවයකට එනවා. එතනදී මේ හුස්මට ම ආශ්වාස ප්‍රාශ්වාස නිමිත්තටම හොඳින් ප්‍රකට වෙලා අපේ සිතට ම දැනෙන අවස්ථාවක් එනවා. අන්න ඒ අවස්ථාව මේ උපචාර සමාධි අවස්ථාවන් ආනාපාන සමාධි අවස්ථාවට එනවා. ඒ ධ්‍යාන චිත්තය ඔබ හඳුනාගන්න ඕනේ. ඒ ධ්‍යානයක් උපදවා ගැනීම අසීරු කටයුත්තකුත් නෙවෙයි. නමුත් ඇත්තට ම එය ඉතාමත් වටිනවා. ඒ හිත තැන්පත් කර මේ විසිරෙන මනස මේ අවස්ථාවේ දී විසිරෙන් නැතිකම ම තමයි. ඇත්තට ම මහා සුවයක් දැනෙනවා ප්‍රීතියක් ඇති වන අවස්ථාවක්. ඉතිං මේ අවස්ථාව එන කොට තමයි ඒ ධ්‍යාන චිත්තය ඒ කියන්නේ ආනාපාන සමාධි අවස්ථාවට එන තැන

තමයි ඒ ධ්‍යාන අංග පෙන්නන්න ගන්නේ. ඉතිං එතනදී ඔබ හඳුනාගත්තොත් එතන ධ්‍යාන උපදින්නට හේතු තියෙනවා. ඒ ඉතිං විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා. ඒ තමයි ධ්‍යාන අංග. ඉතිං එතැනදී අර භාවනා අරමුණට ම තමාගේ සිත පිහිටවාගෙන පටිභාගනිමිත්තට ම යොමුවෙලා ඒ සිත පවත්වා ගන්න එක තමයි විතක්කය කියන්නේ. එතකොට විචාරය පෙන්වන්නේ ඒ නොකඩවා එන සෑම සිතක්ම භාවනා අරමුණේම නැවත නැවත යෙදවීම විචාරය පටිභාග නිමිත්ත එක දිගට පටන් ගෙන යෑම තමයි විචාරය, විතක්කය විචාරය කියන්නේ මේ සිහිය පැවැත්වීමට එතනදීමයි. මේ කටයුත්ත ඔබට පේන්නේ ඒ හුස්ම රැල්ලට සිහිය පවත්වන තැන එතැන තැන්පත් වීමක් තියෙනවා සමනය වීමක් තියෙනවා. ඒ හුස්මට සිහිය ප්‍රකට වෙනවා. ඉතිං එතන විසිරුණු මනසේ තැන්පත්වීමට ප්‍රීතියට හේතුවයි. එතකොට තමන්ට එනවා මහා සුවයක් සුවයක් කැමැත්තක්. ඒ කැමැත්ත ම තමයි ප්‍රීතිය කියන්නේ. එතකොට ඒ ප්‍රීතිමය අවස්ථාව සිතට ම දැනෙන ප්‍රීතිය කැමැත්තක් බොහොම සැහැල්ලුවක් සුවයක් අන්න ඒක තමන්ට දැනෙන සුවය සුවය කියනවා. එතකොට ඒ නිමිත්ත තමන්ට ම අත්දැකීමක් වෙන්න ඕනේ එතනදි මේ සිහිය ඔබට පැහැදිලි කරද්දී තේරෙනවා මනා සිහි නුවණක් පැවැත්වීමක් තියෙනවා ඉතිං එතනදි ඒ එකම නිමිත්තම නැවත නැවත විසිරෙන්නේ නැතිව එයටම බැහැගෙන එයටම පිහිටා සිටීම තුලයි සමාධියක් උපදින්නේ ඒ සමාධිමත් අවස්ථාව තමයි ඇත්තට ම ඒ ධ්‍යාන අවස්ථාව ඉතිං එතෙන්ට එන්න තමයි මේ සිත බැහැගෙන යන්නේ. නිවීගෙන යන ගමනත් ඒක සමථ සමාධියකටයි යන්නේ විසිරෙනවා ලෞකික සමාධියක් හේතු තියෙන කොට එය සකස් වෙනකොට ඒ ස්වභාවය තුළ මේ සමාධි උපදිනවා නමුත් යම්කිසි තමන්ටම තමන්ගේ ස්වභාවය තුල ඒ සුදුසු ස්වභාවය නැත්නම් මේ සමාධිය විසිරෙනවා එතන පිරිහෙනවා ඉතිං නමුත් මේවා නැවත නැවත පුහුණු කිරීම තුළ තමන්ගේ සිහිය හොඳින් දියුණු තත්ත්වයකට එනවා

ඉතිං මෙය ඉතාම වැදගත් වෙනවා සමාධිය උපදවා ගන්න එක ඉතිං විතක්ක, විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා කියන මේ ප්‍රථම ධ්‍යාන තමන්ට හමුවෙනවා මේක නුවණින් දකින්න ඕනේ තැනක් **''ප්‍රීති පටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති ප්‍රීති පටිසංවේදී පස්ස සිස්සාමිති සික්ඛති''** කියල අපි මීට පෙර ආනාපානසති භාවනාව ගැන මනා පැහැදිලි කර තියෙනවා. ඒ ප්‍රීතිය ඔබට දැනෙන එකත් **''සුඛපටි සංවේදී අස්ස සිස්සාමති සික්ඛති සුඛ පටිපංවේදී පස්ස සිස්සාමිති සික්ඛති''** ඒ කියන්නේ සැහැල්ලුව සුඛය ඔබට ආශ්වාස ප්‍රශ්වාසය තුල ඒ සුවය ඔබට දැනෙනවා ඒ ආශ්වාසය තුල ඒ දැනීමෙන් ආශ්වාස කරන්නෙමියි කියලා තමන්ට දැනීමක් එනවා ආශ්වාසය තුල ප්‍රශ්වාසය තුල **''සුඛ පටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති සුඛ පටිසංවේදී පස්ස සිස්සාමති සික්ඛති''** ඉතිං මේ තුල තමයි ඇත්තටම **''චිත්ත සංකාර පටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති චිත්තං සංකාර පටිසංවේදී පස්ස සිස්සාමිති සික්ඛති''** කියන්නේ මේ භාහිර අන්තයෙන් සිත පැත්තට සිතට දැනෙන මේ සිතට මනා කොට මෙය දැනෙන අවස්ථාවක් එනවා එතකොට **''චිත්ත සංඛාර පටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති චිත්ත සංඛාරං පටිසංවේදී පස්සසිස්සාමති''** කියන තැනට එනවා. එතකොට අර භාහිර රූපයේ අන්තයෙන් නාමයේ අන්තයෙන් පැත්තට එන්නේ **''සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමිති සික්ඛති''** කියන තැනින් රූපයේ අන්තයෙන් නාමයේ අන්තය පැත්තට මෙය දැනගන්නවා ඉතාම සියුම් කොට මේ ආශ්වාසය ප්‍රශ්වාසය දැනෙන අවස්ථාවක් එනවා ඉතිං මේ සමාධිමත් සිත අපට අවශ්‍ය වෙනවා මේ සමාධිමත් සිතින් අපි ඇත්තටම නිවන් දකින්නෙ. සමථය වැඩුවත් එය විපස්සනා භාවනාවෙන්මයි අපි නිවන් දකින්නේ ඒක හොඳට දැනගෙන තියෙන්න ඕනෙ සමථය කුමක් සඳහා ද විපස්සනාව සඳහායි. ඉතිං මේ ධ්‍යානය කුමක් සඳහාද ධ්‍යානය විපස්සනාවට යොමවීම සඳහායි. ඉතිං එතනදි ප්‍රථම ධ්‍යානය අදුනගන්න ඕනෙ ධ්‍යාන අංග අදුන ගන්න ඕනේ එතකොට

ප්‍රීති කියන අංගය අඳුනගන්න ඕනෙ ප්‍රථම ධ්‍යානය ''විතක්ක විචාර ප්‍රීති, සුඛ ඒකාග්‍රතා කියන මේ අංග ටිකත් එක්කම තමන්ට අඳුනගන්න වෙනවා ඉතිං ඒ වගේම ඒ විතක්ක විචාර සන්සිඳෙන අවස්ථාව තමයි දෙවන ධ්‍යානය ඉතිං තමන්ට ඒක අඳුන ගන්න ලැබෙන්න ඕනේ. ඒ වගේම තුන්වන ධ්‍යානය සුඛ දැනෙන කාය සැහැල්ලුවක් ඇත්තටම මේක වචනයෙන් කියනවට වැඩිය ඔබගේම අධ්‍යාත්මිකව ඔබ ප්‍රායෝගික වෙලා මේ ආශ්වාස ප්‍රශ්වාස භාවනාවට යොමුවෙලා ඉතිං මේ සිහිය ඒකාග්‍ර කරගෙන දියුණු ගමනක් කරා යන්නේ ඉතිං ඒක සිහි නුවනින් කරන්න ඕනේ **''සුඛපටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති සුඛපටිසංවේදී පස්සසිස්සාමිති සික්ඛති''** කියන මේ තුන්වෙනි ධ්‍යාන අංගය ලෞකික ධ්‍යාන තමන්ට ම අත් විඳින්න ලැබෙනවා ඒත් එක්කම හතරවෙනි ධ්‍යාන අංගය විදිහට සුඛය ප්‍රීතිය කියන තැනට අභිබවා ගිහිල්ලා ඔබ්බට ගිහිල්ලා අර පටිභාග නිමිත්තේ සිත එකඟව රැඳී තියෙන අවස්ථාවක් තියෙනවා පටිභාග නිමිත්තෙම හිත රැඳුණු අවස්ථාවක් එනවා අර ධ්‍යාන චිත්තය ම සමාධියක් විදිහට ධ්‍යාන අංගයම ප්‍රකටවන අවස්ථාවක් කියන්න පුළුවන් ඒක ඉතිං ඒකාග්‍රතාවයකට ප්‍රකට වන තැනක් එතැන ඉතාම දියුණු තැනක් ඒ තමයි වැදගත්ම තැන ඒ හතරවන ධ්‍යාන අංගය තමයි ඒකාග්‍රතා දැන් **''සුඛ පටිසංවේදී අස්සසිස්සාමිති සික්ඛති සුඛ පටිසංවේදී පස්ස සිස්සාමිති සික්ඛති''** කියන තැනින් පස්සෙ ඔබට හමුවන්නෙ ඒකාග්‍රතාවයම ධ්‍යාන අංගයම ප්‍රකට වන අවස්ථාව ඉතිං එතනදි ඔබට දකින්න ලැබෙනවා ''චිත්ත සංඛාරං පටිසංවේදී'' කියල හඳුන්වන්නේ ඒ තැන තමයි **''චිත්ත සංකාරං පටිසංවේදී අස්ස සිස්සාමිති සික්ඛති චිත්ත සංඛාරං පටිසංවේදී පස්සසිස්සාමිති සික්ඛති''** කියන තැන එතනදි ධර්මය තුල සඳහන් වෙන විදිහට ඔබ බැලුවොත් **''පස්සම් භයං චිත්ත සංකාරං අස්සසිස්සාමිති සික්ඛති''** කියන තැන ඉතාම වැදගත් වෙනවා. දැන් රූපයේ අන්තයෙන් නාමයේ අන්තයෙනුත් මිදෙන තැනක් තමයි මෙතෙන්ට

එන්නේ ඉතිං නුවණින්ම දකින්න ඕනෙ තැනක් මෙතන **''පස්සම් භයං චිත්ත සංඛාරං අස්සසිස්සාමිති සික්ඛති''** දැන් මේ සිතටමයි දැනෙන්නෙ මේ ආශ්වාසය ප්‍රශ්වාසය ඔබගේ ආශ්වාසය ප්‍රාශ්වාසය සිතටමයි දැනේනේ තමන්ගේ සිතටම ප්‍රකට වෙනවා මේ ආශ්වාස ප්‍රශ්වාසය මේ සති නිමිත්ත තමන්ගේ සිතටම ප්‍රකට වෙනවා තමන් ඉන්න ධ්‍යාන නිමිත්ත සිතටම ප්‍රකට වෙනවා ඒ චිත්ත ස්වභාවයන් ප්‍රකට වෙනවා. සියුම්ව දැනෙන්න ගන්නවා ඉතිං එතන නුවනින්ම දකින්න ඕනේ තැනක්. **''පස්සම් භයං චිත්ත සංඛාරං අස්ස සිස්සාමිති සික්ඛති පස්සම් භයං චිත්ත සංඛාරං පස්සසිස්සාමිතී සික්ඛති''** කියන තැන ඉතිං තමන්ගේ සිතුවිලි චේතනා වලට ඉඩක් නැති ඒ සිතුවිලි චේතනා වලින් මිදුනු ඒ ස්වභාවය ඒක අත්දැකීමක් ම වෙන්න ඕන ස්වභාවයක්මයි. ඒක ඒ වචනයෙන් කියනවට වැඩිය ඒ ස්වභාවය ඉතාම එකම සිතවිලි චේතනාවලට ඉඩක් නැති වෙනවා කියන කොටම ඒ මහා සුවයක් තියෙන තැනක් ඔබට මේක දැනෙන්න ඕනෙ ඉතිං ඒ මහා සුවය ධර්මය තුල පෙන්නන කාරනා තියෙනවා **''චිත්ත පටිසංවේදී අස්ස සිස්සමිතී සික්ඛති''** කියන තැන **''චිත්ත පටිසංවේදී පස්ස සිස්සාමිති සික්ඛති''** කියන තැන සිතට දැනෙන්නේ සිතටමයි මේ අරමුණු වෙන්නේ ආශ්වාස ප්‍රාශ්වාස කියන තැන නාමයේ අන්තය දකින්න ඕනේ ඉතිං ඒ විදිහටම අභිප්මෝදයන් කියන තැනට අපි කලින් වගේම ඔබට ඒ තුලම සුවයක් දැනෙනවා ඒ සුවය කලින්ට වැඩිය ගැඹුරුවට යනවා කලින්ට වැඩිය දැනුනු සුවයට වැඩිය සියුම් ව දැනෙන සුවයක් ඔබට ඊට වැඩිය ප්‍රකට වෙනවා ඔබට සුවය. අන්න ඒ අවස්ථාව තමයි **''අභිප්පමෝදයං චිත්තං අස්ස සිස්සාමිති සික්ඛති අභිප්පමෝදයං චිත්තං පස්ස සිස්සාමිති සික්ඛති''** කියල කලින් දැනුනු විදිහට වැඩිය ඉතාමත් සියුම් ව ඉතිං මේක සිත තුලම සිතේම සමාධිමත් සිතට ම දැනෙන සතුටක් කියන්න පලුවන් සුවයක් කියන්න පුලුවන් ඉතිං ඒත් එක්කම ඔබට **''සමෝදහං චිත්තං අස්ස සිස්සාමිති සික්ඛති සමෝදහං චිත්තං**

**පස්සසිස්සාමීති සික්ඛති''** කියන ඒ ධ්‍යාන අංගයම ඔබට හම්බ වෙනවා ඉතිං එතනදී මෙතන ඇත්තටම නාමයේ අන්තය ඔබට හමුවන්නේ ප්‍රකට වෙන්නේ සිතමයි. සියුම්ව දැනීමක් පමණයි. එය මහා සුවයක් පමනි විසිරීමක් නැහැ භාහිරට යන්නැහැ හිත චේතනා සිතුවිලි නැහැ මෙතුලම සමාධිමත් සිතේ ස්වභාවයම ඔබට පේනවා ඇත්තටම මෙතන රූපය ප්‍රකට වෙනවා කියන්න පුළුවන් ඉතිං මේක ධර්මය අපි සෛද්ධාන්තිකව පෙන්වන්න පුළුවන් තැනක් ඉතිං මේ රූපාවචර සමාධිය අපි කියන්නේ රූපය අරූපය කියලා මේ රූපය ප්‍රකට වන තැනක් විදිහට පෙන්නන්න පුළුවන් ඉතිං ඒ වගේම තමයි තමන්ට ම ඒක දැනෙන්න ඕනේ සමාධිමත් අවස්ථාවක් කිසිවක් නොදැනෙන තැනටයි මේ යන්නේ ඉතිං මනා සැහැල්ලුවන් තියෙනවා සුවයකුත් තියෙනවා එතන කිසිවක් නොදැනෙන තැනක් එනවා මෙතන අන්න එතන තමයි හතරවෙනි ධ්‍යානය තුල ඔබ ඇත්තටම රූපාවචර ධ්‍යාන සවනින්ම කරන තැන කිසිවක් නොදැනෙන තැනට සියුම් වීගෙන යන තැනක් ඒ තරම්ම සියුම් වෙනවා කියන් පුළුවන් කියනවාටත් වැඩිය සියුම්ව ස්වභාවයකින්. සියුම්ව තමන් සිහිය පැවැත්වුවොත් දැනෙන නොදැනෙන තරමට ම නොදැනෙන ස්වභාවයකට ම පත්වෙනවා ඒකයි **''විමෝචයං චිත්තං අස්ස සිස්සාමීතී සික්ඛති විමෝචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති''** කියලා පෙන්නන්නේ 'විමෝචයං' කියන්නේ ඇත්තටම සිතෙන් මිදෙන තැන නාමයේ අන්තය මිදෙන තැන නාම රූප පරිච්චේදයක් මේ තුල තියෙන්නේ මේ ආනාපානා සති ධර්මය දන්න කෙනාටයි හැබැයි මේ රූපයය නාමයයි හඳුනගන්න ලැබෙන්නේ එහෙම නැත්තම් ලෞකික පැත්ටමයි යන්නෙ ලෞකික ධ්‍යානයක් විදිහටයි යන්නේ ඉතිං මෙතනදී ඉතාම වැදගත් වෙනවා මේ කියන මේ ධ්‍යාන අංග වගේම මේ පටිභාග නිමිත්ත කියන කාරණය තමන්ට ඒ මූලික අවස්ථාවේ දියුනුවක් දැනෙන මුල් අවස්ථාව ඒ වගේම උපචාර සමාධිය කියන අවස්ථාව උග්ගනා නිමිත්ත පටිභා නිමිත්ත ඒ උපචාර

සමාධිය ආනාපාන සමාධිය ආනාපාන සමාධිය කියන තැන හොදට සියුම් ව තමන්ගේ මනස කොහේටවත් යන්නෑ චේතනා සිතුවිලි මුකුත් පහල වෙන් නැහැ ඉතාම දියුණු අවස්ථාවක් ආනාපාන සමාධිය කියන තැන එතකොට මෙතන ඔබ කිසිම චේතනාවක් එහෙම නැහැ කිසිදු සිතිවිල්ලකට ඉඩක් නෑ කියන කොට එතකොට කාලය සම්බන්ධයෙන් පවා

එතැන කිසිම දෙයක් ගන්න බැහැ දෙයක් නොදැනෙන ස්වභාවයකට පත්වෙන තැනක් තමයි එකත ඔබට දකින්න ලැබෙයි එතකොට මේ දැන් මෙතනදී 'විවෝචයං චිත්තං' කියන තැනින්. ආනාපානා සති භාවනාව නවතින්නැහැ හතරවෙනි ධ්‍යානයේ දී තමයි නමුත් දැන් මේ ධර්මය නොදන්න ධර්මය දන්න අය හටයි මෙතැනින් එහාට ධර්ම මාර්ගයේ ගමනක් තියෙන්නේ. නැත්නත් අරූප ධ්‍යාන තමයි. ඒ කෙනාට ප්‍රකට වෙන්නේ ඊට පස්සේ 'ආකාසඤ්ඤායන' යයි ඊට පස්සේ 'විඤ්ඤානන්චායතන' යි ආකාසය ම අන්නතයි කියලා මේ අනන්ත ස්වභාවයකට යනවා මේ හතරවෙනි ධ්‍යානයෙන් මේ ධර්මය නොදන්න ධර්මය ගැන අවබෝධයක් නැති ධර්මය ගැන වැටහීමක් නැති ධර්මය දන්නැති කෙනා අර අරූප ධ්‍යාන පැත්තටයි යන්නේ එහෙම උනාම තමයි ආකායසේ වගේ ප්‍රකට වෙනවා මුලින් අර ආලෝක නිමිත්තක් වගේ ප්‍රකට වීගෙන එනවා ඒ ආලෝක නිමිත්ත වගේ ප්‍රකට වීගෙන එන එකම ස්වභාවයෙන් ම මහා ආලෝකයක් බවට මහා ආලෝකයක් බවට පත්වෙලා ආකාසය බවට තමන්ම ප්‍රකට වෙන්න ගන්න තැන ඒක බොහෝ වෙලාවට අපට කියන්න පුලුවන් සුදුපාට වෙන්නත් පුලුවන් ඒ වගේ ස්වභාවයකට ආලෝක ස්වභාවයක්ම තමයි ඇත්තටම එතන ප්‍රකට වෙන්නේ ඉතිං එතකොට ආකාස අරූප ධ්‍යානයටයි යන්නේ. එතැන නොදැනෙන ස්වභාවයෙන් එහාට යන කෙනාටයි ධර්මයේ නොදන්න කෙනෙකුට තමයි ඉතිං ඒ. පැත්තට සිත ගලාගෙන යෑමක් සිද්ධවෙනවා නිරායාසයෙන් ම

සිද්ධවෙනවා විඤ්ඤානංචායතණය කියා පැත්තට එනවා ආකාසය අනන්තයි කියලා ඒ ආකාසයම ප්‍රකට වෙන තැන ඒ ආකාසයම දැනේනේ කොහාටද කියලා අර නිමිත්ත තමන්ගේ දැනීම මොකක්ද කියලා අරමුණු එන කෙනාටමයි විඤ්ඤාණ ආයතනය සකස් වෙන්නේ අරූප ධ්‍යාන සකස්වෙන හැටි තමයි මේ කියන්න ගියේ ආකාසයේම විදිහට සකස්වෙන නිසා ඒ නිමිත්ත සකස් වෙනවා ඒ නිමිත්ත තුල ආකාසයේ ම නිමිත්තක් වෙනවා දැන් මුලින්ම ඔබ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත දැන් දියවීගෙන යනවා එතකොට නිමිත්ත ප්‍රකට වෙනවා ඊට පස්සෙ ඔබට නොදැනෙන තැනට එනවා ශූන්‍යතාවය පැත්තට එනවනේ අන්න එතන හතරවෙනි ධ්‍යානයෙන් පසසේ ඔබට සිද්ධ වෙන්නේ. එතනදි තමයි. ආකාසයම මේ මහා ආලෝකයම ආලෝකයට අවකාසයක ස්වභාවය ආකාසයක ස්වභාවයෙන් ප්‍රකට වෙනවා ඉතිං ඒක නිමිත්තක් විදිහටම තමන් කියලා කෙනෙක්ටත් වැඩිය ඒ ආකාසයම තමන් බවට තමයි තමන්ට ප්‍රකට වෙන්නේ. ආකාසයම තමන් බවට දැනෙන විදිහට ආකාසම තමන් වෙලා එනකොට් ඒ ස්වභාවයකය ප්‍රකට වෙනවා අරූප ධ්‍යානවලට අපි බොහෝ අයට මේ අත්දැකීම අඩුයි. අපිට මේ ගැන මනා අත්දැකීමක් තියෙන නිසාමයි අපි එහෙම පැහැදිලි කරන්නේ.

ප්‍රකට වෙනවා පොත් දිහාම බලලා නෙමෙයි ඒක කියන්නේ ඔබටත් දැනේවි ඒ ස්වභාවයට යනවා නම් දැනේවි දීර්ඝකාලයක් තිස්සේ භාවනා කරන කෙනෙකුටයි ඒ ස්වභාවය අත්විඳින්න ලැබෙන්නේ. දීර්ඝ කාලයක් සමහර විට පැය තුන හතර එක දිගට මේ ධ්‍යාන නිමිත්ත මේ මෙතන ඉන්නවා නම් තමයි ඒ කියන්නේ මෙතන මේ ධ්‍යානයට සම වැදිලා මේ මුකුත් නොදැනෙන ස්වභාවයට පත්වෙලා ඒ කාලය මෙතැන ඇත්තටමක ාලයක් කථා කරාට ඇත්තටම වෙන්නේ නම් එහෙම තමයි. වෙනනම් ඒකේ ගැඹුරින් ගැඹුරට ගිලා බැසගෙන යනවා ඉතිං ඇත්තටමක කාලය ගැන අවබෝධයක්

නැති වුනාට විශාල කාලයක් ගතවෙනවා බාහිරින් බැලුවොත් ඊටම බැස ගත්ත කෙනෙකුටයි ඒ අත්දැකීම ලැබෙන්නේ. ඉතිං ඒක බොහොම කලාතුරකින් කෙනෙකුට ලැබෙන අත්දැකීමක් වෙන්න පුළුවන්. කෙනෙකුට කෙනාගෙ කෙනාගෙ හැටියට ඒක වෙනස් වෙන්න පුළුවන්. ඉතිං ඒ තුල මහා ආලෝකයක් අවකාශය විදිහට ම දැනගැනීමක් තියෙනවා. ඒ ස්වභාවය දැනීමයි. එහෙම තමයි අපට කියන්න වෙන්නේ ඒත් එක්කම මෙතන දැනෙන්නේ කියලා ගත්තාම තමයි. විඤ්ඤාණ ආයතනය සකස් වෙන්නේ නැත්නම් මේ දැනීම ගැන අවබෝධයක් ඇති වෙන් නැහැ. දැනීමට සිහියක් යොමුවෙන් නැහැ. නමුත් දැනීමක් කියන එක එනකොටම තමයි විඤ්ඤාණ ආයතනය සකස් වෙන්නේ. ඉතිං නොදැනෙන තැනටම යනවා ඔය ආකිඤ්ඤායතනයේ දී හරිම භයානකයි.

ඒ කියන්නේ අරූප ධ්‍යාන පැත්තෙ සිරවීමක් තියෙනවා. මේ කියන තැන්වල සිරවීමක් තියෙනවා. අපි මේකේ උදේ 07.30 සිට රාත්‍රී 08.00, 09.00, 10.00 වෙනකම් මේ භාවනාවට යොමුවෙලා ඉන්නකොට අපිට මෙවැනි සිරවීමක් සිදුවුණා. ඒ අපි මෙයිට කලින් ප්‍රකාශ කලා ඒ සිදුවීම සිදුවුණු ආකාරය. ඒ ඉතාම භයානකයි. ඔය නේවසඤ්ඤානාසඤ්ඤා කියන්නේ එතනින් ගොඩ ඒමක් නැහැ. පාවීම තුල කොයි මොහොතේ තමන් භාවනාවට යොමු වුනත් එතනම තමයි ප්‍රකට වෙන්නේ දැන් මේ අවස්ථාවට එනකොටත් අපි අවුරුදු 20 විතර භාවනාවට යොමු වුනා. මුල් අවස්ථාවලදී ඔය සමථ භාවනාව තුළ එතන අවුරුදු ගානක් ගතවුණා. ඉතිං පසුකාලීනව අපට දවසක්ම එකහමාරක් දෙකක් ඒ එක දිගට ම භාවනා ඉරියව්වේ පර්යංකේ ඉඳිලා තියෙනවා. ඒ තුළ අපට මේ ප්‍රකට වෙලා තියෙනවා මේ ධ්‍යාන අවස්ථා. ඒ නිසා අපට තියෙනවා අවබෝධයක් මේ ගැන. මනා අත්දැකීමකුත් තියෙනවා. ඒ නිසා තමයි අපි ප්‍රකාශ කළේ. නමුත් අපි දැනගෙන හිටියේ නැහැ ඇත්තටම මේ ධර්මය ගැන. අපි ඒක නිසා තමයි අපි

අත්හැරලා ඊට පස්සේ අපි ධර්මයේ යම්කිසි කරදර ටිකක් සිද්ධවුනා. ඒවත් එක්කම අපි අත්හැරියා. ඊට පස්සේ අපි ධර්මය හොයන්න ගත්තා. පසුකාලීනව අපි ධර්මය ඉස්මතු වුණා. හමුවුණා. හමුවුණ ධර්මය අපි ත්‍රිපිටක අධ්‍යයනයේ නියුතු වුණා. ධර්මය නිවැරදි ව ආනාපානය නිවැරදිව භාවනාවට යොමු වෙන්නේ කොමද යන්න එතන දී අපට හමුවුණා. මේ ''**අනිච්චානු පස්සී අස්සසිස්සාමීති සික්ඛතී, අනිච්චා නු පස්සි පස්ස සිස්සාමිති සික්ඛාතී''** කියන ''**විරාගානු පස්සි අප්සස සිස්සාමිතී සික්ඛති විරාගනු පස්සි පස්සසිස්සාමීතී සික්ඛාති''** කියන තැන ඒ වගේ ම '' **නිරෝධානු පස්සි අස්සසිස්සාමීති සික්ඛාති නිරෝධානු පස්සී සිස්සාමි සික්ඛාතී''** කියන කාරණා. මේවා අතිශයින්ම ගැඹුරුයි. මේ කියන තැන් මෙතනදී දීර්ඝ පැහැදිලි කිරීමක් කළ යුතු වෙනවා. මේ ''**පටිනිස්සග්ගානු පස්සී අස්සසිස්සාමීති සික්ඛති පටිනිස්සග්ගානු පස්ස සිස්සාමීතී සික්ඛති''** කියන මෙන්න මේ අවසාන අධියර ටික ''**අනිච්චානු පස්සි, විරාගානුපස්සි, නිරෝධානු පස්සි, පටිනිස්සග්ගානු පස්සී''** කියන මෙන්න මෙතෙන්ට අපගේ කටයුතු යොමුවුනු ආකාරය ගැනයි අපට පැහැදිලි කරන්න අවශ්‍යතාවය තියෙන්නේ. අපි ඊට කලින් අවස්ථාවක දී ඉදිරිපත් කරා මෙතෙන්ට එන හැටි **විමෝචයන් චිත්තං** කියන තැනට එතනින් එහාට නොදැනෙන තැනට එන හැටි. ඒ තුළ අපි අත්දැකීම් පවා හෙළි කරා ගොඩක් අද අපි කාලය ගන්නේ මෙතනින් එහා. මේ කටයුත්තට ඒක අතිශයින් ධර්මය දන්නනුමයි තියෙන්නේ ධර්මය නොදන්න කෙනෙකුට ඔතනින් එහාට ගමනක් නැහැ හිරවෙනවා. හිරවෙනවාමයි. අපිත් සිරවුනා. අපටත් වැරදුනා. අපිත් අතරමං වුනා වගේ දෙයක් සිද්ධ වුනා. ඉතිං අපි විශාල කරදර වලට මුහුණ දුන්නා. අපට ඒවයින් ගැලවෙන්න බැරි වුණා. ඇත්තම කථාව භාවනාවට වාඩිවෙන්නේ කොයි මොහොතෙද පර්යංකයෙන් තවත් සමාධියට යන්නේ කොයි මොහොතෙද ඒ ප්‍රකට වෙන්නෙම. අර ආකාස නිමිත්ත ප්‍රකට වෙන්නෙම

ශූන්‍යතාවයයි. කිසිවක් දැනෙන්නැති ස්වභාවයක පාවෙනවා කොයි තරම් ද කාලයක් වටහාගන්න බැහැ. අවසානයේ විශාල කරදර වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඉතිං ඒවා ගැන අපි කථා කරන්න අපේ අත්දැකීම් පුද්ගලික අත්දැකීම් විදිහට තියෙන්නේ. ඉතිං අපි ඒවා එහෙම්ම තියමු. අපි බලමු කොහොමද මේ ධර්මය දන්න කෙනා මෙතනින් එහාට නිවන් මග එය කියලා. මේක ඉතාම වැදගත් තැනක්. දැන් මෙතන නාම රූප පරිච්ඡේදයක් තියෙනවා. දැන් අපි මේ තැනදීත් පැහැදිලි කළා රූපයේ අන්තයේ නාමයෙන් අන්තයේ දකින්න කියලා සමථ භාවනාව තුළ. ඔව් ඒක ඉතාම වැදගත්. හැබැයි එතනම ඒ කාරනාවට ම සීමා වෙන් නෑ. දැන් අපි ඔතන කතා කරනවා නේ **''අනිච්චානු පස්සී අස්සසිස්සාමීති සික්ඛතී අනිච්චානුපස්සි පස්ස සිස්සාමිතී සික්ඛති''** කියලා එතෙනට මෙතන අනිත්‍ය දැකීම කුමක්ද රූපය හඳුනගන්න ඕනේ නාමය හඳුනගන්න ඕනේ. මෙතන ධර්මාවබෝධය ඉතාැම වැදගත් වෙනවා. ඒක නිසා මේ දැන් පැහැදිලි කරපු ඒ ටික එහෙම්ම කියලා මේ රූපය දකින්න ඕනේ. රූපය දකින්න ඕනේ කිව්වාම ඔබට එනවා දැන් මේ ගැන. හොඳ අවබෝධයක් ඔබට ඕනෙ. ඔබ නාමයත් රූපයත් හොඳින් දැකලා මිදුනොත් තමයි ඔය අනිත්‍ය දකිනවා කියන්නේ. රූපයේ අනිත්‍ය දකින්න ඕනේ. රූපයේ අනිත්‍ය, දුක්‍ය, අනාත්ම දකින් ඕනේ. එතකොට නාමයෙත් දකින්න ඕනෙ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම. එතකොට රූපය කිව්වාම ඔබට දැන් ලෝකය ඇත්ත වෙලා තියෙන්නෙ ධර්මය දන්නැති කෙනෙක් නම් එතකොට ඔබට මේ ලෝකය ප්‍රකට වෙලා තියෙන්නෙ. එතකොට ඔබ ලෝකයෙන්මිදීමක් සිද්ධවෙලා තියෙන්නෙ නැතුව නිවනක් හම්බවෙන්නෙ නැහැ. **''විනෙය්‍යය ලෝකේ අභිධ්‍යා දෝමනස්සානං කායේ කායානු පස්සි විහරති''** කියලා සතර සතිපට්ඨාන සූත්‍රයේ තියෙන්නේ එහෙනම් සතර සතිපට්ඨානයේ අපිට වේදනානුපස්සනාව තියෙන්නෙත් එහෙමයි. චිත්තානු පස්සනාව තියෙන්නෙත් එහෙමයි. ධම්මානු පස්සනාව තියෙන්නෙත් එහෙමයි.

එතකොට අපිට මේ කය රූපය ප්‍රකට වෙලා තියෙන තාක් අපට දකින් මිදීමක් සිද්ධ වෙන්නෙ නැහැ. අපි මේ රූපාවචර ධ්‍යානවල ලෞකික ධ්‍යානවල හදිස්සියේවත් මිය ගියොත් සාමාන්‍යයෙන් අපි සම්මුතිය තුළ කථා කරමු. හදිස්සියේවත් මිය ගියොත් අපට උපදින්න තියෙන්නෙ රූපාවචර බ්‍රහ්ම ලෝකේ. ඔබ දන්නවා **''බ්‍රහ්මපාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මය''** ඒවායේ දී තමයි සකස් වෙන්නේ. එතකොට ඒවායේ රූපයේ ඒ කියන්නේ ඒවායේ ප්‍රකට වෙන්නේ සංඥාවක්. ඒ රූප සංඥාව ප්‍රකට වීම තුළ සංඥාවක් තමයි මෙතන තියෙන්නේ. සංඥාව තමයි සුඛුම වීගෙන මේ ගමන යන්නෙ මොකද. සති නිමිත්ත අපි කියනවානෙ දැන් ආනාපාන සමාධිය දැන් ධ්‍යාන නිමිත්ත ධ්‍යාන චිත්තය කියලා. ඔය විදිහට හඳුන්වන වානේ සමාධි දැන් ධ්‍යාන අංගය තියෙනවානේ. මේ ධ්‍යාන අංග සම්පූර්ණ වෙලානේ. මෙතෙන්ට එන්නෙ එතකොට. මෙන්න මෙතන තියෙන මේ සංඥාව සුඛුම වීගෙන යනවා. ඒ සංඥාව සුඛුම වීම තුළ ඒ සුඛුම සච්ච සංඥාවක් තියෙනවා. දැන් අපි කියනවානේ **විවේකජ ප්‍රීති සුඛ සුඛුම සච්ච** සංඥාව. ඊට පස්සේ **සමාධිජ ප්‍රීති සුඛ සුඛුම සංඥාව සච්ච** සංඥාව බවට පත්වෙනවා. ඔහොම තමයි අපි වචනයෙන් කියනවා නම් කියන්න වෙන්නේ. එතකොට සමාධි ප්‍රීති සුඛුම සච්ච සංඥාව තමයි දැන් මෙතන ඇත්තට ම භාහිරයට නොයනකම සච්ච සංඥාව එතකොට මෙතන තියෙන්නේ පාවීමක් මෙතන සුඛුම ස්වභාවයක්. ඒක නිසා තමයි ඔය අරූපාවචර බ්‍රහ්මලෝකවල බ්‍රහ්මලෝක පෙන්වන්නේ. එතකොට ඒවා රූපාවචර බ්‍රහ්මලෝක. සමාවෙන්න බ්‍රහ්ම පුරෝහිතය මහා බ්‍රහ්මය ඒ කතා කරන්නේ බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මය. එතකොට ඒ ප්‍රථම ධ්‍යානයේ කෙනෙක් මිය ගියෝතින් තමයි ඒ පෙන්නන්නේ. ඒ වගේම තමයි ද්විතිය ධ්‍යානයේ කෙනෙක් මිය ගියෝතින් පෙන්වන්නේ එතකොට පරිත්තාභය, අප්‍රමානාභය, ආභාස්සර කියන මේ ද්විතික ධ්‍යානය. කෙනෙක්

මිය ගියොත් ඒ ධ්‍යාන තුළ ඒ සුකුම අවස්ථාව තුළ රූපාවචර බ්‍රහ්මලෝකය විදිහට පෙන්නන්නේ. එතකොට තෘතික ධ්‍යාන තුළ අර සුඛුම ප්‍රීති අවස්ථාව නැතුව සුඛුම අවස්ථාවට ගියොත් එතනදී පරිත්තාභය, අප්‍රමානාභය, සුභකින්නකය තෘතිය ධ්‍යානයෙන් මිය ගියොත් තමයි ඒ අවස්ථාව රූපාවචර ධ්‍යානවල මිය ගියොත් රූපාවචර බ්‍රහ්ම ලෝක කියලා පෙන්නන්නේ. එතකොට වේහප්පලය අසඤ්ඤසංඥී කියන්නේ 4 වෙනි ධ්‍යානය. අසංඥ්ඤසංඥී කියන්නේ අසංඥ්ඤතලය සංඥාව දැනෙන් නැති තැන. එතකොට සමාධි ප්‍රිති සුඛ සුඛුම සංඥාව තමයි ඔතන තියෙන්නේ. දැන් මේ පැහැදිලි කිරීම ඉතාම ගැඹුරුයි නේද? මේ පැහැදිලි කිරීම පෙළ දහම අනුවයි නේද? දැන් මේක අපි බලමු ධර්මය පැත්තෙන් අපි ධර්මය පැත්ත බැලුවොත් එතනින් එහාට නිවන් මග කොහොමද තියෙන්නෙ. ඒ හින්දා අපි කලින් කථා කළේ ලෞකික කියන්නේ ලෝකෝත්තර පැත්ත නෙමෙයි. ඒ කියන්නේ සංඛතයි. හේතු තියෙන කොට සකස් වෙනවා. හේතු නැති වෙන කොට නැති වෙනවා. පවතින දේවල් නෙවෙයි පිරිහෙනවා. ලෞකික සමාධි සේරම පිරිහෙනවා. ඔය ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන පිරිහෙන ඒවා. ඒවා තියෙන ඒවා නෙමෙයි. හේතු තිබුනොත් සකස් වෙනවා. හේතු නැතිවුනොත් නැති වෙනවා. ඉතිං ඒ එතන තියෙන්නෙ දුකම තමයි. දුකින් මිදීමක් නැහැ. මොකද සසර දුකින් මිදීමකුත් නැහැ. ඇයි නැවත උප්පත්තියක් තියෙනවා නම් එතන දුකක් තියෙනවා. සසර දුකින් මිදිලත් නැහැ. ඉතිං මේවායේ පාවෙන එකේ කිසිම තේරුමක් නැහැ. ඒ ස්වභාව තුළ සිරවීම තුළ අපට දුකෙන් මිදෙන්න නම් අවශ්‍ය වෙන්නේ. අපට මේ දුක ගැටගැහිලා තියෙන්නේ.

එහෙම ලෝකයෙන් මිදුනොත් තමයි පුද්ගලයා මිදෙන්නේ. ලෝකයේ තියෙනකන් පුද්ගලයා ඉන්නවා. ලෝකය තියෙනවා. තියෙන්නේ සංඥාව තියෙනකම් දුකෙන් මිදෙන්නැහැ. කවුරුත්

දැන් එහෙම නම් මෙන්න මෙහෙමය මෙතනින් තමයි විදර්ශනා නුවණ පැත්තට එන්න ඕනෙ. හැබැයි විදර්ශනා නුවණ පැත්තට එනකොට සමථයානික රහතුන් වහන්සේලාගේ ගමන් මග තුළ මේ ධර්මය තුළ පෙන්වන කාරණා බොහොමයක් තියෙනවා. මෙතන ධාතු මනසිකාරය පැත්තට පෙන්වනවා. එතකොට රූපය දකින පැත්තට පෙන්වනවා. මහා භූත දකින්න පෙන්වනවා. එතකොට **''චත්තාරෝච මහා භූතානං චතුච්චංච මහා භූතානං උපාදාය රූපං රූපං වදේති''** කියලා ධර්මය තුළ රූපය හඳුන්වනවා. එතකොට අපි මේ රූපය මනා කොට දකිනවානම් නාමය මනා කොට දකිනවා නම් නාම රූප පරිච්ඡේදයකට ගියෝතින් අපේ නාමයත් රූපයත් වෙනස්කර ගත්තොත් අපි ඒවා මනා කොට දැක්කොතින් යථාභූත ඥානයෙන් දැක්කොතින් ඒ සත්‍ය අපි දකිනවා. අන්න ඒ සත්‍ය අපි දැක්කොතින් අපිට මේ මායාව මොකක්ද, රැවටීම මොකක්ද, රූපය මායාවක්, රූපය පෙන පිඬක් ඡේන පින්ඩූ පමං රූපං එහෙනම් එය සත්‍යයක් නෙවෙයි. පෙන පිඬක් කියන්නෙ ඇති වෙලා නැති වෙන එකක්. එහෙනම් ඒක අනිත්‍යයයි. **''රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භංතේ''** එහෙනම් ඒ සත්‍ය දකිනකන් අපි නිවන් දකින්න බැහැ. අපි එහෙනම් ඒ ධර්මය දකින්න දැනගන්න ඕනේ. අන්න එතකොට තමයි අපිට මේ ධර්මය අවශ්‍ය වෙන්නෙ දැනගන්න. එතකොට අපි ධර්මය දැනගන්න නිවැරදි දිසානතිය අපි අඳුනගන්නවා. එතකොට ධර්මය තුළ ඔබ දන්නවා. **''ඉති රූපං ඉති රූපංච සමුදයෝ ඉති රූපං අත්ථගචංච''** රූපයේ ඇති වීම දකින්න රූපයේ නැතිවීම දකින්න. එතකොට නිවන්මග සාක්ෂාත් වෙන්නෙ මෙන්න මේ හඳුනාගැනීමෙන්. තව වැදගත් වෙනවා මෙතන මේ හතර මහා භූත ගැන ඔබට අවබෝධයක් තියෙන්න ඕනෙ. **පඨවි, ආපෝ, තේජෝ, වායෝ**. එතකොට මේ හතර මහා භූත කිව්වාම ඔබ දන්නවානේ රූප කාණ්ඩයේ රූප 28ක් ඔබ දන්නවානේ එතකොට මේ රූප විසි අට ගැන ඔබට අවබෝධයක් තියෙනවා නම් එය ඔබට පහසුයි.

කොහොමත් මේ ධර්මය ඇත්තටම දන්න කෙනාට. ඉතිං ඔබ මේ ධර්මය දැනගන්න ඕනෙමයි. ඉතිං මේ ධර්මය හොඳින් ලිහා දැනගත යුතු වෙනවා.

ඉතිං මේ රූපය මනා කොට රූපය පරජානාති කියන්නේ රූපය මනා කොට දකින්න ඕනෙමයි. ඉතිං රූපය හොඳ අධ්‍යයනයක් තියෙනවා නම් ඔබ මනා කොට ඉස්සෙල්ලාම ඔබ දැනුමට දැනගන්න ඕනෙ. අපි දැන් බලමු එකින් එක ලිහා ගමු. හතර මහා භූත ගැන ඔබට වැටහීමක් තියෙනවා. **පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ඝන, ද්‍රව, වායු** කියලා. නමුත් මේ ධර්මය තුළ එන කෙනා පඨවි කියන්නෙ ඔබ දන්නවා. තද ගතිය රළු ගතිය. එතකොට ආපෝ කියන්නේ ගලන ගතිය. එතකොට තේජෝ කියන්නෙ උෂ්ණගතිය. **පස්, වතුර, ගිණි, සුළං** සරලව කියනවනෙ එතකොට **පඨවි තද ගතිය, ආපෝ ගලන ගතිය, තේජෝ උණුසුම, වායෝ කියන්නෙ සැලෙන පිම්බෙන ගතිය.** එතකොට මෙන්න මේ අවබෝධය ඇතුව ඔබ එන්න ඕනෙ. මේ හතර මහා භූත **චත්තාරෝච මහා භූතෝ** ඒ කියන්නේ මහා භූත හතර ගැන අවබෝධයක් තියෙන්න ඕනෙ. මහා භූත රූප ගැන. එතකොට කොහොමත් නිවන් මග අනුපිළිවෙලින් යන මගක් තියෙන්නෙ **අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ පටිපදා** එතකොට අනුපුබ්බ කිරියා කියන්නේ පූර්වභාග ප්‍රතිපදාව. කියන්නේ පරතෝඝෝසය ධර්මය අසා දැනගත්ත එහෙම නැත්නම් ශ්‍රැතවත් ආර්‍යය ශ්‍රාවකයා කියන්නෙත් ඒකයි. කල්‍යාණ මිත්‍රයෙක්ගෙන් අසා දැනගත් එක ධර්මය කියන්නෙ මොකද ධර්මය දන්නැති කෙනාට නිවන් මගක් නැහැ. ඒකයි බුද්ධ දර්ශනය අවබෝධ කරගන්න එකේ වැදගත් කම. දර්ශන අවබෝධය ධර්මයේ ඉතාම වැදගත් තැනක්. ඒකයි ප්‍රතිපදාව කොටස් 2කට බෙදන්නෙ පූර්වභාව ප්‍රතිපදාව, අපරභාග ප්‍රතිපදාව කියලා. පූර්වභාග ප්‍රතිපදාව කියන්නෙ කල්‍යාණ මිත්‍රයෙක්ගෙන් ධර්මය අසා දැනගැනීම. එහෙම නැත්නම් තමා ධර්මය ශ්‍රවනය කිරීම.

ධර්ම සාකච්ඡාවට සවන්දීම. එතකොට දැන් පරතෝඝෝසය ශ්‍රැතවත් ආර්‍යභාවය ඒ බුද්ධ දර්ශනය අවබෝධ කරගැනීම. ඒක ඉතාමත් වැදගත් ඒ කෙනාම තමයි දන්න කෙනාටයි දැනගත් කෙනාටයි කරන්න දෙයක් බුදුන්වහන්සේ පනවන්නේ. එතකොට කරන්න කියන්නෙ ඔබ දැනගන්නවා ධර්මය තුල දැනගන්න කෙනා විදිහට ධර්මය අසා දැනගත් විදිහට කළ්‍යාණ මිත්‍රයාගෙන් අසා දැනගත්ත විදිහට මේ රූපය සත්‍යයක් නොවේ. එතකොට ලෝකය සත්‍යයක් නොවෙයි කියන එක. ඒක තමයි මේකෙ වැදගත් ම තැන. එතකොට ඒක සත්‍යයක් නෙමෙයි කියලා ඔබ දැනගන්නවා. මේ පේන ලෝකේ සත්‍යයක් නොවේ. එතකොට ඔබ දැනගන්නවා මේ පෙනෙන දේ හිතෙන දේ සත්‍යයක් නොවන බව. එතකොට දැන් මේක ඔබ දැනගත්තම ඔබට ප්‍රත්‍යක්ෂ නැහැ දැන් කෙනෙක් කියන්න පුළුවන් ලෝකය බොරුවක් කියන්නෙ කොහොමද ලෝකය මායාවක් කියන්නේ කොහොමද මේ අපිට පේනවා ඇහෙනවා මේ ඇල්ලුවාම තද ගතියක් දැනෙනවා මේ උණුසුම, සීතල ඔක්කොම අපට දැනෙනවා. නෑ කියන්න බෑ. එතකොට අන්න ඒක තමා මෙතන අපි විසඳගන්න ඕනේ. ඒ කියන්නෙ ලෝකයේ අපි දැනගන්නවා ධර්මය තුළ ලෝකය කියන්නෙ මායාවක් කියල. රූපය කියන්නෙ මායාවක් කියලා සත්‍යක් නොවන බව. නමුත් අපි ඒක අවබෝධ කරගන්න ඕනෙ. එහෙනම් අපි ඒක දකින්න ඕනෙ. අන්න එතන දී තමයි අපිට දකින ආකාරයේ කරන්න දෙයක් පනවන්නේ. ඉතිං ඒ විදිහට තමයි අපිට ඒ ගැන කථාකරන්න වෙන්නෙ. එතනදී රූප 28 ගැන ඔබ අහලා ඇත. ඉතිං එතනදී මහා භූත හතර ගැන අපි කථා කළා. **පඨවි, ආපෝ, තේජෝ, වායෝ.** ඉතිං ඒ වගේ ම ඔබට ප්‍රසාද රූප ඇහැක් නැත්නම් පේන්නෑ. කනක් නැත්නම් ඇහෙන්නෑ. දැන් අපි කියනවානෙ දැන් මෙතන ඇහැ කියන්නෙ මස් ඇහැ නෙමෙයි. දැන් මෙතන ගොඩක් සංකීර්ණයි කථාව. නමුත් අපි සරල කරලා ගමු. එතකොට ප්‍රසාද රූප කියන්නෙ ප්‍රසාදවත්

වෙනවනෙ. එතකොට චක්ඛු ප්‍රසාද රූප ප්‍රසාද රූප පහයි. චක්ඛු ප්‍රසාද රූප සෝත ප්‍රසාද රූප , ඝාත ප්‍රසාද රූප, ජිව්හා ප්‍රසාද රූපකාය ප්‍රසාද රූප ප්‍රසාදය වෙලානෙ පෙන්නෙ. ප්‍රසාදයෙන් ඇහෙන්නෙ ප්‍රසාද වෙලා එන එක ප්‍රතිබිම්බය. ඒ කියන්නෙ ආලෝකයත් ගසත් නිසා වැටෙන සෙවනැල්ල කියලා අපි කිව්වා. නාභිය කියන දේ නෙමෙයි. දැන් කන්නාඩියට වැටෙන ප්‍රතිබිම්භය එතකොට ඇහැ කියන එකත් නාභිය. එතකොට ඒ කට වැටෙන ප්‍රතිබිම්භයක් වගේ එකක් තමයි. අපිට මේ ඇහැ කියලා කියන්නෙ. ඇහැ කියන්නෙ පේන බවට එතකොට කන කියන්නෙත් එහෙමයි. ඒක ප්‍රසාදය සෝත ප්‍රසාදය, ඝාත ප්‍රසාදය එතකොට ජිව්හා ප්‍රසාදය. ඒ වගේ ම සුවඳ දැනෙන ප්‍රසාදය ඝාහ ප්‍රසාදය, රස දැනෙන ප්‍රසාදය ජිව්හා ප්‍රසාදය. ඒ වගේම පහස උණුසුම, සීතල දැනෙන්නෙ එතකොට කාය ප්‍රසාදය එතකොට මේ ප්‍රසාද රූප පහයි. එතකොට මහා භූත රූප හතරයි. නමයයි. එතකොට දැන් මේ ප්‍රසාද වෙන්නෙ ප්‍රතිබිම්බයක් වැටෙන්නෙ දැන් අපි කථා කරන්නේ භාහිර අන්තයෙ අභ්‍යන්තර අන්තයේ භාහිරයේ එතකොට තියෙන්නෙ රූපයක්, ශබ්දයක්, ගන්ධයක්, රසයක්, පහසක් උණුසුම, සීතල. දැන් ඒ විදිහට ලිහාගන්න ඕනේ. එතකොට ඒක බාහිර රූප හතරයි. රූප මෙතන තියෙන්නෙ ප්‍රසාදය. ඒ කියන්නෙ ප්‍රතිබිම්බය එතකොට ඒ විදිහට ඔබ ප්‍රායෝගිකව අපි කථා කරමු. නමුත් දැන් ඔබට පෙළ දහම අනුව දකින්න ලැබෙනවා ප්‍රසාද රූප පහයි. එතකොට ගෝචර රූප කියන්නෙ බාහිර රූප ගන්ධ රස පහස කියන එක. එතකොට ගෝචර රූප පහයි. එතකොට ගෝචර රූප පහෙන් හතර මහා භූත තමයි පහස කියන්නෙ. උණුසුම සීතල ඒ නිසා ඒක ගන්නෙ නැතුව හතරයි කියලයි ගන්නෙ. එතකොට ප්‍රසාද රූප 5 යි. මහා භූත රූප 4 යි. ගෝචර රූප 4 යි. රූප, ගන්ධ රස එතකොට එතන හතරක් එක්ක තමයි මහා භූත හතරයි. ඳ ප්‍රසාද රුප 5 යි. නවයයි. එතකොට ගෝචර රූප හතරයි ඔක්කොම 13 යි. එතකොට මේ දැන් අපේ කය දැන් රූපය

කියල ගත්තොත් කය කයේ තියෙනවා. භාව රූප දෙකක් තියෙනවා. එතකොට පුරුෂ භාව රූපයයි. ස්ත්‍රී භාව රූපයි. එතකොට භාව රූප දෙකයි. එතකොට හෘදය වස්තු රූපයයි. ජීවිත ඉන්ද්‍රිය රූපයයි. ආහාර රූපයයි. ආහාර රූපය ජීවිත රූපයයි. හෘදයවස්තු රූපයයි 3 යි. එතකොට ස්ත්‍රී භාව පුරුෂ භාව රූප දෙකයි. පහයි එතකොට අර දහ තුනම මේ පහ එකතු වුනාම එතකොට එන්නෙ දහ අටයි. එතකොට මේ දහ අට අපට අතට දැනෙන රූප මේ ඔක්කොම අපට දැනෙනවා. ආහාර රූපය දැනෙනවා. එතකොට ජීවිතය පවතිනවා කියලා එතකොට ජීවිතයක් තියෙනවා කියලා නැත්නම් මේ කෙනෙක් ඉන්නවා කියලා හැඟීමක් ඒක ජීවිත රූපය. එතකොට හෘදය වස්තු රූපය අපි කථා කරන්නෙ ගොඩක් වෙලාවට අපට මේ දැනෙන්නේ හෘදවස්තු රූපයෙන් කියලා ධර්මයේ තමයි  මේ පැහැදිලි කිරීම කරගෙන යන්නෙ පෙළ දහම අනුවයි. පෙල දහම තමයි ඒ විදිහටම පෙන්නගෙන යනවා මොකද පෙල දහම එහෙම තියෙන නිසා. නමුත් අපි අවසානයේදී ඔබට ගලපලා පෙන්නන්නම් මේ සියල්ලම අවසානයේදී ගලපන්න පුලුවන් ප්‍රායෝගිකව එතකොට පෙල දහමේ තියෙන විදිහ අපි පෙල දහමේ විදිහටම දකිමු. ඒකෙ ඇත්ත පැත්ත දකිමු. අපි අවසානයේ දී නැත්නම් මේවා පැටලෙනවානෙ නැත්නම් කවුරු හරි කියනවානේ මේ පෙල දහමේ තියන එක නෙවෙයි මෙයා කියන්නේ ඔබට අහන්න ලැබුනා දිගින් දිගට අපි පැහැදිලි කරා බොහොම සරලව මේ ධර්මය නමුත් අපි සරලව පැහැදිලි කරාම ගොඩක් අය ඉන්නෙ පොත් වලට කොටු වෙලා ඒක දරාගන්න බැහැ ගොඩක් අය ඒක අපෙන් ප්‍රශ්න කරනවා ඔබ පැහැදිලි කරන්නෙ භාහිර ඇත්තක් නෙමේ රූපය ඇත්තක් නෙමේ නම් නමුත් රූපය බුදුන් වහන්සේ පැහැදිලි කලේ රූප 28 කින් කියලා අපිට කියනවා අපි මේවා දන්නැතුව නොවේ. අපි හොඳට මේවා දීර්ඝ කාලයක් තිස්සේ හොඳට සෛද්ධාන්තිකවත් ඒ වගේම ප්‍රායෝගිකවත් හොඳට බෙදලා වෙන් කරලා බලලා තියෙනවා. අපි දන්නවා මේකේ අවසාන

උත්තරය මොකක්ද කියලා අපි ගාන හදලා ඉවරයි ගාන හදලා ඉවර වෙච්ච එක්කෙනා ගානේ උත්තරය දන්නවා. දැන් ඔබ අපෙන් අහනවා ගාන හදපු හැටි කියන්න කියලා. එතකොට අපට කියන්න සිද්ධවෙනවා උත්තරය කියලා හරියන්නෑ. දැන් ඔබ අපෙන් අහනවා අපි කියනවා දැන් 5, 4, 6 එකතු කලාම කීයද? කියලා ඇහුවාම අපි කියනවා 15 කියලා 5, 4, 6 එකතු වුනාම 15 යි කියලා. කවුරු හරි පොඩි ලමයෙක් හරි අපෙන් අහනවා ඕක කරපු හැටි කරලා පෙන්නන්න කියලා. අන්න එතකොට අපට සිද්ධ වෙනවා පෙල දහම පෙන්නන්න. මොකද ඔබ හැමදේම ඉගෙන ගන්නේ පෙල දහමෙන් ඔබ්බට වෙන දෙයක් නැහැනේ ඔබට තියෙනවා ත්‍රිපිටක තියෙනවා ඉතිං ඒ අනුසාරයෙන් තමයි ගන්න වෙන්නෙ ඉතිං ඒ අනුසාරයෙන් ඔබ දන්න විදිහ තමයි පෙන්නන්නේ එහෙනම් ඔබට අභි ධර්ම පිටකයක් තියෙනවා ඒකෙ රූප කාණ්ඩ ටික තියෙනවා මෙතන පුද්ගලයෙක් නැත්තෙ කොහොමද? මෙතන පුද්ගලයෙක් ඉන්නවා කියලා කෙනෙක් කියනවා නෑ එහෙම කියන්නේ කොහොමද පුද්ගලයෙක් ඉන්නවා කියලා එතකොට අපට සිද්ධවෙනවා දැන් නැති බව පෙන්නන්න. එතනදි අපට පෙන්නන්න සිද්ධ වෙනවා සම්පූර්ණ පර්යාය කොහොමද පුද්ගලයා හැදුනේ අන්න ඒක පෙන්නන්න වෙනවා. එතකොට ආත්මයක් කියලා එකක් කොහොමද තියෙන්නෙ අපට පෙන්නන්න වෙනවා ආත්මයක් මේ හැදුනේ කොහොමද අන්න ඒක නැති වුනේ කොහොමද අන්න ඒක බුදුන් වහන්සේටත් කරන්න සිද්ධ වුනා. ඒක නිසා තමයි බුදුන් වහන්සේ මේ විදිහට වෙන් කරලා පෙන්නුවේ. විබජ්ජය ඕන වුනේ ඒකයි. විබජනය ඕන වුනේ ඒකයි. පට්ඨාන කරනය ඕන වුනේ ඒකයි. ඒකයි රූප කාණ්ඩය ඕන වුනේ මේ හැම දෙයක් ම වැදගත් මේ එකක්වත් වැදගත් නෑ නෙමෙයි වැදගත් ඒවත් අපි දැනගන්න ඕනෙ ඒවා දැනගත්තාම අපට පුළුවනි හරිදේ හොඳට අවසානයේ ගලපගන්න. ආ මේක මෙහෙමයි. මෙහෙමයි වෙලා තියෙන්නෙ. අන්න උත්තරය. ඊට පස්සේ

දන්නවා උත්තරය ආපු හැටිත් දන්නවා. එයා එතකොට රැවටෙන්නේ නෑ. ආයි එයාට ප්‍රත්‍යක්ෂයි. අන්න එතනට එන්න ඕනේ. හැබැයි ඒක දැනුමෙන් එන්න පුළුවන් ගමනකුත් නෙමෙයි. තමන්ට ම ප්‍රත්‍යක්ෂ පැත්තෙන් එන්න ඕනෙ. ප්‍රායෝගිකව එන්න ඕන ධර්මයක් තමන්ගේ ජීවිතයට මේ කථා කරන්නේ විෂයක් නෙමෙයි. විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි වගේ විෂයක් නෙමෙයි. මේ කථා කරන්නේ අපේ ජීවිතය ගැන. අන්න එතන දකින්න ඕනේ ධර්මයට ධර්මයයි. ඔබයි කියන්නේ දෙන්නෙක් වෙන්න බැහැ. ධර්මයමයි ඔබ වෙන්න ඕනේ. එතකොට ඔබේ ජීවිතය දකින්න ඕනෙ. එතකොට ඔබ ඔබව දකින්න ඕනේ මේ ධර්මයෙන් අන්න එහෙම උනොත් ඔබට ප්‍රායෝගික වෙන්න පුළුවන්. එහෙම වුනොත් ඔබ නිවන් දකිනවාමයි. එහෙම උනොත් ඔබ සසර දුකෙන් මිදෙනවා. මේ දුක තියෙන්නේ රැවටීමක් තුළයි. අවිද්‍යාව නිසයි අපි දුක් විඳින්නෙ. එහෙනම් ඒ රැවටීමට හේතුව අපි දැනගන්න ඕනෙ. එහෙනම් ඒක අපි නිවැරදිව කථා කරන්න ඕනෙ. ඉතිං ඒ නිසා තමයි අපි රූප කාණ්ඩවීක පෙන්නන් අපි කිසිම වෙලාවක උත්සාහ කළේ නැහැ. ප්‍රායෝගික පැත්ත විතරයි අපි කථා කළේ. ඉතිං අපි මුලින් දේශනාවේදී ඉදිරිපත් කළා ඔබට අහන්න ලැබෙයි. නමුත් දැන් අපට නැවත වරක් ඔබගේ ඉල්ලීමක් විදිහට අපි ඉදිරිපත් කරන්න හිතුවා. ඉතිං මේ ඔබට ගැටළු තියෙන බව දන්නවා. මේක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. අපි දන්නවා මේ ගාම්භිර අර්ථා වේ. ධර්මය ගාම්භීර ධර්මයක්. මේකෙ තියෙන්නෙ සත්‍යයක් . මේකේ මායාවක් බොරුවක් නැහැ. මේකෙ තියෙන්නෙ සත්‍යයක්. ඉතිං සත්‍ය වැහිලා තියෙනවා මායාවෙන් බොරුවෙන්. අපිට පේන දේ ඇත්ත වෙලා. ඇත්ත මායාවක් කියලා. අපි හිතන් ඉන්න ඇත්ත මායාවක් කියලා අපට දැනගන්න ලේසි නැහැ. මොකද අපි මේකට හොඳට ම රැවටිලා ඉන්නෙ හොඳටම රැවටුනු කෙනෙක් රැවටීමෙන් මිදෙන්න හරියටම ඒක දැනගත්ත දවසට තමයි. ඉතිං එහෙම නම් අපි හැම පැත්තෙන්ම උත්සාහ කළ

යුතුයි. ඉතිං කෙනා කෙනා විවිධාකාර සංඥා ගොඩක ඉන්නෙ. ඉතිං **නානත්ත කායා නානත්ත සංඥා** ඉතිං අපි හැමෝම ඒක විදිහ අය නෙමෙයි. අපි තම තමන් තම තමන්ගේ ස්භාවය අඳුන ගන්න ඕනේ. තම තමන් තම තමන්ගේ ස්වභාවයට උත්තර හොයන්න ඕනේ. ඒ ස්වභාවය අනුවයි ඔබට අවබෝධ වෙන්නෙ තව කෙනෙක්ට තව කෙනෙක්ව නිවන් දක්වන්න බැහැ. කවුරු හරි තමන්ව නිවන් දක්වයි කියලා බලන් ඉන්නවා නම් ඒක මෝඩකමක්. අඥාණකමක්. කවදාවත් වෙන්නැහැ බුදු කෙනෙක්ට වත් බැහැ කවුරුවත් නිවන් දක්වන්න. ආනන්දය මම ජේතවනාරාමයට යන පාරක් කියයි ද එන ආකාරයත් කියයි ද ඔවුන් වෙන වෙන මාවත්වල යයි නම් මම කුමක් කරන්නද? ආනන්දය, මේ තමයි බුදුන් වහන්සේ පැහැදිලි කරනවා අපිට මේ ධර්මය හැම තැනම ජේනවා. අපි මේ ධර්මය ලිහෙනවා. ඒක නිසා මේ රූපය අපට ඉතා වැදගත් මේ කියපු ටික මහා භූත හතරයි මහා භූත රූප ටික ඉතාම වැදගත්. ඇයි ඔබට ජේනවානේ ගස් තියෙනවා. ගල් තියෙනවා. ඔබ කියනවානේ මේ අහස තියෙනවා මේ වතුර තියෙනවා. ඉතිං මේවා තමයි මහා භූත කියන්නෙ. මහා භූත කියන්නෙ මහා අමුතු ඒවා නෙමෙයිනෙ. ඔබට දැන් ජේන සාධක ඔබට ජේනවානෙ මේ වාතය තියෙනවා. වායුගෝලයක් තියෙනවා හුලං තියෙනවා. ඉතිං එක රූපයක් වායුව ඔය රූප කියන්නෙ ඔබට දැනෙන ස්වභාවයට රූප කියන්නෙ තව රූපයක් කියන්නෙ උණුසුම සීතල දැන් පඨවි කියන්නෙ ඝන ස්වභාවය ගල් කැටයක් ඇල්ලුවොත් තදයි කියාලා තේරෙනවා. ඉතිං ඒක තමයි පඨවි ආපෝ කියන්නෙ. එතකොට වතුර වගේ ගලන ස්වභාවයක් තියෙනවා. ඉතිං ඒක තමයි ආපෝ ස්වභාවය. තේජෝ කියන්නෙ උණුසුම රශ්මිය සීතල එතකොට වායෝ කියන්නෙ මේ වායෝ මේ ඔබට ජේන දේම නෙමෙයිද දැන් ඔබගේ අතටගත්තත් තද ගතියක් තියෙනවා. හැබැයි අත කැපුනොත් වැගිරෙන ගතියක් තියෙනවා. ඒ වගේ ම මේ අතේ තියෙනවා නේද වායුවක් නැත්නම් ඔබ අත උස්සන්නේ

කොහොමද මැරිච්ච කෙනෙක්ගේ අත කොච්චර බරයි ද නමුත් ඔබේ අත ඔබ සැහැල්ලුවෙන් උස්සනවා ඕකේ හුලං පිරිලා තියෙන නිසා මෙන්න මේ වගේ අපි දකින්න ඕනේ ඇස් ඇත්තෝම දකිත්වා කිව්වා වාගේ. අපි ගාව තියෙන දේම අපි ඇත්ත බලන්න ඕනෙ ඉතිං ඒ නිසා තමයි අපි රූපය දකින්න ඕනෙ රූපය පරජානාති රූපයේ සත්‍ය දකින්න ඕනේ. ඉතිං මහා භූත හතර ඔබට පැහැදිලියි. ඒ වගේ ම අපේ ඇස, කණ, දිව, නාසය එතකොට අපට පේනවා බාහිර වර්ණ ආලෝකය තියෙන අපට ශබ්ද ඇහෙනවා. ඒ වගේ ම අපට රස දැනෙනවා. ඒ වගේම අපට ගන්ධය දැනෙනවා. ඒ වගේ ම අපට උණුසුම සීතල දැනෙනවා. දැන් මේවා තමයි ගෝචර රූප කියන්නෙ ගෝචර රූප කියන්නෙ අපට ගෝචර වෙන්නෙ ශබ්ද, වර්ණ, ගන්ධ, රස ගෝචර රූප හතරයි. එතකොට ඔබට ඒ වගේ ම ඔබට පේනවා ප්‍රතිබිම්භය. අපේ ඇහැ කියන්නෙ කණ්නාඩියක් නම් ඒකට වැටෙන්නෙ ප්‍රතිබිම්බයක්නෙ කන්නාඩිය ඇතුලේ නැහැනෙ. ආත්මීය දේවල් අන්න ඒ වගේ දකින්න ඕනේ. මේ ප්‍රසාද රූප කියන ඒවා. ඇස කියන්නෙ කණ්නාඩියක්. ඒකට ප්‍රසාදයක් වෙන්නෙ. කණ කියන්නෙ ඇත්තටම ප්‍රසාදයක් වෙන්නෙ. ශබ්දය ප්‍රසාදයක් වෙන්නෙ එළියෙ තියෙන දේ නෙමෙයි. මේක ප්‍රසාදයක් වෙන්නෙ එතකොට එළියේ තියෙන රූපය තමයි ශබ්දය කියන්නෙ. ශබ්ද රූපෙට මෙතන ශ්‍රෝත ප්‍රසාදයක් සිද්ධ වෙන්නෙ කියලා ඒක ප්‍රතිබිම්භයක් විදිහට දකින්න. ඒක බුදුන්වහන්සේ පෙන්වන දහම අවබෝධ කරගන්න පහසුවට පෙන්නනවා. මේක හරි විදියට පෙන්නවා නැත්නම් අපට දැනෙන්නෙ නැහැ. ඇහැ කියන්නෙ කණ්නාඩියක්. කණ කියන්නෙ මෙන්න මේ විදිහයට බෙරයක් වගේ කම්පනය වෙන එකක්. ඒක එළියේ තියෙන ශබ්දය නෙමෙයි. අන්න එහෙම දකින්න. එතකොට ගන්ධය එතකොට මෙතන අපට ප්‍රසාද රූප පහක් පේනවා. චක්ඛු ප්‍රසාදය වර්ණයට ශ්‍රෝත ප්‍රාසාදය ශබ්දයට ඝාන ප්‍රාසාදය මෙතන නාසය එතකොට මේ ජිව්හා ප්‍රාසාදය එතකොට

මෙතන දිවට එතකොට කාය ප්‍රාසාදය ප්‍රසාද රූප පහයි. මහා භූත රූප හතරයි තමයි එතකොට රූප, ශබ්ද, ගන්ධ, රස. එතකොට හතරයි. නමයයි හතරයි දහතුනයි. ඒ දහතුනම ඔබට පේනවා තව රූප ගැහැනු පිරිමි රූප අන්ත ඒ රූප තමයි භාව රූප කියන්නෙ. එතකොට රූප දෙකක් එතන පෙන්නනවා. එතකොට මේ හැම රූපයක් ම රූපයක් කියලා තමයි පෙන්නන්නේ. එතකොට මෙතන පන තියෙනවා. ජීවිත ඉන්ද්‍රිය රූපය එතකොට හෘද වස්තු රූපය භාව රූප දෙකයි. ස්ත්‍රී පුරුෂ ආහාරය මේ හැම එකක්ම ආහාර රූපයකින් තමයි එතකොට ආහාරය එකයි. ජීවිත ඉන්ද්‍රිය දෙකයි. හෘද වස්තු එකයි. තුනයි. භාව රූප දෙකයි. පහයි. එතකොට දහ අටයි පහයි විසිතුනයි. දැන් මීට අමතරව මේ ඔබගේ කය ගැන හිතන්න. මෙතන පුද්ගලයෙක් නැති බව පෙන්නයි. බුදුන් වහන්සේ මේ රූපයෙන් පෙන්නන්නෙ මෙතන කය තමයි උපමා කරලා තියෙන්නේ. ඉතිං එතනදී තමයි බුදුන්වහන්සේ දැන් මෙතන රූප දහ අටක් ඔබ දක්කා. ඒ රූප දහ අට දැක්කෙ අතන. මහා භූත හතරයි. ප්‍රසාද රූප පහයි. ගෝචර රූප හතරයි. දහතුනයි. භාව රූප දෙකයි. හෘද වස්තු රූපයයි. ජීවිත ඉන්ද්‍රිය රූපයයි. ආහාර රූපයයි. දහ අටයි. ඒ දහ අට ඔබට පේනවා. ඔබට මේවට කියන්නෙ ඇත්තට ම නිෂ්පන්න රූප ඒ කියන්නෙ මේවා ඔබට ප්‍රකට වෙන රූප අනිෂ්ප්‍රන්න රූප කියන්නෙ ඒක ප්‍රකට වෙන්නෙ නැහැ. ඒ රූපම අපි අනිෂ්පන්න රූප ලෙස ගත්තොත් එහෙම දැන් රූප දහයක් එතකොට ඔබට තව රූප විසි අටයිනේ තියෙන්නෙ. එතකොට ආකාස රූපය. එතකොට ඔබ කථා කරන ශබ්දය එතකොට මේ කාය විඤ්ඤප්ති රූපය වචී විඤ්ඤප්ති රූපය අදහස් ප්‍රකාශ කරන එක රූපයක් වගේ පේනවා. එතන තමයි වචී විඤ්ඤප්ති රූපය කියන්නෙ එතකොට මේ කාය විඤ්ඤප්ති රූපය කියන්නෙ අපට අංග චලනයෙන් එතකොට අපට පුළුවන් කාට හරි මොනවා හරි කියන්න. කයේ චලනවලින් ඒ තමයි කාය විඤ්ඤප්ති රූපය ඒ විඤ්ඤප්ති රූපය ඒ කියන්නෙ ධාතු කාය විඤ්ඤප්ති රූපය

වචී විඤ්ඤැප්ති රූපය ආකාස ධාතු රූපය එතකොට මෙතන තුනයි. එතකොට ඔබට ඔබගේ අත ඔබ සැහැල්ලුවෙන්නේ උස්සන්නෙ එතකොට මෘදු ස්වභාවයක් තියෙනවානේ. එතකොට ලහුතා කියෙන්නෙ සැහැල්ලුවක් අත පය උස්සන කොට දැනෙන මේ සැහැල්ලුවෙන්නේ කරන්නේ. එතකොට ලහුතා මෘදුතා කියන්නෙ දැන් මේක මෘදුස්භාවයක් තියෙන්නෙ. ඒ මෘදුතා එතකොට ඒවත් ඉතිං ඇත්තට ම බෙදලා පෙන්නන්න පුළුවන්. එතකොට ලහුතා මෘදුතා, කම්මඤ්ඤතා කියන්නේ කර්මන්‍ය කරන ගතිය දැන් මේ රූපවල ඔබ කටයුත්තක් කරන විට ඔබ ඇවිදිනවා. ඔබ වැඩ කරනවා. කර්මඤ්ඤ කරන ගතියක් තියෙනවා. කර්මඤ්ඤ රූපයක් කියන්නෙ එතකොට මෙතන තුනයි. ලහුතා, මෘදුතා කම්මඤ්ඤතා ඒ වගේ ම ආකාස, කාය විඤ්ඤැප්ති වචි විඤ්ඤැප්ති මේවා ජේන රූප නෙමෙයි. දැන් ඔබ ඔබට කටින් කථා කරන කොට තව කෙනෙක් දෙයක් දැනගන්නවානේ. ඒ වචන වල දෙයක් තියෙන බව කාටවත් ජේන්නැනේ. ඒවා අනිෂ්පන්න රූප කියන්නෙ ප්‍රකට වෙන්නැති රූප එතකොට අංග චලනයෙන් මොනවා හරි දෙයක් පෙන්නුවොත් රූපයක්නේ. ඒකයි කාය විඤ්ඤැප්ති වචී විඤ්ඤැප්ති එකයි. අත පය උස්සනකොට ලහුතා මෘදුතා ඒ රූප දැන් මේවත් රූප දැන් ශරීරය තමයි බුදුන්වහන්සේ මේ හඳුනගන්න තමයි මේ රූප පෙන්නන්නෙ රූප විසි අට ඔය විදිහට තමයි පෙන්නන්නේ. එතකොට ඒ අපි පෙන්නුවේ මේ පර්‍යාය විදිහට ඒ කියන්නෙ සෛද්ධන්තිකව ඔබට මේ දැන් රූපය කියලා රූපය **පරජානාති ඉති රූපං ඉති රූපං සමුදයෝ ඉති රූපං අත්තගමෝ** කියන තැනට අපි යන්න හදන්නේ රූපය හටගත්තේ කොහොමද රූපය නැතිවෙන්නෙ කොහොමද රූපය පරජානාති කියලා අපි දැන ගන්නවා එතකොට මේ හැම දෙයක් ම අපි රූපය විදිහටයි ගන්නෙ. එතකොට ශබ්ද රූප ශබ්දයත් රූපයක් එතකොට ශබ්ද රූපය කියන එක වෙන විදිහකින් පෙන්නන්න බෑ ශබ්ද රූප එතකොට ගන්ධ රූප රස

රූප අපි මේවා හඳුන ගන්න ඕනෙ. ඒ කියන්නෙ මේ නිවන්මග යන කෙනෙක් ලෝකයේ ඇත්ත දකින කෙනෙක් වෙනවා. එතකොට ලෝකයෙ ඇත්ත දකින කෙනෙක්ට මේවා තමයි භාෂා වෙන්නෙ. දැන් අපි කථා කරනවානේ සිංහලෙන් භාෂාව ඉංග්‍රීසි භාෂාව එතකොට නිවන් මග යන කෙනෙක්ට ධර්ම භාෂාවක් තියෙනවා මේ ධර්මය තමයි ඔහුගේ ජීවිතය. එතකොට ධර්මයයි ඔබයි දෙන්නෙක් නෙමෙයි කිව්වේ ඒකයි. මේ තමා ඔබගේ ඔබ හිතන්නේ මේවා ගැන වෙන්න ඕන නිතරම ඔබ ධම්මට්ඨිති ඥානය ඔබේ වැඩෙනවා. ඒ කියන්නෙ ඔබ ධර්මය දකිනවා. ධර්මය කියන්නෙ ලෝක ධර්මතාවය දකිනවා. හැම දේකම ලෝක ධර්මතාවයක් තියෙනවා. ඔබ කථා කලත් ඔබ හිනාවුනත් ඔබ ඇවිද්දත් ඔබ ගහක් දිහා දැක්කත් ඔබ වතුර දිහා දැක්කත් ඔබ මොනවාද දකින්නෙ ඔබ මොනවාද ඔබට තියෙන සංඥාව අරමුණ ඒකෙ සත්‍ය දකින්න ඕනෙ. ඒකයි විදසුන් නුවණ කියන්නෙ. ඒක විදගෙන යන සත්‍ය දකින්න ඕනේ. ඔබ ඒ කෙනා තමයි මේ දුකෙන් මිදෙන්නේ මේ දුක තියෙන්නෙ. අපි මායාවක කොටු වෙච්ච නිසයි. එහෙනම් මේ මායාව දකින්න නම් සත්‍ය දකින්නම ඕනෙ. එහෙනම් මේ හැම දෙයක් ම පොඩ්ඩ පොඩ්ඩ යන්නෙ කොහාටද? ඔබ නොදන්න දෙයක් පෙන්න ගෙනයි යන්නෙ. හැම තිස්සෙම ඒ ඔබ සත්‍ය දැනගන්න ඕනෙ නිසා දැන් මේ විදිහට ඔබ රූප කාන්ඩ විසි අට ගැන දකිනවා නම් ඔබගේ ම කය තුළින් මේ රූප ටික පේනවා නම් ඔබගේ කය තුළ කෙනෙක් නැති බවනේ ඔබ දකින්න ඕනේ. දැන් එතෙන්ටනේ මේ කායානුපස්සනාව වඩන්නෙ. එතකොට ඔබ දකිනවා කායානුපස්සනාව ආනාපානාසති විතරක් නෙමෙයි. ඔබ දකිනවා ධාතු මනසිකාරය එතකොට **කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ, මංසං, නාහාරු, අට්ඨී, අට්ඨී මිඡ්ජා, වක්කං, හදයං, යක්කං, කිලෝමකං, පිහතං, පප්පාසං, අන්ත ගුණං, උදරියං, කරීසං, මත්ථලුංගං** කියලා දැන් මේ කියන්නෙ කොටස් 32ට බෙදලා ශරීරයට බුදුන්වහන්සේ මේ විදිහට එක

එක බලන්න කියනවා. දැන් මේ දත් ටික ඔක්කොම බුදුහාමුදුරුවෝ මේ ශරීරය කෑලි කෑලි වලට ගලෝනවා හරියට නිකන් දැන් මේ භික්ෂුන් වහන්සේලා ඉස්සරහා මේ කමටහන් විදිහට දැන් මේ සේරම ශරීරය වෙන් කරලා පෙන්වනවා. අර බිම දිගේ වෙන් කලා කියන්නකො දැන් හිතින් මවා ගන්නකො එතකොට කෙස් ටික ලොම් ටික දත් ටික මේ විදිහට කේසා, ලෝමා, නඛා, දන්තෝ, තචෝ, මංසං, නාහාරු, අට්ඨී මිඡ්ජා, වක්කං, හෘදයං යකනං, කිලෝමකං, පිහතං දැන් මේ මේ විදිහට යන්නෙ මේ ඔක්කොම අපේ ඇගේ තියෙන ශරීරය තමයි වෙන් කර කර යන්නෙ. දැන් මේකෙන් මොකක්ද බලාපොරොත්තු වෙන්නෙ දැන් ආත්මයක් කොහෙද තියෙන්නෙ දැන් මේවා ගැලෙව්වාට පස්සෙ පුද්ගලයෙක් කොහෙද ඉන්නෙ දැන් කෙස්වල ඉන්නවාද මනුස්සයෙක් දත්වල ඉන්නවාද මනුස්සයෙක් මේ ආත්මයක් කොහෙද තියෙන්නෙ දැන් මේ කෙස්වල ආත්මයක් තියෙනවාද දැන් මේ ගලෝලා බුදු හාමුදුරුවොත් මේක දැක්කේ ඇත්තට ම මේක බලන්නකො. තථාගතයන් වහන්සේ මේ පෙන්වන එක ඇත්තට ම ඔබට පේනවා. මේ විදිහට සේරම ලිහලා බැලුවොත් ඇත්තට ම මෙතන ආත්මයක් නෑ. ඒ විතරක් නෙමෙයි බුදුන් වහන්සේ පෙන්නනවා මේ පඨවි මේ ශරීරයේ තියෙනවා. වතුර වගේ ඒවා ශරීරයේ තියෙනවා වායුව ශරීරයේ තියෙනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ ශරීරයේ තියෙන ඒවා බුදුන් වහන්සේ වෙන්කරලම පෙන්වනවා. බුදුන් වහන්සේ කියනවා මේ විදිහට කෑලි බෙදලා පෙන්නන කොට බුදුන් වහන්සේ පැහැදිලි කරනවා කොටස් දොළහක් පෙන්නනවා. මෙතන අපෝධාතුව තියෙන කොටස් දොළහක් පෙන්නනවා. පඨවි ධාතුව කොටස් විස්සක් පෙන්නනවා. එතකොට තිස් දෙකකට කොටස් කඩලා පෙන්නනවා. චතුධාතු මනසිකාර භාවනාව වඩන කෙනෙකුට පේනවා එතකොට බුදුන් වහන්සේ පඨවි කියන්නෙ මෙතන ශරීරයේ කෙස්, ලොම් තමා මේ විදිහට කොටස් විස්සක් ගන්නවා. එතකොට ආපෝ කියන්නෙ වැගිරෙන ගතියනේ.

එතකොට එතන දියරනේ තියෙන්නෙ. එතකොට පිත් සෙම් සොටු ඒ සේරම එනවා **''පිත්තං සෙම්හම් පුබ්බෝ''** කියන්නෙ සැරව **''ලෝහිතං සේදෝ මේදෝ අස්සු වසා ඛේලෝ කෙල සිංගානිකා සොටු ලසිකා මුත්තං''** එතකොට මුත්‍ර සඳ මිඳුළු හැම දියරයක්ම ඇගේ තියෙන මේවා වෙන් කරලා පෙන්නනවා. දොළහක් තියෙනවා. ඒ විදිහට වායුව පෙන්නනවා. වාතය කොටස්වලට බෙදලා වෙන් කරනවා. හතළිස් දෙකක් පෙන්නනවා. පඨවි විස්සයි. එතකොට වැගිරෙන ඒවා දොළහයි. එතකොට වායු කොටස් තිස් දෙකක එනවා දහයක් එනවා. එතකොට එතනත් ගන්නවා උද්ම්ගමන වාතය, අධෝගමන වාතය එතකොට උඩට නගින වායුව යටට බහින වායුව කුස තුළ තියෙන වායුව අග පසග හැසිරෙනකොට අතපය උස්සනකොට ගෙනියන වායුව එතකොට මේ ජීවිතය පවත්වා ගන්න ආශ්වාස ප්‍රාශ්වාස වාතය දැන් මේ විදිහට දැන් එතන හයක් පෙන්වනවා ඒ වායු කොටස් හයක් පෙන්වනවා. එතකොට උණුසුම රශ්මිය ඇගේ තියෙන කොටස් හතරක් තියෙනවා එතකොට දැන් මෙතන ශරීර උණුසුම එතකොට හිසකෙස් පැසීම එතකොට දැවිල්ල බඩේ තියෙනවා. දැවිල්ල ඇති කරන තේජෝ ධාතුව ධාතුවේ කොටස් හතරක් පෙන්නනවා එතකොට බඩේ තේජෝ ධාතුව දාහය එතකොට ආහාර පාන දිරන කොට පැසවන තේජෝ ධාතුව එතකොට පාචක තේජෝ ධාතුව ජීර්ණ වයසට යනවා දිරනවා ජීරණ තේජෝ ධාතුව එතකොට සන්තාපන ශරීර උණුසම එනකොට මේ උණුසුම කොටස් හතරකට බෙදලා බුදුන්වහන්සේ පෙන්නනවා තේජෝ ධාතුව ඉතිං මේ විදිහට හතර මහා භූත මේ ශරීරය තියෙන්නෙ කියලා බුදු හාමුදුරුවෝ අන්තිමට පෙන්නනවා මේ ධාතු මනසිකාරය තුල දැන් ධාතු මනසිකාරය භාවනාවක් විදිහට වඩනවා කියන්නෙ මෙන්න මේ අවබෝධය ඔබට ඇති වෙන්න ඕනෙ. ඒ කියන්නෙ එක දවසක් හරි කෙනෙක් මේ විදියට හිතුවොත් හොඳ නුවනක් බුද්ධියක් තිබ්බොත් හොඳ සාමාන්‍යයෙන් ප්‍රඥාවන්තයෙක්

කියලා එහෙම හොඳ අවබෝධයක් ඔහුට තිබ්බොත් ඔහුට මේක කියනකොටම තේරෙනවා මේ ශරීරය ඇත්තටම කෙනෙක් නැනේ මෙතන තියෙන්නෙ එක පැත්තකින් වතුර ටිකක් තියෙනවා තව පැත්තකින් වාතය ටිකක් තියෙනවා තව පැත්තකින් රස්නෙ තියෙනවා තව පැත්තකින් මේ පඨවි ඝන ඒවා ටිකක් තියෙනවා ඒවට නම් ගොඩක් තියෙනවා කෑලි ගොඩක් තියෙනවා කෑලි තිස් දෙකකට බෙදලා තියෙනවා ඒ විදිහට පඨවි කෑලි විස්සයි වතුර වර්ග එතකොට දොලහයි එතකොට ආපෝ ධාතුවේ දොලහයි එතකොට තේජෝ ධාතුවේ හතරයි එතකොට වායෝ ධාතුවේ හයයි බෙදලා පෙන්නනවා. චතු මනසිකාර භාවනාවේ මේකෙදි අපට වැදගත් වෙන්නෙ ඔය කොච්චර කවුරු භාවනා කලත් එයාට හිතෙනවානේ ආත්මයක් තියෙනවා කියලා හොඳට බලන්නකෝ භාවනා මධ්‍යස්ථානවල ගොඩක් අය භාවනා කරනවා බලන්නකෝ ආත්මයෙන් මිදිලා නැනේ. ඔය අද ගොඩක් අයට තියෙන ප්‍රශ්නයක්නේ කෙනා ඉන්නවානේ එයාට කෙනාගෙන් මිදෙන්න බැරුවනේ ඉන්නෙ බලන්න දැන් ඔබ දන්නවා නිවන් මග යනවා කියලා බොහෝ අය කටයුතු කරනවා කීදෙනාද ආත්මයෙන් මිදිලා ඉන්නෙ කෙනෙක් ඉන්නවා එයා මැරෙනවා කියලා හිතාගෙන ඉන්නවා ඒක දෘෂ්ටියක් කියලා පෙන්වන්න බුදුන්වහන්සේ දරපු උත්සාහය තමයි ඔබට මේ භාවනාව විවිධාකාර විදිහට මේ විදිහට මේ අධ්‍යයනවලින් සිද්ධ වෙන්නේ ඒ කියන්නේ බුදුන් වහන්සේ විවිධාකාර ඒ බුදුන්වහන්සේ කෙනාට කෙනාට පැහැදිලි කරපුවා තමයි මේ එකතු කරලා දාලා තියෙන්නෙ සමහර විට එක්කෙනෙකුට එක භාවනාවක් ඇති. ඒක බුදුන්වහන්සේ එක් කෙනෙකුටයි දේශනා කරලා තියෙන්නෙ එයාට ගැලපෙන එක එතකොට අද අපට සිද්ධ වෙනවා අපි මේ සේරම අධ්‍යයනය කරනවාද අපිට ගැලපෙන එක තෝර ගන්නවාද සමහර විට මේ ඔක්කොම අධ්‍යයනය කරගෙන යනකොට කෙනෙකුට තමන්ට ගැලපෙන එක් පේනවා ආනේ මේක ඇත්තනේ

කියලා එක පාරටම එයාට දැනෙන්න ගන්නවා ඇත්තටම එතනින් තමයි එයාට නිවන් දොරටුව විවෘත වෙන්නෙ එයාට ඒක දැනෙන්න ඕනෙ මේක ඇත්ත මෙතන කෙනෙක් නෑ මේකේ මට නොතේරෙන දෙයක් තියෙනවා මට දැනෙනවා මෙතන කෙනෙක් නැති බව හැබැයි මට ඒක තාම හරියටම ඔප්පුවෙලා නෑ අන්න එහෙම සැකයක සමහර අය ඉන්නවා ඒ අයට නිවන් දොරටුව විවෘත වෙන්නම ඕනේ ඒ අය නිවන් දනින්නට ඕනේ මොකද මේ සත්‍ය අවබෝධ වුනොත් කෙනාට අවබෝධ වෙනවා මරණයක් නැතිනම් ඒ කෙනාට මර බිය නැතිවෙනවා. එතකොට එයා කවදාවත් මරණයක බියක් එයාට දැනෙන් නෑ එයා මරණය ජය ගත්තා වෙනවා. මරණය ජය ගත්ත කෙනා නිවන් දැකපු කෙනෙක් වෙනවා. ඇයි මේ හැමෝම මරභියේ ඉන්නෙ ඔය මරබිය තියෙන නිසා තමයි හැමෝම ඔය සේරම කරන්නේ ඇත්තටම තමන්ගේ තියෙන ඒ ආත්මාර්තය කියන එක හැදිලා තියෙන්නෙ ආත්ම තණ්හාව කියන එක හැදිලා තියෙන්නෙ මේ තමන්ගේ කියලා බය නේද තමන් නැති වෙයි කියලා කියන බයට නේද තමා හැම තිස්සෙම තමන් කියලා හදාගෙන යන්නෙ අනිත් අය ගැන හිතන්නැත්තෙ ඒ තමන් ලොකු වෙන්නෙ කොහොමද තමන් කියලා කෙනෙක් ඉන්නවාද හැබැයි තමන් කියලා කෙනෙක් නැත්නම් අන්න එදාටයි මැරෙන්න කෙනෙක් නැති වෙන්නේ. තමන් කියලා කෙනෙක් ඉන්න තාක් කල් මැරෙන්න කෙනෙකුත් ඉන්නවා එහෙනම් මේ තමා කියලා කෙනෙක් නැති බව පෙන්නන එකයි බුදුන් වහන්සේ ගේ ව්‍යායාමය අප තථාගතයන් වහන්සේ සෑහෙන පරිශ්‍රමයක් දරලා තියෙනවා අපිට ඔප්පු කරන්න ඒ වගේම කෙනා කෙනාට පැහැදිලි කරලා තියෙනවා කමටහන් ඒ ඒ අය මේ කමටහන් අවබෝධ කරගෙන ඒ මාර්ගඵල ලබලා රහත් භාවය ලබලා ඒ රහත්භාවය ලබනවා කියන්නේ මොකුත් නෙමෙයි තමන්ගෙන් මිදිලා තියෙනවා සසර දුකෙන් මිදිලා තියෙනවා නැවත උත්පත්තියකට හේතු වෙන්නෑ අපි ඉස්සරහට පැහැදිලි

කරන්නම් කොහොමද හේතු වෙන්නෙ කොහොමද හේතු නොවෙන්නෙ කියලා දැන් මෙතෙනදි තවත් වැදගත් වෙන දෙයක් තියෙනවා අපෙන් සමාජය තුලදී අහන ප්‍රශ්න ටිකක් තියෙනවා ඒවා ටික අපි විසදලා දෙන්න ඕනෙ. මේ කථා කරන්න ඕනෙ තැන් ටිකක් තියෙනවා අපිට සතර මහා භූත රූපය ගැන ගැටළුවක් නැහැ. එතකොට මෙතන ගොඩක් වැදගත් වෙනවා සියුම් කාරණයක් තියෙනවා ඒ තමයි මේ රූප කලාප ප්‍රසාද රූපයක් කොහොමද හැදෙන්නෙ අපිට කොහොමද දෙයක් පේන්නේ මෙන්න මෙතන තමයි ධර්මයේ තියෙන ගැඹුරුම තැන තියෙන්නේ කොහොමද ප්‍රසාද රූපයක් හැදෙන්නේ මෙන්න මේ ගැන අපිට මේ තියෙනවා රූප කලාප ගැන ගැටළුවක් ඒක ඉතාම ගැඹුරු කාරණාවක් ඔය එතකොට බුදුන්වහන්සේ පෙන්වන පරාසයෙන්ම අප මේක බලන්න ඕනේ මොකද ඒ පරපායෙන් දැක්කොත් තමයි ඔබට ඒ කාරණාව තුල ඒ ධර්මය දකින්න ලැබෙන්නේ මේ රූප කලාප ප්‍රසාද රූප පැහැදිලි රූප කලාප කොහොමද මේ ඇහෙන් කොහොමද වර්ණයක් පේනනේ කනට කොහොමද ශබ්දයක් ඇහෙන්නේ අපිට ඒවයිනගෙන් මේ ලෝකයක් හැදිලා තියෙන්නෙ අපිට වර්ණ ලෝකයක් තියෙනවා අපිට ශබ්ද ලෝකයක් තියෙනවා අපිට ගඳ සුවඳ රස මේ උණුසුම සීතල ඒ එයින්නේ අපිට ලෝකයක් හැදිලා තියෙන්නේ දැන් ඔබේ ඇස් පේන්නැත්නම් ඔබට වර්ණ ලෝකයක් නෑ ඔබට කන් ඇහෙන්නේ නැත්නම් ඔබට ශබ්දය ගැන ගැටළුවක් නෑ. කොච්චර ශබ්ද තිබුනත් ඔබට කන් ඇහෙන් නැත්නම් ඒකේ ගැටළුවක් නෑනේ එතකොට මේ ශබ්දයත් ලෝකයක් නේද ඇයි ඔබ සින්දු අහන්නේ ඒක ඔබට මිහිරියි නේද ඒකෙන් ඔබ ලෝකයක් වගේ එකක් මැවෙනවා නේද ශබ්ද ලෝකයක් දැන් ඔබ අන්ධ නම් ඔබට වර්ණ ලෝකයක් නැහැ නේද එතකොට ඔබ ලස්සන ලස්සන දේවල් නේ බලන්නේ එතකොට ඔබට මේ ඇස් දෙකක් තියෙන හින්දනේ අපි සාමාන්‍යයෙන් තේරෙන විදිහට කථා කරමු ඔය ගැඹුරුම දේට යන්නේ නැතුව

දැන් ඔබට මේවා මැවෙන්නේ කොහොමද ඇයි එතකොට ඇස කියන්නේ ඔය ඇහැට නෙමේය ඇස කියන්නේ පේන බවට ඒක හැදුනේ කොහොමද දැන් අපි කොහොමද දැන් එකක් දිහා බලනකොට ශබ්දයක් ඇහෙනකොට අපිට දැන් හිතන්න පුලුවන් ඒක කැතයි කියන්න ලස්සනයි කියන්න පුළුවන් ඒක මිහිරියි කියන්න පුළුවන් ඒක මට එපා කියන්න පුළුවන් මෙන්න මේවා ආවේ කොහෙන්ද කොහෙන්ද අපට එහෙම සිතුවිලි ආවේ. අපි කොහොමද එහෙම ස්වභාවයකට පත්වුණේ අන්න ඒක තමයි වැදගත් චිත්ත චෛතසික, රූප, නිබ්බාන මේ ධර්මයේ තියෙන ගැඹුරුම ඒ වගේම වැදගත්ම තැන. මේ චිත්ත චෛතසික කියන තැන. මේ චෛතසික කියන්නේ මේ සිතිවිලි ඔය අපි කථාකරේ දැන් ඒක ලස්සනයි ඒක කැතයි. ඊර්සියාව, වෛරය, ක්‍රෝධය, තණ්හාව, ආසාව මේ ඔක්කොම චෛතසික සිතුවිලි ඒවා හැදුනේ කොහොමද ඒවා හැදෙන්නේ චිත්ත නිසා චිත්ත චෛතසික කිව්වේ ඒකයි. චිත්ත කියන්නේ මොනවාද ඇහෙන් එන වර්ණය ඒක ඇවිල්ලා චක්ඛු විඤ්ඤාණය සිතකින් කියලා සිත තමයි චිත්ත කියන්නේ. එතකොට අපි කියන්නේ සෝත විඤ්ඤාන සිතක් ඒ සිතක් චිත්තයක් ඒක නිසා චෛතසිකයක් හැදෙනවා ධර්මය හරි ගැඹුරු පර්යායක් තියෙනවා මේක පෙන්නන්න පුළුවන් නමුත් ඔබ ඉස්සෙල්ලා සරලව මේ විදිහට මේක දකින්න ඕනෙ එතකොට ඔබට පේනවා මේ දැන් වර්ණයක් කියන එක ශබ්දයක් කියන එක දැන් මේ ලෝකේ ශබ්ද කියන්නේ මොනවාද වර්ණ කියන්නේ ඇත්තටම මේ භාහිර තියන ඒවාද නැත්නම් මේ අපේ ප්‍රසාදවලට සකස් වෙච්ච ඒවාද ඇත්තටම ඒවා ප්‍රසාද වලට සකස් වෙන්නේ දැන් එහෙම නම් ඔබට කනක් නැත්නම් එලියේ ශබ්ද තියෙන එහෙම දෙයක් ප්‍රශ්නයක් නැහැ නේ එහෙනම් ප්‍රශ්න තියෙන්නේ එහෙනම් කන කියන්නේ ප්‍රසාදයක්නේ එතකොට කොහොමද ඒක සකස් වුනේ දැන් කෙනෙක්ට කියන්න පුළුවන් ආ මෙතන කණක් තියෙනවා ආ ඒකෙන් ඔය ඇහෙන්නේ ඒක හරි සරලයි. නමුත් එතනින්

කොහොමද ශබ්දයක් හැදෙන්නේ? ඇයි එහෙනම් සමහර කෙනෙකුගේ කන තිබ්බට ඇහෙන්නැත්තේ එහෙනම් එයාගෙ කම්බෙරය මොනාහරි වෙලා. එතකොට එහෙම උනේ කොහොමද ඒක කොහොමද එතකොට සිතුවිල්ලක් හැදෙන්න උදව් උනේ. ඕන්න ඕතන තියෙනවානේ ඔබට ලිහා ගන්න දෙයක් අපි එතෙන්ට එන්න ඕනේ එහෙනම් අපි දැන ගන්න ඕනේ හැම දෙයක් ම හැදිලා තියෙන්නේ බුදුන්වහන්සේ දේශනා කරන පරියාය දිහා බැලුවාම ඔබට පේනවා ඒ රූප කලාපවලින් රූප කලාප ප්‍රසාද රූපයක් හැදිලා තියෙන්නේ රූප කලාප පනස් හතරක් එකතු වෙලා ධර්මය තුල සඳහන් වෙනවා කුඩාම අංශුවක් ඒ කියන්නේ. අපි කුඩාවටම පෙන්වන සාධකය තමයි රූප කලාප කියන්නෙ ඒ රූප කලාප වලින් තමයි සේරම හැදිලා තියෙන්නේ ඒ රූප කලාප වලට බෙදන්න පුළුවන් ඒ රූප කලාප පනස් හතර එකතු වෙලා තමයි එක රූපයක් හැදෙන්නේ.

## ★ 2 වෙනි පරිච්ඡේදය ★

# ඤාන දස්සන විසුද්ධිය

නිවන් මග සරලව 2

රූප කලාප කියන්නෙ කුඩාම ඒකකය රූපයක් හැදෙන්නේ රූප කලාප කුඩාම රූප කලාප සමූහයක්ගේ එකතුවෙන් තමා රූපයක් හැදෙන්නේ. එතකොට මේ රූප කලාප දැකීම දකින්න උත්සාහ කිරීමෙන් ඒ රූප කලාප ගැන අවබෝධය ඇතිකරගැනීම ඉතාම වැදගත් වෙනවා. චක්ඛු ප්‍රසාද රූප, සෝත ප්‍රසාද රූප, ජිව්හා ප්‍රසාද රූප, ඝාණ ප්‍රසාද රූප, කාය ප්‍රසාද රූප මේ විදියට ඔබගේ පංචායතනය ප්‍රසාදවත් වනවා. මේ ප්‍රසාදවත්වවන දැන් අපි උදාහරණයක් විදිහට ගත්තොත් චක්ඛු ප්‍රසාද රූපය වර්ණය ප්‍රසාදවත් වෙනවා. එතකොට ඔබ දන්නවා ඇස කියන්නේ මේ ආයතනයක් මේ ඇස කියන ආයතනයෙන් තමයි පෙනීම කියන කාර්ය සිද්ධ කරන්නේ. ආලෝකයක් නැතුව ඇස් පේන්නේ නෑ ඒ මැරුණ කෙනාටත් මසැසක් තියෙනවා. ඔය දකින් මස් ඇස කියන එක මැරුණ කෙනාටත් තියෙනවා. හැබැයි මැරුණ කෙනාට පේන් නෑ. එතකොට මැරුණ කෙනාට පේන්නැත්තේ එතන අපි කියනවා පණ නෑ කියලා. හැබැයි ඔබට පේනවා එතකොට මෙතන ආයතනය කියන්නේ මස් ඇහැ නෙවෙයි. ඇස කියන්නේ මස් ඇහැ නෙවෙයි ඇස කියන්නේ ආයතන ක්‍රියාවලියක් තියෙනවා කොහොමද මේ පෙනීම කියන ක්‍රියාවලියම සිද්ධ වෙන්නේ ඇත්තටම කිව්වොත් ඇස කියන්නේ මෙතන ප්‍රසාදය සිද්ධ වෙන්න ආලෝකය හේතු වෙනවා. ඒ කියන්නේ හේතු ඵල ක්‍රියාවලියක් සිද්ධ වෙනවා. ආලෝකය නිසා තමා මේ අන්ධකාරයේ පේන නැනේ. ආලෝකයට ප්‍රසාදවත් වෙනවා. අපි කිව්වොත් ප්‍රසාදය තුල

දීප්තිපත් වීමක් තියෙනවා කන්නාඩියකට අර ආලෝකය කියන දේ කන්නාඩියට ප්‍රතිබිම්බයක් වැටෙනවා වගේ, අන්න ඒ ප්‍රතිබිම්බයක් වැටෙන සිද්ධිය තමයි මෙතෙනදි සිද්ධ වෙන්නේ. බුදුන් වහන්සේ උපමාවක් දක්වනවා ආලෝකයත් ගසත් නිසා වැටෙන සෙවනැල්ල රූපයත් ඇසත් නිසා එන චක්ඛු විඤ්ඤාණය දැනගැනීම **"තින්නං සංඝති ඵස්සෝ"** කියලා මනසට ස්පර්ශ වනවා කියලා. හැබැයි මේ චක්ඛු විඤ්ඤාන දැනගැනීම මේ ප්‍රසාදයෙන් ප්‍රසාදය හරහා එන හැඩතලය දෙයක් බවට එහෙම නැත්නම් මේසයක් පුටුවක් ඇඳක් අන්න ඒ වගේ හඳුනා ගැනීමක් සිද්ධ වෙන්නේ නෑ දෙයක් සම්මුති නාමයන් ඒ තුල නෑ එතන හැඩතලයක් පමණයි ඒ තමා ප්‍රසාද රූපය කියන්නේ. ප්‍රසාද රූපය හඳුනා ගැනීම සිද්ධ වෙන්නේ මනෝ විඤ්ඤාණයෙන් ස්පර්ශ වෙනවා මනසට එතකොට ආයතනවල ක්‍රියාවලියක් කෘත්‍යයක් මනෝ විඤාණයෙන් කෘත්‍යයක් හඳුනාගන්න ඕන මනසට බෑ මනසට එන අරමුණු ධම්ම මනසට බෑ බාහිරට එන්න එතකොට පංචායතනයෙන් තමයි බාහිරත් සමග ගනුදෙනු තියෙන්නෙ. එතකොට ඇස වර්ණ ප්‍රසාද වනවා එතකොට අපි කියනවා කණ කියන ආයතනයෙන් සෝත ප්‍රසාදය සිද්ධ වෙනවා එතකොට සෝත විඤ්ඤාණය තමයි ඒක දැනගැනීම ඇස කියන ආයතනය එතකොට මෙතන චක්ඛු ප්‍රසාදය චක්ඛු ප්‍රසාදයෙන් දැනගැනීම චක්ඛු විඤ්ඤානය දැනගැනීමෙන් ඒ වගේම ඝාන ප්‍රසාදය තුල ඝාණ විඤ්ඤාණය දැනගැනීමත් නාසය කියන ආයතනයෙන් ක්‍රියාවලියක් ජිව්හා ප්‍රසාදය තුල ජිව්හා විඤ්ඤානය දැනගැනීම දිව කියන ආයතනය තුල අපි ඇස, කන, නාසය, දිව, කය කියලා ගන්නවා. එතකොට කාය ප්‍රසාදය තුල උණුසුම, සීතල කියන පොට්ඨබ්බ කියන 4ම පඨවි ආපෝ තේජෝ වායෝ මහා භූතවල දැන ගැනීමක් සිද්ධවෙනවා. දැන් මෙතනදි ඉතාම වැදගත් වෙනවා මේ ගැන මනා කොට ඔබ දකින්න ඕන නුවනින් රූප කලාපයක් කියන්නෙ එතකොට ඉතාමත් වැදගත් ඒකකයක් රූපයක් හැදිලා තියෙන්නෙ රූප කලාපයක් කියලා

එතකොට කුඩාම ඒකකය තියෙන්නේ එතකොට රූප කලාපයක් එතකොට මේ රූප කලාපය කියන්නේ දෙයක් පේනකොට ඒක හැදිලා තියෙන්නේ කුඩාම අංශුව තමයි එහෙම කියන්න පුලුවන් මේ ඔක්කොම ඔබට මේ පොත් පත්වලින් උනත් දකින් ලැබෙන්නේ හැම තැනකින්ම අහන්න ලැබෙන්නේ මේක මේ සිදුවීම් මාලාවක් සිද්ධවන ආකාරය ස්කන්ධ ගත්තත් හැමදේම සිද්ධවෙන ආකාරය එතන ඔබ මනසිකාරයක් තිබෙනව ඇත්තටම මනසිකාරයෙන් තමයි ධර්මය අවබෝධ කර ගන්නේ.මේ සියල්ලම මනසේ තමයි, අපි මේ හිතන එක මනසිකාරයන්ගේ කියන්නේ මනසිකාර කෘත්‍යක් තියෙනවා ඉතිං ඒක අපි අවසානෙට කථාකරමු. රූප කලාපයක් කියන්නෙ ඇත්තටම අපි රූපය ගැන කථා කරන විට ඉතාම වැදගත් රූපයක් හැදිලා තියෙන්නේ මෙන්න මේ රූප කලාප වලින් කියන එක. මෙතනදි ප්‍රසාද රූපය ගැනයි ගොඩක් වෙලාවට බුදුන් වහන්සේ කථා කරන්නේ. මොකද සියල්ලම ඔබගේ ප්‍රසාදය තුලින් ආයතන තුලින් සලායතන තුලින් **"සලායතන ලෝකෝ ලෝකේ"'** කියන විටත් තේරෙනවා ආයතන තුලින් තමයි සියලුම හඳුනා ගැනීම් සිද්ධවෙන්නේ.

ආයතනයක් කියන්නේ ඇස කියන ආයතනය උදාහරණයක් ගත්තොත් ඒකෙන් රූප කලාපයක් කියන්නේ ඇසේ ප්‍රසාදය ප්‍රසාදවත් රූපය හැදිලා තියෙන කුඩාම ඒකකය ඒක හැදිලා තියෙන ආකාරය ඉතාම වැදගත්. ඒක අපි අධ්‍යයනය කල යුතුමයි. එතකොට වර්ණය ගත්තොත් එහොම එතකොට අපි දැන් කලින් පැහැදිලි කලා ශුද්ධාශ්ඨකයක් කියන්නේ හැම ඒකකයම ශුද්ධාශ්ඨකයක් තියෙනවා. හැම රූප කලාප 54කින්ම ප්‍රසාද රූපයක් හැදෙනවා කිව්වහම අපි හොයලා බලන්න ඕන මොකද මේ රූප කලාප 54 කියලා එතකොට ඔබට චතු සමුට්ඨාන කියන වචනය ඔබට අහන්න ලැබෙනවා. චතු සමුට්ඨාන කියන්නෙ කම්ම, චිත්ත, සෘතු,

ආහාර එතකොට කම්මජ රූප කලාප, චිත්තජ රූප කලාප, සෘතුජ රූප කලාප, ආහාරජ රූප කලාප මෙන්න මේ රූප කලාප වල සමූහයකගේ එකතුවකින් තමයි එතකොට රූපයක් අපිට විද්‍යාමාන වෙන්නේ. එවිට මේ රූප කලාප දිහා බැලුවොත් රූප කලාප දැන් චතු සමුට්ඨාන ඉතාම වැදගත් හොඳින් නුවනින් ඔබ බලන්න. විමර්ශනය කරලා බලන්න මෙතනදී රූප කලාපත් හැදිලා තියෙන්නේ රූප කලාප වලින් කියන එක. රූප කලාප 54 කින් රූපයක් හැදිලා තියෙනවා කියනකොට ඒ රූප කලාප 54 හැදිලා තියෙන්නේ 54ක් 54ක් ආවේ කොහොමද අන්න ඒක බලනකොට තමයි ඔබට කම්ම, චිත්ත, සෘතු, ආහාර කියන මෙන්න මේ කොටස් 4 කින් සමූහයකගේ එකතුවක්. එතකොට රූප කලාප 54 ට බෙදා දැක්වීම අපි ධර්මය තුල ඔබට දක්නට ලැබේවි. කම්ම, චිත්ත, සෘතු ආහාර කියන ප්‍රසාද රූපය චතු සමුට්ඨානයෙන් හැදෙනවා කියන එක කම්ම කර්මය හේතුවෙලා තියෙනවා කියන සෘතු එතකොට උෂ්නත්වයෙන් එහෙම නැත්නම් උතු, උතුජ අට්ඨාන කාලජ කියන්නේ ශුද්ධාශ්කය පඨවි, ආපෝ, තේජෝ, වායෝ මහා භූත 4 යි. වර්ණ, ගන්ධ, රජ, වණ එතකොට මේ 8 තමයි අට්ඨක කලාපය කියන්නෙ. උතුජ අට්ඨක කලාප කියන්නෙ එනකොට හැම රූප මේ කලාපයක්ම ඔබට පෙනේවි රූප කලාප 54 හැදෙනකොට මේ හැම රූප කලාපේම මේ අට්ඨකයේ තියෙනවා. ශුද්ධාශ්ඨකය තියෙනවා ශුද්ධාශ්ඨකයේ පොදු ස්වභාවයක් තියෙනවා එතකොට වර්ණ, ගන්ධ, රස, ඕජා එතකොට පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන එක හැම රූප කලාපයකම අඩංගුයි ඊට අමතරව තමයි කම්ම. දැන් ඔය අපි ගත්තොත් එහෙම දැන් අපි කිව්වනේ කම්ම, චිත්ත, සෘතු, ආහාර කියලා එතකොට ආහාර රූප හරි හතර මහා භූත 4 යි. වර්ණ, ගන්ධ, රස, ඕජා 4යි එකතු වෙලවා ආහාර රූපය තියෙනවා. නමුත් අටම තමා ප්‍රකට වෙන්නෙ. ආහාර රූප කලාපයක් ප්‍රකට වෙන් නෑ කියලා පෙන්නනවා. ඒ වගේම සෘතුජ, සෘතු කියන්නේ මෙතන රස්නයක් මේක

ඉතාම වැදගත් මේ ධර්මය නිවන් මගටම යොමුවුනු කෙනෙකුට මේ සිත සකස් වෙන්නෙ කොහොමද, වර්ණ සිතක් කියන එක කොහොමද, හැදෙන්නෙ කියලා බැලුවොත් එකින් එක මේක පේනවා පොත පේනවා පොත පේන සිත නෙවෙයි බිත්තිය පේන්නෙ.

අපි මේවා අධ්‍යයනයේ දී පැහැදිලි කරන්නම් මෙතනදි මේ පෙනීම කියන එක කොහොමද සිද්ධ වෙන්නෙ. වර්ණ කොහොමද මේක බිත්තිය පේනවා මල පේනවා දැන් මේ විදියට මෙතන මේ උෂ්ණත්වය කියන එක් තේජෝ කියන එක ඉතාම වැදගත් කාර්යක් කරනවා. උතුජ අට්ඨක කලාප කියලා පෙන්වන්නේ. ඒ වගේම මෙතන ඕජාව කියන එක වැදගත් කාර්යයක් කරනවා ඒ කියන්නේ මේ රූප කලාප සියුම් ව දකින්න ලැබෙනවා. ඔබට මේ නිවන් මාර්ගය කටයුතු කරනකොට මේ රූප කලාප ඇත්තටම කියනවානම් අපි කලිනුත් පැහැදිලි කලා ලෞකික ධ්‍යාන එහෙම නැත්නම් සමාධිමත් සිතට මේවා දකින්න හැකියාවක් තියෙනවා. හොඳින් මනා කොට තීක්ෂණ ඥාණ අභිඥ්ඥා අවදිවන දියුණු වෙනකොට ඒ තරම් තියුණු තත්වෙට යනකොට දකින්න ලැබෙන්නේ අපි ඒ ගැන අවසානෙට කතා කරමු. ගැලපීමක් තියෙනවා ඒක නිසයි අපි එහෙම ඉදිරිපත් කරන්නේ. හේතුවන්නේ රූප දැකීම ඉතාම වැදගත් වෙනවා මෙතන ඔබටත් දැනෙයි අවසාන බාගෙට යනකොට එතකොට මෙතන චිත්තජ කියලා ගන්නකොටත් අර ශුද්ධාශ්ඨක යන කොට චිත්තජ ස්වභාවයක් තියෙනවා. හැම රූපයකටම හැම රූප කලාපයකටම එනකොට ශුද්ධාශ්ඨක තියෙනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ඒවාගේම වර්ණ, ගන්ධ, රස, ඕජා හැම රූප කලාප වලින් තමයි රූපයක් හැදෙන්නෙ කියනකොට ඔබට දැන් පැහැදිලියි ප්‍රසාද රූපෙත් එන්නේ ඒ විදියටම තමයි. ඒකේ 54ට බෙදිලා පේනවා එතනදි චිත්තජ ස්වභාවයත් තියෙනවා, රස්නේ ස්වභාවයත් තියෙනවා, ඍතු ස්වභාවයත් තියෙනවා,

ආහාර ස්වභාවයත් තියෙනවා. ඒ වගේම තමයි කම්ම පෙර කර්මෙන් තව කර්ම හැදෙනවා කියන තැන කම්ම ස්වභාවයක් පෙන්නුම් කරනවා. ඒවා කොටස් 03ට බෙදලා පෙන්නන්නේ මෙතන භාව දශකයක් ඒ වගේම කාය දශකයක් ඒ වගේම චක්ඛු දශකයක් මොකද මෙතන අපි ගන්නේ වර්ණයන් නේ අපි ගන්නේ උපමාකලේ එහෙනම් එතන චක්ඛු දශකයක් ඒ වගේම කාය දශකයක් ඒ වගේම භාව දශකයක් කියන 03 කම්ම දශකයක් විදියටයි පෙන්නන්නේ එතකොට චිත්ත ස්වභාවයක් උෂ්ණත්වය කියන ඍතු ස්වභාවයත් ඒ වගේම ආහාර ස්වභාවයත් පෙන්නුම් ස්වභාව 03 ක් එකක් ශුද්ධාෂ්ඨක විදියටමයි තියෙන්නේ එතකොට ඊට අමතරව දැන් චක්ඛු නිසා ඇහැ එනකොට දක්ඛු දශකයක් ඒ වගේම මෙතන කාය දශකයත් එතකොට මස් ඇහැ තියෙන නිසා කාය දශකයත් ඒ වගේම මෙතන භාව දශකයත් මොකද එතන ස්වභාව දශකයත් කියලා පෙන්නනවා. ඔබ දන්නවා ස්ත්‍රීභාව පුරුෂභාව පුරුෂ සෙල සේරම පිරිමියෙක් විදියට හැදෙනවා. ගැහැණියක්ගේ සෙල සේරම ගැහැණියක් විදියට හැදෙනවා. ඒක තමා භාව දශකයේ එතන පෙන්නන හෙත් වන්නේ එතනම කාය දශකය තියෙන්නේ. මේවා කෙනෙක්ට හිතෙන්න පුලුවන් මෙච්චර වැදගත් නෑ කියලා. වැදගත් නෑ කියලා හිතනවට වැඩිය මේකෙ වැදගත්කම අවශ්‍ය වන්නේ ඔබට අවසානයේදී දැනෙයි දැනට අවබෝධය වැදගත්. එකකට දශක තුනකින් ඒ කියන්නෙ දශක 30ක් දහයේ දහයේ ගොඩවල් තුනක් චක්ඛු දශක, කාය දශක, භාව දශක දහයේ ගොඩවල් 3න් 30ක් හැදෙනවා. ඒ වගේම චිත්ත අට්ඨකය, ඍතු අට්ටඨකය, ආහාර අට්ඨකය අනුව අටේ ඒවා 03ක් 24ක් හැදෙනවා. ඒ අනුවයි 54 හැදෙන්නෙ. හැම ප්‍රසාද රූපයකටම මේ වගේ ස්වභාවය හඳුනා ගත්තොත් ඔබට මේවා කොහොමද නැවත විපරිනාම වෙන්නේ නැවත කොහොමද අභිසංකරණය වෙන්නේ. මෙන්න මේ වගේ විශාල ක්‍රියාවලියක් හරහා තමයි දකින්න වෙන්නේ. මේ හැම එකක්කම ශුද්ධාෂ්ඨක මේ හැම දේම දැන්

අපි වාතය ගත්තත් හැමදේම රස්නය ගත්තත් වර්ණය ගත්තත් ගන්ධය ගත්තත් හැම දේම ශුද්ධාෂ්ඨකයෙන් කියලා දකිනවානම් එකම අංශු ස්වභාවයෙන් ඔබට සියල්ලම පේන්නේ මේක ශක්ති ස්වභාවයක් විදියට සියුම්ව දකින්නත් පුලුවන්. නමුත් මේක අංශු ස්වභාවයක් කියලා දකින්නත් පුලුවන්. මේක උපමාවක් පමනයි. මෙතන ස්වභාවයත් මෙතන එකම ස්වභාවයක් හැමතැනකම තියෙනවා කියන එක පඨවියක ගත්තත් ද්‍රවයක ගත්තත් වායුවක ගත්තත් එකම ශුද්ධාශ්ඨකය නැතුව ඔබට රූප කලාපයක් පේන්නෑ කියන එක එතකොට මේක තමයි අපි එකම ස්වභාවයක් කියන එක හේතු වෙන්නෙ. මෙතන රූප කියලා ගන්නකොට ශබ්ද, ගන්ධ, වර්ණ ඒ වගේම වේගය උෂ්නත්වය ඕජාව කියන්නේ වේගය ඕජාව කියන එක ඇත්තටම එන්නේ. වේගයක් හරහා මේක ශ්‍රෝත පැත්තටමයි එන්නේ. ඕජාව කියන්නේ ශෝතයත් ශබ්දයත් එතකොට ශබ්දය එන්නේ ශෝතයක් හරහා මේවා අති සියුම් කාරණා වේවා සියුම් නුවනක් තියෙන කෙනෙකුට සියුම් ඥාණයක් තියෙන කෙනෙකුට මේ කියන එක ඉතාම හොඳ උත්තේජයක් වනවා. තව දුරට ධර්ම ගැඹුරට ඔහුව දකින්නට හැකියාව ලැබෙනවා. රූප කලාප හරහා දකින දැකීම අති සියුම් ගාම්භීරයි. ඉතිං මේ විදියට ඔබ ශෝතය පැත්ත ගත්තොත් ශෝත ප්‍රසාදයෙන් ගත්තොත් ශෝත ද්වාරයෙන් එන රූප කලාපයක ස්වභාවය දැක්කොත් ඒ විදියටම ඔබ දැක්කොත් සාණ ප්‍රසාදය ඒ විදියටම ඔබ සාණ ද්වාරයෙන් එන රූප කලාපයන් දැක්කොත් ඒ වගේම ඔබ දැක්කොත් ජිව්හා එහෙම නැත්නම් රස දැක්කොත් අපි ඒ විදියටම රූප කලාප දැක්කොත් අපි ඒ විදියටම රූප කලාප දැකීමේ හැකියාවන් ඔබට තියෙනවා ඒක මහ ඥානයක් ඒක අභිඥ්ඥා සකස් වීමක් තුලයි සිද්ධ වෙන්නෙ. ඒ මේකේ අවශ්‍යතාවය දැනෙන්නේ නෑ හැමෝටම මේකේ අවශ්‍යතාවය දැනෙන්නේ සමාධිමත් සිතට යොමුවෙලා ඒ චතුර් ධ්‍යානය දක්වාම සියුම්ව කම්පන චංචල වලටම හිත නොදැනෙන හුස්ම නොදැනෙන තැනටම

යනකොට මේ රූප කලාප ප්‍රකට වෙන ස්වභාවයකට පත් වෙනවා. ඒක අපි එහෙම ඔබට සංඥාවක් විදියට ඒ අදහස ප්‍රකාශ කරනවා. මේ දැකීම සහ අවබෝධය මේ පරම සත්‍ය අවබෝධය ඉතාම ගාම්භීරයි කීවේ මේ කියන සියුම් කම නිසාමයි. එතකොට කාය ප්‍රසාදය ඒ වගේම මනෝ ප්‍රසාදය එතකොට අපි දන්නවා එතන කාය ප්‍රසාදය මනෝ ප්‍රසාදය ඒ වගේම රූප කලාප කාය ප්‍රසාද මනෝ ප්‍රසාද කියන දෙකේදි රූප කලාප 44 විදියටයි ගන්නේ. එතනදි අර චිත්ත කියන එක හෘද වස්තු කියල අරගෙන අභිධර්මයෙදි පැහැදිලි කරන නිසා තමයි භාව දශකය කාය දශකය කියලා ගත්තම තව චක්ඛු දශක වගේ එකක් එන්නෑ. දශකයක් අඩු වෙනවා එතකොට තමයි 54 වෙන්නෑ 44 වෙනවා ඒකම තමා මනෝ ද්වාරය වෙන්නේ එතකොට කාය දශකය එතන මේ භාව දශකයේ කාය දශකයේ මනෝද්වාරයේ දී එකවා මේ හෘද වස්තු රූප හැදෙන එක විඤ්ඤාණය කියලා හැදෙන එක එතකොට හෘද වස්තු දශකය කියලා නමුත් අර කාය දශකයේ එහෙම වෙන ආයතනික ස්වභාවයක් නෑ. එතනම තමා කාය දශකය කියන්නේ තව දශකයක් අඩු වෙනවා එතකොට තමා 44 වෙන්නේ ඒක ගැනම හොඳ අධ්‍යයනයක නියැලෙන කෙනෙකුට තමයි රූප කලාප දකින්නේ කොහොමද කියලා බලන කෙනෙකුට හෘද රූපයක් පේන්නේ කොහොමද ශබ්දයක් ඇහෙන්නේ කොහොමද ගන්ධයක් දැනෙන්නේ කොහොමද රස දැනෙන්නේ කොහොමද කියලා මේ විදියට කොහොමද ප්‍රසාදවත් වෙන්නේ කොහොමද මේ එකිනෙකට සම්බන්ධයක් නැති වෙනස් විදියට හැදෙන්නේ එතකොට කොහෙන්ද ඒවා එන්නේ ඒවා එතකොට එකම ස්වභාවයකින් උත්පාදනය වන බව ඔබට දැනෙන්න ඕන ඒ කියන්නෙ අපි දැන් අපි මේ දකින පේන හැම දේම එකින් එක හොඳට බැලුවොත් පොඩි කරලා ඒ කියන්නේ සියුම් අංශු කරලා බැලුවොත් එකම අංශු ස්වභාවයක් තමයි සේරගේම තියෙන්නෙ. ඒ අංශුවේ තියෙනවා ශුද්ධාශ්ධයක් කියන්නේ අටම තියෙනවා ඒකයි. ඒ

කියන්නේ එක අංශුවක් අපි ගත්තොත් ඒ භාහිරෙන් එන අංශුවක් අපි අන්වීක්ෂෙක දාලා පරීක්ෂණයක් කලොත්ඒ කිව් සියල්ලෙම ශුද්ධාශ්ඨකයක් තියෙනවා සියල්ලම තියෙනවා සියල්ලම ඒ අංශුවේ තියෙනවා ඒ වගේම ඔබ දැන් මනසින් චිත්ත ස්වභාවයක් එක අංශුවක් විදියට ගත්තොත් එක ශක්ති කලාපයක් විදියට දැක්කොත් ඒකේ සියල්ලම තියෙනවා භාහිර එකත් තියෙනවා චිත්ත එකත් තියෙනවා මෙන්න මේක අපි මීට කලින් දේශනා වලදී පැහැදිලි කරලා තියෙනවා කොහොමද ඉතාම ගාම්භීර දේශනාවක් ඉදිරිපත් කරලා තියෙනවා මේ ඒවා සකස් කරලා තියෙන ආකාරයත් පිළිබඳව පැහැදිලි කරන්නේ චිත්ත ස්වභාවය චුති සිත උපත්පත්තියක් කොහොමද සකස් වීමක් වෙන්නෙ. මේ කථාවලදී තමයි සියම්ව දකින ඥාණයකට තමයි මේවා අහුවෙන්නෙ. මේව අතරේ තියෙන සම්බන්දෙ ඉතිං මේවා එකතු වීමෙන් මේ රූප කලාප 54 එකතු වීමෙන් රූපයක් හැදෙනවා කියන එක අතිශය ගම්භීරයි. මේ ධර්මය තුල ඉතිං මේ ගැන තව පැහැදිලි කරන්න පුලුවන් ගැඹුරින් ගැඹුරට පැහැදිලි කරන්න පුලුවන් මේ රූප කලාප වල ස්වභාවය ගොඩක් අපට දකින්න පුලුවන් එකට එකක් සම්බන්ධ නෑ ඒ වගේම අපි ඒක වෙනමමයි කතා කරන්න ඕන මාතෘකාවක් දීර්ඝ කාලයක් ඒ සඳහා ගතවෙනවා. අපි දැනටමත් විශාල කාලයක් ගත කරගෙනයි මේ යන්නේ. අපි එමු දැන් රූපය ගැන මනා කොට දැන් ඔබට අවබෝධයක් තියෙනවා **''ඉති රූපං ඉති රූපං සමුදයෝ ඉති රූපං අන්ත ගමෝ''** කියන තැනට දැන් එන්න ඕන. රූපය හටගන්නේ කොහොමද නැතිවෙන්නේ කොහොමද රූපය හට ගැනීම දකින්න ඔනේ රූපයේ අන්ථභවය දකින්න ඕන රූපය දකින්න ඕන. එය තමයි මේ යෝගාවචරයන්ගේ රූපය පජාහානි කියන තැනට එනකෙට සමථයානික රහතන් වහන්සේලාගේ රූපය පජාහානි කියන තැනට එනකොට නාම රූප පරිච්ඡේදයකට එනකොට සමතයානික රහතන් වහන්සේලා විශේෂයෙන්ම මේ ශුෂ්ඛයානික රහතන් වහන්සේලා කියන්නේ විදර්ශනයානික-

යින් සමථයානිකයා කියන්නේ මේ සමථයානිකයා කරන්නේ ඇත්තටම සමථ භාවනාව වඩලා ලෞකික ධ්‍යාන ඇතිකනරගෙන ප්‍රථම ධ්‍යාන ද්විතික ධ්‍යාන තෘතීක ධ්‍යාන චතුර් ධ්‍යාන පැත්තට යොමුවෙලා ඒ ධ්‍යාන මට්ටම ඉතාම සියුම් මට්ටමේදී මේ රූපේ පරජානාති රූපේ දකින්න දකිනවා නුවනින් එතන තමයි ඇත්තටම සමථයානිකයාගේ ස්වභාවය ඒ අය දකිනවා ඒ අයට පේන්න ගන්නවා ඇත්තටම මෙයාගේ අවධානය යොමු කරාම සිහිනුවන යොමු කරාම පේන්න ගන්නවා ශරීර ධාතු ඒ ධාතු මස්තකය භාවනා කරනකොට ඒ නිවන් මගට යනකොට මේ සත්‍ය දකින කෙනෙක්ට මේ ශරීරය කෙනෙක් ආත්මයක් පුද්ගලයෙක් ඉන්නවද කියලා දකිනකොට කොටස් 42ට බෙදලා අරගෙන එතන පඨවි, ආපෝ, තේජෝ, වායෝ මේ ශරීරයේ ඒ ඒ පඨවි ස්වභාවය ඒවා වෙන් කරලා වෙන්කරලා අරගෙන කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ කියලා මේ විදියට බලලා එතකොට එතන ආත්මයක් කොතනද තියෙන්නේ නෑ නේද කියන එතන ඒ ආත්ම දෘෂ්ඨිය බිඳෙනවා ආත්ම දෘෂ්ඨිය බිදි බිදී යනවා සත්‍ය අවබෝධ වෙන්න වෙන්න ඒ වගේම ඒවත් හැදිලා තියෙන්නෙ මෙන්න මේ රූප කලාප වලින් දකින එක හේතු සියල්ලම එකම හේතු ස්වභාවයක් කියලා පෙන්න ගන්නවා. මේවා හැම එකම වැදගත් ඒ වගේම රූප 28ක් බුදුන්වහන්සේ පෙන්වනකොට ඒ ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා ඒ අනිස්පන්න රූප ඒ වගේම මේ නිස්පන්න රූප මේවා හොඳින් අධ්‍යයනය කරන එක ඒ කියන්නේ ප්‍රසාද රූප ඒ වගේම ගෝචර රූප බාහිර තියෙන වර්ණ, ගන්ධ රූප ඒ වගේම අපි කථාකරන අධ්‍යාත්මික රූප ඒ ප්‍රසාද රූප ඒ වගේම මාතා භූත රූප රූප කතාව ඉතාමත් වැදගත් රූපය හොඳට දකින්න ඕන. රූපය ගැන ඔබට සැකයක් නැති වෙන්න ඕන.

කෙනාට මේ සමථයානික ඇත්තටම **''සමථ පුබ්බංගම ධම්මා''** කියන පැත්තෙන් එන කෙනෙකුට තමා මේ විදිහට

දකින්න විශේෂයෙන්ම සිද්ද වෙනවා. එයාට මෙන්න මේ සියුම් අවස්ථාවේ දී රූපය හොඳින් දැක්කකට පස්සේ ඔහුට නාමය දකින්න සිද්ධ වෙනවා. නාමය ස්කන්ධ හරහායි තියෙන්නෙ. එතකොට ස්කන්ධ කොහොමද හැදෙන්නේ. ප්‍රසාද රූපයේ. අන්න ප්‍රසාද රූපයෙන් ආපු ආරම්භය ඒ ආරම්භය ස්පර්ශ වෙනවා මනෝ මනසට මනෝ විඤ්ඤානයට අන්න එතනදි තමයි ඔහුට නාමය මතු වෙන්නේ. අන්න එතනදි යෝගාවචරයට සිද්ධ වෙනවා ස්කන්ධ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර කියන මෙන්න මේ ප්‍රසාදයන් දන්නෙ නැනෙ මේක මේසයක්ද පුටුවක්ද කියන එක ඒක මනෝ විඤ්ඤානයෙන් දැනගන්නේ අනික ඒ තැනින් තමයි ඔහුට අවතීර්ණ වෙන්නේ මේ කොහොමද අපි දෙයක් දකින්නේ බිත්තිය, මේසේ, ඇඳ අන්න එතකොට නාමය දකින්න සිද්ධ වෙනවා. අන්න නාමයේ පරජානාති කියන පැත්තට එනවා නාම රූප වෙන්කර හොඳට දකින්න හැකියාව ලැබෙනවා කියන තැන අපි දැන් කථාකරන්නේ සමථයානිකයා ගැන අපි නැවත නැවත කියනවා විදර්ශනාඥානිකයා ගැන අපි ඊට පස්සෙ කතා කරමු. ඒ ස්වභාවය වෙනස් වෙනවා දැන් මෙතනදි දැන් මේ කියපු කාරනාව ඉතාම වැදගත් එතකොට ප්‍රසාද රූපයක් හැදෙන හැටි දැකීම ඒ ප්‍රසාද රූපයක් කියනකොට ඒක තමයි ඒ ප්‍රසාදයෙන් එන ආරම්භය එතකොට **"තින්නං සංඝති පස්සො"** කියනකොට තැන කියනකොට ඔබ දකිනවා ඇස කියන්නේ ආයතනයක් ඒ ආයතනයෙන් ඇසත් රූපයත් ඇසේ විඤ්ඤාණයත් කියන මේ තුනේ ඒ හට ගැනීම ඒ ප්‍රසාදයේ ඒ ප්‍රසාදය කියන්නේ චක්ඛු විඤ්ඥාණය අඳුනන්නේ නෑ මොකක්ද කියලා සම්මුති ප්‍රඥ්ඤප්ති හා චක්ඛු විඤ්ඤානය දැන ගැනීමක් තියෙනවා වර්ණයක් ආලෝකයත් හැඩතලයත් එහෙම නැත්නම් ශබ්දයත් ගන්ධයක් චක්ඛු විඤ්ඥාණයට වර්ණ විතරයි දකින්නේ ශෝත්‍ර විඥ්ඤානය ශබ්දයට ආරම්මන වෙනවා ඒ වගේම ගන්ධාරම්බණයක් එනවා. ඒ වගේම ජිව්හා විඥ්ඤානය රස ආරම්භණය ඒ වගේම පොට්ඨබ්බ ආරම්භණය

කාය විඤ්ඤාණය එතකොට මේ විදියට පංචායතනය මෙන්න මේ ආරම්මණ ස්පර්ශ වනවා මනසට එතකොට මනසින් තමයි හඳුනාගැනීම සිද්ධ වෙන්නෙ. අපි කියනවනෙ පෙර මතකයෙන් ගලපා බලනවා කියලා. එතකොට වේදනා සංඥා කියන්නේ මේ ඔබ පරියාය දිහා බැලුවොත් **''කින්නං සංඝති පස්සො''** කියනකොට ඒ තුනේ එකතුව ස්පර්ශ වෙනවා. මනසට එනකොට පටිඝ සම්පස්ස තමයි මෙතන තියෙන්නෙ. හඳුනා ගැනීමක් නෑ හැඩතලයක් පමණයි ඒක රූප කලාප වලින් හැඳුනු මේ ප්‍රසාද රූපයක් 54කින් හැදුනු ඒ එක තමයි හැඩතලය ඒක තමයි ස්පර්ෂ වෙන්නේ මනෝ විඤ්ඤාණයට එක තමයි තදාංග ස්පර්ශ පච්චයා කියන්නෙ මේ හැම දෙයක් අපි වර්ණයක් ගන්ධයක් රසක් මේ හැම එකක්ම මනසට එන්නේ ආරම්මණයක් විදියට එතකොට ඒක හැඩතලයක් පමණයි. ඒක හඳුනාගන්න හැඩතලයක් පමණයි. ඒක මේසයක්ද පුටුවක්ද කියලා එකක් නෑ. ඔය පංචද්වාර විඤ්ඤාණ එහෙම නැත්නම් පංච විඤ්ඤාන චක්ඛු විඤ්ඤාන ශෝත්‍ර විඤ්ඤාන ඝාන විඤ්ඤාන ජිව්හා විඤ්ඤාන කාය විඤ්ඤාන වේවා හැඩතල පමණයි. ඒ සම්මුති නාම නෑ. එතකොට ඒ ස්පර්ශය තමයි රූප, වේදනා, සංඤ්ඤා කියන්නේ. මේ වේදනාව හැඩතලයක වේදනාව වර්ණ වේදනාවක් ඒ කියන්නේ ගන්ධ වේදනාවක් ඒ කියන්නේ ශබ්ද වේදනාවක් වේදනාව කියන්නේ විඳීම විඳීම කියන්නේ මේක මොකක්ද කියලා වර්ණය වර්ණයක් විතරයි මොකක්ද කියලා නෑ. අන්න ඒකයි පටිඝය කියන්නෙ. ඒ පටිඝයට දැන් චෛතසික සිතුවිලි හැදෙනවා චිත්ත චෛතසික චිත්ත කියන්නෙ මේ පංච විඤ්ඤාන චක්ඛු විඤ්ඤාන ශෝත්‍ර විඤ්ඤාන, ඝාන විඤ්ඤාන මෙන්න මේවා චිත්ත සිතත් සමඟ සිතුවිලි හැදෙනවා. එතකොට අර ආරම්භණයක අරමුණක සිතත් සමඟ සිතුවිලි හැදෙන එක තමයි එතකොට මේ ස්පර්ශය තුලින් මෙතන පටිඝය කියලා පෙන්වන්නේ මෙතන චක්ඛු විඤ්ඤානය **''කිණ්නං සංඝති ඵස්සෝ''** මනෝ

විඤ්ඤානයට ස්පර්ශ වන තැන තමයි එතකොට ඉතාම වැදගත් මේ ස්පර්ශ වන තැන තමයි එතැනින් තමයි වේදනා, සංකාර, විඤ්ඤාන කියන ස්කන්ධය කියන තැනට එන්නේ මේ ස්කන්ධය කියන තැන ඇත්තටම මේ මනෝ විඤ්ඤානය මෙතන ඇති අපි ස්කන්ධ ගත්තොත් **ස්කන්ධානනන් ලානිනාමො ආයතනං පටිලාභො අයං වුච්චනි ජාති** ස්කන්ධයෙන් තමයි මනෝ විඤ්ඤානයෙන් තමයි පෙර මතකයන් ගලපලා බලනවා කියන එක ඔබ ධර්මයෙන් අහන්න ලැබෙන්න ඇති එවැනි සිද්ධියක් සිද්ධ වෙනවා ඒ කියන්නෙ මේසයක්, පුටුවක්, අරමුණ ආරම්භණ හා ප්‍රසාදයක් එනකොටම මනෝ විඤ්ඤානයෙන් එක සම්මුති නාමය එනවා ඒ එන්නෙ වේදනා, සංඥා, සංඛාර විදියටම තමයි. සම්මුති නාම එන්නේ නාමය එන්නේ අපි ටග් ගාලා මේසය කියලා හඳුනාගන්නවානේ මේ පටිග සම්පස්සයට ඇයි වචන සම්පස්සයක් කියන්නෙ පුටු මේස ඇඳන් කියන අදිවචයක් එක සිතුවිල්ලක් සිතුවිල්ල ආවේ කොහෙන්ද අර චිත්ත චෛතසික නිසා චිත්තය තමයි මෙතන පටිඝ සම්පස්සය ඒ ආකාර ඒ ලිංග ඒ නිමිති ඒ උද්දේශ ඇති කල්හි ඒ ආකාර ඒ ලිංග ඒ නිමිති ඒ උද්දේශ ඇති පටිඝ සම්පස්සයට ඇධිවචන සම්පස්සයක් කිව්වේ මේක කන්වර්ට් (convert) වෙනවා සිතුවිලි වලට එන ආරම්භණය ප්‍රසාදයේ හැඩතලයක් පමණයි. ඒක අපි කිව්වා කිරණයක් හැඩතලයක් විවිධාකාර නම් වලින් එන මොනවද කියලා දන්නෙ නෑ කියලා එතකොට චක්ඛු විඤ්ඤානය අඳුනන්නෑ මනෝ විඤ්ඤානය තමයි හඳුනා ගන්නේ. මේ සිද්ධිය වෙන හැකි තමයි මේ ක්‍රියාදාමය දකින්න ඕනෙ එතකොට ආයතන දෙකක කෘත්‍යයක් මෙතන තියෙනවා. පංචායතනය වගේම මනායතනය කියන එක ඒ එකතුවෙන් තමයි එතකොට මේ දැනගැනීම කියන තැනට එන්නේ. එතකොට වේදනා සංඥා කියන්නේ මේ හඳුනාගන්නවා විඳපු හැඩතලය කියන එක පෙර මතකයෙන් ගලපනවා කියන එක තමයි සංඛාර කරනවා කියන එක චේතනා කරන එක

එතකොට ඒකට තමයි දැනගැනීම ඊට පස්සෙ පොත කියලා එන්නේ ඒ හැඩතලයක් එතකොට පොත කියන එක උපමා කලොත් ඒ විදියට උදාහරණයක් අපි පොත ගත්තොත් නිතරම පෙන්නන දේ නිසා දැන් ඔබට පැහැදිලියි පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සයක් කිව්වේ චිත්ත චෛතසික කිව්වේ ඔබ දන්නවා සිතත් සමග චෛතසික උපදින්නේ චෛතසික 52 දෙපනස් චෛතසික ගැන කථාකරනවා ඒ වගේම ඔබ දන්නවා චිත්ත කියලා සිතත් සිතුවිලි මේක හොඳින් දකින්න එතකොට චිත්ත චෛතසික 52 ගැන කථා කරන වෙනම කතා කරන්න ඕන එකක් ඒ වගේම පර්යායක් තියෙනවා ඔබ දන්නවා සබ්බ චිත්ත සාධාරණ චෛතසික ප්‍රතිරණ චෛතසික වගේ චෛතසික ඔබ දැන් මෙහෙම කථා කලොත් ඔබට එන සිතිවිලි වල තියෙනවා රාගය ද්වේශය මෝහය කියලා දැන් මේ වගේ සිතුවිලිවල තියෙනවා ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, තන්හාව, ආශාව දැන් මේ අපි කියමු වචන ගොඩක් තියෙනවනේ වචනෙන් ඔක්කොම ඔය විවිධාකාර ස්වභාවය ඉස්මතු කරන සිතුවිලි වල හැදෙන සිතුවිලි බවට කන්වර්ට් වෙනවා. එන කිරනේ හැඩතලය පටිඝය චෛතිසික බවට හැදෙනවා. එතකොට එතන වේදනා කියන්නෙත් චෛතසිකයන්ට තමයි. වේදනා, සඤ්ඤා, සංඛාර සේරම චෛතසික තමයි. ඒ හඳුනා ගන්නේ වචන දැන් මෙතෙක් අපි හඳුනාගන්නේ ස්කන්ධය පොත ස්කන්ධය හරහා එතකොට මේක අපි හදාගත් එකක් තමයි පොත කියන්නේ බාහිර තියෙන එකක් නෙවෙයි මෙන්න මේ නාමය පැත්ත තමයි අපි නාමයේ පරජානාති කියන තැනට එන්නේ රූපයේ පරජානාතී **''ඉති රූපං''** කියන තැනින් ඉති රූපං සමුදයො අත්තගමො කියන තැනට හටගැනීම ඒ වගේම අන්තගමය නැතිවීම ඒ එතැනම එතැනට හට ගත් තැනම නැතිවෙනවා. රූපය කියන එක එතකොට මේක තවත් ටිකක් හොඳට ඉස්සරහට තව තියෙනවා. අපි විග්‍රහ කරලා මේක හැදෙන හැටි එතකොට අපි පොත කියන එක හදා ගන්නවා. පොත කියන එක එතකොට මේ එක හැඩතලය වර්ගය ඔස්සේ

පොතක් එනවා නෙමෙයි පොත කියන එක අපි හදාගන්න එකක් එතකොට අපි මෙතන දී ඇසුරු කරන්නේ පොතක් අපි දන්නේ පොතක් මේසයක් ඇඳක් එතකොට පොතක්, මේසයක්, ඇඳක් කියන එක චක්ඛු විඤ්ඤාණය දන්නේ නෑ. උදාහරණ දිගට ම ගමු. එතකොට අපි මේ මනෝ විඥානයෙන් දැනගන්නේ මෙතන අපි රූපය පොත රූපය කියලා අපි කියන්නේ රූප කියලා පොතට මේසෙට ඇඳට. එතකොට මේ රූපය මේසේ, පොත, ඇඳ කියන එකනම් අපි කියන්නේ අපි ඒක හදාගත්ත රූපයක් මෙන්න මේකයි වැදගත් වෙන්නේ. ඇත්තට ම අපි රූපයක් කියලා කථා කරන්නේ මනෝවිඤ්ඤාණයෙන් නාමයෙන් ම හදා ගත්ත එකක්. ඒකයි නාමය පරජානාති නාමය හරියට දැනගත්තොත් තමයි ඔබට රූපය හරියට දැනගන්නේ. මේක තමයි මේ භාවනාවේ තියෙන වැදගත්ම කොටස්. මේක විපස්සන භාවනා පැත්තටයි සමථ භාවනා පැත්තෙන් හැරෙන තැන තමයි මේ අපි කතා කරන්නේ. ඉතිං විපස්සනා භාවනාවකින් තොරව ඔබට නිවන් මගකුත් නැහැ. සමථයානිකයා උනත් අවසානෙදි ඒක විපස්සනා භාවනා පැත්තට හරවගන්න ඕන. මේක මනා කොට දකින්න ඕනෙ. අපි කලින් කිව්වා මේ විපස්සනා භාවනාවට එන තැන එතකොට ඥාන පරිඤ්ඤා කියන තැන තිග පරිඤ්ඤා කියන තැන පහාන පරිඤ්ඤා කියන තැන පරිඤ්ඤා තුනකට මේ ධර්මයේ සඳහන් වෙනවා. ඒ වගේම ඔබට සබ්බ වග්ගය එතකොට සංයුක්ත සලායතන සංයුක්තය පඨව අප්‍රජානක සූත්‍රවල ඔබට දකින්න ලැබෙනවා. මෙන්න මේ පැහැදිලි කරන මාලාව **''ඉති ඉමස්මිං සුත්තේ තිස්සාපි පරිඤ්ඤා කතිතා හෝ හොන්ථි අභිඤ්ඤා අභිඤ්ඤාති වචනේන ඤානේන පරිඤ්ඤා කතිථා පජානාන්ති වචනේන තීරන පරිඤ්ඤා විරාජයං පජහන්ති ද්විහි පහාන පරිඤ්ඤං''** එතකොට මේකේ තේරුම කියනවානම් සියල්ල දැනීම යනු ඥාණ පරිඤ්ඤා සියල්ල තේරුම් ගැනීම යනු තීරණ පරිඤ්ඤා බවත් සියල්ලේ නොඇලීම ප්‍රහාන පරිඤ්ඤා බවත් මෙන්න

මේ සූත්‍රය තුල පැහැදිලි කරන කාරණය සූත්‍ර ගොඩාක් තියෙනවා මේ විදියට මීන් එහාට මේ ගැන කථා කරන්න යන්නේ මේ සූත්‍රත් එක්ක දැන් මීකේ අදහස ඔබ බැලුවොත් එහෙම නාම රූපවල ඒ තියෙන යථාස්වභාවය දකින එක මෙතනදී ඉතාම වැදගත් වෙනවා. මේ ස්කන්ධ කියන තැන විපස්සනා ඥානය ප්‍රධාන උපාදානස්කන්ධ 5 දැකීම හෝ ප්‍රධාන කොට වෙන්නේ එතකොට මෙතන ඒ හැම තැනදීම මෙතන ඒ වගේම තව දෙයක් තියෙනවා අපි ඒ විපස්සනාවෙන් මෙය හටගැනීම ඇති වී මනැති වීම දකින එක අනිත්‍ය, දුක්ඛ, අනාත්ම දකින එක. ඉතිං ඉතාම වැදගත් මේ කියන කාරණා ඉතිං අපි මේ විපස්සනා භාවනාව තමයි ඇත්තට ම දකින්න ඕනේ. දැන් මෙතන අපි දැන් කිව්වා නේ මේ අර ප්‍රහාන පරිඤ්ඤා නැතිවීම දකින එක එතකොට තීන පරිඤ්ඤා එතකොට තේරුම් ගැනීම එතකොට ඥාන පරිඤ්ඤා එතකොට සියල්ල දැනගන්න එක එතකොට මේ එන්නේ චිත්ත විශුද්ධිය. දැන් අපි චිත්ත විසුද්ධියෙන් දිට්ඨි විසුද්ධියට එනකොට චිත්ත විසුද්ධිය මේක හොඳින් දැනගන්න ඕනෙ තැනක් තියෙනවා. මේ විපස්සන භාවනාව තුළ තමයි චිත්ත විසුද්ධිය දිට්ඨි විසුද්ධියට චිත්ත විසුද්ධියට එනකොට ඒ කෙනා දැනගන්නවා දැන් අපි පෙළ දහම පෙන්නුවා. අපි පර්යාය පෙන්නුවා. එතනදී අපි පෙන්නුවා අපි හදාගන්න දෙයක් තියෙන්නේ පොත කියන්නෙ අපි හදාගන්න එකක් අපි කිව්වා **තින්නං සංගති ඵස්සෝ ඇසත් රූපයත් චක්ඛුං පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං** මේ පෙන්නන සළායතන සූත්‍රවල ඔබ පෙන්වන දකින්න ලැබෙනවා. **''චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්නං සංගති ඵස්සෝ''** එතකොට එතනින් ස්පර්ශ වෙන්නේ ප්‍රසාද රූපය එතනින් එතකොට එන්නේ **''තිණ්නං සංගති ඵස්සෝ ඵස්ස පච්චයා වේදනා යම් වේදන්ති තා සංජානන්ති යං සංජානාති තා විතක්කේති යම් විතක්කේති තං විජානාති''** ඒ කියන්නේ පජානාති කියන්නේ රැවටෙනවා. රැවටිලා බාහිර තියෙන්නේ

පොතයි කියලා අල්ලාගන්නවා. ඒක උපාධාන කරගන්නවා. ස්කන්ධයට ම ස්කන්ධය කියන්නේ වේදනා සඤ්ඤා සංඛාරනේ. රූප වේදනා සංඤ්ඤා සංඛාර ස්කන්ධය එතකොට ඒ හදාගත්ත රූපය උපාදාය රූපයක් උපාදාය රූපයක් කියන්නේ බාහිර තියෙන එකක් නෙමෙයි. උපාදාය රූපයක් කියන්නේ අපි හිතින් හදාගත්ත රූපයක්. ඒක අපි බාහිරට උපාදාන කරගන්නවා. අර එන ආරම්මනයේ බාහිර සතරමහාභූත පෙන්නලා කියනවා අන්න අරකයි අපි දැක්කේ කියලා. අපි බාහිර තමයි හැම තිස්සේම පාදක කරගෙන තිබ්බේ. මහා භූත මහා මහා භූත වලට තමයි අපි අවසානයේ පෙන්නන්න යන්න හදන්නේ. එතකොට එතන තමයි රැවටීම විජානාති කියන්නේ. ඒක තමයි අපේ අතින් වෙන වරද රැවටීම. එනිසා තමයි අපි බාහිර ඉන්නවා කියලා හිතන්නේ. නමුත් මේක ප්‍රසාද නිසා හටගත්ත චිත්ත ලෝකයක්. ඒකයි මේකේ ගැඹුරුම තැන. ඒකෙයි විදර්ශනා නුවණ. එකෙයි නාමයේ පැත්ත එතකොට මෙතන දී අපි අවසානයේ දී රූපය කියලා චිත්‍රයක් මයි ඒක හඳුනාගන්න තමයි මේ නාම නාමය ඉතා වැදගත් වෙන්නේ. නාමය හරියට දැනගත්තොත් ඔහුට අවබෝධ වෙනවානේ මේ අඳුනාගත්තේ අවසානයේ දී චිත්තයක් මයි කියන එක. මොහු චිත්තයම තමා බලනකොට අඳුනාගෙන තියෙන්නේ. නාමය විදිහට රූපය විදිහටත් දැන් අවසානේදී අපි ගැටගහලා තියෙන්නේ දෘෂ්ටියකින් තමයි රූපය කියලා. ඒක දෘෂ්ටියක් නමුත් ඒක චිත්තයක්. ඉතිං මේ රූපය හරියට අවබෝධ ආයිමත් එතකොට තමයි මේක තේරෙන්නේ. අනිත් එක මෙතනදී ඉතාම වැදගත් දෙයක් තියෙනවා කියන්න. ඒ තමයි දැන් මෙතන එතකොට එන්නේ දැන් මෙතන ආරම්මනයන්මනේ ඇහැට චක්ඛු විඤ්ඤානයට වර්ණය කියන ආරම්මනය එනකොට දැන් මෙතන ස්පර්ශ වෙනවානේ මනසට මනෝ විඤ්ඤානයට චක්ඛු විඤ්ඤානය එතකොට මනෝ විඤ්ඤානයනේ මේක දැන් පොත කිලයා දකින්නේ. හැබැයි මෙතන දී මුලින් එන්නේ අපිට

කිරණයක්නේ පටිස සම්පස්සයට අධිවචන සම්පස්සයක්නේ. චෛතසික හැදෙන්නේ ඊට පස්සේනේ. දැන ගැනීම් එන්නේ එතකොට මේ දැනගන්නේ බාහිර තියෙන එකේ කියලා ආයිමත් බාහිරට යැමක් තියෙනවා නේද හොඳට බලන්න. දැන් මුලින් එන්නේ කිරණයක්. ඒක ඊට පස්සේ පොත කියලා අපි හදාගන්නවා. ඊටපස්සේ අපි හදාගත්ත අපි චිත්ත රූපයක් හදාගත අපි ඒක මනෝ විඤ්ඤානයක්නේ  හදාගන්නේ ඒක ඇවිල්ලා ස්කන්ධය නාමයෙන් එන්නේ නාමයෙන් හදාගන්නේ එතකොට එක අපි ආයේ එළියේ තියෙන්නේ කියලා ගැට ගහනවා. අර එතකොට මේ එලියෙන් ආපු තීරණය නැවත අපි එලියට දාලා අරකයි කියලා අපි ගැටගහන්නේ නාමයක් පොත කියලා. එහෙම එකක් නෙමෙයි ඒ වුනාට ආවේ. ආවේ හැඩතලයක් තීරණයක් විතරයි. නමුත් ප්‍රසාදයෙන් ආවේ නෑ. ඒක ප්‍රසාදයෙන් ආවේ හැඩතල තීරණ විතරයි. නමුත් ඒක අපි ආයි එලියට දාලා බලන්නේ පොතක්. එතකොට ඒක අපි හදාගත්ත එකක්. ඒ පළවෙනි වට්ටං **''වට්ටං වට්ටති''** කියලා පලවෙනි වටේ එන්නේ කිරණයක්. ඒකේ දැනගැනීම වෙන්නේ මනෝ විඤ්ඤානය. නමුත් අපි දකින්නේ කෙලින් ම කිරණයක් කියලා නෙමෙයි. පොතක් දැන් ඔබට සිතට ආරම්මනයක් ඔබට අරමුණක් එනකොට දැන් අරමුණනේ සිත කියන්නේ. ඒත් දකින්නේ ඔබ පොතක් ඔබ කිරණයක් දකිනවා කියලා කියන්නේ නෑනේ. ඔබ දකින්නේ පොතක්. පොත කියන්නේ අපි නැවතත් හදාගෙනයි බලන්නේ. එතකොට නැවතත් ඇහැ ඇරලා බලනවා මේක අපිට පේන්නැති උනාට බොහොම වේගයෙන් සිද්ධ වෙනවා. එතකොට ඔබ දන්නවා මේ මේවට යන කාලය චිත්තක්ශන 17 යි. එක සිතක් උපදින්න යන කාලය එතකොට චිත්තක්ශන 17 කි. එක සිතක් උපදින්න යන කාලය කියලා පෙන්නනවානේ එතනත් ඔබ බලන්න එතනත් ලොකු කථාවක් තියෙනවා. චිත්ත වීථි පෙන්නන්නේ ඇයි. චිත්තවීථිවල චිත්තක්ශන 17 ක් එක සිතක් උපදින්න යනවා කියන්නේ චිත්තක්ශන 17ක් කියන්නේ දැන් ක්‍ෂන 17ක්.

එතකොට ක්‍ෂණ 17ක් කියන්නේ එතනත් උප්පාදතිඨිභංග කියලා දැන් මෙතනත් රූප කලාප දැන් මේ අපි දකින රූපය කියන එකනේ. මේ කතා කරන්නේ චිත්තක්ෂන 17ක් තුනක් තියෙනවා. මේ ඒ කුඩා ශත 03ක් එකතුවෙලා තමයි ඒ මහා ක්‍ෂණයක් හැදෙන්නේ. එතකොට එතන ගත්තොත් ඒ තුනේ ඒවා දාහතක් එකතුවෙලා එහෙම උනොත් 51 වෙනවා. කුඩා ක්‍ෂණ 51 තියෙනවා. ඔය චිත්තක්ෂන 17 චිත්තක්ෂන කුඩාම මේ වේගය ගැනයි මේ කතා කරන්නේ. දැන් සිතින් මේ හැදෙන චිත්ත විථියක් නැත්නම් සිතන වේගය ගැන පෙන්වන්නේ ඒ රූප කලාප දකින කොට දැන් මේ දකින කොට වේගයෙන් සිද්ධ වෙනවා චිත්ත ක්‍ෂණ 17 කින් ඒ කියන්නේ චිත්තක්ශනයක් කුඩා ක්‍ෂණ 03 න් තමයි මහා ශතයක් හැදෙන්නේ. උප්පාද තිඨි භංග කියන්නේ ඇතිවීම පැවතීම නැතිවීම කියන එක තමයි මේ ගන්නේ...... ශතයක කුඩා ශතයක් කියලා කුඩා ශත 3 ක් කියලා ගන්නේ. ඒ තුනක් තමයි ඔබ දන්නවා භවාංග සිත ඒ වගේ ම භවාංග චලනය භවාංග උපච්චේද මේ වගේ මේ විදියට නිද්‍රාගතව තියෙනවා. මනෝ විඤ්ඤාණය එතන කථාවක් තියෙනවා. මේවා මේ කොහොමද චිත්ත විථි යන්නේ තියෙනවා. සම්පටිච්චන්න සන්තීරූවොත්තපන හා ජවන් කියලා ඊට පස්සේ ජවන් 7න් ඊට පස්සේ වොන්නපන කියලා මේක ඔබ දැනගැනීම කියන තැනට. එතකොට සම්පටිච්චන්න සන්තීරණ වොත්තපන කියන ජවන් ජවන් කියන්නේ එතකොට සංකාර කරන එක එතකොට සම්පටිච්චන්න මේ මෙතන කියන්නේ එතකොට වේදනා සඤ්ඤා සංඛාර ම තමයි. සංඤ්ඤාවෙන් දැනගන්නේ. එතකොට වේදනාවෙන් එන වේදනාව දැනගන්නේ එතකොට සම්පටිච්චන්න සන්තීරණ ජවන් ජවන් කියන්නේ එතකොට සංකාර කරන එක. එතකොට අවසාන දැනගැනීම තමයි එය වොත්තපන කියලා විඤ්ඤානයට එන්නේ. එතකොට ස්කන්ධයම තමයි මේ වෙන විදියකින් පැහැදිලි කරන්නේ. මේ මෙතන වේගය චිත්තක්ශන 17න් එක සිතක් උපදිනවා කියලා

චිත්තක්ශන 17න් එක සිතක් උපදිනවා කියන එකේ වේගයක් තියෙනවා. ඒ වේගය තුලයි මේක සිද්ධ වෙන්නේ. එතකොට මේ වේගය කියන එක අපි අවසානයේ දී ඔක්කොම ගලපාගෙන යනවා. ඉතාම ලොකු කථාවක් කියන්න යනවා. ඒක නිසා දැනට අපි එකින් එක වෙන් කරලා ඔබට පෙන්නලා දෙනවා එතකොට මේ චිත්තක්ශන 17න් කොහොමද එක සිතක් ඉපදුනේ කියන එක. මේ සිතක් කියලා අපි කතා කරන්නේ අවසානයේ දී රූප කලාපයක්නේ. එහෙමනේ යන්නේ එතකොට ඒක අපි අවසානයේ පොතක් කියලා ගන්නවා. මෙතන වට්ටන් වට්ටති කියන එක දිහා බැලුවහම පේනවා ඇහැට එන්නේ කිරණයක් අපි පොතක් කියන එකක් අපි චිත්ත රූපයක් අපි චිත්තයක් සිතුවිල්ලක් ඒ සිතුවිල්ල තමයි අපි පරිහරණය කරන්නේ. ඔන්න ඕකයි ඇත්ත. නාමයේ දී ස්කන්ධ කියන්නේ සිතුවිල්ලක්. සිතුවිල්ලක් අපි පරිහරණය කරන්නේ අද දකින්නේ කෙලින්ම සිතුවිලි. අපි මහා භූත ආදේශ කරගන පමණයි. අපි රැවටිලා ඉන්නේ ඔය රැවටීම දකින්න හරි අමාරුයි. ධර්මය මනා කොට නුවනින් තීක්ෂණ නුවනින් මේ ඥානයෙන් අභිඥ්ඥාවෙන්ම දැකිය යුතු කාරණයක් අපි නිතරම කියනවා අභිඥ්ඥාවෙන් දකින්න කියලා. ඒකට හේතුව මේවා සිතට පේන් නැහැ. මහා නුවනකට හසුවෙනවා. මෙන්න මෙහෙම සිද්ධියක් සිදුවෙනවා කියලා එන්නේ කිරණයක් දකින්නේ පොතක්. මේ දෙක දෙකක්. පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සක් කිව්වේ. අපි දකින්නේ සිතුවිල්ලක් එන්නේ කිරණයක් කොහොමද ඒක උනේ. අන්න ඒක වෙච්ච හැටියි දකින්න ඕන. එන්නේ කිරණයක් දකින්නේ සිතුවිල්ලක් අපිට පේනවා නෙමෙයි අපි හිතනවා වට්ටං කිරණයක් වට්ටති සිතවිල්ලක් මේ අපි පෙන්නන්න යන්නේ වට්ටං වට්ටති දෙවන වටයක් කැරකෙනවා කියන එක. මේක චිත්තක්ශන 17 දී වේගයෙන් සිද්ධ වෙන සිද්ධියක්. මේ වේගය නිසා තමයි අපි රැවටෙන්නේ කියන එක. මේකේ වේගයේ ලොකු කථාවක් තියෙනවා. මේ

වේගයක් තමා අවසානයේ හැම දේකම තියෙන්නේ. ඒක අපි ලිහලා පෙන්වන්නම්. අපි අවසානෙට තව තව ගැඹුරට අදියර ගානකට මේ විදියට දේශනා කරගෙන යන කොට තමයි ඔබට ඒක අහන්න ලැබෙන්නේ. නැත්නම් ඔබගේ ඥානයට මේක අසුවෙන්න ඕන. ඔබට එවැනි ඥාන අවධි උනොත් ඔබට මේක අසුවේවි. එතෙක් කාටවත් අසුවෙන්නෑ. මේක මස් ඇහැට පේන් නෑ. මේක ඥානයකටයි අසුවෙන්නේ. මේක සිතට සිතලා යන්න බැහැ. නමුත් ඔබගේ සිහි ඥානයට මේක හසුවෙනවා. අපට එහෙම තමයි කියන්න සිදුවෙනවා. සිතුවිල්ල අභිබවා ගිය තැනක්. සිතුවිලි කියන්නේ ඔබට පේන දේ. ඔබ පොතක් කියලා දකින්නේ සිතුවිල්ල. සිතුවිල්ල කියන්නේ එතනට. ඒක තමයි ස්කන්ධානන් ඒක තමයි ස්කන්ධය. උපාධාන කරගන්නේ. ඒකමයි පොත කියන්නේ. උපාදාන රූපය කියන්නේ බාහිර එකක් නෙමෙයි. මේක නාමයක් චිත්ත රූපයක් චිත්ත රූපයක් කියන්නේ සිතුවිල්ලක්. ඔබ ඉන්න සිතුවිල්ලෙන් පිට ඔබ ගිහින් නැහැ. චිත්තේන ලෝකේ කියන්නේ ඒකයි. ඒ නාමය හොඳින් දකින කෙනාට තමයි මේ ස්කන්ධ මේ විදියට දකින්න ලැබෙන්නේ. ස්කන්ධය මේ විදිහට දැක්කොත් තමයි ඔබට මේ නියම චිත්ත විසුද්ධිය ඇති වෙන්නේ. චිත්ත විසුද්ධිය කියන්නේ මේ නාම රූප හොඳින් දකින එක. මේ නාම රූප හොඳින් අධ්‍යනය කරලා මේ දකින දැකීම තමා සම්මා දිට්ඨියට හේතු වෙන්නේ. සම්මා දිස්ඨිය කියන්නේ බාහිර ඇත්තවුන තැන තියෙන්නේ මිත්‍යා දෘෂ්ඨියක්. නමුත් මේක සිතයි කියලා දකින එක සම්මා දිට්ඨියක්. මෙතනයි චිත්ත විශුද්ධිය තියෙන්නේ. චිත්ත විශුද්ධිය ඇති කෙනාට තමයි මෙන්න මේ සිත හැදෙන හැටි දකින කෙනාටයි චිත්ත විශුද්ධිය ඒ චිත්ත විශුද්ධිය ඇති කෙනාට තමයි දිට්ඨී විශුද්ධිය එන්නේ. ඒ සම්මා දිට්ඨිය කියන එක එන්නේ සම්මා දිට්ඨිය තුළ එක මහා ගැඹුරුයි. ඒ කියන තැන ඒ චිත්ත විශුද්ධියක් නැතුව දිට්ඨී විශුද්ධියක් නැති වෙන්නෙ ඒකයි. එතන ඔබ බාහිර ඇත්තක් වෙන්නේ නැහැ. ඔබගේ සිත

තුළ හැදෙන ලෝකයක් බාහිරින් ඔබට හම්බවෙන්නේ නැහැ. මෙතන දිට්ඨි විශුද්ධියට එන කොට සිතෙන් පොත් කියලා දෙයක් නැහැ. මනෝ විඤ්ඤානයේ එහෙම දෙයක් නැහැ. මනෝ විඤ්ඤානයට ආයතනවලින් බාහිරයට එන්න බැහැ. මේ අවබෝධය ඇතිවෙන්නේ දිට්ඨි විශුද්ධියට චිත්ත විශුද්ධිය දිට්ඨි විශුද්ධිය ඉතාම වැදගත් වෙනවා. මේ නිවන් මග යන කෙනෙක්ට මේවා පර්යාය තුළ විවිධාකාර විදිහට අහන්න ලැබෙනවා. දකින්න ලැබෙනවා. මේ මෙතන සප්ත විශුද්ධිය හරහා මේ කාරණාව පෙන්නුව. ඔබට අපි එතකොට ශිල විශුද්ධිය චිත්ත විශුද්ධිය දිට්ඨි විශුද්ධිය එතකොට මෙතන සැකයක් නැතිවෙන්න ඕනෙ. කංඛාවිතරණ විශුද්ධිය ඒ වගේම මග්ගා මග්ග විශුද්ධිය ඥාණදර්ශන විශුද්ධිය මේවා පටලවාගෙන යන්නැතුව ඔහු යන්න ඕනේ. මග්ගා මග්ග ඥාණදර්ශන විශුද්ධිය එහෙම උනොත් තමයි ඒ කෙනාට පටිපදා ඥාණදර්ශන විශුද්ධියට එන්න හැකියාව තියෙන්නේ. ශිල විශුද්ධිය චිත්ත විශුද්ධිය එතකොට චිත්ත විශුද්ධියට එතනින් නාම රූප වල සැබෑ යථාර්ථය දකින එකක් කංඛාවිතරණ විශුද්ධිය ඒකේ සැකයක් නැතිව නුවණින් දකිනවා. ඒ වගේම මග්ගා මග්ග ඥාන දර්ශන විශුද්ධිය ඔහු මග නොමග පටලවා ගන්නැතුව දකින එක පටිපදා ඥාණ දර්ශන විශුද්ධිය කියන්නේ දස ඥාණ දස ඥාණ අවධිවන ආකාරය ඥාණ , භය ඥාණ, භයතු පට්ඨාන ඥාණ, මුංචිතු කම්මතා ඥානය පස්සනා ඥානය, පටිසංකානු ඥාන සංඛාර උපේක්ෂා ඥාන මේ නිවන් මග මේ සප්ත විශුද්ධිය ඔබ එනවා කියන්නෙම දස ඥාණවලට ඔබ නිවන් මගයි අවසාන කටයුතුයි සිද්ධ වෙන්නෙ ඒ කියන්නෙ මේ මහා ඥාන අවධිවන තැන මේ ඥාන මහා ඥාන අවධිවන තැන මහා ගැඹුරු තීක්ෂණ දැකීමක් සිද්ධවෙන්නේ ඒ සමාධිමත් සිතට පමණයි. ඒ සමාධිමත් සිතින් දකිනවා කියන්නේ මේක මෙතන ආකාර දෙකකින් අපි කිව්වා කියන්න ඕනෙ කියලා. ඒ වගේ ම සමථයානික යෝගාවචරයින් සමථය හොඳින් වඩලා සමාධි

හොඳින් ඇති කරගෙන ප්‍රථම ධ්‍යාන ද්වීතික ධ්‍යාන තෘතීක ධ්‍යාන චාතුර් ධ්‍යාන මට්ටමට සිත සියුම් කරගෙන විතක්ක විචාර සන්සිඳවාගෙන ප්‍රීති සුඛ ඒකාග්‍රතාවයට ඇවිල්ලා මේ සිත සිතටම සිතේ සත්‍ය දකින කෙනා අන්න ඒ කෙනාට විපස්සනා විදර්ශනාවට යොමුවෙනවා. මේකේ සත්‍ය දකින්න ගන්නවා ඥාන අවධිවෙනවා. ඇති වෙන නැති වෙන ස්වභාවය පේනවා. හැබැයි ඒ සමථයානිකයා නමුත් ශුෂ්කයානික රහතන් වහන්සේලාටත් ඒ වගේ ම ගමනක් තියෙනවා. හැබැයි මෙතන දී නිවන් මග අවසානයේ දී සමථ විපස්සනා යුගන්ධන ගමනක් යන්නේ අපි ඒක මූලින් කියලා ඉන්න ඕනේ. නැත්නම් පටලා ගන්නවා. මේ කථාව මොකද සමනය අවශ්‍ය වෙනවා. සිත විසිරෙන කෙනෙකුට විද්‍යුත් නුවණක් තිබ්බත් මේවා පේන් නෑ. ඒක නිසා විදර්ශනායානිකයාටත් සමථය අවශ්‍යවන අවස්ථා තියෙනවා. හැබැයි විදර්ශනායානිකයා මේක කෙලින් ම දකිනවා. මේ පේනවා නෙමෙයි. හිතනවා. කියන එක. එතන සමනය හුඟක් වඩලා ආවේ නැති උනාට එයා ඒවා කෙලින්ම දකිනවා. එයා දකිනවා. මේ පේනවා නෙමෙයි හිතනවා කියලා එයා දකිනවා. සිතුවිලි තියෙන්නේ කියලා ඒ විදර්ශනා-යානිකයාගේ දැක්ම එතකොට විදර්ශනායානිකයා ගැනත් එතකොට ධර්මය තුළ හොඳින් පැහැදිලි කෙරෙනවා. මේ ඛනික සමාධියක් උපදින්නේ කියලා ඛණික සමාධිය කියන්නේ සමථයානිකයාට උපදින සමාධිය ඒක නිමිත්තක සිත පිහිටවාගෙන තියෙන්නෙ සති නිමිත්තක සිත පිහිටවාගෙන එකම නිමිත්තක සිත පිහිටවාගෙනයි තියෙන්නෙ. නමුත් ශුෂ්කයානික රහතන් වහන්සේගේ ස්වභාවය විදර්ශනා ශානිකයාට ඛණික සමාධියක් උපදනවා කියන්නේ එන එන අරමුණේ සිත ඇති වන නැති වන ආකාරය දකිනවා. එතන එතන ම ''තනු තනු විපස්සතී'' කියන තැන තත්‍ර තත්‍ර විපස්සති කියන්නේ එතන එතන ඇති වන ආකාරය දකිනවා කියන්නේ ''අනිමිත්ත සමාධියක්'' උපදින්නේ දැන් මේ සිතට අරමුණක් එනවා. පොත දකින සිත සිතට සත්‍ය දකිනවා. ඒ සිත බාහිර

නෙවෙයි තමන්ගේ ''සිතම'' කියලා ඒ සිතේ සත්‍ය දැකලා ඒක භාහිරත් නෙමේ තමන්ගේ සිතෙන් එහෙම දෙයක් නෑ කියලා දකින තැන ඒ උදීනවා සමාධියක් ඒක නිමිත්ත අනිමිත්ත බවට පත්වෙනවා. ඒක විඥ්ඥානය අති දස්සන වෙනවා. තව විදියකින් කියනවා නම් ඔබට කේවට්ට සූත්‍රවල බ්‍රහ්ම නිමන්තනික සූත්‍රවල දකින්න ලැබෙන විඥ්ඥානං **''අනිදස්සනං අනන්තං සම්භතෝ පභං එත්ථ ආපෝච, පඨවි, තේජෝ, වායෝ නගාරති එන්න දිසංච රස්සංවා අනාකුලං සුභා සුභං''** කියන තැනට එනවා. ඒ කියන්නේ ඒ සමථවිපස්සනායානිකයා දකිනවා. මේ විඥ්ඥානය අනිදස්සන වෙනවා කියන්නේ දර්ශන පථය නැති වෙනවා මේ ඇතිවුනේ එක දැනගැනීම. ඒ දැනගන්න ගමන්ම ඔහු දැනගන්නවා මේ සියල්ලම මායාවක් භාහිරත් ඇත්තත් නෙවෙයි කියන එක. ඔහු ඒ වගේම දකිනවා සිත තුළත් එහෙම දෙයක් නෑ. සිතක් ඇත්තක් නොවන බව. එතකොට විදර්ශනානිකයා බොහොම සමථයානිකයා වගේ සිත එක නිමිත්තක් අල්ලන් ඉන්න කෙනෙක් නෙමෙයි. එන එන නිමිත්ත අත්හරිනවා. දැකලා එනකන් ඒ අත්හැරීම තුළ උදයවස ඥාන ඒ උදය වැය දකින ඥානය එතකොට ඒ අත්හැරීම ඛනික සමාධියක් විදිහටයි ඒ සිත දැක්කා එතනින් ම ඒ සිත අනිමිත්ත බවට ද පත්වෙනවා. සිතේ සත්‍ය දකිනකොට විදර්ශනායානිකයා විදසුන් නුවනින් දකින්නේ එන අරමුණ සත්‍ය දකිනවා. බාහිරත් නෙමෙයි සිතත් නෙමෙයි කියලා එතකොට පිහිටන්න තැන නැතිවෙනවා. අනිමිත්ත වෙනවා. නිමිත්තක් හම්බවෙන්නේ නැහැ. අනිමිත්ත සමාධියක් උපදිනවා. ඒක ඛණික සමාධියක්. ඒ එතන එතන ඇති වෙලා නැතිවෙන සමාධියක්. ඒකම ඒකම සමාධියක් විදිහට එකම ස්වභාවයක් විදිහට නිමිති නැති ස්වභාවයක් දකින එක තමා ඛණික සමාධිය කියන්නේ ඛණික සමාධිය ඛණික සමාධිය එකම නිමිත්තක් අල්ලන් ඉන්න එකක් නෙමෙයි පැහැදිලිව කියනවා නම් දැන් එතකොට ඔබට ඒ කාරණාවත් පැහැදිලියි. ඛණික සමාධියක් ගැන විදර්ශනා

භාවනා යෝගියාගේ ඉතාම වැදගත් තැනක් මෙතන දි විපස්සනා භාවනාවේදී රූප පරිග්ගහා මේවා ඉතිං කියනවා නාම රූප පරිග්ගහ, අරූප පරිග්ගහ, පච්චේ පරිග්ගහ, ඥානය එතකොට ධ්‍යාන පරිග්ගහා වගේ ඕනම ධර්මය තුළ තියෙනවා බැලුවොත් විශාල පැහැදිලි කිරීම් ටිකක් ඔබට දකින්න ලැබෙනවා. ඒ වගේ ම නාම රූප පරිච්ඡේදය ඥානය නාම රූප වෙන්කර දකින ඥානය පච්චේ පරිග්ගහ ඥානය එතකොට මේ හැම අපි සංඛාරයක් කියන්නේ සිතින් හදාගත්ත දෙයක් සංඛාරයක් කියන්නේ බාහිර තියෙන දෙයක් නෙමෙයි. පොත කියන්නේ සංඛාරයක් පොත කියලා දෙයක් බාහිර නෑ. එතකොට සංඛාරයක් පච්ංචි පරිග්ගහ ඥානය කියන්නේ මෙන්න මේ සංඛාර ඇති වන ස්වභාවය දකින එක කොහොමද පොත කියන එක හැදුනේ අපි පැහැදිලි කරපු ආකාරය දකිනවා. ඒ වගේ ම සම්මර්ශන ඥානය'' කියන්නේ මේ ඇතිවන නැතිවන මේ අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන ඒ ත්‍රිලක්ෂණ දකිනවා කියන්න පුළුවන් පර්යාය විදිහට මේ කතා කරන්නේ ප්‍රායෝගික පැත්තේ දී ඔබට මෙය දකින් ලැබෙනවා. එකම කථාවක් විදියට දකින්න ලැබෙනවා. නාම රූප පරිච්ඡේද ඥානය පච්චේපරිග්ගතා ඥානය සම්මර්ශන ඥානය ඒ වගේම උයද වැය ඇති වන නැති වන ඥානය මේ එන එන අරමුණ ඇති වන නැතිවන ඥානය ඒ උදයවැය දැකීමේ ඥානය තමයි මෙතන බිඳී බිඳී යන ස්වභාවය දකින එක භය ඥානය ඇතිවෙන්න හේතුව. එවිට භයකු පට්ඨාන ඥානය කිසිම දෙයක් මේ ලෝකයේ ඇත්තවෙන්නෑ. හම්බවෙන්නේ නෑ. ඒක රූප කලාපවලින් දැක්කත් ඒක ඒ විදියටත් එනවා. මේ විදියටත් එනවා දැක්කත් ශුෂ්කයානික මෙතන ඛණික සමාධිය තුළ විදශනායානිකා රහතන්වහන්සේ නැත්නම් මේ සමථයානික රහතන්වහන්සේ වගේම ශුෂ්කයානික රහතන් වහන්සේ මේ දෙන්නම එකම ගමනක් තමයි අවසානෙදි යන්නේ. සමථයානිකයා වුනත් සමථය වැඩුවා උනත් විදර්ශනා විපස්සනා භාවනාවෙන් තමා නිවන් දකින්නේ. ඉතිං ඒ කෙනා

අවසානයේ දී විපස්සනාවට යොමු කරන්න ඕනේ. එතකොට අපි සමථය තමයි මුලින් ඒ කෙනාට එන විදිහට රූපය ''පජානාති'' රූපය අවබෝධ කරගන්න ඕනෙ. ඒ කෙනා නාමය පජානාති නාමය අවබෝධ කරගන්නවා. අන්න නාම රූප පරිච්චේදය නාම රූප හොඳින් දකින්න ඕන. සමතයානිකය පැහැදිලි කරගෙන ආවේ නමුත් විදර්ශනා යානිකයාගේ ස්වභාවය අපි දිගටම කිය කිය හිටියේ ඒ තුළ නිතරම කිව්වා පේනවා නෙමෙයි හිතනවා. අපි ඒවා කිව්වෙ අනිමිත්ත සමාධියක් මෙතන නිමිත්තක් ප්‍රකට වෙන්නේ නෑ. ඒ අපි කිව්වේ ශුෂ්කයානිකයා සමථයානිකයා නෙමෙයි. නමුත් ඇත්තට මේ දෙන්නම කරන්නේ අවසානයේ දී එකම ගමනක් යන්නේ යුගන්ධන සමථ විපස්සනා දෙකම එකතුවුණු ගමනක් දැන් මෙතනදීත් තව අදියර කිහිපයක් ඉස්සරහාට තියෙනවා. ඔබට පැහැදිලි කරන්න නාම රූප පරිච්චයේ දී තව අපි මෙතන දී ඉස්මතු කරන්න උත්සාහ කළේ එතනදි දසඥානවලට අවධිවන තැන එතනදි උයද වැය දකින ඥානය භය ඥානය, භයතු පට්ඨාන ඥානය මේකේ ආදිනව දකිනවා මෙයා කැමතිවෙන්නෙ නෑ. බොරුවට රැවටිලා ඉන්න ලෝකය ඇත්තක් කරගෙන බොරුවකට රැවටිලා ඉන්න ඔහු කැමති වෙන්නෑ. සියල්ලම සිතිවිලි කියලා දකිනවා. මරණය පවා සිතුවිලි කියලා දකිනවා. මෙන්න මේ කෙනා මේ ඥානයටයි අසුවෙන්නේ. ඉතිං මෙතන මෙයා ආදීනව දකින කෙනා එයා සංචාරයන්ගේ ආදීනව දකිනවා. ''ආදීනවානු පස්සනා ඥානය'' ඒ වගේම තමයි ''නිබ්බදාව'' දකිනවා. නබ්බදාවට යනවා අපි ඔබට මතක ඇති මේ දේශනය මීට කලින් දේශනයට සම්බන්ධයි. ඒ කලින් දේශනයෙන් ඔබ දැක්කා අපි කිව්වා ආනාපාන සති භාවනාවෙන් එක්තරා තැනකට එනවා. ආනාපානා තුළින් නිවන් මග පැහැදිලි කරන තැනේ දී විමෝචය චිත්තං කියන තැනදී එතනින් නැවැත්තුවා. එතනදි අපි පැහැදිලි කළා **අනිච්චානු පස්සී විහරති විරාගානු පස්සී විහරති නිරෝධානු පස්සී විහරති පටිනිස්සාගානු පස්සී**

**විහරති''** කියලා මෙන්න මේ **''අනිච්චානු පස්සී විහරති''** විහරනයට එන්නේ විමෝචයං චිත්තං කියන හුස්ම නොදැනෙන තැනින් පස්සේ මේ ධර්මය දන්න කෙනා කියලා අපි කිව්වා. ධර්මය දන්නහුට දැනගත්තහුට සත්‍යඥානය ඇති කෙනාටයි කිව්වා කෘත්‍ය ඥානය තියෙන්නේ. ඉතා වැදගත් තැනක් මේ හුස්ම නොදැනෙන තැන ධර්මය නොදන්න කෙනා අතරමන් වෙනවා. හැබැයි ධර්මය දන්න කෙනා ඔහු දකිනවා. මෙතන ''නිබ්බිදන්ති'' මේ ගමන දකිනවා මේකේ ආදීනව දකිනවා මේකේ දකිනවා ඔහු මෙතන හුස්ම නොදැනෙන තැන හුස්ම නොදැනෙන තැන අනිත්‍ය මේ කිසිවක් ප්‍රකට නැති **''අනිච්චානු පස්සී විහරනය, විරාගානු පස්සි විහරණය නිරෝධානු පස්සී විහරනං පටිනිස්සාග්ගානු පස්සි විහරණය''** අපි මෙන්ම මෙහෙම දකින්න ඕනෙ. විශේෂයෙන් ම අනානාපානා සති භාවනාව කරන කෙනෙක්ටයි මේ හුස්ම නොදැනෙන ස්වභාවය. නමුත් ඔහුට දැනෙනවා ඔහුගේ ම ත්‍රිවිද්‍යා සකස්වෙන තැන. ඔහුගේ ම ඥාන අවධිවෙනවා. ඔහුට මේ කියන විදසුන් නුවණ ඔහුට සකස් වෙනවා. ඒ කියන්නේ මෙතන මොකුත් නොදැනෙනවා නෙමෙයි. හුස්ම නොදැනෙන ස්වභාවය තුළ කිසිවක් ම නොදැනෙන ස්වභාවයකට යනවා. නමුත් එතන ධර්මය දන්න කෙනාට ඔහු එතන තියෙන සියුම් ඥානය තුළ ඔහුට දැනෙනවා. ඔහුගේ ම ආශ්‍රව කෙලෙස් ගෙවී ගෙන යනවා. ඔහුගේ ම ඇශ්‍රව කෙලෙස් ක්ෂය වී ගෙන යනවා. ඔහු දැන් මෙතන දැනෙන ස්වභාවය තුලයි මේ ඥාන අවධිවීම තුලයි. සිද්ධවීම් ස්වභාවය තුලයි ඒ දේ සිද්ධ වෙන්නේ. මෙතන සූත්‍රය තුළ දැගලුවත් බව ගිලෙනවා. පීනුවත් ඔබ ගිලෙනවා. කියන තැනට එනවානේ. ඔබ අවසානේ ''විමෝචයං චිත්තං'' කියන තැනට එනවානේ. චිත්තං කියන තැනින් පස්සේ ඔබට කරන්න දෙයක් නැහැනේ. දැන් මේක ප්‍රායෝගික පැත්තෙ දි එන තවත් වෙනස් විදියකට පැහැදිලි කරන්න පුළුවන්. ඒ කියන්නේ ඔබට දැන් අරමුණක් එනවා. මේ අරමුණට ඔබ රිංගන්නේ නැහැ.

**''සබ්බේ ධම්මා නාලං අභිනිවේසං''** කියන තැන දැන් ශබ්දයක් ඇහෙනවා. ශබ්දය ශබ්දයක් විතරයි. ගන්ධයක් එනවා. ගන්ධය ගන්ධයක් විතරයි. වර්ණයක් පේනවා වර්ණය වර්ණයක් විතරයි. ඒවා ගැන කිසිකථාවක් නැහැ. සම්මුති ප්‍රඥප්ති නැති වෙනවා. එහෙම කිව්වොත් හරි. දැන් මේ තුළ ඔහු කිසිවෙකට වැඩිය රිංගන්නැතුව ඉන්න ස්වභාවය තුළ මොකක්ද සිද්ධ වෙන්නේ අන්න ආශ්‍රව කෙලෙස් ක්‍ෂය වෙන බව ඔහුගේ ඥානයට අසුවෙනවා. ආශවක්ෂය ඥානය. ඒ ආසවක්ෂය ඥානය උපදිනතාක්කල් නිවන් දකින් නෑ. කවුරුත් ඒ ත්‍රිවිද්‍යා සකස් වෙන්න ඕන. ඒ ඒ තුළ ඔහුට මේ හැම දේම සකස් වෙනවා. ඒ කියන්නේ ඔහුට චුතුපපාත ඥානය, පුබ්බේ නිවාසානුස්සති ඥානය, ආසවක්ෂය ඥානය, ගැන ගොඩක් කථා කෙරිලා තියෙනවා. දැන් මෙතන දී ඒවා ගොඩක් ප්‍රශ්න කරන්න යන්නෑ. ඉතිං මේ ආසවක්ෂය ඥානය ඉතා වැදගත් කියලයි පෙන්නුවේ. ඉතිං ඒ සිත් පරම්පරාව දකිනවා. පුබ්බේ නිවාසානුස්සති ඥානය එතන එතන ඇති වන සිත් පරම්පරාව දකිනවා. චුතුපපාත එතන එතන සිත ඇතිවන නැතිවන ස්වභාවය දකිනවා. පැහැදිලිවම අපි ඒ ධර්ම පරාසය පෙන්නනවා. ඒ වගේ ම අපි පෙන්නනවා ආසවක්ෂය ඥානය. ඒක මේ ඥානයක් මේක සිතුවිල්ලක් නෙමෙයි. මේ සිත නෙමෙයි. මේක මහා ඥානයක් තමන්ගෙම අභ්‍යන්තරය තමන්ගෙම ආශ්‍රව කෙලෙස් ස්වභාවය කියලා මෙතනදි කෙනා දිය වී ගෙන දිය වී ගෙන කෙනා නැති වුනාම ස්වභාවයක් තියෙනවා. මේ ස්වභාවය තියෙනවා. මෙතන ආනාපාන සතිය වඩන කෙනාට දිගට ම කියනවානේ. **අනිච්චානු එස්සි අස්සසිස්සාමිනි සික්ඛති අනිස්සානු එස්සි එස්සසිස්සාමීනි සික්ඛති කියන්නේ** ඇයි? ඒ ඔහුගේ අර යටින් පුරුදු කරපු සතිය තියෙනවා. ඒ ස්වභාවය තියෙනවා. එතකොට අරමුණු තියෙනවා. හුස්ම එන එන ස්වභාවයක තමයි සති නිමිත්ත පිහිටලා තියෙන්නෙ. ඒ ස්වභාවයක් තියෙන්නේ දැනෙන ස්වභාවයක් තියෙනවා ඒක සිතුවිලි නෙමෙයි. ඒ සිහියයි

නුවණයි තමයි ඥාන අවධිකරන්නේ. ඒ තුළ අන්නස්ගති දිය වී ගෙන යනවා. එතන තමයි අනිච්චානු එස්සී විහරනය ඒකේ තමන්ගේම ''තන්හා මාන දිට්ඨි'' කියන එක දිය වී ගෙන යනවා. ඒ කියන්නේ මේ මම ඉන්නවා කියන ස්වභාවය තමයි මේ දිය වී ගෙන යන්නේ. අපිට මේ වචනෙන් පැහැදිලි කරන්න වෙන්නේ මෙහෙම තමයි. මේක හරි අසරණයි. වචන හරි අසරණයි. මේ අවසාන ටික පැහැදිලි කරන්න බැහැ. මේක ''ලුණු'' වගේ දෙයක්. තමන්ට ම දැනෙන්න ඕන දෙයක්. සාන්දිට්ඨික දෙයක් මේක වචනවලින් තමයි ඔබට මේක ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නෙ. එතකොට අපට කියන්න සිද්ධවෙනවා වචන වැරදියි. හැබැයි අපි කෙලින්ම කියනවා මෙතන වැරදියි කියලා. වචන වැරදියි මෙතන සිද්ධ වෙන සිද්ධියක් තියෙනවා. ඒ සිද්ධිය තමයි ක්ෂය වී ගෙන යනවා. ඒ ඥානයට අසුවෙනවා. ඔන්න ඔතන කෙටියෙන් කියන්න පුළුවන් ඒකම තමයි ''නිබ්බිදන්ති'' නිබ්බිදා ව විරාගාව නිරෝධාව ඒ කියන්නේ මෙතන ඔබට ම දැනෙනවා රාගීය ස්වභාවය වාතීය ස්වභාවය ඔබට දකින්න ලැබෙනවා දස සඤ්ඤාවල සක්කාය දිට්ඨි විචිකිච්චා සීලබ්බත පරාමාස කාමාරාග පටිග වලින් පස්සේ එතකොට රූප රාග අරූප රාග මාන උද්දච්ච, අවිද්‍යා කියන කොටසේ දී මේ මාන උද්ධච්ච අවිද්‍යා කියන තැනට ඉතාම ගැඹුරුයි. පර්‍යායක් තියෙනවා සියුම් ඥානයටයි අසුවෙන්නේ. මානීය ස්වභාවයක් දිය වී ගෙන යනවා. ඒ ස්වභාවය තමයි මෙතන පුද්ගල ස්වභාවය ඒ පුද්ගලයාම තමා සම්පූර්ණයෙන් දිය වී ගෙන යන්නේ. නමුත් එක අසුවෙන්නේ වෙනින් වානයකට පුද්ගලයෙක් කියන ස්වභාවයෙන් නෙමෙයි අසුවෙන්නේ. මෙතන කම්පන චංචල වගේ දැනෙන ස්වභාවයකින් දිය වී ගෙන යනවා. එතන සවිඤ්ඤානක නෙමෙයි අවිඤ්ඤානක මනසකටයි දකින්න පුළුවන්. සවිඤ්ඤානක මනස බොළඳයි. ඒකට මේක දකින්න බැහැ. ඒක බොහෝ පටු තැනක අවිඤ්ඤානක මනසකයි. මේක අවිඤ්ඤාන ස්වභාවයමයි. පුද්ගල ස්වභාවයක්

කොහෙත්ම හමුවෙන් නැහැ. පුද්ගල ස්වභාවයක් ආත්ම ස්වභාවයක් මොකුත්ම හම්බවෙන්නෑ. ස්වභාවික දැනීමක් ඔහෙම තමයි. අපට කියන්න සිදුවෙන්නේ ස්වභාවය බවට පත්වීමක් ඒක පටිනිස්සග්ගානු ඵස්සී ඒක චිත්ත ස්වභාවයක් නැවත සකස්වෙන් නැති ස්වභාවයකට එනවා. ඒක ඉතිං මේ ස්වභාවය සංචිතේ නිබ්බදාය දැන් මේ කිසිවක් නැති වෙලා නෙවෙයි. අරමුණට රිංගන් නෑ. ඔහේ යනවා. අර හුළඟ ඇවිල්ලා ඔහේ හමාගෙන යනවා වගේ. දැන් වර්ණ එනවා ඔහේ යනවා. ගඳ එනවා ඔහේ යනවා. ඒකයි **''දිට්ඨෙ දිට්ඨ මත්තං සුතේ සුත මත්තං මුතේ මුත මත්තං විඥ්ඥානේ විඥ්ඥාන මත්තං''** කියන්නේ මේ අටුවාන දුටුවා පමණි. දුටු කෙනෙක් නෑ. දුටු දෙයක් නෑ. දුටු බවක් පමණි. ඒක අදාළ නෑ. මෙන්න මේ ස්වභාවයට පත් වෙනවා. ප්‍රායෝගික පැත්ත ඒ ශුන්‍යතාවය මොකුත් නැතිවෙලා නෙවෙයි. බඩු මුට්ටු නැතිවෙන ශුන්‍යතාවයක් නෙමෙයි. මේ සේරම තියෙනවා. එයා ශුන්‍යයයි. ආත්මීය ස්වභාවය ශුන්‍යවෙලා. ඔක්කොම තියෙනවා. අන්න නැවත සකස් වෙන්න හේතු නැහැ. පටිනිස්සග්ගානු ඵස්සී විහරනය කථකරනී සියල්ල අවසාන නැත. උප්පත්තියක් පනවන්න බැහැ. එතන සම්පූර්ණයෙන් මැරිලා ඉවරයි. මේ මරණය ඊට කලින් මේ සිද්ධ වෙලා ඉවරයි. ශරීරය පොළවට පස්වෙන තැන එතන සිත නැති නිසානේ. මරණයක් කියන්නේ නමුත් දැන් මෙතනම සිත නැති කලොත් ඉවරයි. සිත නැති වෙන එකක් නෙමෙයි. ඒකයි භාෂාව අසරණයි කිව්වේ. ඒකයි සිත කවදාවත් නැති වෙන එකක් නෙවෙයි. සිතේ ස්වභාවයෙන් ම ඒ වටිනා හරය සම්පූර්ණයෙන් ම දියවෙලා විරාගය කියන්නේ ඒකයි. දැන් එහෙම නම් ඇලෙනවා නම් රාග ස්වභාවයක්නේ විරාගය කියන්නේ ඔන්න ඕකමයි. දැන් ලෝභ ද්වේශ මෝහ නැහැනේ. අලෝභ අද්වේශ අමෝහනේ වචන වලින් කියාගන්න බැරි ඒකයි. ඒ කියන්නේ මෙතන නැති දෙයක් ඇති කියලා පෙන්නනවා. වචනයක් කිව්ව ගමන් වචනෙක හැම තිස්සේම

දෙයක් තියෙනවා. නමුත් මෙතන දෙයක් නෑ. දැන් ඔබ ගලපාගන්න මෙතන විරාගය කියලා තමයි අපට කියන්න වෙන්නේ. නිබ්බදාව කියන වචනය විරාගය කියන තැන නිරෝදයට යනවා කියන තැන අතිශයින් ගැඹුරුය. වචනයෙන් කියනවාට වැඩිය පටිනිස්සග්ගානු එස්සී ඒක ඥානවලටයි මේ සියල්ලම අසුවෙන්නේ. ඉතිං මේ ස්වභාවය තමයි ශුෂ්කයානික යාගේ ඛනික සමාධිය තුළ ඔබට දකින්නට ලැබෙන්නේ. දැන් නාම රූප පරිච්ඡේදය සච්චා පාරිග්ගතං ඥානයට එන හැටි තමයි ඔබ මේ මෙච්චර වෙලා සවන් දුන්නේ. දැන් නාමය පජානාති රූපය පරිජානාති ඔබ නිවන් මග මනා කොට දකිනවා. හැබැයි තවත් මේවා ගැන පැහැදිලි කරන්න ඕනි. එහෙම නැත්නම් ඔබට කිව්වා කියලා මේක තේරෙන්නෙ නෑ. සමහර කෙනෙකුට තේරුනේම නෑ. කෙනෙකුට මේක යන්තම් ටිකක් තේරුණා. ''උග්ගටිතඤ්ඤ විපටිකඤ්ඤ නෙයිය පදපරම'' කියලා බුදුන්වහන්සේ පෙන්නනවා මේක ඇහුව ගමන් තේරෙනවා කෙනෙකුට ටිකක් විමර්ශනය කරන කොට තේරෙනවා කෙනෙකුට ගොඩක් මේක මහන්සිවෙලා වීර්යක් අරගෙන අවබෝධ කරගන්න කෙනෙකුට මේක තේරෙන්නේ නැහැ. ඒකයි උග්ගටිපඤ්ඤ විපටිකඤ්ඤ නෙයිය පදපරම කියලා කියන්නේ. තමන්ගෙම ස්වභාවය තමන්ටම අවබෝධ කරගන්න. ඉතිං මේ උත්සාහ කරන්නෙ ශුෂ්කයානිකයාගේත් සමථයානිකයාගේත් යුගන්දන විදිහට ගමනක් යනවා කිව්වේ ඒකයි. මෙතනදි විශේෂයෙන් දෙයක් තියෙනවා. ඔබට කියන්න. මේ ශූන්‍යතාවය දකින එක අපි නිතරම කථා කළා. නිතරම අපි කිව්වා අප්‍රනීත අනිච්ත්ත ශූන්‍යක චේතෝ'' විමුක්තියකට ඔබ යනවා කියලා අපි නිතරම කිව්වා මේ මෙතන දී අපි කිව්වනේ ශිල විසුද්ධිය චිත්ත විශුද්ධියට හේතු වෙනවා. චිත්ත විශුද්ධිය දිට්ඨි විශුද්ධියට හේතු වෙනවා. දිට්ඨි විශුද්ධිය නාම රූප දෙක වෙන් කරලා දකින තැනට එනවා. ඒක සත්‍ය දකිනවා. කොහොමද ඒ ස්වභාවය දකිනවා. එතකොට කංඛා විතරන විසුද්ධියට එන එන අපි කිව්වා නාම රූප හටගන්නා ආකාරය

දකිනවා. එතකොට මග්ගා ඥාන දස්සන විසුද්ධිය එතකොට ඔහු පටලවා ගන්නෑ. ඔහු හොඳට මග පේනවා. ඔහුට අන්න ඒ කෙනා පටිපදා ඥාන දස්සන විශුද්ධියට එනවා කියලා අපි කිව්වා. එතකොට එතන දි පටිපදා ඥාන දස්සන විසුද්ධිය තමා නාම රූප පරිච්ජේදය සිද්ධ වෙන්නේ. එතකොට එතන මේ කෙනාට තමයි ඥාන දර්ශන විශුද්ධිය ලෝකෝත්තර මාර්ග සඳහා උපදින්නේ. එතකොට එතන දී තමයි පටිපදා ඥාන දස්සන විසුද්ධියෙ දී තමයි අපි ඒ නාම රූප පරිච්චේද ඥානය ඒ ඥාන අවධි වෙන තැන නාමයයි රූපයයි වෙන්කරලා දකින්න එතකොට පච්චේ පරිග්ගා ඥානය හයතු පට්ඨාන ඥානය ආදිනවානු ඥානය නිබ්බිදානු ශූන්‍ය එතකොට චුංචිතු කම්‍යතා ඥානය පටිසංකානු ඥාන සංඛාර උපේක්ෂා ඥානය'' මේ විදියට සංඛාර උපේක්ෂා ඥානය කියන්නේ සියලු සිතුවිලි සමනය වුනු තැන. අර කියන්නේ අපි එතංසංතං ඒතං ප්‍රනීතං යදිදං සබ්බ සංඛාර සමථෝ කියලා අන්න එතනයි. සංඛාර උපේක්‍ෂා ඥානය එතකොට එතන අනුලෝම ඥාන සකස් වෙන්නේ ලෝකෝත්තර මාර්ග සිත් උපදින තැන එතකොට ගෝත්‍ර භූ ඥානය උපදින තැන එතනමයි. එතකොට සකස් වෙන්නෙ එතකොට කාමාවචර භූමි රූපාවචර භූමි සමතික්කම කරලා ලෝකෝත්තර ආර්ය භූමිය පුද්ගලයා සම්පූර්ණයෙන් මිදුනු තැනයි ආර්ය ස්වභාවය නැම රූප දෙකෙන් මිදුන තැන පුද්ගලභාවයෙන් මිදෙනවා. ගෝත්‍ර භූ ඥානය තියෙන කෙනාටයි අවදිවෙන්න මාර්ග ඥාන තියෙන කෙනාටයි අවදිවෙන්නෙ. එතකොට සෝතාපන්න ඔබ දන්නවානේ මාර්ගඥාන සහදාගාමී මාර්ග ඥාන එතකොට ලෝකෝත්තර ඥානවල මාර්ගඥාන මේක දකින්නේ පැහැදිලි කරන කොට ඔබට පරියාය විදිහට පැහැදිලි කරාම ප්‍රායෝගික පැත්තෙදි මේක ලොකු පැහැදිලි කිරීමක් ඔබට ඕනේ. එතකොට ඵලඥාන එතකොට සෝවාන් සකෘදාගාමී අනාගාමි අරහත් කියන මේ ඵලබවට පත්වෙන තැන ඒවාගේම තමයි පච්චේ පරිග්ගහ ඥාණය පච්චේ පරිග්ගහා ඥානය කියන්නේ ඇත්තට ම මේ

අපි කියන වාගේ අධිගම ලබනවා කියන්නේ සෝවාන් සකෘදාගාමී අනාගාමී මේ මර්ගඵල කෙලෙසී ඉතිරියක් නැතුව සම්පූර්ණයෙන් ම ක්ෂය කරලා දාන්නේ පච්චේ පරිග්ගාඥානය ඉතිං මේ පච්චවේක්ඛණ ඥානය සමාවෙන්න ඕනේ පච්ච වේක්ඛන ඥානය කියලා අපි කථා කරන්නේ ඒක ඵලඥාන වලට පස්සේ පච්චවෙක්ඛනා ඥානය ඒ කියන්නේ ඒවා සම්මර්ශනය කරලා දකිනවා වගේ දෙයක්. එතන තියෙන්නේ දැන් මෙතනදී මේ ඉතාම ගාම්භිරයි මේ කථාව මේ කියනවාටත් වැඩිය ගාම්භිරයි ප්‍රායෝගික පැත්ත ඉතාම වැදගත් වෙනවා. එන අභිඥ්ඥාවෙන්ම දකින්න ඕනේ. නැතත් ඔබට ඥාන අභිඥ්ඥා සකස් වෙන්න ඕනේ තැනක් තියෙනවා. මේවා හැමෝටමචිත්ත විශුද්ධිය හැමෝටම නැහැ. දිට්ඨි විශුද්ධිය හැමෝටම නැහැ. ඒවා ඇතිකර ගන්න මහා වීරියක් ඕනේ. ඉතින් මේ මරණය අභිබවා යනවා කියන්නේ ඒක කෙලින් ම ඉවරයි. ඔක්කොම සම්මුති ප්‍රඥ්ඥප්තිය බිඳ වැටෙනකොට ම මේ සිතුවිලි සේරම බිඳ වැටෙන තැන මරණය කියන එක සිතුවිල්ලක් නතරවෙලා නැතිවෙලා යනවා. මෙතන අපි දිගට පැහැදිලි කළා ගිය දේශනාව ඔබ අහන්න. කොහොමද මේක අකාලික දහමක් වෙන්නේ. කාලය තුන් කාලය බොරුවක් වෙන්නේ කොහොමද එතකොට මේ හැම සිතක්ම උපදින හැටි ඔබ මීට වැඩිය ගැඹුරු පැත්තකට කලින් පැහැදිලි කරා. මෙතනදී අපි කරේ සමථයානිකයා හා ශුෂ්ඛයානිකයා කොහොමද සමථ භාවනාවෙන් රූප කලාප රූපය දැකලා නාමය දකින්නෙ. ඒ වගේම ශුෂ්කයානිකයාගේ ඔතන සමාධිය කුමක්ද කියන එක. සමථ සමාධියක් කණිඛ සමාධියක් අතර වෙනස ඉතිං අපි මේවට තමයි පැහැදිලි කරන්න උත්සාහ කළේ. නැත්නම් මීට පෙර දේශනාව ඔබට අහන්න ලැබෙනවා. ඒ දේශනා මාලාවක තියෙනවා ඔබට මනා කොට පැහැදිලි කරනවා සැරින් සැරේට විවිධාකාර පැතිකඩයන් ඔස්සේ මෙතන අතීත සඤ්ඤා නිසා නව සඤ්ඤා හැදෙන්නේ එතකොට මේ පොත දකින සිත කියන්නේ අතීත සඤ්ඤාවක්

බිත්තිය දකින සිත කියන්නේ අතීත සඤ්ඤාවක් එතකොට වර්තමානයක් හමුවෙන්නෑ කියන එක උදයවස එතකොට මෙතන දී උත්පාද පඤ්ඤායති වායෝ පඤ්ඤායති ඨිතසස කියන තැන තිඊයක් නෑ. වර්තමානයක් නෑ. අන්‍ය ආකාරයට පත්වෙනවා පමණයි. එතකොට අතීතයක් හැමතැනම තියෙන්නේ ඔබ දැක්කා එතකොට වර්තමානය නැති බව. මෙන්න මේක භද්දේකරථ කියන හුදෙකලාවට එන තැන මේවා ඉතාම ගාම්භීරයි. මේ කියන තැනට අපි නැවත කථාකරන්න ගියොත් ඔබට මේක තවත් දීර්ඝ දේශනාවක් වෙනවානේ. අපි දැන් මෙතනින් මේ දේශනය දැන් නවත්වන්න ඕනේ. අපි අරමුණු කරපු දේ ඔබට පැහැදිලි වෙන්න ඇති කියලා අපි අදහස් කරනවා. විශේෂයෙන් ම ශුෂ්කයානික රහතන්වහන්සේගේ ස්වභාවය සමථයානික රහතන් වහන්සේගේ ස්වභාවය ඒ දෙන්නම කරන්නේ අවසානයෙදීදී යුගන්දන විදියට එකම විදසුන් නුවනකින් නිවන් මගට ප්‍රවේශ වෙන එක. එකම ගමනක් යනවා කියන එක. ඉතිං එහෙනම් සියල්ල ඔබගේ ම අවබෝධය සඳහා හේතු වෙන්න ඕනේ. අපි කිච්චා සිතක් කියලා දෙයක් නැති බව. අපි කිච්චා සිත කියලා දෙයක් නෑ. මෙතන ප්‍රවාහයක් තියෙන්නේ. හටගෙන නිරුද්ධවෙන ප්‍රවාහයක් තියෙන්නේ. ප්‍රවාහයක් එහි ක්ෂණික සිතක උදය වැය දකින්නාට සම්මුතිය තුළ මරණය හමු නොවේ කියලා. මේ අපි සැරින් සැරේ ඔබට ඉදිරිපත් කළේ විශේෂ වූ කාරනා අති විශිෂ්ඨයි. සිතක් කියලා දෙයක් නැහැ. එහෙනම් හැමෝටම කිච්චම හිතෙනවානේ ආ එහෙම වෙන්නේ කොහොමද මට හිතක් තියෙනවානේ මේ මට පේනවා නේ නෑ සිත කියලා දෙයක් නෑ. ආත්ම දෘෂ්ඨිය සම්පූර්ණයෙන් ම බිඳ වැටෙනවා. ''අත්ථානු දිට්ඨීන් ඌහච්ච'' කියන තැනට එනවා. ''මච්චුරාජා නපස්සතී'' කියන තැනට එනවා. දැන් මෙහෙම කිච්චොත් ඒහ සූත්‍රය පර්‍යාය නමුත් මරණයක් තියෙන්නේ. ඔබ ඉන්නවානම් පමණයි. ඔබ නැතිවෙන තැන මරණයක් නෑ. මේ ආත්ම දෘෂ්ඨියත් එක්ක

මේක දෘෂ්ටියක් ආත්මය කියලා දේකුත් නැහැ. මේ සංසිද්ධියක් තියෙනවා. ස්වභාවික සංසිද්ධියක් සිස්ටම් එකක් තියෙනවා. දැන් ඒ වචනේ කිව්වොත් හොඳට තේරෙනවා. සිස්ටම් එකක් කියන්නේ ඒ ස්වභාදහමක් කියන්නේ ඒක අවබෝධ කරන එක ලේසි නෑ. ඒක අතිශයින් ගාම්භීරයි. කෙනෙක් පුද්ගලයෙක් නැති බව අවබෝධ කරන එක එයයි. නිවන් මග තෙරුවන් සරණයි.

## ★ 3 වෙනි පරිච්ඡේදය ★

# නාම රූප පරිච්ඡේද ඥානය

අපි ඔබට දිගින් දිගට ම නාම රූප පරිච්ඡේදය ගැන සම්මර්ශන ඥාන ගැන පැහැදිලි කරගෙන ආවා. සප්ත විසුද්ධිය කරා යන ආකාරය, සීල විසුද්ධිය, චිත්ත විසුද්ධිය හේතු වන ආකාරය චිත්ත විසුද්ධිය දිට්ඨි විසුද්ධියට හේතු වන ආකාරය ඒ දිට්ඨි විසුද්ධිය කංඛාවිතාරණ විසුද්ධියට හේතුවන ආකාරය කංඛාවිතාරණ විසුද්ධිය, මග්ගාමග්ග ඥාන දර්ශන විසුද්ධියට හේතු වන ආකාරය, මග්ගාමග්ග ඥාන දර්ශන විසුද්ධිය පටිපදා ඥාන දර්ශන විසුද්ධියට හේතු වන ආකාරය, පටිපදා ඥාන දර්ශන විසුද්ධිය ඥාන දර්ශන විසුද්ධියට හේතු වන ආකාරය මෙන්න මේ විදිහට මේ නිවන් මග කටයුතු කරන යෝගාවචරයෙක්ගේ දිසානතිය කෙසේ විය යුතුද කියන කාරණය. ඒ ඔස්සේ අපි දීර්ඝ පැහැදිලි කිරීම් මාලාවක් කරගෙන ආවා. මෙතන දී අපි ඔබට සිහි කරන්න ඕන මේ රූපය කුමක්ද නාමය කුමක්ද, රූපය පර්ජානාති රූපය මනා කොට දකින කෙනා නාමය පරජානාති නාමය මනා කොට දකින කෙනා මේ නාමයත් රූපයත් වෙන්කර දකින කෙනා, අන්න ඒ ඔහු නාම රූප පරිච්ඡ්ඡේදයට ඒ නාම රූප පරිච්ඡේද ඥානය, පච්ඡේ පරිග්ගහා ඥානය, අන්න මේ නාම රූප පරිච්ඡේද ඥානය කියන්නෙම ඇත්තට ම කෙනා නැතිවෙන තැන. දැන් ඔබ කියනවා අපි මේ ධර්මය සරලව, ඉතාම සරලව දීර්ඝ කාලයක් ඔස්සේ පැහැදිලි කළා. ඉතාම සරලව ඕනම කෙනෙකුට තේරෙනවා. සුනීත සෝපාක වගේ ඇත්තට ම ඉගෙන ගත්ත නැති මුකුත් අධ්‍යනයක් නැති වුනත් සාමාන්‍ය අවුරුදු 7 කුඩා දරුවෙකුට පවා මේ ධර්මය අවබෝධ කරගන්න

පුළුවන්. මේ ඔබ හිතන තරම් මහා ගැඹුරු ධර්මයක් නෙමෙයි. නමුත් ඔබගේ තිබෙන දත්ත දැනුම නිසාම, ඔබ දන්න නිසාම, ඔබට ඒ දන්න දැනුමෙන් බලනකොට ඔබේ දන්න දැනුමට සාපේක්ෂව මෙය අතිශයින් ගැඹුරු ධර්මයක් වෙනවා. ඒ ඔබගේ දැනුම අනුවයි. හැබැයි ඔවැනි කිසිම දැනුමක් නැති පුංචි අවුරුදු 7 දරුවෙක් මොනවාද දන්නේ. නමුත් ඔබ ධර්මය තුළ දකිනවා සෝවාන් වෙනවා. මේකට දහම් දැනුම ද අවශ්‍ය නැහැ. මේ නිවන් මග යමෙක් හරියට දැක්කොත් ඒ අවසානය දැක්කොත්. ඔහුට අවබෝධ වෙනවා මෙතන ඉතාමත් ම සරල කාරණයක් තියෙන්නේ. ඒක සරල වැඩි නිසාමයි ඔබට ඒක අවබෝධ නොවෙන්නේ. සාමාන්‍යයෙන් කෙනෙකුට අපි කිව්වොත් මේ ලෝකය බොරුවක් කියලා. දැන් මේ දැනුම ගොඩක් තියෙන කෙනෙක් ඒක පිළිගන් නැනේ. හැබැයි මේක අපි කිවුවොත් පුංචි දරුවෙකුට, පුතේ මේ ලෝකෙ බොරුවක්. මේ පේන දේවල් අපි හිතින් හදාගෙනයි තියෙන්නේ. ඒ අපි හිතින් හදා ගත්ත නම් තමයි අපි හිතන්නේ. නමුත් එළියේ තියෙන ඒවා අපි හිතන දේවල් නෙමෙයි. මෙන්න මේ විදිහට හරි සරල වාක්‍යයකින් මේ ධර්මය පෙන්නන්න පුළුවන්. ඉතාම සරලයිනේ. ඔය වාක්‍ය. දැන් අවුරුදු 7 ළමයෙක් කියන්නේ පුංචි දරුවෙක් ගොඩක් දත්ත ඔළුවේ නැහැ. ඔබ දන්නවනේ අවුරුදු 7 දරුවෙක් ගාව බොහොම සරල සුන්දර මනසක් තියෙන්නේ. ගොඩක් අපි ළඟ තියෙන මේ දත්ත ඔක්කොම කුණු ගොඩවල්. අපි දන්නවා තියෙන ඔක්කොම කුණු ගොඩක්. හොඳට බලන්න දැන් ඔබ මැරෙනවනම් මොකට ද ඔච්චර දේවල් දැනගන්නේ. දැන් අපි දන්නවා කියලා හිතන් ඉන්නේ මොනවද? හොඳට බලන්න ඔබ මොනවද දන්නේ කියලා. හොඳට බලන්න ඔබේම සිහි නුවණින් කල්පනා කරලා. හිත යොමු කරන්න මේ කියන අදහසට. ඔබ දන්නේ මොනවාද? ඔබගේ දැනුම මොනවාද? දැන් ඔබ හෙට මැරෙනවා කියල හිතන්න. දැන් ඔබ හෙට මැරෙනවනම්, අපි හිතමු දැන් විශාල අධ්‍යාපනයක් කරපු කෙනෙක් කියලා. ඉතින් ඒකෙත් එලක්

නැනේ. හෙට මැරෙනවා නම්, දැන් ඔබ කොච්චර දේවල් එකතු කරගෙන තියෙනවද ඔබේ මනසට, දත්තනෙ මේ හැමදේම අපි කම්පියුටර් එකට දත්ත දානවනේ. දත්ත දාලා දාලා කම්පියුටර් එකට විශාල දත්ත ප්‍රමාණයක් ලෝඩ් කරාම ඒකෙ මෙමරි කැපෑසිටි (Memory Capacity) එක ඕවර් ලෝඩ් (Over loard) වෙනවනේ. එතකොට තව දත්ත දාන්න බැහැනේ. මෙන්න මේ වගේ ඔබ මේ එකතු කරගෙන දන්නවා කියලා දාගත්ත මේ දත්ත, ඔය දත්ත තියෙනකම් ඔබට සිතුවිලි එනවා. අතිශයින් ඔබ ඔබට වන දේ දන්නේ නෑ. ඔබ දන්නවා කියන්නෙම ඔබ දුකේ ඉන්නවා කියන එකයි. ඔබට දුකක් තියෙන්නේ ඔබ දන්න නිසායි. අවුරුදු 7 ළමයෙක් කොහොමද සෝවාන් වෙන්නේ. දැන් හොඳට බලන්න ඒ ළමයා දන්නෙ නෑ. දන්නැත්නම් එයාට දුකකුත් නෑ. හොඳට බලන්න මේ කියපු කාරණේ. පුංචි ළමයෙක් ඉපදිච්ච ගමන් ගොඩක් දරුවෝ අපි දැකලා තියෙනවා තමන්ගෙ අම්මා මිය ගිහිල්ලා තියෙනවා. නමුත් මේ දරුවා අම්මගෙ මිනී පෙට්ටිය ගෙයි සාලෙ මැද්දේ තියල තියෙද්දී ඒක වටේ සෙල්ලම් කරනවා. තමන්ගෙම මේ අම්මා තමයි මැරිලා තියෙන්නේ. නමුත් මේ ළමයා සෙල්ලම් කරනවා. මේ මිනී පෙට්ටිය වටේ. දැන් මේ ළමයාට කිසිම අවබෝධයක් නෑ. මැරෙනවා කියලා. ඒ ළමයා පොඩියි. ඒ ළමයා ඒවා දන්නෙ නෑ. ඒ ළමයා දන්නේ නෑ මේ අම්මා මැරුණා කියලා. එයා අඬන්නෙත් නෑ. ඇයි ඒ. ඇයි එයාට දුකක් නැත්තේ. එයා දන්නේ නැති නිසා. දැන් ඔබට දුක තියෙන්නෙ ඇයි? ඔබ දන්න නිසා. මෙන්න මේ කතාවයි අපේ මුළු ජීවිත කතාවම. අපි දුක් විඳින්නේ දන්න හින්දා. පුදුම හිතෙයි ඔබට මේක කිවුවොත්. අපි දුක් විඳින්නේ දන්න හින්දා. ඔබ දන්නේ කොච්චරක් ද ඒ තරමට අපි දුක් විඳිනවා. ඔබ හිතින් එකතු කරගත්තු දේවල් තමයි ඔබගේ දුක් ගොඩ. ඒවා තමයි සංඛාර කියන්නේ. ඒවා තමයි කෙලෙස්. ඔබ ඉපදෙන කොට ප්‍රභාස්වර චිත්තං කියනවා. ප්‍රභාස්වරං චිත්තං ඔබ ඉපදෙන කොට ප්‍රභාස්වරයි. ඔබේ සිත ප්‍රභාස්වරයි. ඔබ ඔබේම

පුංචි කාලෙට යන්න. ඔබ දකිනවා මේ පුංචි දරුවෝ සෙල්ලම් කරනවා. සමනල්ලු අල්ලනවා. හිනාවෙනවා. හයියෙන්. හරි සතුටක් පේනවා. සැහැල්ලුවෙන් ඉන්නේ. ඔවුන්ට ගැටළු ප්‍රශ්න මොනවද තියෙන්නේ. ඔවුන්ට ගැටළු, ප්‍රශ්න නෑ. ඔවුන් ඉන්නේ හරිම සැහැල්ලුවෙන්. ඒ තමයි ප්‍රභාස්වර සිත දකින්න ප්‍රභාස්වර සිත යට ගිය දවස අපේ හිතෙත් තිබුණා. සුදු රෙදි කඩක්, මොකද වුණේ. ඒ සුදු රෙදි කඩ කිලුටු වුණා. ප්‍රභාස්වර සිත සුදු රෙදි කඩ වගේ. අද ඔබේ සිත කිලුටු වෙලා. පුංචි ළමයා ඉරිසියා කරන්නෙ නෑ. පුංචි ළමයට ඉරිසියාව, වෛරය, ක්‍රෝධය ඒවා තියෙනවද? පුංචි ළමයට ඒවා නැත්තෙ ඇයි. පුංචි ළමයට මේ දත්ත නැහැ. බාහිර වටින දේවල් තියෙනවා කියල පුංචි ළමයට තියෙනවද? මැණික් ගලක් දුන්නොත් මේ පුංචි ළමයා ඒක පොළවේ ගහල දුවයි. එතකොට ඔබ මහගිණි ගොඩක පත්තුවෙනවා. ඔබ ද දුක් විඳින්නේ පුංචි ළමය ද? ඔබ දුක් විඳිනවා. දැන් ඔබ බලන්න මේක ගලපන්න. ඒ උපතත් මරණයටත් දැන් ඔබ හෙට මැරෙනවා. දැන් මරණය ගැන ගොඩක් අය කතා කරනවනේ. හැම තැනම ඔබට අහන්න ලැබෙනවනේ. කොයි මොහොතේ හෝ යන්න වෙනවා කියනවනේ. දැන් ඔබට මේ ජීවිතය ගැන අවබෝධයක් නෑ. ඔබ හිතනවා ඔබ දන්නවා කියල. ඔබ දන්නකමමයි ඔබේ නොදන්නකම. ඔබ නොදන්නකමමයි ඔබ දන්නකම. ඔබ නොදන්නෙම ඔබ නොදන්නකමමයි. ඔබ මෙච්චර කාලයක් දැනගෙන තියෙන්නේ ඕනේ නැති දේවල්. ඕන් නැති දේවල් ගොඩගහ ගත්තොත් අපි ඒකට කියනවා කුණු ගොඩක් කියල. දැන් ඔබ කියනවා මෙතන මේක හරි ලස්සනයි. මේක හරි කැතයි. ඔය ලස්සනයි. කැතයි. කියන දෙකම ඔබේ සිතේ ම තියෙන මායාවක්. එහෙම දෙයක් ලෝකෙ නෑ. නමුත් මෙන්න මේ අල්ල ගැනීම, ඇලීම, ගැටීම මේක තමයි ගිනිගොඩ. මේ සිතේ පත්තුවන කෙලෙස් ගින්න. ලෝභ, ද්වේශ ගින්න. මේ ලෝභ ද්වේශ ගින්නට හේතුව අවිද්‍යාව මෝහය. ඔබ සත්‍ය දකින්නෙ නැති නිසාමයි ඔබ රැවටිලා ඉන්න නිසාමයි ඔබට

දුක තියෙන්නේ. බුදු කෙනෙක් ලෝකෙට දේශනා කරන්නේ දුකෙන් මිදෙන මගක්. දැන් හොඳට බලන්න දැන් එහෙනම් දුකෙන් මිදෙනවා. මේ සත්‍ය දකින තැන දුකින් මිදීමක් තියෙනවා. දැන් ඔබට ම පැහැදිලි වෙනවා මෙහෙම කියාගෙන යන කොට. මේ අපි එකතු කරගෙන තියෙන කුණු ගොඩම තමයි අපේ දුක් ගොඩ. අපි එකතු කරගෙන තියෙනවා ගොඩවල් මොනවාද? අපි බැලුවොත් මොනවද මම මට නමක් තියෙනවා. රූපයක් තියෙනවා. මම කියල කෙනෙක් ඉන්නවා. මට මේ වගේ, මේ වගේ දේවල් තියෙනවා. බලන්න පළවෙනි තැනේ ඉඳන්ම මගේ නම හරිද? ඇත්තට ම ඒ ඔබද? රූපය ඔබද? ඔය රූපය ද ? ඔබ කියන්නෙ. ඔබ ද රූපය කියන්නෙ. ඔබට ධර්මය තුළින් අහන්න ලැබෙනවා ඔබට. අපි දුකට වැටිලා තියෙන්නේ. රූපය මමයි කියල ගත්ත නිසාමයි. ''රූපං අත්තනෝ සමනුප්පස්සති.'' රූපයමයි ආත්මය. අත්තනීවා රූපං සමනුප්පස්සති. ආත්මය මයි රූපය. රූපස්මිංවා අත්තානං සමනුප්පස්සති, රූපය තුළ ආත්මයක් තියෙනවා. අත්තනීවා රූපං සමනුප්පස්සති. ආත්මය තුළ රූපයක් තියෙනවා. (රූපං අත්තනෝ සමනුප්පස්සති, රූප වත්තංවා අත්තනෝ සමනුප්පස්සති රූපයමයි ආත්මය, ආත්මයමයි රූපය, රූපය තුළ ආත්මයක් තියෙනවා. ආත්මය තුළ රූපයක් තියෙනවා.) අපි මේ රූපය ආත්මය කියල හිතන්නෙ. නමුත් අපි කවදාවත් අපේ රූපය දැකලා නැහැ. අපි රූපෙ දකින්නේ කණ්ණාඩියකින්. අපිට ඇස් දෙක අනිත් පැත්තට හරවලා බලන්න බෑනේ. හැබැයි ඉතිං ඔය කණ්ණාඩියෙ තියෙන රූපය ද අපේ රූපය. දැන් අපි අවුරුදු 5 දී තව ආපස්සට ගියොත් ඒ රූපය ද අවුරුදු 10දී තියෙන්නේ. ඒ රූපය ද අවුරුදු 15 වේ දී තියෙන්නෙ. ඒ රූපය ද අවුරුදු 20 දී තියෙන්නෙ. ඒ රූපය ද අවුරුදු 30 දී, ඒ රූපය ද අවුරුදු 40 දී, ඒ රූපය ද අවුරුදු 50දී මේ විදිහට අවසානේ තියෙන්නේ මුලින් තිබ්බ එක. රූපයක්වත් නෙවෙයි. නමුත් අපි කියනවා මේ රූපය මගේ කියලා. නමුත් එහෙම තියෙන රූපයක් නැහැ. මේ ධර්මය නම්

සත්‍යයි. සත්‍යය දකින්න ඕන. සත්‍යය නම් ඔබ දැන් ධර්මය ගොඩක් අහල තියෙන නිසා දන්නවා. එතන එතන ඇතිවන නැතිවන කතාවක් තියෙන්නෙ. පවතින දෙයක් නැහැ. මේ හටගන්නවා නැතිවෙනවා. ඇතිවන නැතිවන ස්වභාවයක් තුළ පවතින දෙයක් නැහැ. ඇත්තට ම අපි කතා කරනවා. මරණයක් ගැන. හැබැයි දැන් මැරෙන්නෙ හිතද? ශරීරය ද ? අපි හිත නැති නිසා නේද ශරීරය වළලන්නෙ. ශරීරය ගිනි තියලා දාන්නෙ. අදාහනාගාරයේ අවන් එකට දානවා. එතකොට ශරීරය අපි එහෙම පුච්චලා දාන්නෙ වළලලා දාන්නෙ එතන හිත නැති නිසානේ. එහෙනම් මැරිලා තියෙන්නෙ හිතනේ. හැබැයි හැම මොහොතකම මේ හිත මැරෙනව. ක්ෂණයක් ක්ෂණයක් පාසා හටගන්නවා. නිරුද්ධ වෙනවා. ඇති වෙනවා. නැති වෙනවා. පවතින හිතක් නැහැ. ක්ෂණයක් ක්ෂණයක් පාසා සිතක් ඉපදී නිරුද්ධ වෙනවා. මේ සිත කියන එක කුමක්ද? සිතයි එහෙම නම් මේ නැති වෙන්නේ ඒ සිත හැම මොහොතෙම මැරෙනවා. නමුත් අපි සම්මුතිය තුළ තමයි අපේ මේ දත්ත. අපි මේ දත්ත තියෙන්නෙ අපි මේ හැමදේම සම්මුතියෙන්නෙ භාවිතා කරන්නෙ. නා ගහ, නුග ගහ, මේසෙ, පුටු, ඇඳන් මේ අපි පාවිච්චි කරන හැම එකක් ම අපි පාවිච්චි කරන හැම භාෂාවෙම හැම වචනයක් ම සම්මුතියෙ තියෙන්නේ. ඒවා අපි හදාගත්ත ඒවා. ඒවා භාහිර කොහෙවත් තියෙන ඒවා නෙවෙයි. ඒවා සිතුවිලි. අපි ඉන්නෙ සිතුවිලිත් එක්ක. මේක කෙසෙල් මේක ඇපල් අපි තමයි මේ හැම එකම කියන්නෙ. මේක මේසේ, මේක පුටුව. අපි මේ රූපවලට අපි මේ නාමයක් දෙනවා. දැන් මේක හොඳට ම පැහැදිලි මෙතන නාමෙකුත් රූපෙකුත් කැරකෙනවා. රූපයක් තියෙනවා. ඒ රූපෙට නාමෙකුත් දෙනවා. එහෙමනෙ අපිට දැනෙන්නෙ. රූපයත් දැන් නාමයත් කියන කොට රූපයක් එනවා. දැන් කදරු හරි පොල් එකක් දීලා කිව්වොත් තැඹිලි කියලා ඔබට තැඹිලි රූපය මැවෙනවා. අම්මා කිව්වොත් ඔබට අම්මගෙ රූපය මැවෙනවා. එතකොට ඒක කියන්නෙ කෝල් එකකින්.

එතකොට ඒක ළඟවත් නැහැ. ශබ්දයක් තමයි ඔබට ඇහැන්නෙ. ඒ ශබ්දෙට රූපයක් මැවෙනවා. දැන් මේ රූපයයි. ශබ්දයයි. මේ දැන් නාමයයි. රූපයයි නේද මේ. නාමය කියන්නෙ එතකොට ශබ්දයක් නේද? දැන් ඔබට සරලව බැලූ බැල්මට මෙහෙම පේනවා නේද? නාමය කියන්නෙ එතකොට ශබ්දයක්. එතකොට රූපය කියන්නෙ අපිට වර්ණයක් කියලා. එතකොට මෙහෙම අපිට හැමතිස්සෙම සිතුවිලි එනවා කියන්නෙ එතන එන්නෙම රූපයක්. නාමෙකුයි රූපෙකුයි තමයි එන්නෙ. අපිට හිතෙනවා කියන්නෙ නාමයක් රූපයක්නෙ. අපිට හැම තිස්සෙම සිතුවිලි එනවනේ. සිතුවිලි එනවා කියන්නෙ නාමයක් රූපයක් මනෙ. එතකොට මෙතන අපිට ලිහාගන්න ගොඩක් දේවල් තියෙනවා. හැබැයි මේ එකතුවෙච්ච දේවල්ම තමයි ලෙහාගන්නත් තියෙන්නෙ. අපි ඉස්සෙල්ලා මේක වෙන හැටි දැනගන්න ඕන. හැදෙන හැටි සිත හැදෙන හැටි දැනගන්න ඕන. සිත හැදෙන හැටි දැනගෙන, ඒ සිත හැදෙන හැටි දැනගත්තොත් අපිට ඒ සිතේ මායාව පේන්න ගන්නවා. මේක හැදෙන හැටි පේනවා. ඒකේ දෙයක් නැහැ. දැන් සිතුවිල්ලක පොත් කියලා දෙයක් නැහැනෙ. ඒ ගැන අපි දිගටම කතා කළානෙ. එතකොට සිතුවිල්ලක දෙයක් කියලා දෙයක් නැහැ. ඒ කියන්නෙ නාමෙ අන්තෙත් දෙයක් කියලා නැහැ. රූපයෙ අන්තෙත් දෙයක් කියලා නැහැ. ඒක ඔබට පැහැදිලියි. දැන් රූපය සතර මහා භූතනෙ. අපි කතා කළානෙ. මේ පඨවි, ආපෝ, තේජෝ මහා භූතනෙ. එතකොට මහා භූත නෙවෙයිනෙ අපි ඇසුරු කරන්නේ. දෙයක් කියලා නාමයක්නෙ පොතක් කියලා. පොතක් කියලා එතකොට පොතක් කියන එකටනෙ අපි රූපයක් කියලා කියන්නෙ. එතකොට පොත කියලා එහෙම දෙයක් නැහැනෙ. එතකොට බාහිර පොත් කියලා දෙයක් නැහැ. බාහිර තියෙන්නෙ සතර මහා භූත, දැන් මැටි නම් මැටි ඔක්කොම එකයිනෙ. කෝප්පෙ, පිඟාන, මල්වාස් එක එතකොට ඇතිලිය, මුට්ටිය සේරම මැටිනෙ. මැටිනෙ සතර

මහා භූත කියන්නෙ. පඨවි, ආපෝ, තේජෝ, වායො නෙ. ඝන, ද්‍රව, වායු ඒවා එක එක ආකාරයක සකස්වීමක්නෙ තියෙන්නෙ. භූත වීමක්නෙ සම්භූත වෙනවා කියන්නෙ ඒකනෙ. එතකොට ඒවා අපි මහා භූත නෙවෙයිනෙ දකින්නෙ. අපි දකින්නෙ පොතක්. අපි දකින්නෙ කෝප්පයක්, අපි දකින්නෙ පීරිසියක්. නමුත් අපි කිච්චනේ අලියෙක් වගේ සතෙක් ආවොත් ඔක්කොම පාගගෙන යනවා කියලා. ගම්මානවල ගෙවල් කුඩු කරගෙන යන කොට අපිට පේනවනෙ ඒ අලිය කියන සතාට එහෙම දේවල් නැහැනෙ. කෝප්පෙ, පිඟාන කියලා එහෙම නැහැනෙ. මේ සේරම මැටිනෙ. මැටි සේරම එකයි නෙ. ඒක නේද ඇත්ත. එහෙම දේවල් නෑ නේද? මෙන්න මේ අවබෝධය ඕන. මේ අවබෝධය ඔබට තියෙනවා. ඔබට මේවා ගැන අවබෝධයක් තියෙනවා. ඔබ දන්නවා එහෙම දෙයක් එහෙම නම් නැහැ කියලා. ඔබට දැන් ඒක වැටහෙනවා. එහෙම නම් බාහිර ඇත්තක් නෙවෙයි. ඒක ඔබට පැහැදිලියි. දැන් නාමය සිත ඇත්තකුත් නෙවෙයි. එතෙක් එහෙම ඝන දේවල් මොකුත් සිතක නැහැ. ප්‍රඥප්ති සම්මුති අපි හදාගත්ත දේවල් එහෙම ඒවායෙ තුළ ඝන දෙවල් නෑ. එහෙනම් සිතක පොතක් නෑනේ. දැන් හීනයක් දැක්කත් හීනේ ඔබ ගොඩක් දේවල් දකිනවා වුනාට හීනේ ඇත්තක් නොවෙයිනෙ. ඒක චිත්තයක් නෙ. අන්න ඔබට දැන් පේනවා නාමය. නාමය තුළ භෞතික එහෙම මොකුත් නෑනෙ. නාමය සත්‍යයක් නොවෙයි. නාමය තුළ පොතක් කියලා දෙයක් නැහැ. එතකොට අපිට දැන් බාහිරත් එහෙම දෙයක් හම්බවෙන්නෙ නැහැ. නාමය තුළත් එහෙම දෙයක් නැහැ. දැන් අපි හිත කියලා කියන්නෙ මොකක්ද? හිත කියලා කියන්නෙ එන අරමුණුනෙ. දැන් අපිට දෙයක් පේනවා. ශබ්දයක් ඇහැනවා. ගන්ධයක් දැනෙනවා. රසක් දැනෙනවා. ඒ වගේ ම සිතුවිලිත් එනවා. දැන් මේවා ඇවිල්ලා අරමුණුනෙ. හැම මොහොතක දී ම සිතේ ඉපිද නිරුද්ධ වෙනවා. පවතින සිතක් නැහැනෙ. ක්ෂණයක් ක්ෂණයක් පාසා ඉපිද නිරුද්ධ වෙනවා. (අවුත්තා සම්භූතං වුත්තානං විස්සති) පෙර නොතිබීම

හටගෙන ඉතිරි නැතිව ම නැති වෙනවා. එතකොට එතන පවතින දෙයක් නැහැනෙ සිතක. ඒක හටගෙන නිරුද්ධ වන ධර්මතාවයක් සිත කියලා දෙයක් කොහෙවත්ම නැහැ. ඒකයි අපි කිව්වෙ සිත කියලා දෙයක් නැහැ කියලා. සිත කියලා දෙයක් නෑ. ඒ සිත කියන්නේ ධර්මතාවයක් ඒ කියන්නෙ හටගෙන විරුද්ධ වෙනවා. සුළඟ වගේ සුළඟ කියලා දෙයක් නැහැනෙ. අපිට පෙන්නන්න බෑනෙ සුළඟ අපි පෙන්නන්නෙ බස ගහක අත්තක් හෙල්ලෙනවා. මොකක් හරි නෙ. එතකොට සුළඟ කියලා දෙයක් පෙන්නන්න බැහැනෙ. අපිට ගහ කියලා කිව්වට අපි ගහ කියලා පෙන්නුවට ගහ කියලා එහෙම දෙයක් නැහැනෙ. ඒක දෘෂ්ඨියක් නෙ. අතට ඇල්ලුවොත් වතුර ටිකක් නෙ. දැන් වැස්ස කියලා දෙයක් නැහැනෙ. වැස්ස වහිනවා කිව්වට වහින්නෙ කොහොමද? වැස්සක් මොකක් ද එතකොට ඇල්ලුවොත් අහුවෙන්නෙ වතුර ටිකක් නෙ. එතකොට වතුර බිංදු ටිකකට ද අපි වැස්ස කියන්නෙ. එතකොට වැස්ස කියන්නේ ප්‍රවාහයක් දෘෂ්ඨියක්. එහෙම එකක් නැහැ. අල්ලලා පෙන්නන්න පුළුවන් එකක් නැහැ වැස්ස කියල. හුළඟ කියලත් එහෙම පෙන්නන්න පුළුවන් එකක් නැහැ. අපි මේ උපමා තමා පෙන්වන්නේ සිතත් ඒකමයි. ප්‍රවාහයක් දෘෂ්ටියක්. එහෙම සිත කියල දෙයක් නැහැ. දැන් අවබෝධයට දැනුමට ඔබට දැනෙනවා. මේක ඇත්ත සිත කියල දෙයක් නැහැ. ඇතිවන නැතිවන ප්‍රවාහයක් තියෙන්නෙ. එතකොට මේ සිත හැදෙන්නේ කොහොමද ? අන්න එතෙන්ටනෙ අපි යන්න ඕන. දැන් මේවා දකින්න. ඇත්තට ම මේ දැන් අපි සිතුවිලි ගොඩක ගිනි ගොඩක සිතුවිලි ජාලාවක පැටලිලා ඉන්නකොට අපිට මේවා පේන්නෙ නෑ. මේ සිත ඇති වෙනවා නැතිවෙනවා කියන එකත් දකින්න අපිට සිහියක් ඕනනේ. අන්න සිහියයි නුවණයි වැදගත් වෙනවනේ. විසිරෙන හිතට දකින්න බෑනේ. එතකොට සමථය වැදගත් වෙනවනෙ. එතකොට ගිය පාර දේශනාවල පැහැදිලි කළා මේ නාම රූප පරිච්ඡේදයේ මුල් කොටසේ පැහැදිලි කළා මේ සමථයානික රහතන් වහන්සේ

නමකගේ කටයුතු සිද්ධ වන ආකාරය. මුල ඉඳන්ම අපි ආනාපානා සතිය කමටහනක් ලෙස උපමා කරගෙන ඒ සමථයානික රහතන් වහන්සේනමකගේ කටයුතු සිද්ධවන අකාරය මුල ඉඳන්ම අපි ආනාපාන සතිය කමටහනක් ලෙස මූලික කරගෙන ඒ සමථයානික රහතන් වහන්සේ රහත්භාවය ලබන ආකාය, ඒ විදර්ශනාවට එන ආකාරය, ඒ සමථය තුළින් සමාධිමත් සිත හදාගෙන ඒ ආකාරය. ඉතිං බොහොම සරලව කෙටියෙන් කියනවානම් සීල විසුද්ධිය, චිත්ත විසුද්ධිය, චිත්ත විසුද්ධියෙන් දිට්ඨි විසුද්ධියට, දිට්ඨි විසුද්ධියෙන් කංඛාවිතාරණ විසුද්ධියට කංඛාවිතාරණ විසුද්ධියෙන් මග්ගාමග්ග ඥාණ දස්සන විසුද්ධියට පටිපදා ඥාණ දස්සන විසුද්ධියට එන්නේ. දැන් එහෙම අපට වචන වලින් පෙන්වන්න කියන්න පුළුවන්. නැත්නම් තව විදිහකට සරලව කියනවනම් සිත තැන්පත් කර ගන්නව ඉන්ද්‍රිය සංවරය ඇති කරගන්නවා සීල විසුද්ධිය කියන්නෙ ඒ සිත සීලයක පිහිටව ගන්නවා විසිරෙන්න නොදී සමථය වඩනවා කියන්නෙ ඒකනෙ. සමථය වඩනවා කියන්නෙ එක අරමුණක සිත තියාගන්නවනෙ. ඉතිං ඒ තුළින් තමයි සමථයානික කියන්නෙ. ඒකයි සමථයානික කියන්නෙ. සමථ කියන්නෙ සිත විසිරෙන්න නොදී තියාගන්න එකට. එක නිමිත්තක තියාගන්න එක. සිත විසිරෙන්න නොදී තියා ගන්න එක තමයි ඒකෙන් අදහස් කරන්නෙ. ඉතිං ඒ තුළ ගැඹුරට යන්න පුළුවන් මනස විසිරෙන්නෙ නැතිව තියා ගැනීම තුළින් (සුබු සුබුම සත්ත සංඥා, සම්මා සුබ සුබුම සත්ත සංඥා) කියලා සමාධියකට යන්න පුළුවන්. ඒවත් ඔක්කොම විසිරෙන ඒවා ලෞකිකයි. හැබැයි එතන ලෝකෝත්තර ධර්මතාවය දකින කෙනාට ලෝකෝත්තර ධර්මය ඒ තුළින් දකින හැටි අපි පැහැදිලි කරා. දැන් මෙතනදී අපිට තියෙනවා ඔබට විශේෂ දෙයක් කියන්න. ශුෂ්කයානික රහතන් වහන්සේට කණික සමාධියක් උපදිනවා. මෙතන දී කණිඛ සමාධියක් කියල කියන්නේ ශුෂ්කයානික රහතන් වහන්සේට එන එන සිත සත්‍ය දැකලා මිදෙන සමාධියක්. ඒක අනිමිත්ත සමාධියක්. මෙතන

සවිතක්ක සවිචාර සමාධියක්. අතන දී හම්බවෙන්නෙ විතක්ක විචාර සමාධියක්. විතක්ක විචාර කියන්නේ මේ සිත විසිරෙනවා තැන්පත් වෙනවා විතක්ක විචාර කියන්නෙ. ඒ තුළ ප්‍රීති සුඛ ඒකාග්‍රතාවයකට යන එක විතක්ක විචාර සංසිඳෙන තැන. ඒකාග්‍රතාවය තමයි දියුණුම තැන. හතරවෙනි ධ්‍යානය. ඉතිං එතනින් තමා සමාධිමත් සිත ඇති කරගෙන මේ ධර්මතාවය දකින්න උත්සාහ කරන එක තමා සමථයානික ස්වභාවය, ක්‍රමය, දැන් එතන දී සිද්ධවෙන්නෙත් අවසානෙ දී විදසුන් නුවණ, විදර්ශනාභාවයෙන් තමයි සත්‍ය දැකලා දුකෙන් මිදෙන නිවන්මගට ප්‍රවේශවන්නේ එතනින්. විදසුන් නුවණ තමා වැදගත් වෙන්නේ. දැන් සමථයානික විදසුන් නුවණට එන හැටි අපි පෙන්නුවා. රූපයෙ දකින ආකාරය ශරීරය තුළ කෙනෙක් නැති බව දකින ආකාරය ආත්ම දෘෂ්ඨිය බිඳ වැටෙන ආකාරය කොටස් 42කට මේ ශරීරය බෙදලා දැකීම තුළ ඒ ශරීර කොටස් 42 හැදිල තියෙන පඨවි, ආපෝ, තේජෝ කියල දකින ආකාරය. එතන දී **''ඉති රූපං, ඉති රූපං සමුදයෝ, ඉති රූපං අත්තගමෝ''** කියල එතකොට ලක්ඛණ පදට්ඨාදාන කියල ඒ රූපයෙ ලක්ෂණ දකින එකත් පදට්ඨාදාන රූපයයි. ගති ස්වභාවය පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියල ඒ ඝන, ද්‍රව්‍ය, වායු කියල ඒ ස්වභාවය පඨවි ආපෝ තේජෝ වායෝ කියල ඒ ඝන ද්‍රව්‍ය වායු කියල ඒ ස්වභාව දකින එක. එතකොට ඒක අපි පෙන්නුවේ සමථයානික රහතන් වහන්සේ රූපය දකින ආකාරය. ඒ තමයි ලක්ඛෂණ පදට්ඨාන විදියට රූපය දකින්නෙ ඒක, සමථයානික රහතන්වහන්සේ සිත සමාධිමත් කරගෙන රූපයවිදර්ශනාවට එන ආකාරය තමයි එතනින් ප්‍රවේශය තියෙන්නෙ. රූපය දැකලා නාමය දකින්න ගන්න උත්සාහය. එතන අපි දැක්කොත් අපි යම්කිසි සම්පිණ්ඩනයක් විදියට මේ පැහැදිලි කිරීම ඔබට කලොත් මේ අපිට ඉස්මතු කරන්න ඕන වැදගත් කාරණා ටිකක් තියෙනවා. ඒ තැන් වල දී ඉස්මතු වෙන්නේ නැහැ. ඒ විදිහට ම පැහැදිලි කරගෙන යනකොට නමුත් අවසානයේ දී අපි ඔබට කිවුවා මේ සියල්ල අපි

සම්පිණ්ඩනය කරල පැහැදිලි කරනවා කියලා. ඒකෙ එක අදියරක් විදිහට අපි මේ උත්සාහ කරන්නේ මේ පැහැදිලි කිරීම් කරන්න. දැන් සමථයානික රහතන්වහන්සේ ලක්ඛණ පදට්ඨාදාන මේ විදිහට දකින දැකීමට රූපය දැකල තමයි නාමය දකින්න උත්සාහ කරන්නෙ. සමථයානික ක්‍රමේ දී එතන දී රූප විසි අට දකින්න උත්සාහ කරනවා. එතකොට මහා භූත, මහා භූත රූප පාදක කරගෙන තමයි සියලු රූප හටගන්නෙ. මෙන්න මේ වචනය ඉතාම වැදගත්. මෙන්න මේ ධර්මය තුළ පැහැදිලි කරන හැම තැනකදීම ඔබට ඒක අහන්න ලැබෙනවා. මේ රූපය ගැන පැහැදිලි කරනකොටත් ඔබට අහන්න ලැබෙනවා. ''**චත්තාරෝච මහා භූතානං**'' කියන තැනින් තමයි පැහැදිලි කරන්නෙ. ඒ කියන්නෙ මහා භූතයෝ පදනම් කරගෙන තමයි අනිත් රූප හටගන්නෙ. ''**චත්තාරෝච මහා භූතානං චතුන්නංච මහා භූතානං උපාදානය රූපං, රූපං වදේති**'' කියල කියන්නෙ ඉතාම වැදගත් කතාවක් මේ රූපය ගැන කියන. දැන් මොකක්ද මෙයා එන්න ඕනනෙ දිට්ඨි විසුද්ධියට. එයා එන්න ඕනනෙ මෙතන දී චිත්ත විසුද්ධියට. චිත්ත විසුද්ධිය තමයි දිට්ඨි විසුද්ධියට හේතුවෙන්නෙ. ඒ කියන්නෙ මෙයා මේකෙ සත්‍ය දකින්න ඕන. සත්‍ය දැක්කොත් තමයි එයාට දිට්ඨි විසුද්ධියට හේතුවෙන්නෙ. විසුද්ධිය කියන්නෙ සත්‍ය දකින එක. එයා දකින්න ඕන මේකෙ සත්‍ය දැක්ම කුමක්ද කියල. දැන් අපි ඉන්නෙ රැවටිලානෙ. එතනින්නෙ පටන් ගන්නෙ. අවිද්‍යාව තුලනෙ ඉන්නෙ. අවිද්‍යාව කියන්නෙ නොදන්නකම රැවටීමක් තියෙනවනෙ. මේකෙ මෝහයක්, සම්මෝහයක් තියෙනවනේ. මුලාවක් තියෙනවනෙ. අන්න ඒ මෝහයෙන් මිදෙන තැනනෙ අවිද්‍යාවෙන්මිදෙන තැනනෙ මේ විද්‍යා ලෝකය පහළ වෙන්නෙ. මහා ප්‍රඥාව සත්‍ය දකින තැනනෙ ඒක තියෙන්නෙ විමුක්ති මාර්ගය එන්නෙ එතනින්නෙ. එහෙනම් අපි සත්‍යයි දකින්නෙ. දකින්න, හොයන්නෙ මේ මාර්ගය තුළ උත්සාහ කරන්නෙ. එහෙනම් ඒ වෙනුවෙන් අපි රූපය දැනගන්නත් මේ

රූපයයි නාමයයි තමයි එතකොට මේ සියල්ලම කතාව තියෙන්නෙ. අපි ලෝකය කියල කිවුවොත්, ''සලායතන ලෝකෝ ලෝකෝ'' කියල බුදුන්වහන්සේ පෙන්වන්නෙ. ඒ කියන්නෙ ආයතන මගින් හැදෙන ලෝකයක් තමයි බුදුන් වහන්සේ පෙන්වන්නේ ධර්මය තුළ (සලායතන ලෝකෝ ලෝකං වදේති) කියන්නෙ ඇස කන නාසය දිව කය ආයතන වලින් අපි ලෝකයක් හදාගෙන ඒ ඉන්නෙ මවාගෙන වර්ණ ශබ්ද ගන්ධ රස ඕජා කියන ඒ මේ තමයි අපි හදාගත්ත ලෝකය. අපි ඇත්තට ම ඉන්නෙ ඇස, කන, නාසය, දිව, කය කියන දෙයින් හදාගත්ත ලෝකයක. ඒ කියන්නෙ ආයතන වලින් හදාගත්ත ලෝකෙක තමයි අපි ඉන්නෙ. ඒක බාහිර තියෙන දේ නෙමෙයි අපි හිතින් හදාගත්ත දෙයක් තියෙන්නෙ. ඒකයි ''චිත්තේන නීයති ලෝකෙ'' කියල කියන්නෙ, සිත තුළින් හදාගත්ත ලෝකයක් තියෙන්නෙ. දැන් මෙතන අපි පැහැදිලි කරගෙන ආවෙ සමථයානික රහතන් වහන්සේගේ ගමන තුළ රූපය පරජානාති අර රූපය දකින්න උත්සාහ කරන්නෙ. අපි කිව්වා විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා ඒ කියන්නේ එක නිමිත්තක හිත පිහිටවගෙන විසිරෙන හිත තැන්පත් කරගෙන ඊට පස්සෙ ඒ තැන්පත් හිත සමථය තුළ ඒ සමථයනෙ එන්නෙ විතක්ක විචාර කියන්නෙ ඒ හිත විතක්කයට විචාරයට අරමුණක තියාගන්න දරන උත්සාහය නෙ. පිට යන්න නොදී එතකොට මේ එන එතන එතන ඇතිවන සෑම සිතක් ම එකම නිමිත්තක තියා ගන්නවා සති නිමිත්තෙ. සතිය වඩනවා. මේක ලෞකික පැත්තේ ලෞකික සමාධියක් එතකොට එතන විතක්ක විචාර සංසිඳෙනවා ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියලා ඒකාග්‍රතාවයට එනකම් ඒ කියන්නේ හතරවෙන ධ්‍යානය කියන්නෙ එතන. එතන්ට එනකම් විතක්ක විචාර ප්‍රථම ධ්‍යාන ප්‍රීති සුඛ කියන්නේ දෙවෙනි ධ්‍යාන තෘතිය ධ්‍යාන සුවය සංසිඳෙන තැන ඒකාග්‍රතාවය සතර වෙනි ධ්‍යානය එතනදී මේ සිත විසිරෙන්නේ නැහැ. එතන සිත එකම ස්වභාවය පවත්වාගෙන ඉන්නවා සමාධිය තුළ. ඉතිං ඒකම තමයි ඔබ අපි

දැක්කා අපි උග්ගහා නිමිත්ත, පටිභාග නිමිත්ත, සති නිමිත්තට සිත පිහිටුවන ස්වභාවය අනුව අපර්නා සමාධිය එතන උපචාර සමාධියට එන්නේ එතකොට ඒ දියුණුම තැනක් කියලනේ ගන්නෙ. එතනින් එහා තියෙන්නෙ විදර්ශනාවට එන්න. එතනදි තමයි රූප බලන්නෙ. එතනදි මහා භූත දකින්න ඕන. පඨවි, ආපෝ, තේජෝ, වායෝ රූප දකින්න ඕන එතකොට තමයි චතුධාතු මනසිකාරය වැදගත් වෙනවා. එතකොට මෙතන ආත්මයක් නැතිබව දකිනවා. හතලිස් දෙකකට බෙදිලා පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා වෙන් කරගෙන පඨවි විස්සයි. ආපෝ 16 එතකොට තේජෝ 4 යි. වායෝ 6 යි. මේ විදිහට අපි දැක්කා අපි ඒවා ඉදිරිපත් කලා. දැන් එතන දි එන්නේ මේ රූපය. එතකොට මේකෙදිත් ඔබ මහා භූත දකිනවා. මේවිදිහට පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඒ විදිහට ම ඔබ රූප කලාපෙකින් රූපයක් හැදෙන තැනට එනවා. දකින්න ඔන්න ඔතන ඉතාම වැදගත්. අපි ඒක නාම රූප පරිච්ඡේද දෙවෙනි කොටසෙදි පැහැදිලි කළා ඒ රූප කලාප හැදෙන ආකාරය ගැන. අන්න ඒ රූප කලාපය හැදෙන ආකාරය ගැන ඇත්තටම සමාජය තුළ ප්‍රසිද්ධ කතිකාවත අඩුයි. නමුත් වැදගත් ම තැනත් එතනයි තියෙන්නේ. ඉතිං ඒ ගැන අවබෝධයක් නැතිකම තමයි ගොඩක් ප්‍රසිද්ධියට අඩුවෙලා තියෙන්නේ. එතන මේ ධර්මයෙ ඉතාම නිරවුල්ව ගන්න ඕනෙ. මෙතන අවසානයෙදිත් අපි ඒක මේ විදිහට සාකච්ඡා කරන්නෙ බොහොම පැහැදිලිව ගන්න ඕන. මෙතනදි රූපය කිව්වම රූප කාණ්ඩ විසි අට දකින කොටත් ඔබට මහා භූත හතරයි ප්‍රසාද රූප පහයි. එතකොට ගෝචර රූප පහයි බාහිර තියෙන රූප 4 යි. එතකොට කය ගන්නෙ මහා භූත කියලනෙ ඒක නිසා 4 යි. ඊට පස්සෙ ඔබට මේ ප්‍රසාද රූප ගැන අහන්න ලැබෙනවා. ගෝචර රූප කියන්නේ වර්ණ, ගන්ධ, රස ප්‍රසාද රූප කියන්නේ ඒවා ප්‍රසාද වන ඇස, කන, දිව, නාසයෙන් ප්‍රසාද වන රූප. ඉතිං ඒවා විඤ්ඤප්ති රූප විදිහටත් එනවා. එතකොට මේ ප්‍රසාද රූප, එතන අපි වෙනමම පැහැදිලි කළා. මෙතන කෙනෙක් නැති

බව තමයි. මේ දකින එකේ ඔබ අවසානෙට එන්න ඕන. අවසානෙදි ඔබට සිද්ධවෙන්නෙ කෙනෙක් නැති බවයි දකින්නේ. මෙතන කෙනෙක් දෙයක් නැති බවයි දකින්නෙ. මේකෙ අවසානෙදි ඔබ එන්නෙ මේ රූප හොඳට බල බල එන්නෙ මෙතන මේ ශරීරය මෙහෙම බෙද බෙද බලනකොටත් කේසා ලෝමා නඛා දන්තා තචෝ මංසං නහාරු අට්ඨී, අට්ඨී මිඤ්ජා වක්කං කියල මේකෙ ඝන ඒව මොනවද ද්‍රව මොනවද වායු මොනවද තේජෝ මොනාද කියල මෙහෙම වෙන් කරල බලන කොටත් කෙනෙක් හම්බවෙන්නෙ නෑ. මේ රූපය හරියට බලනවා කියන එකෙන් සිද්ධවෙන්නෙ රූපය ඇත්ත කරගන්න එකත් නෙමෙයි. රූපය ඇත්තට ම සත්‍යක් නොවන බව ''ඵේන පිණ්ඩුපමං රූපං '' කියන එක තමයි මේදී ඔබට එන්න ඕන. දැන් සමහර අයට විෂයක් විදිහට දැනුමක් විදිහට බාගෙට මේ දහම තුළ තාම ඉන්නෙ හරියට සම්පූර්ණ වෙලා නැහැ. අවබෝධය ධර්මය හරියට අවබෝධ නොවුනහම ඔහු රූපය ඇත්ත කරගෙනයි ඉන්නෙ. ඒ කියන්නෙ අධ්‍යනය කරනවා. යෝගාචර විදිහට ඉගෙන ගන්නවා. උත්සාහ කරනවා හොඳයි. නමුත් ඔබ තාම සම්පූර්ණ වෙලා නැහැ. ඒ කියන්නෙ ධර්මය සම්පූර්ණයෙන් අවබෝධයට පත්වෙලා නැහැ. ඒ තාක් ධර්මය දේශනා කරන්න සුදුසු නැහැ. තමන් දන්න ටික තමයි කියන්නෙ වෙන්නෙ. නමුත් එතන තමන්ම ඉන්නෙ සමහර විට තාම දෘෂ්ටියකනෙ. තාම හරියට අවබෝධ වෙලා නැනෙ. රූපය කුමක්ද කියල. ඒක නිසා රූපය ඇත්ත කරගෙනයි ඉන්නෙ. රූපය ඇත්ත කරගෙන ඉන්න තැනක ඉඳගෙන බණ කියන්න ගියොතින් ඔබ කරන්නෙ ඇත්තට දෘෂ්ටියක ඉඳගෙන තවත් කෙනෙක්ට දන්නෙ නැතුවයි කියන්නෙ පොත දිහා බලලා. බණ කියන අයට ගොඩක් ඒක වෙලා තියෙනවා. එහෙම ධර්ම දේශනා කරන්න බැහැ. ධර්මය දේශනා කරන්න නම් ධර්මය අවබෝධ වෙන්න ඕන. ධර්මය අවබෝධය නැතුව මේ පොතේ තියෙන එක මාතෘකාවක්ට පොතේ තියෙන වචන ටික කට පාඩම් කරගෙන කිව්වා කියන එකේ ඔබ රූපය ඇත්ත

වෙලා නම් ඔබ ඉන්නේ තාම ධර්මය තුළ නෙමෙයි. මිත්‍යාදෘෂ්ඨියේ, සම්මා දෘෂ්ඨියෙවත් නැහැ. සම්මා දිට්ඨිය තියෙන්නෙ රූපය ඇත්තක් නොවෙයි බව දකින තැනයි. රූපය ''නිච්චතෝ, අනිච්චතෝ'' කියන කොට ''අනිච්චං භන්තේ'' කියන්නෙ ලොකු තේරුමක් තියෙනවා. මේ නිකං අනිත්‍යක් නෙමෙයි. මේකෙ ලොකු තේරුමක් තියෙනවා. මේක තේරෙන්න මේ ඔක්කොම අවබෝධ වෙන්න ඕන. මේ ''අනිච්ඡ'' කියන වචනෙක තේරුම තියෙන්නේ අනිත්‍යයි කියන වචනෙ. එහෙම එකක් නෙවෙයි ඊටත් වඩා ගැඹුරුයි. රූපය කියල දෙයක් කෙහෙවත් ප්‍රතිශ්ඨාවක් හම්බවෙන්නෙ නැහැ. රූපය ඇත්ත කරගත්ත කෙනාට මේ ධර්මයේ එක ඇත්ත කරගත්ත එකෙන් මිදීම තමයි ධර්මය අවබෝධ කරගන්නවා කියන්නෙ. ඉතිං රූපය ඇත්ත කරගන්න යන්න එපා. පරමාර්ථ සත්‍යයක් කියල රූපය පරමාර්ථ සත්‍යයක් කරගෙන යන්නත් එපා. මොකද ඔය හතර මහා භූත කියල හතර මහා භූත තමයි. ඇත්ටම මේ රෑපයෙ පාදකය වෙලා තියෙන්නෙ. දැන් මොකද අපි ඛණික සමාධිය තුළ දැක්කොත් ඒ කියන්නෙ විදර්ශනා අපි ඒ ගැන කතා කළේ නැහැ තාම විදර්ශනා යානිකයාගේ ගත්තොත් ඔහු හතර මහා භූත බාහිර හතර මහා භූත කියලනෙ ගන්නෙ. එතකොට හතර මහා භූත සම්භූත වෙන එකක්නෙ සතර මහා භූත ඒ වුනාට සිතින් හදා ගන්න චිත්තජ උපාදාය රූපය සතර මහා භූතයට ගැට ගැහිච්ච නිසානෙ මේ ස්කන්ධයේ උපදාන ස්කන්ධය වෙන්නෙ බාහිර තියෙන්නෙ ඒකෙයි කියල අල්ල ගත්ත නිසානෙ. නමුත් එහෙම දේකුත් නැහැනෙ. එතකොට එහෙම දේකුත් නැහැ. ඒක තමයි අවබෝධ කරන්න තියෙන්නෙ. එහෙම දේකුත් නැති බව. එය අවබෝධ කලොත් තමයි සුඤ්ඤතාවයට එන්නෙ. සුඤ්ඤත මේතෝ විමුක්තියකටයි යන්නෙ. සුඤ්ඤත චේතෝ විමුක්තියට යන ගමනේ කොහෙවත් සුඤ්ඤතාවය නැතුව දෙයක් ඇත්ත වෙලා බැහැ. සමහර අය ධර්මය දේශනා කරන්නෙ ඇත්තට ම ප්‍රසිද්ධියට. ඉතිං ඒක ලාභ පෘතජ්ජන භූමිය, පෘතග්ජන භූමිය

තමයි ඇත්තට ම අනිත් අයගෙ කීර්තිය. ඒවට රැවටුනොත් එහෙම ඔබට ධර්ම මාර්ගය වැහෙනවා. ඔබ ඉන්නෙ ප්‍රීතියකට සමහර විට ඔබ ඉන්නෙ මාන්නෙකට, උන්මාදෙකට ලක්වෙලා. ඒ කියන්නෙ ඒ තුළ මත්වෙලා රාගයකට අසුවෙලා. ඒ තුල ධර්මය වැහෙනවා. ඉතිං ධර්ම මේ දේශනා කරන අයට තමයි මේ වචන ටික ගොඩක් වැදගත් වෙන්නේ. මේ අවසානෙදි කිවූ මේ පොඩි වචන කීපයෙ ඇස් ඇරෙන්න ඕන සමහර අවබෝධ ඇති වෙන්න ඕන. ඒ කියන්නෙ අවසානෙ ''සුඤ්ඤත චේතෝ විමුක්තියක්'' කරා යනවා කියන කොටත් තේරෙන්න ඕන. එහෙනම් සුඤ්ඤතාවයට යනවා කියන්නෙ රූපය ඇත්ත කරගන්න නෙමෙයි. මේ අධ්‍යයනය කරන්නෙ. රූපය ඇත්තක් නොවන බවයි ඔබ දකින්නෙ අවසානෙ. ඔබට මේ දේ ඇත්තටම රේරුකානේ චන්දවිමල හාමුදුරුවන්ගෙ නැත්නම් නා උයනේ අරියධම්ම හාමුදුරුවන්ගෙ ඒ පැහැදිලි කිරීමේ අවසානෙ දැක්කොත් රූපෙ ඇත්ත නෙමෙයි තියෙන්නෙ ඇත්ත වෙලා නෙමෙයි තියෙන්නෙ. දැන් මේ ලක්ඛණ බලන්නෙ පදට්ඨානදාන බලන්නෙ රූපය ඇත්ත කර ගන්න නෙමෙයි රූපයෙ ලක්ෂණ දකිනකොට තමයි තේරෙන්නෙ ඇත්තක් නොවන බව. එතකොට තමයි තේරෙන්නේ අනිත්‍ය ලක්ෂණය තියෙන්නෙ කියල. එතකොට නමුත් මේක ඉගෙන ගන්න කොට රූපය ගැන රූප කලාප වුනත් ඉගෙන ගන්න කොට අර අධ්‍යනය තුළ මැද හරියෙදි ඇත්ත වගේ තමයි ඉගෙන ගන්නෙ ඇත්ත වගේ එකක් ඒ කියන්නෙ ඇත්ත වගේ තමයි ඉගෙන ගන්න වෙන්නෙ එහෙම තමයි මේක අධ්‍යනය කරන්න වෙන්නෙ. පොත පත අධ්‍යනය කරන අයට තමයි ඒ වචන ටික කිවුවේ ඉතිං රූප කලාපය විශේෂයෙන් ම ඔබ කලබල වෙන්නත් එපා රූප කලාපය කියන වචනය ලොකු එකක් නෙවෙයි. අපි නාම රූප පරිච්ඡේදයෙ දේශනාවෙ දෙවෙනි කොටසෙ රූප කලාප ගැන තමයි විශාල කොටසක් පැහැදිලි කරන්නෙ. ඉතිං රූප කලාපයක් කියන්නෙ කුඩාම ඒකකය කියල ගන්නෙ රූපය හැදෙන්න රූප කලාප ප්‍රසාද

රූප හැදෙන්නෙ රූප 54 ක එකතුවෙන්. ඉතිං රූප කලාප විශාල ප්‍රමාණයකින්නෙ රූපය හැදෙන්නෙ. බුදු රජාණන් වහන්සේ පැහැදිලි කරන්නෙ විශේෂයෙන් ම ප්‍රසාද රූපය. මොකද මේ කතාවෙ ඔබට අවසානෙට යනකොට ඔබට මේ කතාවෙ ඉතුරු වෙන්නෙ ඇත්තම කිව්වොත් මේ කතාවේ ඉතුරුවෙන්නෙ ප්‍රසාද රූපයම තමයි. ඒ කියන්නෙ ඔබ යමක් දැන ගන්නෙ ඔබේ ම විඤ්ඤාණයෙන්. ශුෂ්කයානක රහතන්වහන්සේලා තමයි ඒ අවබෝධය. ඒ පැත්තෙන් තමයි ශුෂ්කයානික රහතන්වහන්සේ අවබෝධ කරන්නෙ. නමුත් සමථයානිකයා හිරවෙන්නෙ සමථයානික මේ අද ඉන්න බාගෙට දැනගන්න අයයි හිරවෙන්නෙ. ඒකට හේතුව මේ සම්පූර්ණ දැනගන්න කෙනාට හිරවෙන්නෙ නැහැ. මොකද සමාධිමත් හිතේ සමාධිය නම් දකින්නෙ සමාධිය තුළින් නම් මේ රූපය දකින්නෙ ගැටලුවක් එන්නෙ නැහැ. නමුත් දැන් මේ සමාධියත් නැතුව පොතෙන්නෙ දකින්නෙ. පොතනෙ බලන්නෙ දැන් පොතේ ලියල තියෙන එක කියවන්නෙ. එතකොට සිද්ධ වෙන්නෙ ඒක දැනුමක් විදියට අධ්‍යයනය කරන්නෙ. දැන් ඔහුට එතකොට ප්‍රත්‍යක්ෂ වෙන්නෙ නෑ. ප්‍රායෝගික නැති නිසා හිතනවා මේ රූපය තියෙනවා කියල දැන් සාමාන්‍ය පෘතග්ජන ඕනම මනුස්සයෙකුට සත්තුන්ට වුනත් මේ රූපය තියෙනවා කියල තමයි හිතෙන්නෙ. ඒකම තමයි දුක ඒකම තමයි මායාව ඒකම තමයි අපි රැවටිලා ඉන්න විද්‍යාව. දැන් ඒකෙන මිදෙන්න ඒක ඇත්ත කරගන්න ගිහිල්ලා බෑ. එතකොට ඒකෙන් මිදෙන්න ඒක ඇත්තක් නොවන බවම දකින්න ඕන. ඉතිං රූප කලාපය කියනකොට මේ කවුරුත් නොදන්න සැඟවුනු ඒ වගේ දෙයක් නිසා ඒක රූප කලාපයක් තියෙනවා කියල ගන්න යන්න එපා. ඇයි එහෙම කියන්නෙ අධ්‍යනය කරන්න රූප කලාප ගැන හොඳට අධ්‍යනය කරන්න සුද්ධාෂ්ඨකයකින්නෙ මේ සේරම හැදිල තියෙන්නෙ. එතකොට සුද්ධාෂ්ඨකය කියන්නෙ කුඩාම ඒකකයනෙ එන්නෙ. රූප කලාපයක් හැදිල තියෙන්නෙ සුද්ධාෂ්ඨකයකින්නෙ රූප කලාප

54 කින් රූපයක් හැදෙනවා කියන කොට ඔය හැම රූප කලාපයක් ම සුද්ධාෂ්ඨකයකින් හැදිලා තියෙන්නෙ. ශුද්ධාෂ්ඨක තමයි මූලික බේස් එක තියෙන්නෙ. එතකොට රූපය කියල දෙයක් කරගන්න යන්න එපා මේ කතාව අපි එහෙම හැම තිස්සෙම කියන්න හේතුවක් තියෙනවා. ඒ කියන්නේ රූපය කියල දෙයක් එහෙම මේකෙ දකින්න ලැබෙන්නෙ නැහැ. ඔබට නැහැ මේ සත්‍ය දකින කොට ඔක්කොම දකින්නෙ මේකෙ ඇයි මේ ලක්ඛණ පදට්ඨාදාන මෙහෙම දකින්න තියෙන්නෙ. එහෙම දකින්න තියන්නෙ එහෙම නැති බව දකින්නයි. ඒ රූපයම එහෙම දකින කොටයි එහෙම නැති බව දකින්නෙ. බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරන්නෙ මෙතන ප්‍රසාද රූපය ගැන දැන් ඔබ රැවටෙන්න එපා. ඔබ රූපය කියල දකින්නෙත් ප්‍රසාද රූපයම තමයි. ඔය සියල්ලම දකින්නෙ ප්‍රසාද රූපයෙන් තමයි. ප්‍රසාද රූපය දකින එක තමයි ප්‍රසාද රූපයකටයි රූප කලාප 54 ක් තියෙන්නෙ. ප්‍රසාද රූපයෙන් තමයි අනිත් රූප සියල්ල දකින්නෙ. අමතක කරන්න එපා මොකද ඔබ කොහොමද දකින්නෙ ඇහෙන් තමයි මේ වර්ණ පේන්නෙ. ඇහැට පේන්නෙ චක්ඛු ප්‍රසාද රූපයක් නෙ. ශබ්දය එතකොට සෝත ප්‍රසාද රූපයකින්නෙ. එතකොට චක්ඛු ප්‍රසාද රූපයක රූප කලාප 54 ක් තියෙනවනෙ. එතකොට චක්ඛු ප්‍රසාද රූපනෙ එතකොට මේව සේරම ප්‍රසාද රූප අමතක කරන්න එපා ආයතන හයෙන් තමා මේ ප්‍රසාද රූප තමා අපි අධ්‍යයනය කරන්නෙ. මේ අධ්‍යනය කර කර යන කොට ප්‍රසාද රූපයක් කියන කොට දැන් ඔබට ඇහෙන් පේනවා ඇහෙන් දෙයක් පේනකොට ඒ පේන රූපය කොහොමද හැදුනෙ කියන එක එතකොට ඒ රූපය ඔබ දැන් කියන්නෙ පොතක් කියලනෙ ඕකෙ පොතක් කියල කතාවක් නෑ. ඉස්සෙල්ලා ඒක ලිහා ගන්න. ඒක මොකද මේ ඇහැ දන්නෙ නෑ. ඇහැ කියන්නෙ කැමරාවක්. ඇහෙන් ගන්නෙ කැමරාවෙන් ගන්නෙ ෆොටෝ එකක්. එතකොට මනෝ විඤ්ඤාණයෙන් තමා පොත කියන එක ගන්නෙ. එතකොට මනෝවිඤ්ඤාණෙට තාම ගිහිල්ල නෑ.

මේ පංචද්වාරනෙ. ද්වාර කියන්නෙ දොරටුනෙ දොරටු වලින් ඇතුලටනෙ මේ අරමුණු එන්නෙ ආරම්මණ එන්නෙ. එතකොට මනෝ විඤ්ඤාණෙට තාම ගිහිල්ල නෑනෙ. මේ සිද්ධිය තමයි අවබෝධ කරගන්න මේ පැහැදිලි කිරීම. නැත්නම් මේවත් අන්තිමටම වෙනින් විදියකට තමා පැහැදිලි කරන්නෙ ගැඹුරෙන් ගැඹුරට යනවා මේ ධර්මය කියල කිවුවේ ඒකයි. දැන් ද්වාරයෙන්නෙ අරමුණු එන්නෙ. එතකොට දැන් අරමුණු චක්ඛු ද්වාරයෙන් එන්නෙ දැන් වර්ණයනෙ. වර්ණාරම්මනයක් එතකොට සෝත ද්වාරයෙන් එන්නෙ මේ ශබ්ද ආරම්මනනෙ. මේ ආරම්මනනෙ. මේ ගෝචර රූප කියන්නෙ ඒවානෙ.

# ★ 4 වෙනි පරිච්ඡේදය ★

# රූපය පිළිසිඳ දැකීම
## (සමථයානික, ශුෂ්ක විදර්ශක)

එන්නේ රසාරම්භනයක්. එතකොට කාය ප්‍රසාදයෙන් එන්නේ ඒ විදිහටනේ පොට්ඨබ්බාභාරම්මනයන් නේ. දැන් මෙතන ආරම්භනය කියන්නේ ප්‍රසාද රූපයක්. ඒ ප්‍රසාද රූපය කියන්නේ එතකොට චක්ඛු ප්‍රාසාද රූපයක් කියන්නේ ඒක තමයි. රූප කලාප 54කින් හැදෙන්නේ. රූපකලාපයක් කියන්නේ. එක රූප කලාපයක් කියන්නේ ශුද්ධාෂ්ඨකයක්. මේ කථාවේ ශුද්ධාෂ්ඨකය කියන්නේ කුඩා ම ඒකකය. ඒකකය කියන්නෙ එහෙම දෙයක් නෑ. ඒක අපිට ශක්ති ස්වභාවයක් වගේ එකක්. ඒක ඔබට දකින්න පුළුවන් එකක් නෙමෙයි නේ. ඇහැට දකින්න බෑනේ. ඒක අංශුවක් කියල කියන්නත් බැහැනේ. ඒක ශක්ති ස්වභාවයක එකක් නේ. ඒක අංශු ස්වභාවයෙන් තමයි පැහැදිලි කරන්නේ. අංශුවක් කියල අරගෙන ඒ වගෙ ස්වභාවයකින් අපි පැහැදිලි කලා. නමුත් ඒක අංශුවක් විදිහට පෙන්නුවාට ඒක අංශුවක් විදිහට නෙමෙයි ඇත්තට ම පෙන්නන්න ඕන. ඒකකයක් කියන නමින් තමයි අපිට මේ වචන තමයි පාවිච්චි කරන්නේ. ඒකකයක් කියල කියමුකො අපි රූප කලාප කුඩාම ඒකකයක්, ශුද්ධාෂ්ඨකයක් ඒ කියන්නේ. ශක්ති ප්‍රභවයක් කීවත් හරි. ඒ ශක්ති ප්‍රභවය ශුද්ධාෂ්ඨකයක් ශක්ති කියන වචනයක් පාවිච්චි කරන්න ඕනෙත් නෑ. ප්‍රභවයක් කියන්නත් පුළුවන්. ඕනම වචනයක් අපි මෙතැනට හඳුන්වාදීමක් නෙ ඕනේ. ඒක ඇහැට පේන එකකුත් නෙමෙයි ඒක ශුද්ධාෂ්ඨකයක් තියෙන්නේ. මේ ශුද්ධාෂ්ඨකය කියන්නෙ ශක්ති ස්වභාවයක් නේ. හේතුව මේක දැන් මේ

ශුද්ධාෂ්ඨකයේ ස්වභාවය. ඒ කියන්නෙ ඝන දෙයක් කියල හිතන්න එපා. ඝන වගේ ඒවා නෙමෙයි. ස්භාව, පඨවි, ආපෝ, තේජෝ, වායෝ මේ ශක්ති ස්භාව, පඨවි කියන්නෙ ඝනවෙන ශක්තියක්. අපි මේ දැන් අවසානයේ දී කියන එකක් මේ දැන් කියන්නේ. මුලින් අපි පඨවි ඝන කියලා කිව්වට ඝන, ද්‍රව, රස්නෙ මෙහෙම කිව්වට. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ඝන, ද්‍රව, රශ්නිය (උෂ්ණුසුම) වාතය කියල කව්වට ඔබට දැන් එහෙම කියන කොට මේ දැන් එහෙම දේවල් තියෙනවා වගෙනෙ දැනෙන්නෙ. ආත්මීය දෘෂ්ඨියකින්නෙ අපි මේවා බලන්නේ. ආත්මීය දෘෂ්ඨියෙන් බලනවා කියන්නේ සවිඤ්ඤාණ, මනසකින්නේ බලන්නේ. අපේ තියෙන හිතෙන් ද අපි මේ මානසිකාරයෙන්නෙ දකින්නේ. දැන් මනසිකාරයෙන් අසරණ කමක් තියෙනවා. මේ සත්‍ය දකින්න බැරි. ඒක නිසා අපි මුලින් අපි මේ මාර්ගය තුළ කටයුතු කරන මුලින් නවකයාට අපි පෙන්නන්න සිද්ධ වෙන්නේ එයා ඉන්න ස්වභාවය එයාට තේරුම් ගන්න පුළුවන් විදිහට. එතකොට අපිට පොතක උනත් දකින්න ලැබෙන්නෙ. ලියන්නෙ දෙයක් තියෙනවා වගේ. පඨවි කියල දෙයක් තියෙනවා වගේ එතකොට ඒ ඝන, ද්‍රව ඔය විදිහට තමයි ඔක්කොම ඔය විදිහට පැහැදිලි කරන්නේ. ඒක එක්තරා අඩියරක් හිතන්න එපා. ඒක අවසානය කියලා අවසානය නෙමේ. නිට්ටාව නෙමේ. අවසානයම නෙමෙයි ඒ දැන් ඔබ එන්න එපැයි මෙතනින් යථා භූත ඥානයට ඔබ අභිඤ්ඤාවට එන්න එපැයි. ඔබ අභිඤ්ඤාව අවදි වෙන්න එපැයි ඔබේ අභිඤ්ඤාවෙන් දකින කොට ඔහොම නෙමෙයි පේන්නේ. හැබැයි අභිඤ්ඤාවෙන් දකින්න පෙර මුල් අවස්ථාව මෙන්න මේ සිද්ධාන්තය හැටියට දකිනවා. ඒත තමයි ඔබ ඉන්න තැන. ඔබට තාම අභිඤ්ඤා නැති නිසා තමයි ඔබ දෙයක් තියෙනවා වගේ කථාකරන්නේ. හැබැයි මේ අපේ භික්ෂූන් වහන්සේ නමක් හරි මේ විදිහට අධ්‍යාත්මිකව දියුණු නම් උන්වහන්සේට වැටහෙනවා උන්වහන්සේ ඇත්තට ම මහා දියුණු මනසකින් දකිනවා එහෙම දේකුත් නැති බව.

එහෙම දේකුත් නෑ. මේකේ අවසානයේ අන්න ඒ කෙළවර තියාගන්න. ශුන්‍යත පටිසංයුත්ත දේශනාවේ තියෙන්නේ බුදුන්වහන්සේ දේශනා කරන්නෙ එතැනට යන්න. සුඤ්ඤතාවය කරා යන්නයි. සුඤ්ඤත චේතෝ විමුක්තියක් කරා යන්නයි. එතකොට සුඤ්ඤතාවය එක පාරටම දකින්න බෑ. ඒක නිසා අපි අදියරයෙන් අදියරය එන්න ඕන ගැඹුරට. එතකොට මේ සත්‍යදකින කෙනෙක් අවබෝධ වුනුකෙනෙක් පැහැදිලි කරන කොට ඔහු පැහැදිලි කරන්නෙ බහු සත්‍ය දැකලා. ඔහු සත්‍ය දකිනවා. එතකොට ඔහු දන්නවා මෙහෙම දේකුත් නැති බව නමුත් ඔබට පැහැදිලි කරන්න ඕන නිසා එතැනින් ඉඳගෙන කථාකරනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, කියලා පොතුත් ලියනවා. වෙන්න පුළුවන් නමුත් ඒක ඔහු නොදැන නෙමේ කරන්නේ. දැන් පුංචි ළමයෙක් එක්ක සෙල්ලම් ගේ ඇතුලේ අම්ම ගිහිල්ලා සෙල්ලම් කළාට අම්ම කිව්වට රසයි කියලා මේ වැලි කෝප්පයක්නෙ දෙන්නේ. වැලි කෝප්පයක් කිරිබත් කියලනෙ කන්නෙ නමුත් එතැන වැලිනෙ තියෙන්නේ. නමුත් අම්ම දන්නවනේ මේක එහෙම නෙමෙයි කියලා. අන්න ඒ අවබෝධය මේ සත්‍ය අවබෝධ වුනු කෙනා දන්නවා පඨවි කියල දේකුත් නෑ. වායෝ කියල දේකුත් නෑ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සේරම මේ අවබෝධයට පත්වුනු කෙනාට අවබෝධයි. මේ සේරම සම්භූත කියලා. සම්භූත කියන්නෙ සකස් වෙනවා. සකස්වෙන ශක්ති ස්වභාව ටිකක් තියෙන්නේ නැතිව එහෙම එකක් නෑ. මෙතැන ශක්ති ස්වභාව ටිකට සකස් වීමක් තියෙන්නේ. මේක උපමා කරනවා නම් දැන් උෂ්ණුසුම වැඩිනම් ජල වාෂ්ප සීතල වේ ගෙන එනවා නම් උෂ්ණුසුම අඩුවෙන කොට ඒ ජල වාෂ්ප ඝනීභවනය වෙලා ද්‍රවයක් වෙනවා. තවත් ශිතල වැඩි වෙනකොට ඒ කියන්නේ උෂ්ණසම් අඩු වෙන කොට ඒ ද්‍රව තවත් ඝන වෙලා අයිස් කැටයක් වෙනවා. මේකේ අනිත් පැත්තට කියනවා නම් අයිස්කැටය තේජෝ ධාතුව වැඩිවෙන කොට රස්නෙ වැඩිවෙන කොට ද්‍රවයක් වෙනවා. ඒ කියන්නෙ පඨවි ද්‍රව

වෙනවා. තේජෝ ධාතුව වැඩිවෙන කොට එතොට ද්‍රවය තවත් තේජෝ ධාතුව වැඩි වෙන කොට වායෝ වෙනවා. එතකොට මේ විදිහට මේක වායෝ මේක ඇවිල්ලා තේජෝ ධාතුවත් එක්ක කියල කිසිම දෙයක් නෑ. ශක්ති ස්වභාවයක් තමයි තේජෝ කියන්නේ. තේජෝ කියන්නෙ රස්නියනේ. ඒකේ ශක්ති ස්වභාවයක් තියෙන්නේ. මේ රස්නියත් එක්කලා ඒ අපි අංශු කියලා කිව්වොත් එහෙම ඒ අංශු ශිතල වෙලා ඝන වෙලා අයිස් කැටයක් වෙන කොට ඒ අපි උපමා ගන්නේ උදාහරණයක් හැටියට. ඒ අංශු ටික තවත් ශීතල වැඩි වෙන කොට ඝන වෙලා ඒ අංශු ටික රස්නිය වැඩිවෙන කොට ද්‍රව වෙලා තවත් රස්නිය වැඩිවෙන කොට වායෝ වෙලා, නැත්තට නැති වෙනවා කියන එක. එතකොට එතන අන්තිමට වතුරත් නෑ. අන්තිමට ම වායුවත් නෑ. අන්තිමට ම අර අංශු බවට ම පත්වෙච්ච එකක් තියෙන්නේ. අංශුව එකතු වෙලා ඝණ වෙන එකක් තියෙන්නේ. දැන් මේ විදිහට ඔබ දැක්කොත් ඔබට මේ මහා භූත දැන් මෙතන කියනවානේ ධාතුමස්තකය කියලා. ධාතුමස්තකය කියන මාතෘකාව මේ හරියට මේ එක කමටහනක් වැඩුවොත් නිවන් දොරටුවම ඇරෙනවා. හතර මහා භූත හරියට මේ ධාතුමස්තකයක් හරියට වැඩුවොත් ඒ ධාතු මනසිකාරය හරියට වැඩුවොත් නිවන් දොරටුවම ඇරෙනවා. ඒක තමයි මේ පෙන්නන්නේ. මේක ගැඹුරෙන් ගැඹුරට යන හැටි දැන් අපි හිතමු. උපමාවක් විදිහට කොස් ගහ ගමු. කොස්ගහ කියන්නේ දැන් ඝන දෙයක්නේ. ඒක අල්ලන්න පුළුවන්නේ. පඨවියක්නේ. නමුත් මේකෙ රස්නිය ගොඩාක් වැඩි වුනොත් ඉතිං මේක පිච්චෙනවනේ. ඔබ දන්නවා පෘථිවියෙ රස්නිය වැටෙන කොට තණකොළ ගස් පවා අළුවෙලා කාන්තාර බවට පත් වෙනවා. ඉතිං මේ වගේ ඔබ මේ රස්නිය වැඩිවුනොත් මේ කොස්ගහ වුනත් මේ අළුවෙලා යනවනේ. ඊට පස්සෙ තවත් රස්නිය වැඩි වුනොත් ඉතිං එහෙම ඊට පස්සේ ඒක ගිය තැනක් සොයාගන්න බැරි වෙනවනේ. දැවිල ගිය තැනක් සොයාගන්න බැරි වෙනවනේ.

දැන් පෘථිවියට ඒ දේ සිද්ධ වෙනවනේ. රස්නෙ වැඩිවෙලා සූර්යා රත්වෙලා මේ විදියට කථා කරනවනේ. මේ විදිහට තමයිනෙ කෙනෙක් මැරුණම අවන් එකට දැමීමට එයා ගිය තැනක් නෑනෙ. ශරීරය ගිය තැනක් නෑනෙ. ශරීරය දැවිල නැත්තං නැතිවෙනවනේ. එතකොට මේ ඝන වුනෙත් මොකක්ද අවසානයේ දී අපි මේක අනිත් පැත්තට හරවමුකෝ. දැන් අයිස්කැටයට වෙච්චදේනේ වෙන්නේ. ඒ කියන්නෙ මේ රස්නිය ශීතල වෙන කොට ඝන වෙලා තවත් ඝන වෙලා ද්‍රව වෙලා, ද්‍රව තවත් ඝන වෙලා පඨවි වෙලානේ. ආයි රස්නිය වැඩිවෙන කොට පඨවි ඝනය ද්‍රවවෙලා වායු වෙලා නැත්තට ම නැති වෙනවනේ. එතකොට මේ නැතිවුනේ මොකක්ද? ඒ නැති වුනෙ අවසානයේ දී නැතිවෙලා ගියා කියන්නෙ මොකක්ද? එතකොට අරතියෙන රස්නියම නේද මේ ශක්තියම නේද මේ මේ ශක්ති ස්වභාවයක් ම නේද ඝන වෙලා තියෙන්නේ. හොඳට බලන්න මෙතැන දැන් අපි අංශු ටිකක් ඝන වෙලා ද්‍රව වෙලා අයිස් කැටය හැදෙන එකක් අංශු විදිහට දැක්කාම පේනවනෙ උපමාවකින් දැන් මේකම නේද ශක්ති ස්වභාවයක් විදිහට ඝනවෙලා දැන් මේ කොස්ගහ කියන්නෙ ඇත්තට ම ඝනයක් ද? බැලුවම නෑනෙ අර ශක්තියමනෙ ඝන වෙලා තියෙන්නේ. එහෙනම් ආයි අනිත් පැත්තට කොස්ගහ අළුවෙලා නැත්තට නැති වෙනවා නම් ඒ ශක්තියමනෙ තියෙන්නේ. එතකොට මේ ධාතු මනසිකාරය හඳුනාගෙන හරියට වැඩුවොත් එයාට තේරෙන්න ඕන මේ හතර මහා භූත ම එහෙම දෙයක් නැතිවෙන බව ශූන්‍යතාවයට දකිනවනේ ශූන්‍යතාවය පේන්න ගන්නවනේ. ඉතිං ඒ නේද ශූන්‍යක චේතෝ විමුක්තිය යට යන පාර ඒක නේද මේකේ අවසානය. මේකේ මේ අපි මේ රූපය ඇත්ත කරගන්න නෙමෙයි. රූපයෙ සත්‍ය දකින්නයි ඕන. ඉතිං මෙතැන අපි දැන් කථා කරන්න ගියේ රූප කලාපෙත් මේ කථාවමයි තියෙන්නේ. දැන් මෙතැන ශුද්ධාෂ්ඨකය කියන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන්නෙ අර විදිහම ශක්ති ඝන වීම් ටිකක්. ඒකෙම

ශුද්ධාෂ්ඨකයෙම වර්ණ, ගන්ධ, රස, ඕජා කියලා කියන්නේ අටක් නේ. අට කියන්නේ පඨවි, ආපෝ, තෝජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නේ මේකෙ වර්ණයක් තියෙනවා. ගන්ධයක් තියෙනවා. රසයක් තියෙනවා. ඕජාවක් තියෙනවා. දැන් මේකේ සියුම් අංශුවක මේ සේරම තියෙනවා. ඔය කියන විදිහට ඕනම තැනක. ඕනම තැනක. ඒ කියන්නෙ ඕනම තැනක. ඕන අංශුවක තියෙනවා. ඇත්ත කථාව කිව්වොත් ඕකයි. ඒ කියන්නෙ මේක ශක්ති ස්වභාවයක්. ඒ ශක්ති ස්වභාවය හැම තැනම එකයි කියන එකයි. මේකෙදි අපේ මේ අපේ මේ දෘෂ්ඨිය තුළ වෙන්කරල දැක්කම එහෙම වෙන් කරන්න පුළුවන් කමක් නෑ. මේ සත්‍ය දකින කෙනාට වෙන්වෙලා පේන්නෙ නෑ. සියල්ලම එකට වෙනවා. ඒක තමයි අවසාන උත්තරේට එන්නෙ. නමුත් අවසාන උත්තරේ දැන් සමීකරණය ගානක් දීල අන්තිම උත්තරේ මුලින් කීවට ළමයෙකුට තේරෙන්නෙ නෑනේ ඒ වගේ ඔබට දැන් මේක තේරෙන්නේ නෑනේ. ඔබ දැන් තාම ඉන්නේ මේ පොත් ටිකනෙ ඉගෙන ගන්නේ. ඒක නිසා ඔබට අපිට කියන්න සිද්ධවෙනවා. ඔය කියන පොතේ තියෙන විදිහට එතකොට පොතේ තියෙන විදිහ අපි කියනවානම් ශුද්ධාෂ්ඨකය කියන්නේ අටක් තමයි. එතකොට පොතේ තියෙන විදිහටම අපි බලමු. පඨවි, ආපෝ, තේජෝ, වායෝ 4 යි වර්ණ, ගන්ධ, රස, ඕජා 4 යි. අටයි. නමුත් ශුද්ධාෂ්ඨකයේ අපි කථාකරන කොට සියුම් ම අංශුවයි. ඒක බාහිර තියෙන එකද ප්‍රසාද රූපයත් බාහිර තියෙන එකත් එකමයි. නමුත් අපි ඒවත් පටලවගෙන හින්ද අපි ඒවත් නොකිය ඉමු. අපි කියමු මේක ප්‍රසාද රූපයෙ කියලා. ප්‍රසාද රූපයක රූප කලාප 54 ක් තියෙනවනේ. දැන් ඕකනෙ ලිහල බලන්න යන්නෙ මේක එතකොට රූප කලාප 54 රූප කලාප පනස් හතර ම ශුද්ධාෂ්ඨකයකින් හැදෙන්නේ. එක රූප කලාපයක් අපි ගමු. එතකොට දැන් චක්ඛු ප්‍රසාද රූප කලාපයක් ඇසට එන රූපාරම්භනයක ප්‍රසාද රූපෙක, රූප කලාප පනස් හතර දිහා

බැලුවොත් ඔබට පෙනෙයි ඒකේ චතුසමුට්ඨානං, කම්ම, චිත්ත, සෘතු ආහාර කියන හතරට බෙදනවා. ඔබ ඒවා දන්නවානම් ඔබට ඒවා දැන් කියන කොට තේරෙනවා. එහෙම නැත්නම් ඔන්න ඔබ මේක දැනුමට ගන්න. කම්ම, චිත්ත, සෘතු, ආහාර කියල හරට බෙදනවා. බෙදන්නේ මෙතැන මේ ධර්මයම තමයි මේක අවබෝධ කර ගන්න මේ යන පාරේ මේ මෙහෙම දැනුමක් මෙතන තියෙනවා. එතකොට භය වෙන්න දෙයක් නෑ. මේ ලොකු වචන නෙවෙයි. මෙතැන කම්ම, චිත්ත, සෘතු ආහාර කියන්නේ මේ චක්ඛු ප්‍රාසාද රූපය කියන්නෙ වර්ණාරම්මණයක් ඇහැට එනකොට ඒ ප්‍රාසාද රූපයක්, චක්ඛු ප්‍රාසාද රූපයක් රූප කලාප 54කින් හැදිල තියෙනවා කියල දැන් ඔබට ගොඩවල් පනස් හතරක් පේනවා. ඒ ගොඩවල් ටික එකතුවෙලා ප්‍රාසාද රූපයක් හැදිච්ච බවක් පේනවා. හැබැයි මේ පනස් හතරම දැන් අපි බැලුවොත් පොඩ්ඩක් ඒත් පනස් හතරත් බෙදෙනවා ගොඩවල් හතරකට. එකක් කම්ම, දශකයක් එතකොට කම්ම, චිත්ත, රිතු ආහාර කම්ම කියන එක අපි පොඩ්ඩක් තියමු. ඒක ගොඩවල් 3 කට බෙදෙනවා. අපි චිත්ත, රිතු, ආහාර කියන ගොඩවල් බැලුවොත් දැන් අපට මේ ප්‍රධාන පේන හැම දේකම ආහාර රූපයක් පෙනෙනවා. ආහාරයක් නැතිව රූපයක් වර්ධනය වෙන්නෑ. ගහක් වුනත් හැදෙන්නෙ ආහාර වලින් නේ. දැන් මේ ශරීරය වුනත් ආහාරයෙන්නේ යැපෙන්නේ. එතන ආහාර රූපයක් තියෙනවා කියලා. සාමාන්‍ය කෙනෙකුට වුනත් මේ කියනකොට තේරෙනවා. ඇත්තට ම එහෙනම් ආහාර රූපයක් තියෙනවා කියලා. ඔබ දැන් මේ කියන පැහැදිලි කිරීම හොඳට ම පේන්න ගන්නවා. කොස් ඇටයක් කොයිතරම් පුංචි ද? කොස් ඇටේ අගල් එකහමාරයි. නමුත් පොළොවේ තියෙන ඕජාව මේ මැෂින් එකක් වගේ උරනවා. උරලා පොළොවේ තියෙන ඕජාවෙන් ම නේද දැවැන්ත කොස්ගහක් හදන්නේ අඩි 50, 60 ක. එතකොට මේ අගල් 1 1/2ක පුංචි මේ ඇඟිල්ලක කොටසක් වගේ පුංචි කැල්ලක් කොහොමද අඩිගානක් අඩි පනහ හැටක දැවැන්ත

වෘක්ෂ රාජයෙක් හැදෙන්නේ අර පොළොවෙ තියෙන ඒවා සේරම එතකොට මේ පුංචි කොස් ඇටෙන් ද ගත්තේ. මෙන්න මෙතැන එතකොට පේනවා. මෙම ස්වභාවයක් තියෙනවා. ඒකට කියනවා ඇත්තට ම බීජ නියාමය කියලා. පංච නියාම ධර්ම, චිත්ත නියාම, ඍතු නියාම, කම්ම නියාම, බීජ නියාම, නියාම ධර්ම නියාම කියන්නේ මේ නියාමනයක් මේ සිද්ධි මේක ස්වභාවයක් තියෙනවා. දැන් ඍතු නියාම කියන්නේ අව්ව පායනවා. අපි දන්නවා මේ මෝසම් වැස්ස, නිරිත දිග මෝසම, ඊසාන දිග මෝසම මේ ඍතු නියාම තියෙනවනේ දැන් අපි දන්නවා සමහර රටවල් වල දැන් ග්‍රීස්ම ඍතුව. මේ ශිත ඍතුව, ඍතු තියෙනවා. මේ ඍතු නියාමනේ ඍතු කියන්නෙ උෂ්ණත්වය සම්බන්ධ කරගෙනයි. ඍතු කියලා ආකාරයකින් ගෙන තියන්නේ ඒක තේජෝ ධාතුවත් එක්කයි. එතකොට ඒ තේජෝ ධාතුව හැමතැනම බලපානවා. මේ කථාවේ තේජෝ ධාතුව නැති තැනක් නෑ. මේකේ තේජෝ කියන එක ලොකු තේරුමක් තියෙනවා. ඕජා කියන්නෙ වේගයක් තියෙන ස්වභාවයක් ගලන ස්වභාවයක්, මේවා ඉතාම ගැඹුරුයි. දැන් මේ කියන තැන ඉතාම ගැඹුරුයි. ඔබට සමහර විට ඔරොත්තු නොදෙන්න පුළුවන්. ඒක ඔබේ දැනුමට ගන්න. එහෙම නැත්නම් ඔබ මේක ඇත්තට ම මේ ඉතාම ගැඹුරු තැනක් මේ කියන්නේ. දකින්න ලැබෙන්නේ. ඥාණ, අභිඥා අවධිවූ අයට පමණයි. මේ විදිහට හොඳට ගලපන්න හැකියාව තියෙන්නේ. අපි මේ ගලපන කාරණාව සිතක් හැදෙන තැනක් පෙන්නන්නෙ මේ විදිහටමයි. කොහොමද මේ සිතක් හැදෙන්නෙ කියන එකත් අපි මෙතැනට පෙන්නන්නෙ ඇත්තටම රූප කලාපයක් ගැන නේ. නමුත් සිතක් හැදෙන විදිහත් අපි පස්සේ අපි දේශනයක් ඉදිරිපත් කරන්නම්. මීට කලිනුත් අපි එවැනි දේශනා යම්කිසි කොටසක් ඉදිරිපත් කලා. සම්පූර්ණ දේශනයක් කළේ නැහැ. මොකද මේ සමාජෙට තාම එහෙම අධ්‍යාත්මික දියුණුවක් සමාජයේ අපි එහෙම අය දකිනවා අඩුයි. කෙනෙක් ඇහුවොත් කියනවා ඇර ප්‍රසිද්ධියෙ

එහෙම කරන්න සමාජෙට ඒවා අහන්න අය නෑ. ඒත් බොළඳ විදිහට මේ මනසවල් ඇත්තට ම බොළඳ වෙලා. බොළඳ දේවල් කියලා කියලා ඇත්තට ම ගුණවත්කම මේ වගේ අධ්‍යාත්මික දේවල්, කථා කරලා නැතිකමට මුළු සමාජයේ ම මිනිසුන්ගේ මානසිකත්වය බොළඳත්වයක් තියෙනවා. එතැනින් අධ්‍යාත්මික පැත්තට දියුණු වෙන්න නම් මේ වගේ කථිකාවක් කරන්න ඕන. ඒ නිසාම තමයි අපි මෙහෙම ඉදිරිපත් කරන්නෙ මේ ගැඹුරු කාරණා. සිතක් හැදෙන්නෙ කොහොමද කියලා තමයි ඇත්තට ම වැදගත් වෙන්නේ. මේක අවසානයේ දී අපි එතැනට යමු දැනට අපි මෙන්න මේ තියෙන රූප කලාපෙත් ඒ වගේ ම ගැඹුරු ඉදිරිපත් කිරීමක් තියෙන්නේ. කොහොමද රූප කලාපයක් හැදෙන්නේ, කොහොමද රූප කලාපෙකින් ප්‍රසාද රූපයක් හැදෙන්නේ කොහොමද, මෙතැන ඔබ හිතනව වගේ නිකම් පොතේ තියෙන වචන ටික බලලා හරියන්නෙ නෑ. ප්‍රායෝගික වෙන්න ඕන. ප්‍රායෝගික වෙනකොට ඔබට අර කීව විදිහට සමාධිමත් සිතක් ඇති කර ගෙන මේ දිහා බැලුවොත් ඔබට විදසුන් නුවන ගලාගෙන යනවා. ඒ ගලාගෙන ගියොත් ඔබට මේවා තවත් ප්‍රසාරණය වෙලා පේන්න ගන්නවා. ගැඹුරින් ගැඹුරට ගිහිල්ලා. එතකොට ඔබට මේ වගේ සත්‍යය පේන්න ගන්නවා. අන්න ඒ සත්‍යය පේන කෙනෙකුට විතරයි මෙහෙම කියන්න පුළුවන් කමක් තියෙන්නේ. පොතේ බැලුවොත් ඔබට එතරම් ගැඹුරට පොතේ යන්නෙ නෑ. අපට පේනවා ගිහිල්ලා නැති බව. අපි ඒක නිසාම අපි ඔබට ඉතාම පතුලටම ගෙනිහිල්ලා පෙන්නනවා. කොහොමද මේක වෙන්නෙ කියලා එහෙම වුනාම තමයි ඔබට චතුසමුට්ඨාන වලින් අපි නවත්තන්නේ නෑ. අපි ඊටත් ගැඹුරට ගෙනියනවා. කම්ම, චිත්ත, රිතු, ආහාර කියන්නේ මේ ඔබ දැන් මේ භාෂාව තුලින් දෙයක් කරගෙනයි මේක අහන්නේ. දෙයක් කරගෙන නෙමෙයි මේක ඊට වැඩිය ගැඹුරුයි. ඒ කියන්නේ ශුද්ධාෂ්ඨකයකින් ශුද්ධාෂ්ඨකයෙත් තමයි මේ රූප කලාපයක්. රූප කලාප පනස් හතරකින්නෙ දැන් ප්‍රසාද රූපය

හැදෙන්නේ. දැන් ඇහැට එන මේ වර්ණයක් හැදෙන හැටිනෙ මේ බලන්නේ. එතකොට පනස් හතරට මේක ගන්නේ, අපි කර්ම රූප කියල තව කොටස් තුනකට ගන්න නිසා අපි ඒක පැත්තකින් කියල ගත්තොත් චිත්ත, රිතු, ආහාර එකින් එක ලිහා ගත්තොත්, ආහාර රූප කලාප එතකොට එතන අටක් තියෙනවා. ශුද්ධාෂ්ඨකයට ඒ රූප කලාපයක් එකක් කියන්නෙ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, එතකොට මේ වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නේ අමුතු දෙයක් නෙවෙයි. ඒවත් ඔබගේ ම ඇස, කන, දිව, නාසය, ශරීරයට අරමුණු වන වර්ණ, ගන්ධ, රස, ඕජා, කියන එක හැම රූප කලාපයකම අඩංගු බව පෙන්නනවා. මේක ඝන දෙයක්වත්, අංගු දෙයක්වත් නෙමෙයි. ශක්ති ස්වභාවයක්. ඔබ කොහොම හිතවත් අපට එහෙම වචන පාවිච්චි කරන්න වෙනවා. එතැනට තමයි යන්න වෙන්නේ ඝන, පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, ආහාරමය ස්වභාවයකින් රූප කලාපයක් පෙන්නන්න අපේ මේ ධර්මය තුළට මේ දේවල් දාපු ඒ අයගේ උත්සාහය පෙන්නන එක එතන දකින කවුරු හරි කෙනෙක් දැකල තමයි පෙන්නන්නේ. ගිහින් තියෙන්නෙ ධර්මය තුළ නැත්නම් ඇත්තටම මේ අධ්‍යාත්මික දියුණු ඒ ආර්‍යයන් වහන්සේලාට ඒ යම්කිසි මේ සත්‍ය දකින කෙනෙක් මේ විදිහට කියන්නෙ නැත්නම් බුදුන් වහන්සේගෙන් ම ඒ බුදුන් වහන්සේ ඉදිරිපත් කරපු ඒ දේශනා ඉස්මතු කරගෙන තමයි ඒ අභිඤ්ඤාවෙන්ම දකින කාරණා මේවා. සාමාන්‍ය ආර්‍යය භූමියෙ දකින ඒවා. මේවා ගැඹුරුම ගැඹුරුයි. ඒ නිසා තමයි අපි කිව්වෙ මේ පඨවි කියන්නේ අපි ඝන කියලා පෙන්නුවට ඒකෙ ස්වභාවය ඇත්තට පෙන්නුවේ ඒක ශක්ති ස්වභාව වලින් දකින්න කියන එක. පඨවි, ආපෝ, තේජෝ, වායෝ මෙහෙම ස්වභාව භූත වෙන ස්වභාව එකත් එක්කම වර්ණ ගන්ධ රස ඕජා, මේ ශුද්ධාෂ්ඨකයක මේ තියෙනවා. ශුද්ධාෂ්ඨකය කියන්නේ අපි හිතමු ඔබ දන්න මේ සේරම අංශුවලට කැඩුවා කියලා. කුඩාම අංශුවලට කැඩුවා කියලා ඒ

එක අංශුව ශුද්ධාෂ්ඨකයක්. හැබැයි ඒ කඩන හැම අංශුවේම ශුද්ධාෂ්ඨකයෙ තියෙනවා. දැන් ඔබ කියනවා මේක පොතක්. මේක මේසයක් මේක අඹ ගෙඩියක්. මේ ඕනම දෙයක් ඔබ හිතන්න මේක යකඩ, ඕනම දෙයක් හිතන්න ඔය ඔක්කොමකඩන්න කෑලි කෑලි වලට කඩලා පරීක්ෂණාගාරයක අන්තිම කුඩා අංශුව ගන්න ඒකෙත් ශුද්ධාෂ්ඨකයක් තියෙනවා. ඒ කියන්නෙ ඔක්කොම සමානයි. ඔක්කොම ශුද්ධාෂ්ඨකයෙ නම් ශුද්ධාෂ්ඨකයේ සමානයි. ඒ අට්ඨකේ තමයි ඔය අට, ශුද්ධාෂ්ඨකය කියන්නේ හරියට නිකම් රස අටක් වගේ. මේක උපමා කරන්නෙ කොහොමද කියලා අපිට තේරෙන භාෂාවෙන් ඒ කියන්නේ මේ නැති ශක්ති ස්වභාව අටක් තියෙන්නේ. ඒ අට හැට එකේ ම තියෙනවා. දැන් අපි ප්‍රසාද රූපයක් ගත්තත් ඒ අට, වර්ණයක් ගත්තත් ඒ අට, ශබ්දයක් ගත්තත් ඒ අට, මෙතැන රස්නිය ගත්තත් ඒ අට, ගන්ධය ගත්තත් හැම ප්‍රසාද රූපයකට අට තියෙනවා. නැත්නම් ඔබ ගන්න මොකක්ද රූප කලාපේ. ඒ හැට එකක් ම ඔය අටෙන් හැදෙන්නෙ. ශුද්ධාෂ්ඨකයෙන් මේක සාමාන්‍ය කෙනෙකුට තේරෙන විදිහට කිව්වොත් මෙන්න මෙහෙම උපමාවක් ගන්න පුළුවන්. ඔබ ඔය ගහක වැටිල තියෙන කොළයක් ගන්න අතට, ඒ කොළේට වර්ණයක් තියෙනවා. ඒ කොළේ ඇල්ලුවොත්. තද ගතියක් තියෙනවා. ඒ කොළේ මිරිකලා බැලුවොත් ඒකේ තේජෝ ගතියකුත් තියෙනවා. දියවෙනවා. ඒ කොළේ ඊට පස්සෙ ඔබ ගිනි තිබ්බොත් ඒකේ වායෝ ගතියකුත් තියෙනවා. ඊට පස්සේ ඒ කොළේ ඉඹලා බැලුවොත් සුවඳකුත් තියෙනවා. ඒ කොළේ දිවෙන්විකලා බැලුවොත් රසකුත් තියෙනවා. ඒ කොළේ පොඩ්ඩක් රස බැලුවොත් ඒ කොළේ රසත් තියෙනවා. ගන්ධයකුත් තියෙනවා. රසකුත් තියෙනවා. ඒ කොළේට තට්ටුවක් දැම්මොත් ඒ කොළේ ශබ්දයකුත් එනවා. ශබ්දයකුත් තියෙනවා. ඒ ඉතිං මේ වර්ණ ගන්ධ, රස, ඕජා, පඨවි, ආපෝ, තේජෝ, වායෝ ඔය කොළේ තියෙනවා. ඔබ මොකක්ද අතට ගත්තේ. ඔබ මොකක්ද දකින්නෙ. හැමදේකම ඕක තියෙනවා.

මේක තමයි ඇත්තම අන්වීක්ෂයේ ඒ කියන්නේ කුඩාම ඒකකයට යන තැන. අපි කියන්නෙ නෑ මේ නූතන විද්‍යාවේ මේ පරමානු ගැන අපි කියන්නේ පරමානුවටත් වැඩිය කුඩයි කියලා කියන්නෙ. පරමානුව කුඩාවට කඩන්නේ තව බුදුන් වහන්සේ මේ පෙන්නන තැන පරමානුව දැන් විද්‍යාගාරයේ අරගෙන පරමානුව කඩලා පරමානු බෝම්බ හදුවේ සුඤ්ඤතාවයට සුඤ්ඤතාවය එම්ටිනස් (emptiness) එකනෙ ඔය පෙන්නන්නෙ බෝම්බ කියලා. එතනනෙ ශක්තිය උපදින්නේ. අන්න එවැනි දෙයක් මෙතන තියෙනවා. මේක ඇත්තට ම කිව්වොත් දෙයක් කියල ගන්න බෑ. ශක්ති ස්වභාවයකට පත් වීමක් ශක්ති ස්වභාවයක් තමයි. මෙතන තියෙන්නේ. ශක්තිය අංශුවක් කියන්න පුලුවන්. ශක්ති අංශුවක් කියල අපි ගමු. දැන් එතකොට කරන්ට් එක කියන්නෙ ශක්ති අංශුවක්. එතකොට චුම්භක ශක්තිය කියන්නෙ ශක්ති අංශුවක්. ඒ වගේ ඔබට දැන් රස්නය කියන්නෙ ශක්ති අංශුවක්. තරංග කියන්නේ ශක්ති අංශුවක්. මෙන්න මෙවැනි සිද්ධියක් ඒකයි මේක සවිඤ්ඤාණ මනසකින් නෙමේ අවිඤ්ඤාණ මනසකයි ධර්මය දකින්නේ ඔබට හම්බවෙන්නෙ කියලා සවිඤ්ඤාණක මනසින් බැලුවහම ධර්මය ඔබට හම්බ වෙන්නෙ නෑ ගැඹුරු තැන අවිඤ්ඤාණ මනසකින් බැලුවොත් තමයි ඒක හම්බවෙන්නේ. එතැනට යන්නෙ ගලාගෙන. ඒ තරම්ම ගැඹුරු පරියායක් එතැන තියෙන්නෙ දැන් මේ විදිහට දැන් අපි සිත හැදෙන වර්ණය කියන්නේ වර්ණ සිතනේ. විඤ්ඤාණය කියන්නෙ සිතනේ. එතකොට ගන්ධ සිතනේ. රස සිතනේ. ඒත් ප්‍රසාද නෙ මේ තියෙන්නේ ප්‍රසාද ඒත් සිතමනේ තියෙන්නේ. සිත හැදෙන හැටිම තමයි. මේ කථා කරන්නේ තව පැත්තකින් බැලුවොත් මේ රූපය රූප කලාපය, රූප පරජානාති කියන තැන. නමුත් මෙය ඉතාම ගැඹුරුයි. මේ මේක අපි තව තැනකට ධර්මය තුළ ගලපන තැනක් තියෙනවා. ඒක අවසාන කොටසක් තියෙනවා මේ නාම රූප පරිච්ඡේදයෙන් පස්සේ දිට්ඨි විසුද්ධියට චිත්ත විසුද්ධියෙන් දිට්ඨි විසුද්ධියට අපි මේක

තවත් ගැඹුරට යන තැනක් පෙන්නන් පුළුවන් අපට, මේ සිතක් කොහොමද සකස් වෙන්නේ, කොහොමද මේ සිතුවිලි අභිසංකරණයකට යන්නේ, කොහොමද නැවැත නැවැත එක එක ඒවා මතක් වෙන්නේ මේ හැමදේම කථා කරන්න පුළුවන්. හැමදේම වෙන හැටි කියන්න පුළුවන්. නමුත් දැන් අපි කථාකර පරියාය ටිකක් බලමු. ප්‍රසාද රූපය තුළම රූප කලාප පනස් හතර එතකොට හැදෙන්නෙ එතකොට කම්ම, චිත්ත, සෘතු, ආහාර කියල ගත්තම ආහාර රූප වෙන කොට අෂ්ඨකයෙම පෙන්නනවා. අපි කියන්න ගියේ පඨවි, අපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා ඒ ආහාර රූපමය නොපෙනෙන ස්වභාවය තිබ්බත් ආහාර රූපයක් හැටියටයි ඒක ගන්නේ. ඒකම ගන්නවා චිත්ත සෘතු කියන්නේ අතන තේජෝ මෙතන ගන්නෙ උෂ්ණය රස්නයෙ ස්වභාවය ගන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, කියන එකත් රස්නි ස්වභාවයෙන්. එතකොට චිත්තජ අට්ඨකය කියල ගන්න කොට, කම්ම චිත්ත, සෘතු ආහාරගන්න කොටත් එතනින් ශුද්ධාෂ්ඨකයක් අරගෙන එතකොට චිත්තජ නොපැහැදිලි චිත්ත ද රූපයක් හැටියට තමයි ඔය ප්‍රසාද රූපවල පෙන්නන්නෙ. එතකොට අටේ ඒවා තුනක් ගන්නවා. කම්ම, චිත්ත, සෘතු ආහාර ආටේ ඒවා තුනක් විසි හතරක් ගන්නවා. මේ කම්මය කියන එක ගොඩවල් 3කට බෙදෙනවා. මේක ප්‍රසාදයක්නේ. මේක ඇහෙන්නෙ ප්‍රසාද වෙන්නේ දැන් කණ්ණාඩියක් කියන්නේ. දැන් අපි කණ්ණාඩියකට ආලෝකය තියෙන කොට අපි මොනව හරි වැටුනොත් ඒක ස්පාර්ක් වෙනවා. කණ්ණාඩියට පේනවනේ. කණ්ණාඩියක් ඇල්ලුවොත් එහෙම පේනවනෙ. කණ්ණාඩියට වැටෙන ඒවා ආලෝකය තියෙන කොට වැටෙනවනෙ. එතකොට කණ්ණාඩියෙන් අපට පේනවනෙ මෙන්න මේකම තමයි අපට ඇහැ කියන්නේ. ඇහැට එන්නෙ ප්‍රතිබිම්භයක්නෙ. කණ්ණාඩියෙ තියෙන ඇහැ කියන එකේ මුකුත් නැනේ. ඇහැ කියන එකේ බාහිර පේන එකේම ප්‍රතිබිම්බයක් නේ. අන්න ඒ වගේ ඇහැ කියන්නෙ

ප්‍රතිබිම්බයක්ම තමයි. හැබැයි ඇහැ කියන එක ප්‍රතිබිම්බයක් වුනාට ඒ ප්‍රතිබිම්බයම අපි දකිනවානෙ ප්‍රතිබිම්බයක්. එතකොට එතන හැදෙන්න හේතුවක් තමයි පෙන්නේ. ඒක හැදෙන්න හේතුවෙලා තියෙන්නේ දැන් කණ්ණාඩිය නම් රසදිය, රසදිය දාපු නිසානෙ එතන අනිත් පැත්තට පේන්නේ. කණ්ණාඩිය නිකන් වීදුරුවෙන් පේන්නෑනේ. ඒකට රසදිය ගෑවට පස්සෙ ඒකෙන් දීප්තිමත්ව ප්‍රතිබිම්බයක් මෙහෙම ස්පාර්ක් වෙන එකක්. ප්‍රසාදයක්නේ. මේ ප්‍රසාදයක් මේක. ප්‍රසාදය රූපයක් කියන එක. අන්න ප්‍රසාද රූපයක් කියන එකේ අපි මෙතන චක්ඛු, අපි කලු ලපය කියනවා. චක්ඛු ප්‍රාසාද දැන් මේ එතන තියෙනවානෙ. කණ්ණාඩිය සිද්ධිය වෙන අන්න එතන වෙන හැදෙන්න හේතුවෙලා තියෙනවා. පෙර කර්මය නම කර්මය කියන එක මේක පෙන්නන තැන. ඊටත් වැඩිය ගැඹුරු තැනක් මේ තියෙන්නෙ. නමුත් අපට මෙතැන තියෙන විදිහට බැලුවොත් ඔය කම්ම රූපය කියන එක දශක තුනකට බෙදලා එතකොට කාය දශකය භාව දශකය, චක්ඛු දශකය කියලා. එතකොට චක්ඛු දශකය කියන්නේ මේක ඇහෙන්නේ පේන්නේ. එතකොට භාව දශකය කියන්නේ මෙතන, පුරුෂ, ස්ත්‍රි කියා තියෙනවනේ. පුරුෂ භාව, ස්ත්‍රී භාව, පුරුෂයෙකුට ස්ත්‍රින්ගේ ඒවා හැදෙන්නේ නෑනේ. ස්ත්‍රීන්ට පුරුෂයන්ගේ ඒවා හැදෙන්නෙ නෑනේ. දැන් අපි ගත්තොත් කොස් ඇටෙන් හැදෙන්නෙ කොස්ගහක් නේ. අඹ ඇටෙන් හැදෙන්නෙ අඹ ගහක් නේ. එතකොට මෙතැනත් තියෙනවානෙ මොකක් හරි මේ කොස් ඇටෙන් කොස් ගහත් හැදෙන්නේ කොහොමද කොහොමද කොස් ඇටෙන් කොස් ගහක් හැදෙන්නේ. ඇයි කොස් ඇටෙන් අඹ ගහක් හැදෙන්නෙ නැත්තේ. අන්න එතන ඒවගෙ ස්වරූපයක් මෙතන තියෙනවා කියන එක තමයි මේකෙත් තියෙනවා මේ මේක හැම රූප කලාපයකම මේක තියෙනවා. හැම රූප කලාපෙක මේ මේ ස්වභාවය එකතු වෙලයි හැදෙන්නේ. නිකන් එකකින් හැදෙන්නෙ නෑ. එක රූප කලාපයකින් කිසිදෙයක් වෙන්නෙ නෑ. රූප කලාප මේ

සමූහයක් එකතුවීම නිසයි. මේ දෙයක් හැදෙන්නෙ. සම්භූත වෙලයි හැදෙන්නේ. ඒකයි මෙතන සම්භූත වෙනවා. පටිච්ච වෙනවා. මේ හැමදේම වචනයකම ලොකු දෙයක් සිද්ධ වෙනවා. ශුද්ධාෂ්ඨකයෙ එක වුනාට මේකේ ස්භාව සකස් වීමක් තියෙනවා. ඒ සකස් වීම තුළ දැන් ඒකයි මේක කම්ම, චිත්ත, ඍතු, ආහාර කියල කොටස්වලට බෙදල පෙන්නන්නේ. ඒකයි මේකේ ආහාර රූපයක් පෙන්නන්නේ. ඒකයි මේකේ උෂ්ණත්ව රූපයක් පෙන්නන්නේ. ඍතු රූපයක්. ඒකයි මේ චිත්ත රූපයක් පෙන්නන්නේ. මොකද මේක නිකන් අර අපි කියනවානේ පැලැටියක් සත්වයෙක් කියන නිකන් අර මේකෙ තියෙනවානේ අර මෙලෙක් ගතියක් තියෙනවානේ. එතකොට එවැනි ධාතුවක් සකස් වෙන්න එපැයි ශෛල සකස් වෙන්න එපැයි අන්න ඒ විදිහට මේක දකින්න ඕන. මේක ගැඹුරු නුවණකට ගන්න ඕන. එතකොට තමයි මේ චිත්ත රූපයක්, කොහොමද එන්නෙ කියන එක චිත්ත රූපයක් කියන එක ආවෙ කොහොමද කියලා. එතකොට තමයි මේක තේරෙන්නෙ. භාව රූපයක් එන්නෙ කොහොමද කියන එක. අපි කියනවනෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන අෂ්ඨකයට දැන් මේක දශක කලාපයක් වෙන්නෙ කොහොමද? දශක කලාපයක් මේක හැදෙන්නෙ මේකේ දැන් ඔබ දැක්කොත් ධර්මය තුළ තියෙන වචනය ධර්මය තුළ තියෙන වචන අපි ගමුකො ඒ භාව දශකය කියල කියන කොට, ජීවිත දශකය, භාව රූපය, ජීවිත රූපය කියලනෙ ගන්නේ. ඔය දෙකනෙ අටට එකතු වෙන්නේ එතකොට නෙ දහයක් හැදෙන්නේ. එතකොට මේක ඊගාව එකටත් එනවනෙ. ජීවිත රූපය ඊගාව එකටත් එනවනේ. කම්ම රූප, තුනේම ජීවිත රූපෙ තියෙනවා. ජීවිතයක රූපයක් කියලා මේක දැන් සෛද්ධාන්තිකව ඔබ ඒ විදිහට පෙන්නන ඒ නියාය ධර්මය දිහා බැලුවම ඔබට පේනවා. එතකොට ජීවිත රූපයක් තියෙනවා. එතකොට චක්ඛු දශකයට, චක්ඛු දශකය කියලා දානවා. ඇස කියන එක වර්ණ රූපයක් පෙන්නන එක ඊට

පස්සෙ කාය දශකයට දැම්ම, කාය ප්‍රාසාදය කියලා දැම්මා. ඊට පස්සෙ දැම්මා භාව දශකය කියලා. මෙතැන කම්ම රූප දශක තුනක් තමයි මේ ගොඩවල් තුනකට බෙදලා මේ විදිහට ජීවිත කියලා තුනක්ම අරගෙන කම්ම නිසා ජීවිතය එන්නෙ කියලා තුනක් අරගෙන ඊට පස්සේ ඒක චක්ඛු ප්‍රසාද කියල අරගෙන. කාය ප්‍රසාද කියල අරගෙන, භාව ප්‍රසාද කියලා අරගෙන ඊට පස්සෙ ඒක කම්ම, රූප කියලා අරගෙන දශක තුනක් විදිහට අරගෙන දශක 30ක් අරගෙන තියෙනවා. මේ විදිහට තවත් මේවා ඕන නම් බෙදලා පෙන්නන්න පුළුවන්. එතකොට දැන් ඇත්තට ම මේ බුදුන් වහන්සේ දේශනා කරපු ඒ දේශනා උපමා කරගෙන අපි හිතනවා මේවා මේ විදිහට ඉදිරිපත් කරන්න ඇති නැත්නම් ඇත්තටම කියනවා නම් අභිඥාවෙන් ආර්යන් වහන්සේ නමකට ගැඹුරු පර්යායට ගිහිල්ලා ගැඹුරින් ඒක ගැඹුරින් ගැඹුරට බෙද බෙදා ගියාම මෙතැන මෙහෙම ස්වභාවය පේන එක කාට හරි කියන්න ඕනනම් ඒ දේ පැහැදිලි කරන්න ඕන නම් මේ විදිහට පැහැදිලි කළා නම් ස්වභාවයක් අපිට පේන එක. ඒක අපිට වැරදි කියන්න බෑ. මොකද අපිට වුනත් මේ ධර්මය ගැඹුරින්, ගැඹුරට බෙද බෙදා ගියාම මෙවැනි ස්වභාව තමයි පේන්නේ. මෙවැනි ස්වභාව පේන්නෙ නමුත් කියන කොට ඒක අවබෝධයක් නැතිව කෙනෙකුට කියාගන්න බෑ. අවබෝධයක් ඇතිව කියන කොට එයාට තේරෙනවා මේ හැම එකක්ම එකම ශුද්ධාෂ්ඨකයක් කියන කොට ඒ ශුද්ධාෂ්ඨකයෙ වචනය කොහෙන් හරි තිබ්බොත් එකම ශක්තිය ස්වභාවයක් එන්නේ. හැබැයි මේව පටලවා ගන්න එපා. මේ වේදය තුළ හින්දු ආගමට ශිව ශක්ති කියලා එකක් හදාගෙන මේ එක එක නම් දා ගෙන ඒවා සංඛාර, එහෙම සංඛාර දැන් අපි කියනවානම් මේක ශක්තියක් කියලා එකක්. සංඛාරයක්, සංඛාරයක් කියන්නෙ මේ අපි දාගත්ත නම් නේ. දාගත්ත නම් සම්මුති ප්‍රඥප්ති නේ. ඒවා සංඛාරනෙ නමුත් මේකේ යථාර්ථයක් තියෙනවා. යථාර්ථයක් තියෙනවා කියන්නෙ මේකේ සත්‍යයක් තියෙනවා. ඒ සත්‍ය ස්වභාවය අපට කියන්න

වචන ඕන වෙනවා. එතකොට අපි මේ කියන හැම වචනයක්ම සංඛාර මොකද ඒවා අපි කියන ඒවා. නමුත් මේකේ. දැන් අපි ලුණු ගැන කියන්න ගිහිල්ලා අපිට ලුණු ඒවා ගැන එක එක විදිහට කීවට ලුණු ගැන. කොහොමත් අපිට කියාගන්න බැනේ. ඉතිං මේ සත්‍ය ධර්මය අවබෝධ වුනොත් කෙනෙකුට, සත්‍ය දැක්කොත් කෙනෙක් ප්‍රත්‍යක්ෂ වුනොත් ඒක ඔහුට ම විතරයි සාන්දිට්ඨික, තව කෙනෙකුට කියාගන්න අපහසු නොවී පුළුවන්. ඉදිරිපත් කරන්න ගියාම ඒ අහන් ඉන්න කෙනා ගන්නෙ එයාගෙ දැනුම අනුව. එයා සමහර විට මෙයා කියන ඒ ගැඹුරු පර්යාය එයාට තේරෙන්නෙ නැති වෙන්න පුළුවන් සමහර විට එයා ඒක ගැඹුරින් ගැඹුරට ගිහින් එයාට ප්‍රත්‍යක්ෂතාවම ඥාණයට හසුවුනොත් එයාට ඒක දැනෙයි. අන්න ඒ වැනි දෙයක් මෙතැන තියෙන්නේ. ඉතිං මේ ශුද්ධාෂ්ඨකය කියන අපි මේ මෙච්චර රූප කලාප 54 කින් ප්‍රසාදරූපයක් හැදෙනවා කියන තැන මෙච්චර කථා කරන්න හේතුව ඒක අතිශයින් මේක වැදගත්කම සිත හැදෙන හැටි තැනක් තියෙනවා. ඒ විතරක් නෙමෙයි. මේකේ ඔබට ඔබ කියනවානේ ඔබ දෘෂ්ඨියෙ සිටියොත් ඔබට නැවැත උත්පත්තියක් තියෙනවා කියලා. අන්න එතනටත් සම්බන්ධයක් තියෙනවා. අපි අන්න එතනින් ඒ ටික කියලා නවත්වනවා. ඔබ මේ දෘෂ්ඨිය තුළ මිත්‍යා දෘෂ්ඨිය තුළ ඔබ මේ ලෝකයක් තියෙනවා කියලා දාගත්ත රූප කලාපයක් තියෙනවා. එතනත් රූප සකස්වීමක් තියෙනවා. අපිට එහෙම තමයි කියන්න සිද්ධ වෙන්නේ. නැත්නම් ශක්ති ස්වභාවයක් තියෙනවා. ඒ විඤ්ඤාණ ශක්තිය තුළ ඒ පන්ට්ඨිත විඤ්ඤාණය තුළ එහෙම ස්වභාවයක් තියෙනවා. ඒක සකස් වෙනවා. ඒක වෙනම පරියායක්. ඒ කියන්නෙ මේ මරණින් මත්තේ එක දිගට යන විඤ්ඤාණයක් නෑ. කොහේවත් එතැනත් මෙතැන සකස් වෙන ඇති වෙලා නැති වීමක් ආය ඒක ඊගාව එකට සම්බන්ධයක් නෑ. මේ එක සිතක්වත් ඊගාව සිතට සම්බන්ධයක් නෑ. මේ ධර්මය ඉතාම බොහෝම සියුම්ව ලිහාගන්න ඕන. මේ සිතක්

කියන එකත් එතන එතන හටගෙන නිරුද්ධ වන ස්පාක් එකක් කිව්වනෙ. අපි ස්පාර්ක් එකක් කියල කිව්වට සිතක් කියල දෙයක් නෑ කිව්වනෙ ඒක ප්‍රවාහයක් කිව්වනේ. ප්‍රවාහයක් කියන්නෙ දැන් ඔබ දකිනවා. තරංගයක් කියලා ඔය නූතන විද්‍යාඥයෝ අඳිනවනෙ රූපයක්. තරංගයක් කියලා. දැන් අපි කියනවනෙ රස්නියත් තරංගයක්. වර්ණයත් තරංගයක්. ආලෝකය තරංගයක්. එතකොට තාපය තරංගයක්. එතකොට අපි දැන් දකිනවානේ තම විදිහට කියනවානේ මේ ෆ්‍රීකුවන්සි (Freequanse) කරන්නේ දැන් රේඩාර් තරංග. ඒ වගේ දැන් තරංග වලින් ලෝකෙ කියන වනිත එතකොට අපි දන්නවා කොන්ටම් නියාය, කොන්ටම් නියාය කියන්නෙත් තරංගයක් තියෙන කෑලිනෙ පැකට්, ඒ කියන්නේ තරංගයකත් තියෙනවනේ ඇතිවෙන. නැතිවෙන. ඇතිවෙන, නැතිවෙන භාවයකින්නේ තරංගය තියෙන්නේ. ඇයි කොන්ටම් න්‍යාය එන්නේ කොන්ටම් න්‍යාය එන්නේ දැන් මේ කුඩාම අංශු මේ රූප කලාපයම තමයි මේ යන්නේ. මේ රූප කලාපය වගේ ම දෙයක් තමයි නූතන විද්‍යාවේ මේ යන්නේ. රූප කලාපය ඊට වඩා ගැඹුරුයි. ඒක තාම නූතන විද්‍යාවට අහුවෙන්නෙ නෑ. නූතන විද්‍යාවට අහු වෙන්නෙ නැත්තෙ තාම ඒ තරම් ගැඹුරට නූතන විද්‍යාව වැටිලා නෑ. නූතන විද්‍යාවට එතනට යන්න තව අවුරුදු 100 ක් 200 ක් ම වැඩිය යයි. මොකද අපට ඒත් හිතාගන්න බෑ. එතැනට යයිද කියලා. එතැනට ඒ කියන්නෙ ඒ තරම්ම මේ අධ්‍යාත්මිකව මේ ආසියාවේ තියෙන මේ මහා අධ්‍යාත්මික දියුණුවෙ ගැඹුර තාම භෞතිකව පෙන්නන්න බෑ. භෞතිකව පරීක්ෂණාගාරයට ගිහින් නෑ. ගන්න බෑ. ඒක අතිශයින් ගැඹුරුයි. ඒ කියන්නෙ මේ ශ්‍රද්ධාෂ්ඨකයෙ පෙන්නන තැනම මේ රහස තියෙනවා. ඒ තරම්ම ගැඹුරු තැනක් මේක තව පෙන්නන්න පුළුවන්. අපට මේ ශක්ති ස්වභාවය 8 ම බෙදන්නෙ කොහොමද ? බෙදුවෙ කොහොමද ඇයි එහෙම හිතන්නේ. ඇයි එහෙම ගන්නේ. එකෙක් තව ගැඹුරු තව ගොඩාක් මේව කථා කරගෙන යන කොට පැය ගනන් යනවා.

දැන් ඔබට අහන් ඉන්නත් බෑ. ඔබට මේ විෂය සමහර විට නීරසය වෙන්නත් පුළුවන්. කෙනෙකුට මේක එච්චර අදාල නැහැ. කියල කෙනෙකුට ඒක අත්හැරලා දාන්නත් පුළුවන්. නමුත් ගැඹුරින් ගැඹුරින් ඇතුලට යන කෙනෙකුට මේ ඇත්තට ම ඥාණ සකස් වෙන්නේ අභිඥ්ඥා සකස් වෙනවා. ඒ අභිඥ්ඥාවෙන් දකින දේ ඥාණයට හසුවෙන දේ සිතුවිලි වලට අසුවෙන්නෙ නෑ. ඇත්ත කථාව. සිතිවිලිවලට ඒක නීරසයි. කෙනෙකුට ඒක එපා වෙන්නෙ සිතටයි. සිතට ඒකට යන්න වේ. ඒ සුඥ්ඥත සංයුත්ත ඒ ගැඹුරින් ගැඹුරට යන සුඥ්ඥතාවය දකින තැන ඒ සමහර ඒ පැහැදිලි කිරීම් ඒ ඥාණයට හසුවන දේවල් සිතුවිලි වලට ඔරොත්තු දෙන්නෙ නෑ. සිතුවිලි වලින් ප්‍රතික්ෂේප වෙනවා. නමුත් මෙය අතිශයින් ගැඹුරුයි. මේ විෂය මේ රූප කලාපත් ඒ හා සමාන විෂයක් කොහොමද මේ වර්ණයක් හැදෙන්නෙ කියන එක කොහොමද ශබ්දයක් හැදෙන්නෙ කියන එක කොහොමද මේ ශබ්ද විෂයෙ කොහොමද ප්‍රසාද රූපයක් හැදෙන්නේ කියන එක. කොහොමද වර්ත් ප්‍රසාද රූපයක් හැදෙන්නෙ කියන එක වර්ණ ප්‍රසාදයේ එළියෙ හැදෙන්නෙ එකක් නෙමේ ඇත්ත කථාව. ඇත්ත කථාව මෙතන තියෙන්නෙ චිත්තයක් චක්ඛු ප්‍රසාද රූපය ඇවිල්ල චිත්තයක් ඒක තියෙන්නේ. ඒක ඔබට ඔය පේන එක නෙමේ දැන් ඔබට පේන්නේ වර්ණයක් නේ. ඔබට පේන්නේ වර්ණයක් හැඩ තලයක් වර්ණයක් හැඩතලයක් නෙමෙයිනෙ. ඔබ ඇසුරු කරන්නේ. නාමයක් නේ. හොඳට බලන්න ඔබ ඇසුරු කරන්නෙ පොතක්. ඔබ ඇසුරු කරන්නෙ අඹ ගහක්. ඔබ ඇසුරු කරන්නෙ කමල්, නිමල්, ඔබ ඇසුරු කරන්නෙ මේ චිත්තයක්. එතකොට ඔබ දකින්නෙ චිත්තයක් ඔබ චිත්තයක් කියන්නෙ මෙතැන තියෙන්නෙ ඇත්තට ම ඔබ හිතන දේ නෙවෙයි. ඔබ හිතන්නෙ මෙතැන වර්ණයක් පේනවා කියලා. මෙතැන වර්ණයක් නෙමෙයි ඔබට ඔබට ඒක අපට පැහැදිලි කරන්න වෙන ක්‍රමයක් නෑ. භාෂාවේ චිත්තයක් තියෙන්නේ. චිත්තයක් තියෙන්නේ. රූප සංඥාවක්

තියෙන්නේ. ඒක අතිශයින් ගැඹුරුයි. ප්‍රාසාද රූපය කියන එක අතිශයින් ගැඹුරුයි. හැබැයි මේ රූපෙ පරජානම් කියනවා නම්, පරජානාති කියන්නෙ මේ අවබෝධයට එන කෙනා, මේකට තමයි රූප කලාප බෙදා බැලිම කියන එක තියෙන්නේ රූප කලාප බෙදා බැලීමයි. ලක්ඛණ පදට්ඨධාන විදිහට බලනවා කියන්නේ ඉතාම ගැඹුරුයි මේක ඒ කියන්නේ මහ භූත විදිහට බලන එක අරමුණ සම්මර්ෂණය කරන එක මේක ඉතාම ගැඹුරුයි මේ රූප කලාප සමථයානිකයාගේ විදසුන් ඒ සමථයානිකයාගේ විදසුන් නුවන එන්නෙ මේ හරහා රූපෙ පරජානාති වෙන්නෙ නැතිව නාම ජරජානාථි වෙන්නෙ නෑ මොකද මේ රූපය මෙතන දැකීම තුලම නාමෙම ගලනවා. ඒකට හේතුව තමයි එතනම විදසුන් නුවනට මේකෙන් නාම රූප පරිච්ඡේදයට නාමයයි, රූපයයි වෙන් කරලා දැකීමේ තැනට මෙතැනින්ම ගලන්නේ ඒ කියන්නෙ දැන් මෙයා භාහිර කියන්නෙ මේකේ කියලා හිතුවට මෙහෙටම මේක දැන් තව ටිකක් දිගින් දිගටම මේවා එන්නේ අපි කිව්වා විතක්ක විචාර ප්‍රීති සුඛ සංසිඳිලා ඒ කියන්නෙ කම්පන, චංචන සංසිඳිලා මේවට ඇලෙන්නෙ නැතිව ගැටෙන්නෙ නැතිව මේ සංඳාව සුතම වෙලා ඒකාග්‍රතාවය කියන තැන මේ සතිය පිහිටන සති නිමිත්ත පිහිටන තැන හතර වෙනි ධ්‍යානය, සමාධිමත් සිතට ඒ ධ්‍යානයේ ඒ කියන්නේ ඒකාග්‍රතාවයේ එකම අරමුණක පිහිටලා ගැඹුරට යන්න තරම් සුදුසු සමාධියක් ඉපදුනු දාටයි. කෙනෙකුට ඉවසීමකින් බොහෙම තීක්ෂණ නුවණකින් විදසුන් නුවණකින් විදසුන් ඥාණයකින් මේ එකින් එක එකින් එක විදගෙන විදගෙන ගැඹුරින් ගැඹුරටම ලිහාගෙන ලිහාගෙන ලිහාගෙන ගිහිල්ලා පරම සත්‍ය අවබෝධ වෙන්නේ. එතැනට යන ගමනෙ තමයි රූපයෙ මේ විදියට පටන් ගත්තම.

## ★ 5 වෙනි පරිච්ඡේදය ★

# භාහිරත් සිතත් සත්‍යක් නොවේ

## (දිට්ඨි විශුද්ධිය )

ඒ රූපයම දැක දැක යනකොට ඊට පස්සෙ කොහොමද අපිට පේන්නේ දිගින් දිගට යනවා ඊට පස්සෙ තමයි එයාට මේ ප්‍රසාදය මේ ප්‍රසාද රූපය එතකොට ස්පර්ෂ වෙනවා මේ මනෝ විඤ්ඤානයෙන් නේ දැනගන්නේ අන්න එනවා ආයතන වේදගෙන මනෝ විඤ්ඤාන පැත්තට අන්න නාමය පැත්තටයි එන්නෙ දැන් ගලන්නෙ. දැන් ඊට පස්සේ ප්‍රසාදය අඳුරන්නේ නැහැ චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු විඤැඤානය අඳුනන්නේ නැහැ. එතකොට තමයි තිංනං සංගති පස්සෝ මේවා ඔලුවට ගලන්නේ. එතකොට තමයි ඇසට වැටුනු හැඩතලයේ එතකොට ඇසත් රූපයත් ඇසේ විඤ්ඤානයත් මේ තුනම එකතුවීම තමයි මෙතන ඇස කියන්නෙ. ඇස කියන්නේ මැරුණු කෙනාට ඇහැක් තියෙනවානේ මැරුණු කෙනාට පේන්නෑනේ එතකොට දැන් පේන්නේ සහ තියෙන කෙනාමනේ ඇයි හා තියෙන කෙනාට පේනනේ ඇයි මැරුණු කෙනාට පෙන්නැත්තේ. ඇයි මැරුණු කෙනාට ඇහැ තියෙනවානේ අන්න එතකොට තමයි තේරෙන්නේ මේ කම්මජ රූප කලාප ඇයි තියෙන්නේ ඇයි මෙතන භාව රූප තියෙන්නේ ඇයි මෙතන ජීවිත ඉන්ද්‍රිය රූප තියෙන්නෙ ඇයි ජීවිකතා නාම රූප ඇයි මේ කම්ම රූප තියෙන්නේ අන්න එතකොට තියෙනවා ශුද්ධාෂ්ඨකය විතරක් නෙවෙයි. මෙතන පන තියෙන ස්වභාවයක් කොහොමද තියෙන්නේ මේවට හැබැයි තවත් මේ ආහාරජ රූප එකතුවෙනවා කාටවත් නෑ කියන්න බෑ. එතකොට මෙතෙන්ට

උෂ්ණත්වයේ රූපය මේ රශ්මිය කියන එක මයි ඩබල් කරන්නෙ මේ වචනේ කියනවා අපි කිව්වා මේ ස්පන්දනයක් කියලා ඒ ස්පන්දනය කියන වචනය කොහේවත් නැහැ. එතකොට මේ හොයාගන්න බැරි වෙනවා. එතකොට නමුත් මේවා පැහැදිලි කරන්න ගියාම අපට සිද්ධ වෙන්නේ මේ වගේ අපට දැනෙන ස්වභාවයක් තියෙනවා කම්පනයක් කියන්නේ මොකක්ද. මෙතන රශ්මියක් තමයි දිය බුබුලක් හදන්නෙ හොදට බලන්න ඒක මේ බුබුළු නටනවා දැන් රශ්මියට ජලය, කේතලේ නටනකොට බුබුළු නටනවා මෙන්න මේ විදිහට ඔබගේ මේ හමේ සෛල වර්ධනය වෙන්නේ කොහොමද ඍතු නිසා රශ්මිය නිසා මේකේ තියෙනවා මේකේ ලොකු කතාවක් තියෙනවා ඒ කියන්නේ මෙතන ඕජාව කියන එක ඕජාව කියන්නේ මේ ඕජාව රූපය ඇවිල්ලා වේග රූපයක්. ඒකයි මේ වේගරූපයක් කියන්නේ. ඔබට මේ ගැන කියන්න වචන නෑ. ඕජා කියන්නේ මේ ගලන ස්වභාවය වේගයක්. දැන් අපි ආපෝ ස්වභාවය ගලන ස්වභාවයනේ එතකොට ආපෝ රූපය තියෙනවාද නෑ. ඕජා රූපය කියන්නේ මොකක්ද ඒ වේගේ. ඒම වේගය කියලා කියන්නේ වචනයෙන් ගත්තොත් මොනාහරි වේගය කියන්නේ අපි උපමා කරලා තියෙන්නේ වාහනයක් වේගයෙන් යනවා ඔන්න ඔහොමනේ. එහෙම එකකුත් නෙමෙයි. ඕජා කියන්නේ වේගයක් කිව්වාම මේ මේක රශ්මියේ වේගය මේක දැන් කියන කොට ම ඔබට සමහර විට යාන්තම් ටිකක් හරි ගැඹුරින් ගැඹුරට අභිඥා සකස් වුණු කෙනෙකුට යයි. නැත්නම් යන්නේ නෑ මේ කියන එක මේ රශ්මිය කියන එක වැදගත් ඕජාව කිය වේගස්වභාව කියලා එහෙම ගන්න ඔබට කොයි විදිහෙන් දැනෙයිද දැනෙන කෙනෙකුට ඒක වැදගත් වෙනවා එතකොට මේ ඍතු ආහාරජ චිත්ත ස්වභාවයක් මේ වචන තමයි ඉතිං අපට පාවිච්චි කරන්න වෙන්නේ. නමුත් මෙතන මැරුණු කෙනාට පෙන්නැති වෙන්නත් අර හුස්ම වැටුන කෙනා කිව්වේ අපි හුස්ම වැටෙන කෙනා කියන්නේ පන තියෙන කෙනා කියන එකනේ

එතකොට මේ වායුවෙනුත් මේකේ දෙයක් තියෙනවා ඔබට පේනවාද වායු රූපයක් මේකේ තියෙනවා කියලා. හැම තැනම මේ රූපය වැදගත් වෙනවා. එතකොට මෙතන නම් සියුම්ව රූප කලාපයනේ. සියුම්ම රූප කලාපයේ ඇයි මේ ජීවිත රූපයක් තියෙන්නෙ කම්ම රූප තුනේම ජීවිත රූපය පෙන්නන්නේ ඇයි කම්ම රූප තුනක් පෙන්නන්නේ ඇයි චක්ඛු කියන රූපයක් පෙන්නන්නේ ඇයි කාය රූපයක් භාව රූපයක් කියලා පෙන්නුවේ. මේ හැම එකටම හේතුවක් තියෙනවා. නමුත් ඔබට පෙන්නෑ ඔබ දැනුමට වචනටික කටපාඩම් කරනවා විතරයි ඔබ ඒක යථාර්ථයක් කරගෙන ඇතුලෙන් ඇතුලට ගිහිල්ලා මේකෙ රශ්මියෙන් මොකද වෙන්නේ වේගරූපය ඕජා රූපය කියන් මොකක්ද සෘතු රූපය, රශ්මිරූපය කියන්නේ මොකක්ද මේකේ තව ටිකක් හොඳට ඔබට යථාර්ථයක් කරගන්න ගියොත් ඉතිං ඔබට දැනෙන්න ගන්නවා යම්කිසි දෙයක් ඒ දැනෙනදේ කාටවත් කියන්න බෑ ඒ තමයි ප්‍රසාද රූපය ඔබට දැන් නොදැනෙන්න මේක ඇත්තටම වෙන හැටි පේනවා වගේ දෙයක් වෙනවා. මෙකේ මොකක්ද වෙන්නේ කියන එකක් වගේ එකක් මෙතන ඇත්තටම වෙන්නේ කන්නාඩියේ තියෙන දේමයි ප්‍රසාද රූපයක් කියන්නේ ප්‍රතිබිම්භයක් මයි. භාහිර මෙත ආලෝකයක්මයි ප්‍රසාද වෙන්නේ ඔව් මෙතන ප්‍රසාද වෙන්නේ අර කණ්නාඩිය වගේ ඔපය හැදෙන්නේ මෙන්න මේ ප්‍රසාද රූපය මෙතන සකස්වීම නිසයි. මේ රූපය සකස් වෙන්නේ ප්‍රසාදවත් වෙන්නේ ආලෝකයට ප්‍රසාදවත් වෙන වෙන හැටියි මේ පෙන්නන්නේ. මෙතන හැදෙනවා අර වගේ ඔපයක් හැදෙනවා වගේ දෙයක් ඒකත් එක්ක තමයි ප්‍රසාදය කියන එක රූපටික හැදිලා. එතන එතන හැදෙනවා මිසක් මේක කලින් තියෙන දෙයක් නෙවෙයි. එතනම එතනම සකස් වෙලා ඇති වන නැතිවන එකක් මිසක් කලින් තියෙන දෙයක් නෙමෙයි. හැබැයි දැන් මෙතනින් එන්නේ පොටෝ එකක් වගේ එකක් මේ කොච්චර කථා කලත් ප්‍රසාද රූපයක් කියන එක එතන

නිකන් හැඩ තලයක් විතරයි. ඒ තමයි ස්පර්ශ වෙනවා කියන්නේ මනෝ විඤ්ඤානයට එතනින් තමයි ඒක තමයි මෙතන තවත් සිද්ධියක් සිද්ධ වෙනවා මනෝ විඤ්ඤානය ඇතුලේ. මනෝ විඤ්ඤානය ඇතුලේ වේදනා සංඥා, සංකාර, විඤ්ඤාන කියන එක තවත් ඔය වගේම ගැඹුරින් ගැඹුරට යන විග්‍රහයක් තියෙනවා ඒක මේ ශබ්දයත් මෙතන එකතු වෙලා මෙතන වර්ණයත් එකතුවෙලා මෙතන කලින් තිබුනු ඒ ස්වභාවයක් කොහොමද නැවත ඉස්මතු වුනේ කියන එක. ඇයි මේ කලින් තිබුනු ස්වභාවයක් ඉස්මතු වෙන්නේ ඇයි එතන ස්කන්ධ එතන එතන ඒ ස්වභාවය සමාන වෙන කොට එතන ඉස්මතු වෙනවා ඔහොම තමයි අපට කියන්න වෙන්නෙ. ඒ කියන්නේ අපි කිව්වා මීට කලින් පුංචි දරුවෙක් ඉපදිලා අම්මාගේ හැඩතලය එනකොට භාහිරින් කෙනෙකුන් ඒ හැඩතලය රූපය එනකොට අම්මා අම්මා කියන ශබ්දය දැම්මාම මේ දෙක ඒ අම්මා කියන ශබ්දය ඒ හැඩතලයට එකතුවීමක් සිද්ධ වෙනවා. දැන් මෙතන ඔබට මේ රූප කලාප සකස් වෙන ආකාරයත් බැලුවාම ඔබට මේ ලොකු කතාවක් මේකෙ තියෙනවා. මේ කොහොමද මේ සියල්ලම ඇත්තටම කිව්වොත් මේ කතාව **රූපං රූපත්තාය අභිසංඛරෝති** කියන්නේ ඇයි. **රූප රූපත්තාය සංඛතං අභිසංඛරෝති** කියන්නේ, රූපය දෙයක් බවට පත් වෙනවා කියන එකනේ. රූපං රූපත්තාය සංකතං අභිසංකරනයකට ලක් වෙනවා සංචිතයකුත් වෙනවා සංචතය කියන්නේ නැවත නැවත එකතු වෙනවා. රූපයක් නැවත රූපයක් බවට රූපයක් රූපයක් බවට **රූපං රූපත්තාය සංඛතං** නැවතත් සකස්වීමක් තියෙනවා අභිසංකරනයක් නැවතත් අභිසංකරනයක් මේවා වේගවත් විදිහට නැවත නැවත අර වාර 7ක් ගියා වගේ වැඩක් සංචාර කරනවා කියන එක. ඒ කියන්නේ කාටුන් එකක් යනකොට එකම වගේ රූප පේලියක් දාලා දුවන ලමයෙක් පේන්නේ. අපි කියන්නේ පුංචි කාලේ අර පිටු 200 යේ පොතක රූපයක් ඇඳලා එකම විදිහට දුවන ලමයෙක් අන්තිමට පෙරලගෙන

යනකොට පේනවා අන්න ඒ වගේ සිද්ධියක් මෙතන සිද්ධ වෙනවා. අපට එහෙම තමා තව උපමා ගන්න වෙන්නේ. නමුත් ඊට වැඩිය මේක ගැඹුරුයි. ඊටත් වඩා ගැඹුරුයි මේ චිත්ත රූපයක් කොහොමද හැදෙන්නේ කියන එක. චිත්ත රූපයක් හැදෙන්නේ මනෝ විඤ්ඤානයෙන්. අතනින් එන්නේ ඇවිල්ලා හැඩතලයක් ඒක පටිඝ සම්පස්සයක් කියලානේ කියන්නේ. ඒක කිරනයක් කියලා ප්‍රතිබිම්බයක් කියලා මොන වචනය කිව්වත් එතන දෙයක් නැහැ. පොතක් කියලා දෙයක් නැහැ. චක්ඛු විඤ්ඤානයෙන් එහෙම එකක් එන්නෑ. චක්ඛු ප්‍රසාදයයෙන් එහෙම එකක් එන්නෑ. චක්ඛු ආරම්මණයෙන් ඒ වර්ණ ආරම්මනයේ එහෙම එකක් ැහැ. මනෝ විඤ්ඤානයේ වෙනම කතාවක් තියෙනවා එතනින් තමයි මේ අපි කිව්වේ ස්පන්දනය කියලා ඔයදේ පෙන්නන්න. ඒ කියන්නේ මෙතන දැන් මේක වේගයක් තුලයි තියෙන්නේ කියන එක. දැන් මේක ලොකු වේගයක් තුලයි තියෙන්නේ එතන එතන එතන එතන ඒ එනකොට ඒ එනකොට ඒ ඒක සකස්වෙන එකක්. මේක මේක මෙන්න මෙහෙම වෙනස් විදිහට මනෝවිඤ්ඤානය මෙතන කතා කරන්නේ අපි නාමය ගැන. නාමය ගැන කියන්න හදන්නේ මේ දැන් රූප කලාප වලින් අපි ප්‍රසාද රූපවලින් එනවානේ රූපයක් හැදෙන හැටි ඒ එතනදි ගන්නේ ඒ හරහා නේ අපි රූපය පරජානාති කියන තැනට එන්නේ. නමුත් දැන් අපි නාමයට එනවානේ නාමය පරජානාති කියන තැනට. එතකොට දකින්නේ විදසුන් නුවනින් නේ එතකොට මෙයා එන්නේ දැන් දකින්නේ දැන් එන්නේ යන්නේ විදර්ශනායානිකයාගේ පැත්තට දැන් විදර්ශනායානිකයාගේ පැත්තට විදර්ශනායානිකයා රූප කලාප පස්සේ දුවන්නේ නැහැ. ඒ සමථයානිකයා තමයි රූප කලාප පස්සේ ගිහිල්ලා ඔතනින් එන්නේ. ඔතන්ට එයා දකිනනෙත් ඒ විදියටම එතනින් එන්නේ. නමුත් සමථයානිකයාත් අවසානයේදී ධර්මය දකිනකොට ස්කන්ධය දකින්නේ ස්කන්ධය පර්ජංනානි යථාභූත ඥානයෙන් දකිනකොට විදර්ශනායානිකයාගේ ඒ

ශුෂ්කයානිකයාගේ පැත්තටයි එන්නේ. එකම දේ තමයි මේකේ සුගන්දන කියන්නේ තවත් පැත්තක් තියෙනවා. මේකේ මොකද මේ පැහැදිලි කිරීමක් මේ ධර්මය තුල කෙරෙන පැහැදිලි කිරීමේ ඇත්තටම භාගයක්වත් නැහැ. තවත් මේ වගේ දෙගුණයක් පැහැදිලි කරන්න තියෙනවා තවත් ඉස්සරහට මොකද ආසවක්ශය ඥානය පැත්තට යන්න ඕන පුබ්බේ නිවාසනුස්සති ඥානය ත්‍රිවිද්‍යා පැත්තට යන්න ඕනේ එතන තව සූත්‍ර ගනනාවක් තියෙනවා ඒ පැහැදිලි කරන්න ඒවත් එක්කලා. එහෙම මේක ලේසියෙන් ඉවරවෙන කථාවක් නෙවෙයි දැන් මෙතන පොඩි කෑල්ලක් මේ පැහැදිලි කලේ. මෙතනත් මේ නාම රූප පරිච්චේද පච්චේපරිග්ගහා ඥානය එතන මේ සම්මර්ශන ඥානවලට එන තැන මිත්‍යා දෘෂ්ඨිය කියන්නේ භාහිර ඇත්ත කරගත්ත තැනින් මිදිලා සම්මා දිට්ඨියට ඒ සත්‍යයක් නොවන තැනින් එන්නේ. ඉතිං ඒ එන තැනට තමයි මේ මුල් අවස්ථාවේ තාම ඉන්නේ. මේක හිතන්න එපා දැන් මෙතනින් හරි තබා කියලා නෑ මෙතනින් අපි කිව්වාට සමථයානිකයා ඛණික සමාධියනේ දැන් මෙතන තියෙන් සමථයානිකයෙන්ගේ නමුත් එයා අවසානයේ දී විදර්ශනා ඥානයෙන් එපා නිවන් දකින්න. මොකද එයා සත්‍ය දකින්න එපෑ. සත්‍ය දකිනවා කියන්නේ දැන් මේ නාමයෙන්ගේ හැදෙන්නේ පොත ඔන්න ඔතනයි සත්‍ය දකින්නේ. නාමය පර්ජානාති කියන තැනින් දකින්න. එතන තමයි විදර්ශනයානිකයා ඉන්නේ. විදර්ශනායානිකයා කොච්චර සමථය හරහා එච්චර දුර ගියේ නැතුවාට හැබැයි ඒත් එයාටත් විසිරෙන හිතෙන් දකින්න බෑ. සමථය යන්තම් හරි තියෙන්නෙ ඕනේ. සමථය ගැඹුරට ගියේ නැති වුනත් යන්තම් හරි තියෙන්න ඕනේ. මොකද එයාට විසිරෙන හිතෙන් දකින්න බැහැනේ. එයාටත් සීලේ පටිත්තාය නරෝ සපඤ්ඤෝ කියන තැනින් තමයි එන්නේ. හැබැයි ඔය සීලය කියන්නේ මේ ඇත්ත මම හැමදේම වැදගත් ඉතිං ඒ සීලය ඔබ හිතන් ඉන්නවානේ සීලයක් ගැන හිතන් ඉන්නවානේ ඉන්ද්‍රිය සංවර සීලය. ඕනම

දෙයක් තර්ක කරන්නයන්නෑ අපට එහෙම කථාවක් නෑ. අපි කියනවා මේ සත්‍ය දකිනවා කියන සීලය තමයි ඒ කියන්නේ අරමුනේ සත්‍යයක් දකින එකයි. එතනත් එන එන අරමුනේ සත්‍ය දකිනවා ඒක තව ටිකක් ගැඹුරට යන්න ඕනේ. ඒ පැත්තට එන්න අපි දැන් මෙතනදී ගත්තොත් මේ නාමය හැදෙන තැන පටිඝසම්පස්සයට අධිවචන සම්පස්සයක් කියන තැනම තමයි ඔය ප්‍රසාද රූප එන්නේ. ප්‍රසාද රූපය එන්නේ විඤ්ඤනය දැනගැනීම සංඝති පස්සෝ කියනවානේ චක්ඛුංච පටිච්ච රූපේච චක්ඛු විඤ්ඤානං අන්න එක තමයි ප්‍රසාද රූපයෙන් එන්නේ. තිනං සංඝතී පස්සෝ ස්පර්ශ වෙන්නේ ස්පර්ෂ වෙන්නේ මනසටයි. එතකොට මනසට කියලා එතකොට පටිඝයක් තමයි ස්පර්ශ වෙන්නේ. රූපයක් දෙයක් පොත නෙමෙයි. කිරණයක් පටිඝයක් වදිනවා. ස්පර්ශක්. චිත්ත චෛතසික උපදිනවා කියන්නේ සිතුවිලි උපදිනවා චිත්ත චෛතසික මෙතනදී එන්නේ වදින්නේ කිරණයක් පටිඝයක්. නමුත් ඇතුලෙන් එන්නේ පොතක් කියලා දැනගැනීමක් මෙතන නිකන් ට්‍රාන්සිලේට්වීමක් ඉංග්‍රීසි භාෂාව සිංහලට පරිවර්තනය උනා වගේ. ඒ කියන්නේ මේක සිතුවිලි බවට පරිවර්තනය වෙනවා. වදින්නේ කිරණයක් හැදෙන්නේ සිතුවිල්ලක්. අන්න ඒක ආවේ කොහොමද පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සයක්. අධිවචන සම්පස්සයක් කියන්නේ සිතුවිලි දැන් හැදෙන්නේ මනෝ විඤ්ඤානය අරමුණක් එන කොටම ඇහැට වර්ණයක් එනකොටම ආ ඒක අඹ ගහක් ඒ කපුටෙක් ඒ ඇවිල්ලා පොතක් දැන් අපිට පේන්නේ හැම තිස්සේම මේ සම්මුතියක්. අපි හදා ගත්ත නාමයක්. අපිට මේ හැඩතල එහෙම හැඩතල නම් ප්‍රශ්නයක් නැහැ. අපට පේන්නේ සිතුවිල්ලක් ඇත්ත කථාව මේක සරල කරලා කියන්න එපා. සිතුවිල්ලක් එතකොට සිතුවිල්ලක් ආවේ කොහොමද එතකොට තවත් ගැඹුරට යන්නවෙනවා. එතකොට ඒ ආකාරයෙන් ඒලියන ඒ නිමිති ඒ උද්දේශ ඇති කල්හි පටිඝ සම්පස්සයට වදින ඒ කියන්නේ මේ ඔය ඒ ආකාර ඒ ලිංග ඒ

නිමිති ඒ උද්දේශ ඒ ආකාරයම තමයි. එන හැඩතලය කියන්නේ. ඒ හැඩතලයට අනුරූපව ඒ ආකාරය ඒ ලිංග ඒ උද්දේශ ඇති අධිවචන සම්පස්සයක් හට ගන්නවා කියන එක ඒ කියන්නේ වේදනා වින්දේ කිරණ හැඩතලය ප්‍රතිබිම්බය ඕන වචනයක් ඒ වේදනා කියන්නේ මේ මනසේ මනෝවිඤ්ඤාන ඇති වන තැන. මනෝවිඤ්ඤානය සංඥාව ඒක දැනගැනීම ඒ දැනගැනීම සිද්ධ වෙන්නේ සංචාරයෙන් අපි ඒකම කියනවා. පෙර මතකයේ ගලපලා බලනවා කියලා නමුත් පෙර මතකයේ කියලා මතකය කියලා දෙයක් කොහෙවත් නෑ. මෙතන මේ ස්කන්ධය කියන්නේ මේ හැඩ තලය මේ ස්කන්ධය කියන්නේ මේ හැඩතල. මේ පැත්ත බලන කොට බිත්තිය පේනවා කියන්නේ හැඩතලය. ඇතිපැත්ත බලන කොට පොත පේනවා කියන්නේ ඒ හැඩතලය ඒ හැඩතලයමයි පොත කියලා කියන්නේ. ඒ හැඩතලය තමයි බිත්තිය කියලා කියන්නේ. නමුත් මේක මෙතනින් ඉවරයි. මේ පැත්ත බලලා මේ පැත්ත බලනකොට එතනම සිත ඇති වෙලා නැති වෙනවා. ඇයි මේ පැත්ත බලනකොට ඒ හිතේ සම්බන්ධයක් නෑ, එතන කෙලෙන්ම වෙනින් හිතක් දැන් මෙතන වෙනින් හිතක් එතන වෙනින් හිතක්. මේ හැඩතලයට ඒ කියපු එක එනවා කියන එක. මේ හැඩතලයට මෙයින් කලින් කිව්වානේ බිත්තිය කියලා ඒකම එනවා කියලා. කොහෙවත් තිබිලා එන එකක් නෙමෙයි. හැඩතලයට මයි එන්නේ ඒ කොහෙවත් තිබිලා එනකක් නෙමෙයි හැඩතලයටමයි එන්නේ. ඔය විදිහට කියන කොට ඔබට තේරෙන්නැද්ද දැන් මේ ස්කන්ධය මේ නාමය මේ ස්කන්ධයට මේ නාමය මේ ස්කන්දයට මේ නාමය මේ ස්කන්ධය ආවොත් මේක එනවා මේ ස්කන්ධය ආවොත් මේක එනවා. ඔන්න ඔහොම දෙයක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ ඒ ස්කන්ධය කියන්නේ වේදනා සංඥා සංඛාරා ඒ කියන්නේ මහා ලොකු දෙයක් නෙමෙයි. විදින එක වේදනාවක්. ඒක කොහොමත් සංඥාවක්. සංඥාවක්නේ අඳුනගන්නේ සංඛාර කරනවා කියන්නේ අර කලින් ආපු එක නැවත නැවත අර රූප

වැටෙනවා වගේ කාටුන් හැදෙන කොට වැටීම තුළ අර චේතනා කරනවා කියන්නේ අන්න ඒ වගේ සිද්ධියක් සංඛාර වෙනවා කියන එක. සංචාරය තුළ ඒ වේදනා සංඥාව තමා සංඛාර වෙනවා කියන්නේ. වේදනාවම සංඥාවෙන් හඳුනාගැනීමයි සංචාරය ඒ දැනගැනීම විඤ්ඤානය. එකම කථාවක් ඔය කියන්නේ. ස්කන්ධය කියලා කියන්නේ ඔන්න ඕකට. ස්කන්ධය කියන්නේ නාමයක් නාමයේ අන්තරයක් රූපයේ අන්තයට ගන්නේ නැහැ. ඒක චිත්තයක් චිත්ත ස්වභාවයකටයි එන්නේ. එතකොට ඒකත් කොහෙවත් තියෙන එකක් නෙවෙයි. එතනම සකස් වෙනවා. මේක ස්භාවික සන්සිද්ධියක්. මේ පුද්ගලයෙක් කරන දෙයක්. එහෙම දෙයක් නෙවෙයි. ආත්මයක් එහෙම එකක් නෙමෙයි. කෙනෙක් පුද්ගලයෙක් ආත්මයක් කියන දෘෂ්ඨියකින් ගන්නෙපා මේක නිකන් ස්භාවික සිද්ධියක් දැන් මෙතන විදිල්ලක් කොටනවා. ඒක ස්භාවික සිද්ධියක්. මෙතන ආලෝකයක් තියෙන කොට මෙතන දිලිසෙන කණ්ණාඩියක් වගේ තිබුනොත් ඒක දිලිසෙනවා. ඒක ස්භාවික සිද්ධියක්. කවුරුත් කරන එකක් මුකුත් පුද්ගලයෙක් නෙමෙයි. ස්භාවික සංසිද්ධි ගොඩක් මෙතන තියෙන්නේ. එතකොට ස්වාභාවික ඇත්තටම මේ චිත්ත නියාමයක් කියලා ඒක ඍතු නියාම බීජ නියාම කම්ම නියාම චිත්ත නියාම කොස් ඇටෙන් කොස් ගහක් හැදෙන එක බීජ නියාමය නේ. ස්වාභාවික සිද්ධියක් තියෙනවා එතන එතනත් තියෙනවා. පැහැදිලි කරන්න. මෙතනත් තියෙනවා චිත්ත නියාමයක්. ඒක ස්වාභාවිකයි. ඒක ස්වාභාවික සිද්ධියක්. මෙතන බීජය මොකක්ද බීජය අනුව පැල වෙන්නේ ස්වාභාවික සිද්ධියක්. මේ මේක හොඳින් නුවනින් දකින්න ඕනේ. ඒක ශුද්ධාෂ්ටකයට යන එක ගොඩක් වැදගත් වෙනවා. රූප කලාපය දකින එක ගොඩාක් වැදගත් වෙනවා. සමථයානිකයාගේ පැත්තත් ගොඩක් වැදගත් වෙනවා. නමුත් ශුෂ්කයානිකයානික රහතන් වහන්සේ විදර්ශනා නුවනින් යන කොට ඔය විදිහට නෙමෙයි දකින්නේ. ඒ අය දකින්නේ

මෙන්න මෙහෙමයි. ඒ අය දකින්නේ භාහිරින් දෙයක් එනකොට ශුෂ්කයානිකයා අච්චර සමථය රූප කලාප පැත්තට යන්නේ නෑ. එයා කෙලින්ම නාමය විසඳගන්නවා. රූපය දකිනවා. මෙයා දකින්නේ කෙලින්ම චක්ඛු ප්‍රාසාදයට. එතකොට කෙලින්ම ප්‍රතිබිම්බයක් කණ්ණාඩියට වැටුනා වගේ. එතකොට එයා දන්නවා මුකුත් නෑ. එයා දකිනවා ඊට පස්සේ මනෝ විඤ්ඤානයට එනකොට එයා දකිනවා ඒක සිතින් හදාගත්ත එකක්. එතකොට පොත කියන එක එයා දකින්නේ මේ ස්කන්ධය. එතකොට ඒක ඒ ශබ්දය එකතු වෙන එක එයා දකින්නේ ඒක මේක හැඩතලයට ශබ්දය එකතුවෙලා ශබ්දයක් තමා එයා දකින්නේ. එහෙම එකක් එයා දැන් හැඩතලය එතකොට ශබ්දයක් එන්නේ. දෙයක් කියන්නේ ශබ්දයටයි. චිත්තය කියන්නේ. චිත්තය කියන්නේ ශබ්දයමයි. දැන් මෙතන තියෙන්නේ ඇත්තට ම කියනවා නම් ඔබ හිතනදේට වැඩිය ස්වාභවික සන්සිද්ධියක් තියෙනවා. එතන එතන ඇති වෙනවා. නැති වෙනවා. එතන එතන ස්පාක් වෙවී නැතිවෙන එකක් තියෙන්නේ. ඒක තමයි ශුෂ්කයානිකයා දකින්නේ. දකින්නේ එතකොට භාහිර තියෙන එකක් නෙමෙයි. මෙහෙත් හැදෙනවා එතනත් එහෙම දෙයක් නැති බව දකිනවා. දැන් භාහිර තියෙන එකක් නෙමෙයි මේක මෙහෙ හදාගෙන බාහිරින් බලනවා කියලා. ශුෂ්කයානික ඒ රහතන් වහන්සේ ගමන් මග තමයි ගොඩක් වෙලාවට අපි පෙළ දහමේ පැහැදිලි කරන කොට කරන්නේ. යම් වේදෙති තං සංජානාති යං සංජානාති තං විතක්කෙති . විතක්කෙති තං විජානාති කිව්වොත් භාහිරට ගැට ගැහෙනවා කියලා. ඒ කියන්නේ තිංනං සංඝති ඵස්සෝ කියන තැනින් ස්පර්ශයට එනවානේ. ඵස්ස පච්චයා වේදනා වේදනාවට එනවා වේදනාව තන්හා ඵස්ස පච්චයා වේදනා තං වේදෙති වේදනාවෙන් දැනුනද ඒක සංඥාවෙන් අඳුනනවා. යං වේදෙති තං සංජානාති තං විතක්කේති ආ ඒක තමයි ගැලපීමක් සිද්ධ වෙනවා. යම් විතක්කෙති තං විජානාති ඒකම බාහිර තියෙන්නේ කියලා දැනගත්ත දේ කියලා දැන ගත්තදේ

ශබ්දයක් ශබ්දයකින් තමයි දැනගැනීම කියන එක තියෙන්නේ. ඒ කියන්නේ ඇයි එහෙම කියන්නේ. ඒක නාමයක් කියන්නේ අපි කියන්නේ ශබ්දයක් දැන් අපි කපුටා කියන්නේ ශබ්දයක්නේ. දැන් ර යන්න කියන්නේ ශබ්දයක් නේ. රතු කියන්නේ ශබ්දයක් නේ. මෙතන ශබ්දයක් ස්පන්දයක් තියෙනවා. මෙතන ශබ්දයක් ස්පන්ධනයක් තියෙනවා. ඒ කියන්නේ මෙතන තියෙන්නේ ඇත්තට ම වේගයක් තුළ තරංගයක්. අපි දැන් තරංගයකින්නේ ටීවී එකේ සිරස හිරු අල්ලන්නේ. ඒක තරංගයකින්නේ අල්ලන්නේ. ඒ වගේ ම මෙතනත් තරංගයක් තියෙන්නේ. අපි කියනවා සිතක් කියලා සිතක් එතකොට මෙතනත් ටීවී එකේ සිද්ධ වෙන දේ තමයි සිද්ධ වෙන්නේ. දැන් ටීවී එකේ කොමද ප්‍රීකොන්ස් එකක් නේ අල්ලන්නේ තරංගයක්නේ අල්ලන්නේ. ඒක ඕනම තැනක තරංගය ඇල්ලුවාම ඒ විදිහට ඒ නාලිකාව වැඩ කරනවානේ. එතකොට එතන තරංගයක් නේ තියෙන්නේ. ඒ වගේ ම මෙතනත් තරංගයක් තියෙන්නේ. තරංග සිස්ටම් එකක් කියෙන්නේ. මේ තරංග සිස්ටම් එක චිත්ත නියාමයක්. ඒක ආත්මීය දෙයක් නෙමෙයි. අපි ආත්මීය දෙයක් කියලා හදාගත්තා එකක් චිත්ත නියාමයක්. ඒ කියන්නේ එකත් ඒ සිස්ටම් එකේමයි තියෙන්නේ. මෙතන ස්බාවයක් තියෙනවා. සිද්ධි ගොඩක් තියෙනවා. ඒ කියන්නේ එතන එතන සකස් වෙවී නැති වෙනවා. දැන් තරංගයක් කියන්නේ තරංගයක ඇති වෙනවා නැති වෙනවා ඇති වෙනවා නැති වෙනවා කියන එකක්නේ. තරංගයක් කියන්නේ තරංගයක සිද්ධවෙන්නේ එක දිගට යන තරංගයක් නෑනේ. දැන් කරන්ට් එකක් වුනත් නෙගටිව් පොසිටිව් එතන ධන ඍණ යනවානේ දිගට එතන මැද්දේ ශුණ්‍යතාවයක් තියෙනවානේ. එම්ටිනස් එකකුත් තියෙනවා. හිස් තැනක් තියෙනවා. මොකද ධන ඍණ කියන්නේ නොගැලපෙන දෙකක්. නොගැලපෙන දෙකක් තිබුනොත් මැද්දෙ තියෙනවා අනිවාර්යයෙන් ම ඒ නොගැලපෙන ඒ ස්පාක් වෙන තැන එම්ටිනස් එක තමයි

ශක්ති ස්වභාවය ඒක තමයි. විඤ්ඤානය කියලා අපි සිත කියන්නේ දැනගත්තා කියලා. ඒකම තමා චිත්ත නියාමය තියෙන්නේ දැන් අපි මේක ගත්තේ බයිසිකල් ඩයිනමෝවේ උපමාව තමයි ගත්තේ. බයිසිකල් ඩයිනමෝවේ චුමුභකයක් තියෙනවා. ඒක අපි අර පොඩිකාලේ දැක්කේ බයිසිකලේ දැන් බයිසිකල්වල ඒක නෑනේ. එතකොට ඩයිනමෝව කැරකෙනවා. රෝදයට තද කරාම. එතකොට චුම්භකය කැරකෙනවා ධන සෘණ කියන නොගැලපෙන අන්ත දෙකක් කැරකෙනවා. එතකොට ඒ නොගැලපෙන අන්ත දෙක කැරකීම තුළ ඒ කැරකීම තුළ නේද මේ මේ වේගයක් තුල නේද මේ විද්‍යුතය උපදින්නේ ධනයි සෘණයි නොගැලපෙන අංශු දෙකක් එකට කැරකෙන කොට ඒ නොගැලපෙන ස්භාව දෙක තුල ස්පාක් එකක් නේද අපි දකින්නේ. මේ කරන්ට් එක කියලා. ඒ කියන්නේ දැන් චුම්බක කැරකෙන කොට ධන සෘණ කියලා රතුයි නිලුයි වයර් දෙකක් පේනවානේ. ගෙනැල්ලා ඔබ ලයිට් එකට දැම්මාම ලයිට් එක පත්තු වෙනවානේ. එතකොට කරන්ට් එක කියලා නෙගෙටිව් පොසිටිව් වයර් දෙහකින්නේ එතකොට ධන සෘණ නේ යන්නේ. එතකොට නොගැලපෙන දෙකක් ස්පාක් වුනාම නේද මේ ලයිට් එක පත්තු වෙන්නේ. දැන් ඔබට තේරෙනවාද චුම්බකයෙන් නොගැලපෙන අංශු දෙක කැරකුනාම ශක්තිය උපදිනවා කියලා. ඕක ඔහොම කිව්වොත් පෘතුවියෙත් සිද්ධවෙනවා. ඒ කියන්නේ මේ චුම්භක ශක්තිය කියන එක පෘථිවියෙත් ගලක් උඩ දැම්මාම බිම වැටෙන්නේ මේ පෘථිවියේ අංශ දෙක දෙපැත්තේ කැරකීම තුලමයි. ඒකත් ඉපදිච්ච එකක් කොහොමත් තියෙන එකක් නෙමෙයි. මේ කැරකීම තුළම මේ අංශ දෙකක් ධන සෘණ කියලා හැදිච්ච එකක් වේගයක් තුලයි මේක සිද්ධ වුනේ ඒ වේගයක් තුළ ඒ අංශ දෙක හැදිලා නොත් සවුත් කියලා හැදෙන්නේ ධන සෘණ කියලා ඒකම තමයි මුළු පෘථිවියම චුම්භකයක් මුළු පෘථිවියම චුම්භකයක් පෘථිවියම කැරකෙනවා. එතකොට ධන සෘණ දෙක කැරකෙන කොට

ගුරුත්වාකර්ශනයට කොටු වෙලා මේක ඇතුලේ බෝලයක් වගේ පෘථිවිය ඇතුලේ අර ඕසෝන් ස්ථරය කියලා හැදිලා තියෙන්නේ ඒක ඇතුලේ තියෙන ඒවා ඇතුලෙම හිරවෙලා තියෙනවා කැරකීම තුලයි මේක සිද්ධවෙන්නේ. මේක වේගයක් තුළයි සිද්ධවෙන්නේ. වේගය තමා ඕජාව කියන්නේ. මේකම තමයි සිත හැදෙන්න මේ සංසිද්ධිය ස්භාවික හැම තැනම තියෙනවා. දැන් කරන්ට් එක ඇති වෙලා තියෙන්නෙත් එහෙමයි. කරන්ට් එක විතරක් නෙමෙයි චුම්බක ශක්තිය විදුලි ශක්තිය ඒ විතරක් නෙමෙයි මේ කථා කරන හැම ශක්ති ස්භාවයකම අංශ දෙකක් ස්පාක් මැද්දේ තියෙනවා. ශුන්‍යතාවයක් ඒ ශුන්‍යතාවය තමයි පරමානුව කියන න්‍යෂ්ඨිය ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන දෙක දැන් මීක පිපුරුවොත් දැන් මේක පරමානුව මොකද වෙන්නේ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන දෙක අතර ශුන්‍ය මායාවයි. එළියට එන්නේ ශුන්‍යතාවය තමයි. ශක්තිය කියන්නේ ඒක තමයි. පරමානු බෝම්බයක් හැදෙන්නේ ඒකේ විශාල ශක්තියක් උපදින්නේ කොහොමද මේ මේකේ තියෙනවා ලොකු කථාවක්. දැන් මේ තමා චිත්ත ශක්තිය කියන්නේ දැන් අපේ ශරීරය ඇතුලේ අපි දැන් සාමාන්‍ය ශරීරයේ. යම්කිසි කරන්ට් එකක් තියෙනවානේ ඒක සිතුවිලිත් එක්ක තියෙන්නේ. සිතුවිලිත් එක්ක ශක්තියක් උපදිනවා. දැන් මේක සිතුවිලි කියලා ආත්මීය දෙයකින් දකින්න එපා. සවිඤ්ඤානක මනසකින් දකින්න එපා. අවිඤ්ඤානක මනසකටයි අහුවෙන්නේ මේක ආත්මීය කථාවක් නෙමෙයි මේක ආත්මීය කථාවක් දෘෂ්ටියක් ඒක ඇතුලේ හැදිච්ච එකක් ඒ කියන්නේ මෙතන බාහිර තියෙනවා කියන එකයි. අපේ තියෙන දෘෂ්ටිය බාහිර තියෙනවා. තියෙනවා කියන කොටම අපට උපදිනවා මේ පැත්තේ ඒක තියෙනවා කියන්නේ නැති එකක් නැති එකක් තමයි අපි හැම තිස්සේම තියෙනවා කියන්නේ තියෙනවා කියලා එකක් නෑ. ඔන්න ඔතනයි ඒකේ රහස තියෙන්නේ. ශක්තිය උපදින්නේ තියෙනවා කියපු ගමන්. කවදාවත්

තියෙනවා කියලා එකක් මේ ලෝකේ නැහැ. ඒකයි සියල්ල අනිත්‍යයි කියන්නේ. ඒ කියන්නේ මේ සිතත් ඔතනමයි හට ගන්නේ. සිතෙන් ඔය කථාවමයි තියෙන්නේ. ඒ කියන්නේ මේ චිත්ත ශක්තියක් උපදින්නේ චිත්ත ශක්තියක් උපදින්නේ ඒක ස්වභාවික සංසිද්ධියක් ඒක ඒ තියෙනවා කියලා කවුරු හරි කෙනෙක් අත් හැරියහොත් ඒ ආත්මීය දෘෂ්ටිය බිඳ වැටෙනවා. එතකොට ස්පාක් එක නවතිනවා. එතකොට විඤ්ඤානය මෙක නැවත සකස්වෙන ශක්තිය නැති වෙනවා. මෙතන මේ බාහිර දැන් ඔබට කන්නාඩියක් කියලා හිතන්න මේ ඇහැ ඇහැ කන්නාඩියක් දැන් කන්නාඩියට වැටෙනවා. දැන් එලියේ තියෙන එපා. සේරම ඔබේ ඇහැත් කන්නාඩියක් දැන් ඔබ මේ පැත්ත හරවන කොට මේ සේරම වැටෙනවා. වැටුනම කන්නාඩිය ඇතුලේ කවුරුත් ඉන්නවාද දැන් කන්නාඩිය ඇතුලේ මුකුත් තියෙනවාද දැන් ඔබේ ඇහැ ඇතුලේ ඔබ හිතන්නේ මොකුත් තියෙනවාද නෑ. මෙච්චරයි සිද්ධවෙන්නේ මේ වැටෙන එකට ස්පාක් එකක් තුළ ශක්තියක් ඉපදිලා තියෙනා. ඒක තියෙනවා කියන ශක්තිය ඒ ශක්ති ස්භාවයක් ඒක කරන්ට් එකක් ඒක තමයි විඤ්ඤාන ශක්තිය කියන්නේ. ඒක උපදින එකක්. හට ගන්න ධර්මයෝ ඒක හැම තැනම පෙන්නන්නේ විඤ්ඤානය සකස්වෙන එකක් සංඛත අසංඛතයක් නෙමෙයි. සංඛකය සකස් වෙන එකක්. එතන එතන සකස් වෙලා නැති වෙනවා. ආයි කොහොමත් ඒක තියෙන එකක් නොවෙයි. දැන් මෙතන ස්පාක් වෙනවා. ස්පාක් එක තමයි ස්පාක් වෙනවා. මේක මේකේ දැන් මෙතන අපි මෙච්චර කථා කරන්න හේතුව මෙච්චර රූප කලාප ගැන වුනත් මෙච්චර කථා කරන්න හේතුවක් තියෙනවා. මොකද මෙතන හැමතැනම තියෙන්නේ එකම ස්භාවයක්. මේ අංශුව අංශු කියලා ගත්තොත් අංශු නෙමෙයි තියෙන්නේ. ශක්තියක් තියෙන්නේ. දැන් පෘථිවිය සම්පූර්ණයෙන් ම අලුවෙලා ගියා කියමු. නැති වෙලා ගියා කියමු. ශක්තියනේ තියෙන්නේ. අවකාශයේ. අභ්‍යවකාශයේ තියෙන්නේ. එකම ශක්ති

ස්භාවයක්නේ එක ඝන වෙලානේ පෘථිවියක් හැදිල තියෙන්නේ. පටකයක් හැදෙන්නේ එහෙමනේ. පඨවියක් හැදෙන්නේ එකම තමයි මේ පෘථිවියක් කියන්නේ. දෙයක්වත් මී ගහක් කියලා දෙයක්වත් මේ ඔක්කොම නම් අපි හදාගත්තු ඒවා. එහෙම ඒවා නෑ. සේරම පඨවි පඨවිමයි. ඝන නම් ඝන ද්‍රව නම් ද්‍රව වායු නම් වායු මේකේ තියෙන්නේ සම්පූර්ණයෙන් ම සම්භූතන් සකස් වෙන එකක් එකම ශක්ති ස්භාවයක්. ශක්ති ස්භාවය ඝන වෙලා තියෙන්නේ. තියෙන දෙයක් නෑ. ශක්තියක් විතරයි එතන ඒක දකින්න අමාරුයි. මේක දැන් අපි දකින්නේ ඇවිල්ලා මේ දකින්න පුළුවන් එකක් නෙමෙයි. මේ ඇත්ත දකිනවා කියන්නේ යථාර්ථය දකිනවා කියන එක ඇවිල්ලා සත්‍ය දකිනවා කියන එක ඇවිල්ලා හිතන්න බුදුන් වහන්සේ උනත් මේ සත්‍ය අවබෝධ කරගෙන මේ මිනිස්සුන්ට තේරෙයිද කියලා හිතන්නේ ඇයි. මේක තේරෙන්නෑ කාටවත්. මේක හිතකට හිතන්න බෑ. හිතක් නැති බව හිත කොහොමද හිතන්නේ. හිතක් නෑ. හිත කියලා දෙයක් නෑ. ඒ නැති බව කොහොමද හිතන්නේ. දැන් ඒ අවබෝධ වුනාට පස්සේ මරණය ඒවා මේවා ඇවිල්ලා ඒවා සිතුවිලි විතරයි. එහෙම ඒවා නෑ මේ ස්පාක් එක දකින්න ඕනේ. මේ ස්පාක් වෙනවා. ස්පාක් වීම ගොඩාක් ස්පාක් වෙලා ස්පාක්වෙලා ස්පාක් වෙලා ඔන්න ඕක තමයි චිත්තය කියන්නේ. ඒ එක එක හැඩතල ස්පාකින් කමයි අපි මේ විඳවන්නේ. ඒ හැම එකක් ම ස්පාක් වෙන්නේ මේ මෙතන මෙතන මේ තියෙනවා කියලා ස්භාවයෙන් බාහිර එහෙම ඒවා දැන් අපි ස්පාක් එක බාහිර තියෙනවා කියලා හිතනවා. අපි ස්පාක් එකෙ බාහිර තියෙනවා කියලා හිතනවා. මෙතන ඇත්තටම චිත්ත ස්භාවය අවබෝධවෙනවා. මෙහෙම කිය කියායන කොට ස්පාක් එක මේ ගැන කියලා එකෙක් එහමෙ එකක් නෙමෙයි. ශබ්දයක් තියෙන්නේ මෙතන ශබ්දයක් පුංචි දරුවාට මොකුත් නැහැ. මෙතන ප්‍රභවය එහෙම දේවල් නැහැ කිව්වා පුංචි දරුවා ඉපදෙන කොට ප්‍රභාස්වරන් චිත්තං කිව්වා ප්‍රභාස්වරන් චිත්තං වල කිසිම නැහැ. මොකුත් දාන්නේ

ඉර තියෙනවද හද තියෙනවද පොඩි ළමයා මොකුත් දන්නෑ. කහ පාට රතු පාට කතන්දර මොකුත් එතන නෑ. ඉපදෙන කොට ඔය කාගෙවත් ගාව නෑ. කිසිම පුංචි දරුවාගේ සිතක මුල් අවස්ථාව එම්ටිනස් ඒ කියන්නේ ප්‍රභාස්වරයි. මොකුත් නැහැ. හැබැයි මේ ශබ්දය එකතු වෙනවා ඊට පස්සේ හැඩතල ශබ්ද එකතුවීම තමයි මෙතන සිද්ධ වෙන්නේ. දැන් අර අම්මාගේ හැඩතල එනකොට මා... මා... ගාලා ඒ බාහිරින් එන ශබ්දය මෙහෙන් ප්‍රතිකම්පනයක් තමයි මේ ස්රාලයෙන් එන වායුව පිටවෙන කොට සිදුධ වෙන්නේ. දැන් අහසේ විදුලි කොටන කොට මෙහෙ ජනෙල් හෙල්ලෙන්නේ මෙතන ප්‍රති කම්පනයක් නේ සිද්ධ වෙන්නේ. මෙන්න මේ අහසේ විදුලි කොටන කොට මෙහෙ ජනෙල් හෙල්ලෙන එකම තමයි බාහිරින් අම්මාගේ හැඩතලය එන කොට මා.... මා....... කියලා මේ ස්වරාලයෙන් මා කියන එක කියවෙන කොට එක ඒ ශබ්දේ මේ ශබ්දේ වෙනවා. ඒ ශබ්දය මේ ශබ්දය වෙනවා. බාහිර තියෙන ශබ්දය මේ ශබ්දය වෙනවා. ඇත්තට පොඩි එක්කෙනාට වෙන්නේ ප්‍රතිකම්පනයක්. ප්‍රතිකම්පනය තමා සිත කියන්නේ. මේ ඔක්කොම මිලියන් ට්‍රිලියන් ගානක ප්‍රතිකම්පන බ්ද අපි සිත කියන්නේ. සිත කියලා දෙයක් නෑ. බාහිර ඒ හැම බ්දයක්ම මෙතන මේ හැඩතල ශබ්ද ගැටගැහිලා තියෙන්නේ. ඒවමයි ගැටගැහිලා අපට කියන්න වෙන්නේ එතන මේ ශබ්දයට මේ එතන එතන තියෙන ස්කන්ධ තමයි එතන එතන බ්ද ශබ්දයි ඔක්කොම එකට තියෙන්නේ. හැබැයි මෙතන ඒ ස්කන්ධටික හැඩතල තියෙනවා නම් ඒ ශබ්දටික එනවා එතනට. ශබ්දය ආවොත් ඒ ස්කන්ධ ටිකත් එනවා. ශබ්ද ස්කන්ධ එකට එනවා. මේවා එහෙම තමයි කියන්න වෙන්නේ. මීක පුංචි පුංචි අඩුපාඩු තියෙයි ඔබට සකස් කරගන්න පුළුවන් නමුත් මේ සිත කියලා දෙයක් නැඳ මේක ස්පන්ධනයක් කිව්වේ ඒකයි. ස්පන්දනය කියන වචනය මේ පාලි භාෂාවේ තියෙන්නේ අපි දැකලා නෑ පාවිච්චි කරනවා. නමුත් අපිට මේ වගේ ස්භාවයක් ස්පාක් එකක් ස්පන්දනයක් වගේ එකක් මේ

නූතන භාෂිතය තුළ පෙන්නන්න පුළුවන් මෙහෙම දෙයක් සිද්ධ වෙනවා කියලා. ඒක මේ රූප කලාප පැත්තෙන් ගත්තාම ම්කේ හොඳට පේනවා. ශුද්ධා අෂ්ටකය කියන හොඳට පේනවා එකම ස්භාවයයි තියෙන්නේ කියලා පෙන්නන්නේ එකම ස්භාවයයි හැම තැනම. ශබ්දය කියලා ආලෝකය කියලා වර්ණය කියලා ගන්ධය කියලා වෙන්කරන්න ඒවා නෑ. එකම ශුද්ධාෂ්ටකයක් එකම ශක්ති ස්භාවයක් අපට වෙන්කරගත්තම එහෙම එකක් නැහැ කියලා ශුද්ධාෂ්ටකය හොඳට බැලුවාම ඒක පේනවා. රූප කලාප කියලා ගත්තාම හොඳට පේනවා ඔක්කොම එකමයි. ඒකේ පොඩි පොඩි අර පුංචි පුංචි ස්භව වෙනස් කර ටිකක් තමයි එකතුවෙවී එන්නේ. ඒ ස්භාවය ස්භාවය එකතුවීමක් තමයි අන්තිමටම මේ මෙතන දී ඔබ සංචාර කියලා එකක් බාහිර නෑ. සංචාර කියන්නේ මේ භෞතිකව එකක්වත් නෑ, සේරම චිත්ත ස්භාවයක් සංචාර කියන්නේචිත්ත ස්භාවයක් සංචාර කියලා එකක් බාහිර නෑ. අපි කියන්නෙම්මේ චේතනා සිතුවිලි සංචාර කියන්නේ. ඊටත් වැඩිය ගැඹුරු පැත්තකින් අපි මේ විඤ්ඤාණයෙන් පෙන්නන කාරනාවන් දෙන්නේ. ඒ සත්‍යමයි දෙන්නේ පරම සත්‍යයමයි දෙන්නේ ඒකේ ආත්මීය පැත්තකින් නෙමෙයි දෙන්නේ. ආත්මීය සිතකට දකින්න බෑ කිව්වේ ඒකයි මේක සවිඤ්ඤානක මනසකට දකින්න බෑ කිව්වේ ඒකයි. මේක දකින්න අවිඤ්ඤානක මනසකින් දකින්න විදිහට. ආ දැන් සිතක් කියලා දෙයක් නෑ කියලා ආත්මයක් කියලා දෙයක් නෑ කියලා දැන් ඔබ ධර්මය තුල වචන ඔබ අහනවා. රූපය නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ. එතකොට රූපය කියලා දෙයක් නෑ කියලා.